# අනාගත වංශය

හෙවත්

# මෙතේ බුදුසිරිත

විල්ගම්මුල සංඝරාජ මාහිමි

# අනාගත වංශය

හෙවත්

## මෛත්‍රී බුදු සිරිත

# අනාගත වංශය
## හෙවත්
## මෙතේ බුදු සිරිත

විල්ගම්මුල සංඝරාජ මාහිමියන් වහන්සේ

# හැඳින්වීම.

ශ්‍රී ලංකා සාහිත්‍යයෙහි වංශකථාවන්ට ලැබෙන්නේ අද්විතීය ස්ථානයකි. මේ වංශකථා සාහිත්‍යයට පාළි භාෂාවෙන් මෙන්ම සිංහල භාෂාවෙන් ද ලියැවුණු කෘතීන් රැසක් ඇතුළත්ය. විෂය ක්ෂේත්‍රය අනුව වර්ග කළහොත් මේ වංශකථා හා ඓතිහාසික වංශකථා හා ආගමික වංශකථා වශයෙන් පුළුල් ලෙස දෙකොටසකට බෙදා දැක්විය හැකිය. ඓතිහාසික වංශකථා ඇසුරෙන් දීපවංස හා මහාවංස යන ග්‍රන්ථ දෙක ශ්‍රී ලංකා දිවීපයේත්, ජාතියේත්, එමෙන්ම බුදුදහමේත් වංශකථාව ප්‍රාමාණික ලෙස විස්තර සානර ඉතා අගනා කෘතීන් වශයෙන් ඉතිහාසඥයින්ගේ ප්‍රශංසාවට ලක්ව ඇත.

ආගමික වංශකථා රචනා වී ඇත්තේ බෞද්ධයින්ගේ අතිමහත් ගෞරවපුරස්කෘතභක්ත්‍යාදරයට භාජන වන පූජනීය වස්තූන් අරභයාය. මේ ශ්‍රී දළද වහන්සේ, ශ්‍රී මහා බෝධීන් වහන්සේ, සර්වඥධාතූන් නිදන් කිරීම නිසා පූජනීයත්වයට පත් ස්ථූප ආදිය ය. මෙම ආගමික වංශකථා අතර ශ්‍රී දළද වහන්සේ වස්තු කොට ගෙන ලියැවුණු දඨාවංස, ධාතුවංස, දළදසිරිත, දළද පූජාවලිය ආදී වංශ කථා විස්සක් පමණ වේ. ශ්‍රී මහාබෝධීන් වහන්සේ අරභයා බෝධිවංස චූලබෝධිවංස, සිංහල බෝධිවංශය ආදී වශයෙන් ලොකු-කුඩා ග්‍රන්ථ තිහකට ආසන්න සංඛ්‍යාවක් සැකසී ඇත, ථූපවංශය ස්ථූපයේ ප්‍රභවය, වර්ධනය ආදී විස්තර ක්‍රමනුකූලව ඉදිරිපත් කරන අගනා වංශ කථාවකි.. මේ වංශකථා අතුරෙන් වැඩි ප්‍රමාණයක් මුල් පාලි කෘතිවල පරිවර්තන වශයෙන් සැලකේ.

ආගමික වංශකථා අතුරෙන් අනාගතවංශය නම් සිංහල කෘතියට හිමි වන්නේ සුවිශේෂ ස්ථානයකි. ඊට ප්‍රධාන

හේතුව එහි. අපූර්ව වස්තු විෂයය. අනාගතයේ දී ලෝක සත්ත්වයාගේ හිත-සුව පිණිස ලොව පහළ වන මෛත්‍රිය බුදුන්වහන්සේ පිළිබඳ කථා පුවත ඉදිරිපත් කිරීම මෙහි මුඛ්‍ය අරමුණය. මේ නිසාම මෙම වංශකථාව "මෙතේ බුදු සිරිත" යන නමින් ද හැඳින් වේ.

සිංහල අනාගතවංශය ස්වතන්ත්‍ර නිර්මාණයක් නොවේ. එය මුල් පාළි කෘති දෙකක් ආශ්‍රයෙන් සිංහලට සැකසුනකි.. මේ සඳහා මූලාශ්‍ර වී ඇති පාළි කෘති දෙක නම්, පාළි බුද්ධවංසයේ අතිරේකයක් වශයෙන් පාළි භාෂාවෙන් ලියැවී ඇති "අනාගතවංස" යන කෘතියත් ඊට අටුවා වශයෙන් සම්පාදනය වූණු සමන්තභද්දිකා යන කෘතියත් ය.

අනාගතවංස නම් පාළි කෘතිය කිනම් වකවානුවකට අයත් කවුරුන් විසින් රචනා කරන ලද්දක් ද යන්න නිශ්චිත ලෙස කිව නොහැකිය. බුද්ධවංසයට අතිරේකයක් වශයෙන් සැකසී ඇති නිසාත්, බුද්ධවංස නම් කෘතිය බුද්දකනිකායට අයත් යැයි සැලකෙන නිසාත් අනාගතවංස නම් පාලි කෘතිය ද බුද්දකනිකායට ම ඇතුළත් කොට සැලකිය යුතු යයි තර්ක කළ හැකිය. එසේ නම් එය ත්‍රිපිටකයට අයත් කෘතියක් ලෙස පිළිගැණුනු බවක් දක්නට නැත. පාළි අනාගතවංසය මෝහවිච්ඡේදනී, විමතිවිනෝදනී, බුද්ධවංස ආදී පාලි ග්‍රන්ථ සම්පාදනය කළ චෝළදේශවාසී කස්සප නම් ස්ථවිරයන්ගේ ම කෘතියක් ලෙස සැලකිය හැකි බවට බුද්ධවංස, සාසනවංසදීප ආදි කෘතිවල සටහන් වී ඇතැයි ශ්‍රී ලංකාවේ පාළි සාහිත්‍යය පිළිබඳව ගැඹුරු පර්යේෂණයක යෙදුණු මහාචාර්ය ගුණපාල මලලසේකර ශ්‍රීමතාණන් දක්වා ඇත.

කරුණු එසේ වුවද ප්‍රචලිත ඉපැරණි සම්ප්‍රදාය අනුවත්, පාළි-සිංහල අනාගතවංශයන්හි සඳහන් පරිදිත් මෙම කෘතිය බුද්ධභාෂිතයක් වශයෙන් සැලකුණු බව පැහැදිලිය.

"සකල ගුණ නිධාන වූ කරුණාවෙන් සිහිල් වූ. තිලෝගුරු සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ විසින් බුද්ධවංශ

දේසනාවසානයෙහි දහම් සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේගේ ආරාධනාවෙන් ආකාශයෙහි රුවන් සක්මනක් මවා එහි සක්මන් කෙරෙමින් සිට වදළා වූ අනාගතවංශ දෙසනාව..." යන සිංහල අනාගතවංශයෙහි ඇතුළත් පාඨය මුල් පාලි කෘතියෙහි අනුවාදයකි.. මෙයින් පැහැදිලි වන්නේ මෙම කෘතිය බුද්ධභාෂිතයක් සේ සැලකීම පැරණි සම්ප්‍රදය බවය. සද්ධර්මාලංකාරයෙහි යෙදෙන "ඒ වනාහි මතු උපදනා මෛත්‍රිය බුදුන්ගේ බුද්ධශ්‍රීය ප්‍රකාශ කිරීම වශයෙන් අපමහා ගෞතම බුදුන් විසින් වදරණ ලද අනාගතවංශ දේශනාවමය. එබැවින් විස්තර කථාව අනාගතවංශයෙන්ම දත යුතු" යන පාඨයද මෙම සම්ප්‍රදය පැරණි බව තවදුරටත් තහවුරු කරයි.

අනාගතවංස නම් පාළි කෘතිය මිනායෙෆ් නැමැති විදේශික විද්වතකු විසින් සංස්කරණය කොට පාළි ග්‍රන්ථ සමාගමේ 1886 වර්ෂයේ සඟරාවේ මුල්වරට පළ කරනු ලැබිණි..

සිංහල අනාගතවංශයට මූලාශ්‍රය වූ දෙවන කෘතිය නම් සමන්තභද්දිකා නමින් පාළි අනාගතවංසයට ලියැවුණු අටුවා ග්‍රන්ථයයි. මෙය කාලවාපි(කලාවැව) විහාරයේ සේනරාජප්‍රාසාදවාසි උපසේන නම් ස්ථවිරයකුගේ කෘතියකි.. අනාගතවංශයේ එක් සංස්කරණයක් කළ වටද්දර මේධානන්ද ස්ථවිරයන් ස්වකීය සංස්කරණයට ලියූ ප්‍රස්ථාවනාවෙහි මෙසේ සඳහන් කරයි. බුරුම රටින් ලක්දිවට ලැබී තිබෙන පැරණි ලිපියක අනාගතවංශට්ඨකථා නාමයෙන් එහි කතෘපාදයෝ ලක්දිව උපසේන මහා ස්ථවිරයන් වහන්සේ බව දක්වා තිබේ. මේ උපසේන ස්ථවිරයන් වහන්සේ නම් නිද්දෙසට්ඨකථාදියෙහි කතෘ භූත තෙවෙනි අටුවාචාරීන් වහන්සේ යයි පිළිගත හැකිය.

ගන්ධවංශයට අනුව ශ්‍රී ලංකාදීප වාසී උපතිස්ස නම් ස්ථවිරයකුගේ අටුවා කථාවත් අනාගතවංසය සඳහා

වූ බවත්, එම අටුවාකථාව වඩා පැරණි මූලාශ්‍රයක් පදනම් කොටගෙන සැකසුනක් බවත් මහාචාර්ය මලලසේකර විද්වතාණන්ගේ අදහස ය.

පාළි අනාගතවංස නම් කෘතිය හා ඊට අටුවාකථාව වශයෙන් ලියැවුණු සමන්තභද්දිකා නම් කෘතිය මූලාශ්‍ර කොට සැකසුන සිංහල අනාගතවංශය හුදු පරිවර්තනයක් නොවේ. පාළි මූලාශ්‍රයන්හි දක්නට නොමැති උපමා- රූපක ශබ්දලංකාරාදියත් විවිධ අර්ථකථනත් උපයෝගී කොට ගෙන ස්වකීය කෘතිය රසයෙන් හා අර්ථයෙන් වඩාත් පරිපූර්ණ කොට පෝෂණය කිරීමට කතෘ උත්සාහගෙන තිබේ.

සිංහල අනාගතවංශයේ කතෘ විල්ගම්මූල ස්ථවිරපාදයන් වහන්සේය. මේ "විල්ලගම්මූල" යන්න පුද්ගලනාමයක් ද යන වග පැහැදිලි නැත. විල්ගම්මූල, සරසිගාම, සරෝගාම ආදී නම්වලින් හැඳින්වුණ, අධ්‍යාපන මූලස්ථානයක් පැරණි ආරාමික අධ්‍යාපනක්ෂෙත්‍රයේ අෂ්ටායතන අතර විය. පුරාණ විල්ගම් වෙහෙර යනු දැනට සේරුවිල නමින් ප්‍රසිද්ධ වෙහෙර බව වටද්දර මේධානන්ද හිමියන්ගේ අදහස ය. පොළොන්නරු යුගයේ සිට ඉතා ශීඝ්‍රයෙන් දියුණුවට පත් මේ ආයතනය කුරුණෑගල රාජධානි සමයේ ද ඉතා ක්‍රියාකාරී ලෙස පැවතියේ ය. 13 වන සියවසේදී එහි මූලස්ථානය කුරුණෑගල දිස්ත්‍රික්කයේ කොටින්ගේ ප්‍රදේශයේ පැවතියේයි. මහාචාර්ය මැන්දිස් රෝහණදීර මහතා "ශ්‍රී ලංකාවේ සංඝ සංවිධානය" නම් සිය කෘතියෙහි අනුමාන වශයෙන් සඳහන් කරයි.

"විල්ගම්මූල" යන්න විල්ගම්මූල ආයතනයේ අධීශ්වර බව ලැබූ මහතෙරවරුන් හැඳින්වීමට යෙදූ පදවි නාමයක් සේ සැලකිය හැක. කුරුණෑගල යුගයේ දෙවැනි පණ්ඩිත පරාක්‍රමබාහු (=හතරවෙනි පරාක්‍රමබාහු) රාජ සමයේ විල්ගම්මූල ආයතනයේ අධීශ්වර වූයේ සිරිමෙවන් කැළණි මහා විහාරයේහි අධිපති වූ ශ්‍රී පරාක්‍රමබාහු මහා ස්ථවිරයන්

වහන්සේ බවත්, එනිසා උන්වහන්සේ විල්ගම්මුල මහා ස්ථවිරයන් වහන්සේ වශයෙන් හැඳින්වුණු බවත් පිළිගත් මත.යකි.. අනාගතවංශය මුන්වහන්සේගේ කෘතියකි. එම වකවානුවේදී විල්ගම්මුල ආයතනය විශේෂ රාජානුග්‍රහයට ලක් වූ අතර විල්ගම්මුල ස්ථවරයන් වහන්සේ මා හිමි නැතහොත් සංඝරාජ පදවිය ද හෙබවූහ.

මුන්වහන්සේ විසින් අනාගතවංශය සම්පාදනය කරන ලද්දේ දෙවෙනි පණ්ඩිත පරාක්‍රමබාහු රජුගේ ඇරයුමෙන් බව ග්‍රන්ථයේම දැක්වේ. ඒ ඇරයුම පිළිගත් විල්ගම්මුල මහා ස්ථවිරයෝ "ශ්‍රද්ධා බුද්ධි පූර්වාංගම අදහසින් පාළි පාඨයෙන් කිසිවකුත් නොපිරිහෙළා. මේ අනාගතවංශ නම් වූ ධර්ම ප්‍රබන්ධය ස්වභාෂාවෙන් කොට මස්තකප්‍රාප්ත කළසේක" යයි ග්‍රන්ථාවසානයෙහි සඳහන් වේ. ග්‍රන්ථයේ සමාරම්භයේ ද මේ බව අවධාරණයෙන් දැක්වේ.

දෙවනි පණ්ඩිත පරාක්‍රමබාහු රජතුමා කලා හා සාහිත්‍ය ප්‍රබෝධයට සුවිශේෂ සේවාවක් කළ රජතුමෙකි.. එතුමා සාමාන්‍යයෙන් ම ධර්මශ්‍රවණයට රිසිබවක් දැක් වූ අතර අනාගතවංශ දේශනාව ඇසීමට ඉමහත් සේ කැමති වූ බව ප්‍රකටය. අනාගතවංශය සිංහලෙන් සැකසීමට එතුමා විසින් ඇරයුම් කෙරුණේ මේ කැමැත්ත නිසා විය යුතුය.

සත්පුරුෂයින්ගේ පහන් සංවේගය සඳහා අනාගතවංශය උපකාරී වන්නේ එය අනාගතයේ බුදු බවට පත්වීමට සිටින මෛත්‍රීය බුදුන්වහන්නසේගේ චරිතාපදනය ඉදිරිපත් කරන හේතුවෙනි. අතීත අනාගත බුදුවරයන් වහන්සේලා පිළිබඳ විශ්වාසය ඉපැරණි අවධියක සිට බෞද්ධයින්ගේ සිත් සතන්වල මුල් බැස ගෙන තිබෙන්නකි.. දීපංකර බුදුන්වහන්සේගෙන් ඇරඹෙන අතීත බුද්ධ වංශකථාවේ අතීත බුදුවරයන් වහන්සේලා විසිහත් නමක් ගැන සඳහන්ය. විසි අටවැනි බුදුවරයාණන් වශයෙන් සඳහන් වන්නේ ගෞතම බුදුන්වහන්සේය. මෙම අටවිසි බුදුවරයන් වහන්සේලා අතුරෙන්

බුදුවරයන් වහන්සේලා හතර නමක්ම මෙම කල්පයට අයත් යයි පිළිගැනේ. උන්වහන්සේලාගේ නම් මෙසේය. කකුසඳ, කොණාගමන, කස්සප සහ ගෞතම මෛත්‍රිය බුදුන් වහන්සේ මෙම යුගයෙහි පහළ වන පස්වන බුදුන්වහන්සේය. බුදුවරයන් වහන්සේලා පස්නමක් පහළ වන කල්පයක් හෙයින් මෙයට "භද්‍ර කල්පය" යන නම ලැබී ඇත.

අනාගත බුදුන් වහන්සේලා පිළිබඳ සංකල්පය අතීත බුදුවරයන් වහන්සේලා පිලිබඳ සංකල්පය තරමට දියුණු වී නැත. 12 වන සියවසට අයත් "දසබෝධිසත්ත උප්පත්තිකථා" නම් කෘතියක මෛත්‍රිය බෝධිසත්ත්වයින් ඇතුළුව අනාගතයේදී බුදු වන බෝධිසත්ත්වවරුන් දසදෙනකු ගැන සඳහන් වන බව කියැවේ. මේ අතරින් වංශකථාවක් සඳහා වස්තු විෂය වශයෙන් භාවිත වී ඇත්තේ මෛත්‍රිය බුද්ධචරිතාපදානය පමණි..

මෛත්‍රිය බුදුන්වහන්සේ ගැන ඇති එක් ඉපැරණිම සඳහනක් දීඝනිකායේ චක්කවත්ති සීහනාද සූත්‍රයේ ඇතුළත් වේ. ඉන් අනතුරුව වෙනත් කෘතිවල වරින් වර තැනින් තැන සඳහන් වී ඇතත් පූර්ණ චරිත කථාවක් වශයෙන් ඉදිරිපත් කෙරෙන්නේ පාළි අනාගතවංසයේය. අනාගතයේදී දඹදිව සකල සෞභාග්‍යයෙන් සපිරි පුණ්‍ය ක්ෂේත්‍රයක් වන කේතුමතී නම් නුවර සබ්‍රාහ්මණ සහ බ්‍රහ්මවතී නම් දෙගුරුන්ට දාව අජිත නමින් උපත ලබන අනාගත බුදුවරයාණන් වහන්සේ මෛත්‍රිය නමින් බුදු බවට පත්වන ආකාරය මේ වංශකථාවෙන් බුද්ධාලම්බන ප්‍රීතිය සිත් සතන් තුළ දනවන අන්දමින් ඉදිරිපත් කෙරේ.

මෛත්‍රිය බුදුන්වහන්සේ ශ්‍රී ලංකාවාසී ශ්‍රද්ධා සම්පන්න බෞද්ධ ජනතාවගේ සිත් සතන් තුළට වඩාත් සමීපවීමට හේතු වුණු පුරාවෘත්තයක් වංශකථා සම්ප්‍රදයෙහි ගැබ්ව ඇත. අනාගතවංශයේ දැක්වෙන සම්ප්‍රදයට අතිරේක වූ මෙම පුරාවෘත්තය මහාවංශයෙහිඇතුළත්ය. මේ අනුව අනාගතයේදී මෛත්‍රිය බුදුන්වහන්සේගේ දෙගුරුන් වන්නේ කාවන්තිස්ස

රජු හා විහාරමහාදේවී බිසවුන්ය. පුත් වන්නේ සාලිය කුමරාය. දුටුගැමුණු හා සද්ධාතිස්ස යන දෙසොහොයුරු රජවරු මෛත්‍රිය බුදුන්වහන්සේගේ අග්‍රශ්‍රාවකයින් වහන්සේලා වශයෙන් උපදිනු ඇත. ශ්‍රී ලංකා වාසීන්ගේ ඉමහත් ගෞරවාදරයට පත් රජ පවුලක් හා මෛත්‍රිය බුදුන් වන්සේ අතර ඇති සම්බන්ධය මෛත්‍රිය බුදුන්වහන්සේ කෙරෙහි ලංකාවාසී බෞද්ධ ජනතාව තුළ අචල භක්තියක් පුබුදුවාලීමට හේතු වී ඇති බව නිසැකය. ශ්‍රී ලංකාවාසී ශ්‍රද්ධා සම්පන්න බෞද්ධයින්ගේ එකම පොදු පැතුම අනාගතයේදි ලොව පහළ වන මෛත්‍රිය බුදුන්වහන්සේ දැක නිවන් පසක් කර ගැනීමය.

අනාගතවංශය මීට පෙර ප්‍රකාශයට පත්ව ඇත. ඉස්වැල්ලේ ජිනරතන ස්ථවිරයන් විසින් කෙරුණු සංස්කරණය 1934 දී ද වටද්දර මෙධානන්ද ස්ථවිරයන් විසින් කෙරුණු සංස්කරණය 1959 දි ද පළවිනි. දැනට පහසුවෙන් ලබා ගත නොහැකි එහෙත් සැදැහැවත් බෞද්ධයින් විසින් කියවීමට ඉතා ආශා කරන එසේම කියවිය යුතු මේ මහැඟි කෘතිය නැවත වරක් පළ කිරීම බෞද්ධ පාඨකයිනට පිදෙන උපහාරයක් බඳුය.

සනත් නානායක්කාර
බෞද්ධ විශ්වකෝෂයෙහි හිටපු නියෝජ්‍ය කර්තෘ
01-02-1997

සිංහල

# අනාගතවංශය.

**නමො තස්ස භගවතො අරහතො**
**සම්මා සම්බුද්ධස්ස.**

**ස**කලගුණනිධානවූ කරුණාවෙන් සිහිල්වූ, ල ඇති, ප්‍රඥා නැමැති ප්‍රදීපයෙන් දුරුකරණලද මොහාන්ධකාර ඇති, දෙව් මිනිසුන් සහිත ලොවට එකගුරුවූ, මහර්ෂිවූ, අෂ්ටාඞ්ගසමුපෙත බ්‍රහ්මස්වර විහිදුවන්නාවූ ඉෂ්ටානිෂ්ටයෙහි නිර්විකාරීවූ, තිලොවට එකනෙත්වූ, සම්‍යක්සම්බුද්ධරජාණන්වහන්සේ විසින් බුද්ධවංශ දෙශනාවසානයෙහි දම්සෙනෙවි සැරියුත්මහතෙරුන්වහන්සේගේ ආරාධනාවෙන් ආකාශයෙහි රුවන්සක්මනක් මවා එහි සක්මන්කෙරෙමින් සිට වදාළාවූ, අනාගතවංශය ත්‍රිසිංහලාධීශ්වර, නවරත්නාධිපති, අශරණ ශරණ, කරුණානිධාන, යාචකජනපාරිජාත, ප්‍රාඥජනබන්ධු, ප්‍රජාසංරක්ෂණප්‍රවීන, නිර්ජිතපුෂ්පකෙතු රූපසෞන්දය්‍යී, අභිජිතවිතතාමාණික්‍ය, සකලකලාචාය්‍යී, අනවරතදානධාරාප්‍රවාහ, සකලසත්ත්වනෙත්‍රොත්සව, ශාසනාභිවෘද්ධිකර, සකලගුණගණාභරණ විභූෂිත දෙහ, රාජකුලාම්බර පූර්ණචන්ද්‍ර රාජමූකුට මණිරස්මිරඤ්ජිතපාද පීඨ රාජකුලශෙඛරරාජවංශ ශිඛාමණිරාජකුලප්‍රදීපායමාන,ස්වවික්‍රමාක්‍රාන්ත සකලභූමණ්ඩල දානශීලාද්‍යනෙකප්‍රකාර පුණ්‍යසම්භාර සම්පූර්ණ සන්තානොපෙත, දෙවෙනි පණ්ඩිතපරාක්‍රමබාහු මහරජ්ජුරුවන්ගේ ආරාධනාවෙන් සව්දෙශවාසීන්ට වැඩපිණිස ස්වභාෂාවෙන් ප්‍රකාශකොට කියමි. ඒ මාකියන්නාවූ අනාගතවංශය සත්පුරුෂවූ සියලුසත්ත්වයන් විසින් කන් නමා සිත් යොමා සාවධානවැ ඇසිය යුතු.

තවද මේ අනාගතවංශය කවරකෙනෙකුන් විසින් දෙසනලද්දේද? කොතැන්හිදී දෙශනලද්දේද? කවරකාලෙක දෙසනලද්දේද? කුමක්පිණිස දෙසනලද්දේද? කවරකෙනෙකුන්ගේ ආරාධනාවෙන් දෙසනලද්දේදැයි යන මේ ප්‍රශ්නයන් පස්දෙනාගේ විසඳීම කොට වර්ණනා කටයුතු.

එහි කවර කෙනෙකුත් විසින් දෙසන ලද්දේද? යත්:-
සියලු ධර්මයෙහි අසබලිතවැ පවත්නා ඥානගති ඇති, චතුවෛශාරද්‍ය විශාරද වූ, ධර්මරාජනත්වූ ධම්මසවාමිවූ සර්ඥවූ සම්‍යක් සම්බුදුරජානන් වහන්සේ විසින් දෙසන ලද්දේය. කොතැන්හිදී දෙසන ලද්දේද? යත්:-

කිඹුල්වත්නුවර නිග්‍රෝධාරාමයෙහි ඉතා සිත්කලුවූ දැකුම් ඇති, රුවන්සක්මනැ සක්මන් කරන්නාවූ සර්වඥයන්වහන්සේ විසින් දෙසනලද. කවරකලෙකැ දෙසනලද්දේද? යත්:—

බුද්ධවංශදේශනාවසානයෙහි දෙසනලද. කුමක්පිණිස දෙසනලද්දේද? යත:—කාමොඝාදි චතුරෝඝයෙන් නිස්තරණය පිණිස දෙසනලද. කවුරුන්ගේ ආරාධනාවෙන් දෙසනලද්දේද? යත්:—දම්සෙනෙවිසැරියුත් මහතෙරුන් වහන්සේගේ ආරාධනාවෙන් දෙසනලද.

මෙපමණෙකින් කවර කෙනකුන් විසින් දෙසනලද්දේද, යනාදිවූ ප්‍රශ්නපස විශේෂයෙන් ප්‍රකාශ නොවන්නේය, එසේ හෙයින් ඒ ප්‍රශ්නයන් පස්දෙනාගේ විසර්ජනය මෙ මතුකියන්නාවූ ක්‍රමයෙන් දතයුත්තේය.

එහි කවරකෙනකුන් විසින් දෙසනලද්දේද? යත්:—යම් සර්වඥකෙනකුන් වහන්සේ මේ කල්පයට සාරාසංඛ්‍ය කප්ලක්ෂයකින් මත්තෙහි අමරනම් නුවර සුමේධනම් බ්‍රාහ්මණකුමාරවැ අක්ෂරලිඛිතාදිවූ සිහලු ශිල්පයෙහි නිෂ්පත්තියට පැමිණ දෙමවු පියන්ගේ ඇවෑමෙන් නොයෙක් කෙලගණන් වස්තු පරිත්‍යාග කොට ඍෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිවැ හිමාලය වනයෙහි වෙසෙමින් පඤ්චාභිඥා-අෂ්ටසමාපත්ති උපදවා ආකාශයෙන් යන්නාහු දීපඞ්කරසර්වඥයන් වහනසේ සුදර්ශනමහාවිහාරයෙන් නික්ම රම්‍ය ගම්නුවරට වඩනා සඳහා මං එළි කරන්නාවූ මහාජනයා දැක ඒ සුමේධතාපසයෝ තමන්ටත එක් භූමිප්‍රදේශයක් ඉල්වා ගෙණ ඒ මාර්ගප්‍රදේශය සරහා නිමවන්නාට පළමු කොට වැඩියාවූ සර්වඥයනවහනසේට තමන් සෙයක් කොට මඩමත්තේ අතුට සර්වඥයන්වහන්සේ සාරලක්ෂයක් ක්ෂීණාශ්‍රවයන් වහන්සේ හා සමග මඩ නොමැඩ මා පිට මැඩගෙණ වඩනා සේක්වයි සිතා වැද හොත්තාහුය. දීපඞ්කරසර්වඥයන්වහන්සේ ඒ සුමේධතාපසයන් දැකලාම මෙතෙම බුද්ධාඞ්කුරයෙක. අනාගතයෙහි සාරාසංඛ්‍ය කප්ලක්ෂයකින් කෙලවර ගෞතමනම් බුදුවන්නේය යි විවරණ දී වදාළසේක.

ඒ සර්වඥයන් වහන්සේට මෑතභාගයෙහි කොණ්ඩඤ්ඤය-මඞ්ගලය-සුමනය-රේවතය- සොභිතය- අනෝමදස්සීය-පදුමය

-නාරදය- පදුමුත්තරය- සුමේධය- සුජාතය- පියදස්සීය- අත්ථදස්සීය-ධම්මදස්සීය-සිද්ධත්ථය- තිස්සය-ඵුස්සය- විපස්සීය-සිඛී ය-වෙස්සභූය-කකුසන්ධය-කෝණාගමනය-කාශ්‍යපය යන ලොව බබළවා උපන්නාවූ තෙවිස්සක් පමණ සර්වඥවරයන්වහන්සේ සමීපයෙන් ලබනලද විවරණ ඇතිවැ දශපාරමිතාය-දශඋපපාරමිතාය-දශපරමාර්ථ පාරමිතාය යන සමත්‍රිංශත් පාරමීධර්මයන් පූරණයකොට **විශ්වන්තරාත්මභාවයෙහි** සිට මහීකම්පා කරන්නාහු මහදන්දී, පුත්‍රදාරාවන් පරිත්‍යාග කොට, ආයුකෙළවර **තුෂිත දිව්‍යලෝකයෙහි** ඉපැදැ එහි ආයුපමණින් සිට දසදහසක් සක්විළ දෙවියන් විසින් රැස්වැ සිටැ,

"කාලො’යං තෙ මහාවීර! උප්පජ්ජ මාතුකුච්ඡියං,
සදෙවකං තාරයන්තො බුජ්ඣස්සු අමතං පදං"යි.

යාචඤාකරණ ලදුවැ පඤ්චමහාවිලෝකනය කොට, එයින් චුතව **ශාක්‍යරාජවංශයෙහි** ප්‍රතිසන්ධිග්‍රහණයකොටැ, එහි මහසම්පත් විඳිමින් ක්‍රමයෙන් සොඳුරුවූ යෞවනයට පැමිණ, තුන්සෘතුවට සුදුසුවූ තුන්පායෙහි දිව්‍යලෝකශ්‍රියක් වැනිවූ රාජ්‍යශ්‍රී අනුභව කෙරෙමින් උයන්කෙළියට යන වේලෙහි ක්‍රමයෙන් ජීර්ණ-ව්‍යාධි-මෘත සඞ්ඛ්‍යාත දෙවදූතයන් තුන්දෙනා දැක, සංවේගයට පැමිණ වැලකැ, සතරවැනි වාරයෙහි ප්‍රව්‍රජිතරූපය දැක, ප්‍රව්‍රජ්‍යාව යහපතැයි මහණවීමට සිත් උපදවා, උයනට ගොස් එහි දවස්යවා,මගුල්පොකුණුතෙර හිඳ කපුවෙස් ගෙණ ආ **විශ්වකර්මදිව්‍යපුත්‍රයා** විසින් සරහා පිළියෙළ කරණ ලද්දාහු, **රාහුල කුමාරයන්** උපන් නියාව අසා, සෙනහය බලවත් බව දැන යම්තාක් සෙනහබන්ධනය මතුමත්තෙහි වඩා ගෙණ නොයන්නේ වීනම්, පළමු කොටම ඒ සෙනහබන්ධනය සිඳිමි යි සිතා සවස නුවරට වදනාවූ බෝධිසත්වයෝ,

"නිබ්බුතා නූන සා මාතා නිබ්බුතො නූන සො පිතා,
නිබ්බුතා නූන සා නාරී යස්සා’යං ඊදිසො පතී"යි.

**කිසාගෝතමී** නම් කිසවුන් විසින් කියනලද මේ ගාථාව අසා, මම මැයවිසින් නිබ්බුතපදය අස්වනලද්දෙමි යි, මුක්තාහාරය ගලවා ඒ කිසවුන්ට යවා තමන්ගේ මාලිගාවට වැද ශ්‍රීයහන්මස්තකයෙහි හුන්නාහු නිද්‍රාවට පැමිණියාවූ නාටක ස්ත්‍රීන්ගේ නැතැතීම් නන්දෙඩිම් දත්කෑවිලි ආදිවූ නොයෙක් විප්‍රකාර දැක සසර කලකිරුණාවූ සිත් ඇතිවැ **ඡන්න** නම්

අමාත්‍යයා ලවා කණ්ඨක නම් අශ්වයා ගෙන්වා ගෙණ ඔහු පිටට පැන නැඟී ඡන්න නම් අමාත්‍යයා සමග දසදහසක් සක්වළ දෙවියන් විසින් පිරිවරණලද්දු ව මහබිනික්මන් නික්ම අනෝමා නම් ගංතෙරදී මහණ ව, ක්‍රමයෙන් රජගහනුවරට ගොස් එහි පිඬු සිඟා ඇවිද පාණ්ඩවපර්වත සමීපයට ගොස් එතැන්හි හිඳ බිම්සරරජ්ජුරුවන් විසින් රාජ්‍යයෙන් පැවරූ කල්හි එරාජ්‍ය ප්‍රතික්ෂෙප කොට ආළාරකාලාමය, උද්දකරාමපුත්‍රය යන තාපසවරුන් දෙදෙනා සමීපයට ගොස් ඔවුන්ගේ සමයම පරීක්ෂා කොට එහි සාරත්වයක් නුදුටුහෙයින් කලකිරුණාවූ සිත් ඇති වැ එතැන් පටන් සාවුරුද්දක් මුළුල්ලෙහි අනන්‍යසාධාරණවූ දුෂ්කරක්‍රියා කොට වෙසක්මස මැදිපොහෝ දිනයෙහි උදෑසන ම සුජාතා නම් සිටුදුව දුන් අසමභින්න ක්ෂීරපායාසය නේරඤ්ජරා නම් ගඞ්ගාතීරයෙහි දී වළඳා තලිය උඩුගඟ බලා හැර ගංතෙර සල්වෙනෙහි දිවාවිහාර කොට සවස්වේලෙහි සොත්ථිය නම් බ්‍රාහමණයකු විසින් දෙනලද තණ අටමිටක් ගෙණ ශක්‍ර, සුයාම, සන්තුෂිතාදිවූ නොයෙක් දෙවියන් පඤ්චාඞ්ගික තූර්යනාදයෙන් හා පරසතු මඳාරාමල් ආදියෙන් පූජා සත්කාර කරන්ට පටන්ගත් කල්හි මහාකාළ නම් නාරජ්ජුරුවන් විසින් ස්තුතිඝොෂා පවත්වන්ට පටන්ගත් කල්හි බෝමඩට පැන නැඟී තණ සළා පැන නැංගාවූ තුදුස්රියන් වජ්‍රාසනාරූඪ වැ යම්තාක් සම්‍යක්සම්බොධිඥානය සමධිගමය නො කෙළෙම් වීම් නම් ඒතාක් මේ පර්‍ය්‍යඞ්කයෙන් නැඟී නො සිටිම් යි ප්‍රතිඥා කොට නැගෙනහිරට මුහුණ ලා වැඩ හිඳ හිරු අස්තයට යන්නාට පළමු කොට ම සපරිවාරමාරපරාජය කොට ප්‍රථමයාමයෙහි පූර්වේනිවාසානුස්මෘතිඥානයද, මධ්‍යමයාමයෙහි ච්‍යුති උත්පත්ති දෙක දන්නා දිව්‍යචක්ෂුරභිඥානය ද, පශ්චිමයාමයෙහි ද්වාදශාඞ්ගප්‍රතීත්‍යසමුත්පාදය අනුලොම ප්‍රතිලොමවශයෙන් සත්මර්ශනය කෙරෙමින් ආනාපානචතුර්ථධ්‍යානයට සමවැද එයින් නැඟී පඤ්චස්කන්ධයෙහි ද, උදයව්‍යය වශයෙන් සමපණස්ලකුණු දක්නා ගොත්‍රභූඥානය දක්වා විදර්ශනා වඩා ආර්‍ය්‍යමාර්ගයෙන් සකල කෙලශයන් නසා අරුණු නැඟෙන වේලෙහි සර්වඥතාඥානය ද ප්‍රතිවෙධ කොට ප්‍රීතිවෙගයෙන් "අනෙකජාතිසංසාරං" යනාදීන් උදන් ඇනූසේක.

ඒ භාග්‍යවත්වූ නිකෙලෙශීවූ සම්‍යක්සම්බුද්ධරජානන්වහන්සේ විසින් මෙ අනාගතවංශය දෙසනලද්දේය. මෙපමණෙකින්

කවර කෙනකුන් විසින් දෙසනලද්දේ ද යන මේ ප්‍රශ්නය විශෙෂයෙන් විසඳන ලද්දේය.

කොතැන්හි දී දෙසනලද්දේ ද? යත්: ඉක්බිත්තෙන් ලබන ලද සර්වඥතාඥනඇති ඒ සර්වඥයන්වහන්සේ බොධිද්‍රැමසමීප යෙහිම සත්සති ඉකුත්කොට අටවැනිසතියෙහි අජපාල න්‍යග්‍රොධ වෘක්ෂමූලයෙහි වැඩහුන්සේක් තමන්වහන්සේ විසින් ප්‍රතිවෙධකරණලද ධර්මය ගැඹුරුබව සැලැකීමෙන් දෙශනා කිරීමට මන්‍දොත්සාහබවට පැමිණ දසදහසක් සක්වළ මහා බ්‍රහ්මයන් පිරිවර කොට ඇති සහම්පතිමහාබ්‍රහ්මයා විසින් "නස්සති වත භො ලොකො විනස්සති වත භො ලොකො" යනාදීන් ධර්මදෙශනාවට ආරාධනා කළ කල්හි බුද්ධචක්ෂුසින් ලොව බලා වදාරා බ්‍රහ්මාරාධනාව පිළිගෙණ පළමු කොට මම කවරක්හට ධර්මදෙශනා කෙරෙම් දෝ හොයි බලාවදාරණ සේක් ආළාරකාලාමයන් හා උද්දක රාමපුත්‍රයන් කළුරියකල නියාව දැන පස්වගමහණුන් වහන්සේ තමන්වහන්සේට නොයෙක් පරිද්දෙන් උපකාරීනියාව සිහි කොට හුනස්නෙන් නැගී කසීපුරයට වඩනාසේක් අතරමග දී උපක නම් ආජීවක යක්හු හා සමග කථා කොට ඇසළමස පුණුපොහෝ ලද දවස් බරණැස්නුවර ඉසිපතන නම් මිගදායෙහි පස්වගමහණුන් වහන්සේ වසන්නා වූ ස්ථානයට පැමිණ නුසුදුසුවූ ආවුසො වාදාදි ව්‍යවහාරයෙන් වැවහරකරන්නාවූ ඒ භික්ෂූන් වහන්සේට තමන්වහන්සේ බුදුවූ නියාව කියා ගිවිස්වා අඥාත කොණ්ඩඤ්ඤමහතෙරුන්වහන්සේ ප්‍රධානකොට ඇති අට ලොස්කෙළක් බ්‍රහ්මයන් ධර්මාමෘතපානය කරවමින් ධම්සක් පවතුන්සූත්‍රදෙශනාව කොට පවත්වනලද උතුම් ධම්සක්පව තුන්සූත්‍රදෙශනා ඇති ඒ සර්වඥයන්වහන්සේ ඇසළමස අව විසේනියෙහි ඒ සියලු පස්වගමහණුන් වහන්සේ අර්හත්ඵලයෙහි පිහිටුවා එදවස්ම යසකුලපුත්‍රයන්ගේ අර්හත්ඵලයට උපනිශ්‍රය සම්බන්ධය දැක රාත්‍රිභාගයෙහි කලකිරී ප්‍රාසාදය හැර නික්මෙන් නාහු මෙසේ වර! යසය යි, කියා කැඳවා ඒ රාත්‍රිභාගයෙහි ශ්‍රොතාපත්තිඵලයට හා දෙවෙනි දවස් අර්හත්ඵලයට ද පමුණුවා අන්‍ය වූ ත් ඒ යසකුලපුත්‍රයන්ට යහළුවූ සිවුපණස්දෙනකු එහිභික්ෂුප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි කරවා අර්හත්ඵලයට පමුණුවා, මෙසේ ලොකයෙහි එක්සැටක් රහතුන් වූ කල්හි වැස නිමවන ලද වස්ඇතිසේක් වස් පවරා මහණෙනි! ඒ ඒ තැන්හි චාරිකා කරව යි කියා, සැටක් පමණ භික්ෂූන්වහන්සේ ඒ ඒ දිග යවා

තමන්වහන්සේ උරුවෙලාවට වඩනාසේක් අතරමග කප්පාසික වනසණ්ඩයෙහි දී භද්‍රවගීරාජකුමාරවරුන් තිස්දෙනකුට ධර්මදෙශනා කළසේක. ඔවුන් අතුරෙන් ඇමට කෙළවර රාජකුමාරයෝ සෝවාන් වූහ. ඇමට වැඩිමහලු රාජකුමාරයෝ අනාගාමි වූහ.

එතිස්දෙනා එහි භික්ෂුභාවයෙන් මහණකරවා ඒ ඒ දිග යවා උරුවෙලාවට වැඩ තුන්දහස්පන්සියයක් ප්‍රාතිහාර්‍ය්‍ය දක්වා උරුවෙලකාශ්‍යපයන් ප්‍රධාන කොට ඇති, තුන්බෑජටිලයන් හා දහසක්ජටිලයන් විනයනය කොට එහි භික්ෂුභාවයෙන් ම මහණ කරවා ගයාශීර්ෂයේ හිඳුවා ආදීප්තපර්‍ය්‍යාය සූත්‍රදෙශනාවෙන් අර්හත්ඵලයෙහි පිහිටුවා ඒ දහසක්රහතුන් වහන්සේ විසින් පිරිවරණලදුව බිම්සරරජ්ජුරුවන්ට දෙනලද ප්‍රතිඥාව මුදමිසි සිතා රජගහානුවර ලට්ඨිවන නම් වූ උද්‍යානයට වැඩ සර්වඥයන්වහන්සේ වැඩිසේක යනු අසා එක්ලක්ෂවිසිදහසක් පමණ බ්‍රාහමණගෘහපතීන් හා සමඟ සමීපයට අා රජ්ජුරුවන්ට මිහිරි වූ ධර්මදෙශනා කරණසේක් රජදරුවන් හා සමඟ එක් ලක්ෂදසදහසක් දෙනා සෝවාන්පෙලෙහි පිහිටුවා දසදහසක් දෙනා ශරණශීලයෙහි පිහිටුවා දෙවෙනිදවස් ශක්‍රදේවේන්ද්‍රයන් විසින් මාණවකවේෂයක් ගෙණ,

"කප්පකසායෙ කලියුගෙ බුද්ධුප්පාදො අහො මහච්ඡරියං,
හුතවහමජ්ඣෙ ජාතං සමුදිතමකරන්ද මිවාරවින්දං.

යනාදීන් විශෙෂයෙන් ස්තුතිකරණලද සේක් රජගහනුවරට වැද රජ්ජුරුවන්ගේ මාලිගාවෙහි දී වළඳා වෙළුවනාරාමය පිළිගෙණ එහි වාසය කොට වදාළසේක.

එසමයෙහි ශුද්ධෝදන මහරජ්ජුරුවෝ මාගේ පුතනුවන් වහන්සේ උතුම්වූ සම්‍යක්සම්බෝධියට පැමිණ පවත්වනලද උතුම්වූ දම්සක්පවතුන්සූත්‍රදෙශනාවෙන් ඇතිසේක් රජගහනුවරට වැඩ වෙළුවනාරාමයෙහි වසනසේක, යනු අසා එක්තරා මහාමාත්‍යයකු කැඳවා දහසක්පුරුෂයන් පිරිවරා රජගහනුවරට ගොස් මාගේ කීමෙන් නුඹවහන්සේගේ පිතෘ වූ ශුද්ධෝදන මහරජ්ජුරුවන්වහන්සේ දක්නාකැමැතිසේකැයි කියා මාගේ පුතනුවන්වහන්සේ කැඳවා ගෙණ එව යි කියා සම්මත කළාහ. ඒ අමාත්‍යයා යහපත දේවයන්වහන්සැ යි කියා රජ්ජුරුවන්ගේ බස පිළිගෙණ පුරුෂයන් දහසක් පිරිවර කොට ඇත්තේ සැට

යොදුන් මාර්ගය ගෙවා ගොස් ධර්මදෙශනාකරණවේලෙහි විහාරයට වැද රජ්ජුරුවන්වහන්සේගෙන් කියා එවූ අසුන් තව තිබෙන්නාට යයි සිතා බණපිරිස්කෙළවර සිට බුදුරජාණන්වහන්සේ වදාරන්නා වූ ධර්මදෙශනාව අසා සිටිසේ සිටම පුරුෂයන් දහසක්දෙනා හා සමග රහත් ව මහණවීමට අවසර ඉල්වා එහිභික්ෂුභාවයෙන් පැවිදි ව පණීත් හා සමග භාග්‍යවත්වූ සර්වඥයන්වහන්සේ පිරිවරාගෙණ සිටිසේක. ශුද්ධෝදනමහරජ්ජුරුවෝ ගියවුන්ගෙන් එනකෙනකුත් නැත, අස්නකුත් නො ඇසෙන්නේය යි පළමුපරිද්දෙන් ම අටවරෙකැ දහසක් දහසක් පිරිවර කොට ඇති මහාමාත්‍යයන් අටදෙනෙකු යවා ඔවුන් හැම්දෙනාත් ගොස් අර්හත්ඵලයට පැමිණ මහණ ව මුවෙන් නො බැණ හුන්කල්හි මහාපුරුෂයාණන්වහන්සේ හා සමග එකදවස් උපන් අතිවිශ්වාසීවූ එක් ව වැලිකෙළි කෙළියාවූ කාළුදායි නම් අමාත්‍යයා කැඳවා දරුව! උදායීනි, මාගේ පුතනුවන් වහන්සේ දක්නාකැමැති ව අමාත්‍යයන් නවදෙනකු හා සමග පුරුෂයන් නවදහසක් යවීම්, උන්හැමදෙනාගෙන් එකෙකුත් අවුත් අසුන්පමණකුත් මට කීකෙනෙක් නැත, එසේහෙයින් මාගේ පුතනුවන් වහන්සේ මා ඇස පැපියන්ට පිළිවන්දැයි කීකල්හි ස්වාමීනි! ඉදින් මහණ වන්ට අවසරයක් ලද්දෙම් වී නම් ගෙණවුත් දක්වා ලන්ට සමර්ථයෙමි යි කීකල්හි දරුව! තොපි මහණව වේව යි මහණ නොවී වේව යි මපුතනුවන්වහන්සේ මට ගෙණවුත් පැලවයි සමමතකළහ. කාළුදායීනම් අමාත්‍යයා යහපත දෙවයන්වහන්සැයි කියා දහසක්පුරුෂයන් පිරිවරා රජගහනුවරට ගොස් සර්වඥයන්වහන්සේගෙන් ධර්මදෙශනාව අසා පුරුෂයන්දහසක්දෙනා හා සමග අර්හත්ඵලයට පැමිණ එහිභික්ෂුප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි ව මැදින්දිනමස පුරපසළොස්වක් දිනයෙහි හෙමන්තකාලය ඉකුත්විය, වසන්තකාලය පැමිණියේය, වනලැහැප් මනා ව පිපියේය, මාර්ගය වැඩීමට සුදුසුය, දශබලධාරීවූ බුදුරජාණන්වහන්සේ ඥාතිසඞ්ග්‍රහකරන්නාවූ කැලෑයි සිතා සර්වඥයන්වහන්සේ කරා එළඹ,

"අඞ්ගාරිනොදානි දුමා භදන්තෙ-ඵලෙසිනොඡදනං විප්පහාය,
තෙ අච්චිමන්තොව පභාසයන්ති-සමයොමහාවීරභගීරථානං."

යනාදිවූ සැටක්පමණ ගාථාවෙන් මාර්ගවර්ණනා කොට සර්වඥයන්වහන්සේ උදායීස්ථවිරයෙනි! කුමක් පිණිස ගමනවර්ණනාකරන්නෙහි දැයි වදාළකල්හි එසේය ස්වාමීනි! නුඹවහන්සේට

පිතෘ වූ ශුද්ධෝදනරජ්ජුරුවෝ දක්නාකැමැත්තෝය. එසේ හෙයින් නැයන්ට සඞ්ග්‍රහ කොට වදාළමැනැවැයි කියා, යහපත උදායීස්ථවිරයෙනි, නැයන්ට සඞ්ග්‍රහ කෙරෙමි, එබැවින් භික්ෂුසඞ්ඝයාට කියවයි වදාළකල්හි යහපත ස්වාමීනි යි කියා උදායීස්ථවිරයන්වහන්සේ භික්ෂුසඞ්ඝයාවහන්සේට දැන්වූසේක. සර්වඥයන්වහන්සේ අඞ්ගමගධ දෙරටවැසි කුලපුත්‍රයන්ගෙන් දසදහසක්දෙනාවහන්සේය, කිඹුල්වත්නුවර වැසි කුලපුත්‍රයන්ගෙන් දසදහසක්දෙනා වහන්සේයයි කියා එක්කොට විසිදහසක් ක්ෂීණාශ්‍රවභික්ෂූන්වහන්සේ විසින් පිරිවරණලදුව රජගහනුවරින් නික්ම දවස දවස යොදනක් යොදනක් වඩනාසේක් දෙමසකින් කිඹුල්වත්පුරයට පැමිණිසේක. ශාක්‍යරජදරුවෝත් සර්වඥයන් වහන්සේ වඩනාට පළමුකොට ම අපගේ නෑ උතුමානන් වහන්සේ දක්නමෝවේ දැයි කියා, භාග්‍යවත්වූ සර්වඥයන්වහන්සේ වසන්ට සුදුසුතෙනක් පරීක්ෂා කරන්නාහු නිග්‍රෝධ නම් ශාක්‍යරජ්ජුරුවන්ගේ උයන සිත් කළුය යි සලකා එහි ගඳකිළිමණ්ඩප, සක්මන්මණ්ඩප, දොරටු ආදි වූ රාත්‍රිස්ථාන, දිවාස්ථාන කරවා ගඳදුම්මල්පහන් ගත් අත්ඇති ව පෙරගමන්කරන්නාහු සර්වාභරණයෙන් සැරසී සුවඳමල් සුවඳසුණු ආදියෙන් පූජා කෙරෙමින් සර්වඥයන්වහන්සේ පෙරදැරි කොට නිග්‍රෝධාරාමයට ගියාහුය. එහි බුදුරජානන්වහන්සේ විසිදහසක් ක්ෂීණාශ්‍රවයන් වහන්සේ විසින් පිරිවරණලදු ව පනවනලද බුද්ධාසනමස්තකයෙහි යුගඳුරුමුඳුනෙහි දිලියෙන්නාවූ ළහිරුමඬලක් මෙන් දිලිහි දිලිහී වැඩහුන්සේක. ශාක්‍යරජදරුවෝ වූකලි ජාතිය නිසා තදමන් ඇත්තාහු සිද්ධාර්ථකුමාරයෝ අපට ඉතා බාලයෝ ය, අපගේ මලනුවෝ ය, බෑනනුවෝ ය, මුනුබුරුණෝ ය, පුතනුවෝ ය යි සිතා බාලබාලරාජකුමාරවරුන්ට තෙපි වඳුව, අපි තොපගේ පිටිපස්සේ හිඳුම්හ යි කීහ. මෙසේ ඒ ශාක්‍යරජදරුවෝ ජාතිමානය පෙරදැරි කොට උන්කල්හි ඉක්බිත්තෙන් භාග්‍යවත්වූ සර්වඥයන්වහන්සේ ඔවුන්ගේ අදහස් බලා මාගේ මෙනෑයෝ තමන් වයසින් වැඩිමහලුවූ පමණකටම නො වඳුම්හ යි කියති; බුදුහු නම් කෙබඳුසේක් ද, බුදුබල නම් කෙබඳු දෙයකැයි කියා ද, බුදුහු නම් මෙබඳුය බුදුබල නම් මෙබඳු දෙයකැයි කියා ද, නො දනිති. එබැවින් මම මාගේ බුද්ධබලය ත් දක්වමි, ඍද්ධිබලය ත් දක්වමි, ප්‍රාතිහාර්‍යය ත් කෙරෙමි යි, ආකාශයෙහි දසදහසක්සක්වළ පැතිර සිටියා වූ සත්රුවන්මය සක්මනක් මවා එහි සක්මන් කෙරෙමින්

මහාජනයාගේ අධ්‍යාශය පරීක්‍ෂා කොට ධර්‍මදෙශනාවකුත් කෙළෙම් වී නම් යහපතැයි සිතූසේක.

ඉක්බිත්තෙන් මෙසේ බුදුරජාණන්වහන්සේ සිතූසිත හා සමඟ දසදහසක් සක්වළ බූමාටුදෙවියන් ආදිකොට ඇති සියලු දෙවතාවෝ සතුටු වූ සිත් ඇති ව සාධුනාද පැවැත්වූහ. එසඳ සර්‍වඥයන්වහන්සේ සිතූසිතට අනතුරුව ම **ඔදාතකසිණසමාපත්තියට** සමවැද දසදහසක්සක්වළ ආලෝකවේව යි ඉටූසේක. ඒ අධිෂ්ඨානචිත්තය හා සමඟ ම අවීචියෙහි පටන් අකනිෂ්ඨබ්‍රහ්ම ලෝකය දක්වා එකාලෝක වි ය. එකෙණෙහි භාග්‍යවත්වූ සර්‍වඥයන්වහන්සේ දසදහසක්සක්වළ උතුරුවා අභිඥාපාදක කොට ඇති චතුර්‍ථධ්‍යානයට සමවැද එයින් නැගී ආවර්ජනා කොට අධිෂ්ඨානචිත්තයෙන් ආකාශයට පැන නැගී ඒ නැයන් ගේ ඉසපිට පස්වගුරුවන්නාක් මෙන් මහත්වූ දිව්‍යමනුෂ්‍ය පර්‍ෂත් මධ්‍යයෙහි **යමකප්‍රාතිහාර්‍ය්‍ය** දක්වා වදාළසේක.

ඒ කෙසේ ද? යත්:-ඌර්‍ධ්වශරීරයෙන් ගිනිකඳෙක් පවත් නේය, අධඃශරීරයෙන් දියකඳෙක් පවත්නේය, අධඃශරීරයෙන් ගිනිකඳෙක් පවත්නේය, ඌර්‍ධ්වශරීරයෙන් දියකඳෙක් පවත් නේය, පූර්‍වශරීරයෙන් ගිනිකඳෙක් පවත්නේය, පශ්චිමශරීර යෙන් දියකඳෙක් පවත්නේය. පශ්චිමශරීරයෙන් ගිනි කඳෙක් පවත්නේය, පූර්‍වශරීරයෙන් දියකඳෙක් පවත්නේය, දකුණැසින් ගිනිකඳෙක් පවත්නේය, වමැසින් දියකඳෙක් පවත්නේය, වමැසින් ගිනිකඳෙක් පවත්නේය, දකුණැසින් දියකඳෙක් පවත්නේය, දකුණුකන්සිදුරෙන් ගිනිකඳෙක් පවත් නේය, වම්කන්සිදුරෙන් දියකඳෙක් පවත්නේය, වම්කන්සිදු රෙන් ගිනිකඳෙක් පවත්නේය, දකුණුකන්සිදුරෙන් ගිනිකඳෙක් පවත්නේය, දකුණුකන්සිදුරෙන් දියකඳෙක් පවත්නේය, දකු ණුනාසාසිදුරෙන් ගිනිකඳෙක් පවත්නේය, වම්නාසාසිදුරෙන් දියකඳෙක් පවත්නේය, වම්නාසාසිදුරෙන් ගිනිකඳෙක් පවත් නේය, දකුණුනාසාසිදුරෙන් දියකඳෙක් පවත්නේය, දකුණු දසරුවෙන් ගිනිකඳෙක් පවත්නේය, වම්දසරුවෙන් දියකඳෙක් පවත්නේය, වම්දසරුවෙන් ගිනිකඳෙක් පවත්නේය, දකුණු දසරුවෙන් දියකඳෙක් පවත්නේය, දක්‍ෂිණහස්තයෙන් ගිනි කඳෙක් පවත්නේය, වාමහස්තයෙන් දියකඳෙක් පවත්නේය. වාමහස්තයෙන් ගිනිකඳෙක් පවත්නේය, දක්‍ෂිණහස්තයෙන් දියකඳෙක් පවත්නේය, දකුණැලයෙන් ගිනිකඳෙක් පවත්නේය

වමැලයෙන් දියකඳෙක් පවත්නේය, වමැලයෙන් ගිනිකඳෙක් පවත්නේය, දකුණැලයෙන් දියකඳෙක් පවත්නේය, දකුණුපසින් ගිනිකඳෙක් පවත්නේය, වම්පසින් දියකඳෙක් පවත්නේය, වම්පසින් ගිනිකඳෙක් පවත්නේය, දකුණුපසින් දියකඳෙක් පවත්නේය, ඇඟිල්ලක් ඇඟිල්ලක් පාසා ගිනිකඳ පවත්නේය, ඇඟිලිඅස්සක් ඇඟිලිඅස්සක් පාසා දියකඳ පවත්නේය, ඇඟිලීඅස්සක් ඇඟිලිඅස්සක් පාසා ගිනිකඳ පවත්නේය, ඇඟිල්ලක් පාසා දියකඳ පවත්නේය, රෝමයක් පාසා ගිනිකඳ පවත්නේය, රෝමකූපයක් පාසා දියකඳ පවත්නේය, රෝමකූපයක් පාසා ගිනිකඳ පවත්නේය, රෝමයක් පාසා දියකඳ පවත්නේය, බුදුරජානන්වහන්සේ වැඩහුන්සේක් වී නම් නිර්මිතසර්වඥයන් වහන්සේ සක්මන්කරණසේක් හෝය, වැඩසිටිනාසේක් හෝය, සැතපෙතසේක් හෝය, බුදුරජානන්වහන්සේ සැතපෙතසේක් වීනම් නිර්මිතසර්වඥයන්වහන්සේ සක්මන්කරණසේක් හෝය, වැඩසිටිනාසේක් හෝ ය, වැඩහිඳිනාසේක් හෝ ය, ඒ භාග්‍යවත් වූ සර්වඥයන්වහන්සේ තෙජෝකසිණසමාපත්තියට සමවැදීමෙන් ඌර්ධවශරීරයෙන් ගිනිකඳෙක් පවත්නේය. ආපොකසිණසමාපත්තියට සමවැදීමෙන් අධඃශරීරයෙන් දියකඳෙක් පවත්නේය. නැවත තෙජෝකසිණසමාපත්තියට සමවැදීමෙන් අධඃශරීරයෙන් ගිනිකඳෙක් පවක්නේය. ආපොකසිණසමාපත්තියට සමවැදීමෙන් ඌර්ධවශරීරයෙන් දියකඳෙක් පවත්නේය. මෙහි වූ කලි දියකඳ ගිනිකඳ හා මිශ්‍ර නොවන්නේය. ගිනිකඳ දියකඳ හා මිශ්‍ර නොවන්නේය. ෂට්වර්ණඝනබුද්ධරශ්මීන් අතුරෙන් දෙවැනි දෙවැනි වූ රශ්මිය පළමු පළමු වූ රශ්මියට යුවල යුවල වූවාක්මෙන් එකක්ෂණයෙහි පවත්නේය. දෙසිතක් එක විට උපදනේ නැත, එතකුදු වූවත් සර්වඥවරයන්වහන්සේගේ භවාංගපරිවර්තනය ලඝුබැවින් හා පස්ආකාරයකින් පුරුදුව කරණලද්දවූ සිත් ඇති බැවින් සවණක්රස් එකක්ෂණයෙහි ම පවත්නේය. ඒ ඒ රශ්මි පිණිස ආවර්ජනාදිය පරිකර්මය අධිෂ්ඨානය යන මේ සියල්ල වෙනවෙන ම වන්නේය. ඒ එසේ මැයි. භාග්‍යවත්වූ සර්වඥයන්වහන්සේ නීලරශ්මි සඳහා නීලකසිණසමාපත්තියට සමවදනාසේක. රන්වන්රස් සඳහා පීතකසිණසමාපත්තියට සමවදනාසේක. රත්වූරස් විහිදුවනුසඳහා ලෝහිතකසිණසමාපත්තියට සමවදනාසේක. සුදුරස් විහිදුවනු සඳහා ඔදාතකසිණසමාපත්තියට සමවදනාසේක. මෙසේ බුදුරජානන්වහන්සේ යමකප්‍රාතිහාර්‍ය්‍ය කරණකල්හි සියලු දසදහසක්සක්වළ නොයෙක් සැරසීමෙන් සරහන්නාක් මෙන් වූයේය.

ඉක්බිත්තෙන් සර්වඥයන්වහන්සේ යමකප්‍රාතිහාර්‍ය්‍ය කරණසේක් මහජනයාගේ සිත්හසර බලා ඔවුන්ගේ අදහසට සුදුසු වූ ධර්මකථාවක් සක්මන්කරමින් සිට වදාරණු කැමැති ව දසදහසක්සක්වළ දසදහසක්රුවන්මෙර පිළිවෙළින් සිට රුවන් ටැම් මෙන් කොට මෙරමුදුනෙහි දසදහසක්සක්වළ පැතිර සිටියා වූ එක්කෙළවරකින් නැගෙනහිරි සක්වළමෝවිට ඉක්ම සිටියා වූ කෙළවර ඇති, එක්කෙළවරකින් බස්නාහිරි සක්වළ මෝවිට ඉක්ම සිටියාවූ කෙළවර ඇති,සත්රුවන්මය වූ පැහැසර වත් වූ සක්මනක් මවා එහි සක්මන් කරණසේක්, අෂ්ටාඞ්ගයෙන් සමුපෙතවූ කර්ණසුඛශ්‍රවණීය වූ සිත්කලු වූ බ්‍රහමස්වර විහිදුවා නොයෙක් නයින් විසිතුරු වූ චතුස්සත්‍යයෙන් යුක්ත වූ අනිත්‍යාදි ලක්ෂණත්‍රය ප්‍රකාශකරන්නා වූ අතිමධුර වූ ධර්මදෙශනාව කරණසේක්, දිව්‍යමනුෂ්‍යයන්ගේ නෙත්‍රයට රසාඤ්ජනයක් බඳු වූ යමකප්‍රාතිහාර්‍ය්‍ය කොට වදාරණසේක.

එසඳ භාග්‍යවත් වූ සර්වඥයන්වහන්සේ ඒ රුවන්සක්මන සක්මන්කරණසේක්, ඒ සක්මනදෙකෙළවරට පැමිණම නවත්නාසේක. අතුරෙහි කෙළවරට නොපැමිණ නොනවත්නාසේක යම්සේ සතරරියන් පමණ සක්මනෙකැ සක්මන්කරණසේක් සක්මන දෙකෙළවරට පැමිණ ම වහා කරකැවේ ද, එපරිද්දෙන් ම සර්වඥයන්වහන්සේත් දසදහසක්යොදුනෙහි පැතිරසිටි රුවන් සක්මනැ දෙකෙළවරට පැමිණ මුත් අතුරෙහි සිට කරකැවී නොවිඩනාසේක.

කිමෙක් ද? ඒ සර්වඥයන්වහන්සේ දසදහසක්සක්වළ පමණ දිගඇති සක්මන හ්‍රස්ව කොට පූසේක් ද? නොහොත්, ඒ සක්මන දිගපලල නිසා මහත් වූ ආත්මභාවයක් මැවූසේක් ද?යත්: එසේ එදෙක ම නොකළසේක. ඒ සර්වඥයන්වහන්සේගේ බුඩ මහිමය නොසිතිය හැක්කෝය. අකනිෂ්ටබ්‍රහමලොකයෙහි පටන් අවීචිය දක්වා එකාඞගණ විය. සරසින් දසදහසක්සක්වළ එක් එළිවිය. දෙවියෝ මනුෂ්‍යයන් දකිති, මනුෂ්‍යයෝ දෙවියන් දකිති. යම්සේ සියලුදිව්‍යමනුෂ්‍යයෝ ස්වභාවයෙන් අභිමුඛයෙහි සිට සමීපයේ සක්මන් කරන්නා දකිත් ද? එපරිද්දෙන්ම භාග්‍යවත් වූ සර්වඥයන්වහන්සේ මෙරමුදුනෙහි පිහිටි රුවන්සක්මන සක්මන්කරන්නා දුටහ. ඒ භාග්‍යවත් වූ සර්වඥයන්වහන්සේ විසින් කිඹුල්වත්නුවර නිග්‍රොධාරාමයේ ඉතාසිත්කලු වූ දැකුම ඇති රුවන්සක්මන සක්මන් කෙරෙමින් සිට මේ අනාගතවංශය වදාරණලද්දේය.

මෙපමණෙකින් කොතැන්හි දී දෙසනලද්දේ ද? යන මේ ප්‍රශ්නය සර්වාකාරයෙන් විසර්ජනය කරණලද්දේය.

කවරකලෙක දෙසනලද්දේ ද? යත්:-

පස්විස්සක්පමණ සර්වඥයන්වහන්සේගේ වංශයෙන් සැර හුනා වූ නොයෙක් නයින් විසිතුරු වූ බුද්ධවංශදෙශනාවසාන යෙහි දෙසනලද්දේය.

කුමක් පිණිස දෙසනලද්දේ ද? යත්: කාමොඝය, භවොඝය, දෘෂ්ට්‍යොඝය, අවිද්‍යොඝය යන චතුර්විධ වූ ඔඝයෙන් නිස්සරණ ය කරණුපිණිස දෙසනලද්දේය.

කවරකෙනකුන් වහන්සේගේ ආරාධනාවෙන් දෙසනලද් දේ ද? යත්:-

ධම්සෙනෙවිසැරියුත් මහතෙරුන් වහන්සේගේ ආරාධ නාවෙන් දෙසනලද්දේය. හේ කෙසේ ද? යත්:-

ඉක්බිත්තෙන් ආයුෂ්මත්වූ ධම්සෙනෙවි සැරියුත්මහතෙ රුන්වහන්සේ රජගහනුවර ගිජුකුළුපව්වෙහි වසනසේක් භාග්‍යවත් වූ සර්වඥයන්වහන්සේ කිඹුල්වත්නුවර ආකාශයෙහි රුවන්සක්මනක්මවා එහි සක්මන්කරන්නා දුටුසේක. ඒ බුදුහු කෙබඳු වූ ශ්‍රීසමෘද්ධියෙකින් යුක්ත වූ සේක් ද? යත්: දෙතිස්මහා පුරුෂලක්ෂණයෙන් හා අසූඅනුව්‍යඤ්ජනයෙන් බබළන්නා වූ උතුම්වූ ශ්‍රීශරීර ඇති සේක. ශරත්කාලයෙහි සම්පූර්ණ වූ චන්ද්‍ර මණ්ඩලය වැනි සේක. අග සිට මුල දක්වා පිපී වැනීගිය මල් ඇති යොදුන්සියක් උස ඇති පරසතුමඳාරාරුක වැනිසේක. අට ලොස්රියන් බුද්ධරූපයවටා සිටියා වූ ව්‍යාමප්‍රභාමණ්ඩලයෙන් සශ්‍රීක සේක. ගමන්ගත් උතුම් වූ රුවන්මෙරක් වැනි සේක. සුපිපි පියුමෙන් ගැවැසී ගත්තා වූ පියුම්විලක් වැනි සේක. නො යෙක් රත්නයෙන් විසිතුරු වූ උතුම් රුවන්තොරණක් වැනි සේක. තාරකාරසමින් ගැවැසී ගත්තා වූ ආකාශතලයක් වැනි සේක. ඈත මෑත දිවන්නා වූ පතන්නා වූ ෂට්වර්ණ වූ ඝන බුද්ධරශ්මිමාලාවන් විහිදුවනසේක. නිරුත්තර වූ බුද්ධශ්‍රීන් හා උප මාවිෂයාතික්‍රාන්ත වූ බුද්ධවිලාශයෙන් බබළනසේක. මෙබඳු වූ බුද්ධශ්‍රීන් විරාජමාන ව සක්මන් කරන්නා වූ ඒ බුදුරජානන්වහන් සේ දැක මේ සියලු දසදහසක්සක්වළ දිව්‍යබ්‍රහ්මාදීහු රැස්වූහ. මෙ තැන්හි වූකලි මහත් වූ ධර්මදෙශනාවක් වියයුතුය. බුද්ධවංශ

දෙශනාව වූකලි බොහෝසත්ත්වයන්ට උපකාරීය. ප්‍රසාදවහය. එ
සේහෙයින් මම දශබලධාරී වූ සර්වඥයන්වහන්සේගේ මූලප්‍රණි
ධානයෙහි පටන් බුඬවංශදෙශනාව විචාළෙම් වී නම්, යහපත්
වන්නේය යි සිතා තමන්වහන්සේගේ පරිවාරභික්ෂූන් පන්සි
යක්දෙනාවහන්සේ හා සමඟ ආකාශයෙන් ගොස් සර්වඥයන්
වහන්සේ සමීපයට එළඹැ නමස්කාර කොට දෙහොත් මුදු
නෙහි පිහිටුවා සිට මහත් වූ වීර්‍ය්‍ය ඇති නරෝත්තම වූ සර්වඥ
යන්වහන්ස! නුඹවහන්සේගේ ප්‍රථමප්‍රණිධානය කෙබඳු ද? කව
රකලෙක නුඹවහන්සේ විසින් මේ උතුම් වූ බුදුබව ප්‍රාර්ථනාක
රණලද්දේ දැ යි විචාළසේක. එසඳ අසාධාරණඥාන ඇති සංසා
රදුක්ඛාදි වූ සියලුදුක්ඛයන් ප්‍රහීණකළා වූ භාවනායෙන් වඩනා
ලද සිත් ඇති, මිහිරි වූ කටහඬ ඇති, මහර්ෂි වූ ධර්මරාජන් වූ
සර්වඥයන්වහන්සේ මේකල්පයට සාරාසඞ්ඛ්‍යකල්පලක්ෂයකින් මත්
තෙහි දර්ශනීය වූ මනොඥ වූ අමර නම් පුරෙක් වූයේ ය, යනා
දීන් බුඬවංශදෙශනාව නිමවා, කෙළවර මේ භද්‍රකල්පයෙහි කකු
සඳය–කොණාගමනය–කාශ්‍යපය යන සර්වඥවරයෝ තුන්දෙ
නෙක් උපන්නාහුය. මම දැන් සතරවැනි ව ගෞතම නම් බුදු
වීමි. මතු මෛත්‍රෙය නම් සර්වඥනෙනෙක් ලොකයෙහි පහළවෙත්.
අෂ්ටලොකධර්මයෙන් අකම්ප්‍ය වූ සියලුලොකවාසී වූ සත්ත්වයන්
කෙරෙහි පතළා වූ කරුණා ඇති, මේ සර්වඥවරයෝ පස්දෙන ම
මේකල්පයෙහි ම පහළවන්නාහයි, අනාගතවංශදෙශනාවට අව
සර පාඩා බුඬවංශදෙශනාව නිමවා වදාළසේක.

ඉක්බිත්තෙන් ආයුෂ්මත් වූ ධම්සෙනෙවිසැරියුත් මහතෙ
රුන්වහන්සේ දිව්‍යමනුෂ්‍යයන්ගේ අදහස් දැන අනාගතයෙහි
පහළවන්නාවූ මෛත්‍රෙයසර්වඥයන්වහන්සේගේත් වංශය අස
නුකැමැති ව සර්වඥයන්වහන්සේ කරා එළඹ නමස්කාර කොට
සිවුරු එකාංශ කොට බහා දෙහොත්මුදුනෙහි බැඳ සිට, ස්වාමීනි!
නුඹවහන්සේ විසින් අනාගතයෙහි මෛත්‍රෙය නම් බුදුකෙනෙ
කුන්වහන්සේ උපදිති යි, සංක්ෂෙපයෙන් වදාරණලද. ඒ මෛ
ත්‍රෙය නම් බුදුහු කෙබඳුසේක් ද? ස්වාමීනි භාග්‍යවත් වූ බුදුර
ජානන්වහන්ස! මා කෙරෙහි කරුණාවෙන් විස්තර කොට ඒ
අනාගතවංශදෙශනාව වදාළ හොත් යහපත්වන්නේය යි, ආරා
ධනා කළසේක. ඒ සැරියුත්මහතෙරුන්වහන්සේ කෙබඳුසේක්
ද? යත්:- මනුෂ්‍යරූපය ඉක්ම දිව්‍යරූපයට නොපැමිණියා වූ
රූපසාරයද සියලුලොකවාසී වූ සත්ත්වයන් විසින් පිදියයුතු වූ

බ්‍රාහ්මණමහාසාරකුලය යි කියනලද කුලසාරය ද, ප්‍රමාණාති ක්‍රාන්ත වූ සම්පත්තිසාරය ද, භුවනත්‍රයෙහි පතළ වූ චන්ද්‍රාලෝක යක් හා සමාන සශ්‍රීක වූ යසසාරය ද, කුලස්ත්‍රීන්ට ආභරණයක් හා සමාන වූ ආචාරගුණසාරය ද, මාර්ගඵල උපදවන්ට සමර්ථ වූ කුශලසම්භාරසාරය ද, මොවුන්ට ඇත් නු යි කියා ශාරීයයි තෙරුන්වහන්සේගේ මෑණියන් බැමිණිදෙවින්ට නමකි. උන් ගේ ඖරසපුත්‍රහෙයින් ශාරීපුත්‍රනම්වනසේක. මහත්වූ සතිප ට්ඨාන- සම්‍යක්ප්‍රධාන- ඍද්ධිපාද- ඉන්ද්‍රිය- බල- බොජ්ඣඞ්ගාදි වූ ධර්මයන් පිළිගන්ට සමර්ථ මහත් වූ ප්‍රඥ ඇතිබැවින් හා ලෝ කස්වාමී වූ සර්වඥයන්වහන්සේ හැර ප්‍රඥාවෙන් තමන්වහන්සේ හා සමකෙනකුන් ලෝකයෙහි නැතිබැවින් ද, පඤ්චමහාගඞ්ගා යෙහි වැලි හා සමුද්‍රයෙහි ජලය හා පෘථිවියෙහි පාංශුව මුන් වහන්සේගේ නුවණට ලක්තබත් හොත් වැලි ආදිය මද, නුව ණම බොහෝවනබැවින් නොගෙවෙන්නා වූ ප්‍රඥ ඇතිබැවින් ද, කපක්මුළුල්ලේ වැසිවටකල්හි ජලඵලවනපර්තාදි වූ හැමතැන් හි වගුළ දියබිඳු මෙතෙකැ යි පිරිසිඳ කියන්නට සමර්ථ වූ ප්‍රඥ ඇතිබැවින් මහත් වූ ප්‍රඥ ඇතිසේක. සමචිත්තපරියායසූත්‍රදෙශ නාවෙහි කෙළලක්‍ෂයක් දිව්‍යමනුෂ්‍යයන් අර්හත්ඵලයට පැමිණ වූසේක. සෝවාන්-සෙදගැමි-අනගැමිය යන තුන්මඟතුන්ඵල යට පැමිණියා වූ සත්ත්වයන් සංඛ්‍යාවෙක් නැත්තේය. මෙප මණ වූ සත්ත්වයන් විනයනය කරණහෙයින් විනායකනම්වන සේක. චක්‍රවර්ති රජ්ජුරුකෙනකුන්ගේ චක්‍රරත්නය පවත්වන් නා වූ ප්‍රධානපුත්‍රරත්නයක් මෙන් බුදුරජානන්වහන්සේ විසින් පවත්වනලද ධර්මචක්‍රය අනුව පවත්වා ධර්මයට සෙනෙවිරත් තනතුරෙහි සිටිබැවින් ධර්මසේනාපතිනම් වනසේක. මෙබඳු වූ ගුණගණාඞ්ගයෙන් සමන්විත වූ ඒ ධර්මසේනෙවිසැරියුත් මහ තෙරුන්වහන්සේ යොදනක්පමණ දිග ඇති රුහැණක් සුවාසූ දහසක් යොදුන් පමණ ඇති, ගම්භීර සාගරපත්ලට පැමිණ යා නොහෙන්නා සේ කාලත්‍රයවර්ති වූ සියලුධර්මයන් දැනගන්ට සමර්ථ වූ සර්වඥතාඥානය නොලත් බැවින් ප්‍රාදේශිකඥානයට විෂ ය වූ සිත සර්වඥතාඥානයට විෂය නොව පවත්වනට අසමර්ථ බැවින් ඒ මෛත්‍රෙයබුදුහුනම් කෙබඳුසේක් දැ යි, තමන්වහන් සේගේ සිතට උපනාසැකය මසැස-දිවැස-පැනඇස-බුදුඇස- සමතැස යන පසැස් ඇති, සර්වඥයන්වහන්සේ අතින් විචාරා වදාළසේක. මෙසේ ඒ ධර්මසේනෙවිසැරියුත් මහතෙරුන්වහන් සේ විසින් ආරාධනාකරණලද්දා වූ සියලුධර්මයෙහි අස්ඛලිත

වැ පවත්නා වූ ඥානගති ඇති, සර්වඥරාජොත්තමයානන්වහන්සේ රුවන්සක්මනෙහි සක්මන්කරමින් සිටම රත්ගල්තලාමුදුනෙහි සිංහනාද කරන්නා වූ අභීතකේශරසිංහරාජයකු පරිද්දෙන් ගර්ජනා කෙරෙමින් බ්‍රහ්මස්වර විහිදුවා ආකාශගඞ්ගාව ගෙණ හැර පානාකලක් මෙන් අනාගතවංශදෙශනාවට පටන්ගන්නාසේක්, ශාරිපුත්‍රස්ථවිරයෙනි! සර්වඥකෙනකුන් හැර අන්‍යසත්ත්වකෙනකුන් විසින් දෙශනාකරන්ට නොපිළිවන් වූ මෛත්‍රෙයසර්වඥයන්ගේ මහත් වූ කුශලරාශිය සර්වප්‍රකාරයෙන් කියන්ට නොපිළිවන. එතකුදු වුවත් එකදෙශයකින් කියමි යි දක්වන්නාවූ බුදුරජානන්වහන්සේ,

"අනප්පකං පුඤ්ඤරාසිං—අජිතස්ස මහායසං,
නසක්කා සබ්බසො වත්තුං—විත්ථාරෙනෙව කස්සචි
එකදෙසෙන වක්ඛාමි—සාරිපුත්තසුණොහි මෙ."

මෙසේ වදාළසේක. යම්සේ දිවසින් සියලු මහාසමුද්‍රය දැක සිටියා වූ කෙනකුන්ට තමන් විසින් දක්නාලද සියලු මහාසමුද්‍රය දිවස්නැතිකෙනකුන්ට සර්වප්‍රකාරයෙන් දක්වන්ට නොපිළිවන් ද, එක්ප්‍රදෙශයකින් බස්වා මේසමුද්‍රය බලව යි කියා එකප්‍රදෙශයක් ම දක්වන්ට පිළිවන් ද එපරිද්දෙන් ම සර්වඥතාඥානයෙන් සියලුබුද්ධානුභාවය ප්‍රතිවෙධ කොට සිටියා වූ තමන්වහන්සේ විසින් ප්‍රතිවෙධ කරණලද මෛත්‍රෙයසර්වඥයන්ගේ කුශලසමෘද්ධිය හා මහානුභාවසම්පන්න යශස්සමෘද්ධිය සර්වඥනොවන්නා වූ නොපට සර්වප්‍රකාරයෙන් දක්වන්නට නොපිළිවන. සංස්කාර-විකාර-ලක්ෂණ-නිර්වාණ-ප්‍රඥප්තිය යන පඤ්චවිධඥෙයමණ්ඩලය හස්තාමලකඥානයෙන් දත්නා වූ සර්වඥකෙනකුන් විසිනු දු ඒ මහත් වූ කුශලරාශිය ඥානගතිය ශීඝ්‍රබැවින් දැනගන්ට පිළිවන. වාගගතිය මඳබැවින් කියන්නට නොපිළිවන. එහෙයින් එකදෙශයකින් කියමි. තමන්වහන්සේ විසින් ප්‍රතිඥකරණලද අනාගතවංශය එකදෙශයකින් දක්වන්නා වූ බුදුරජානන් වහන්සේ,

"ඉමම්හි භද්දකෙ කප්පෙ—අසඞ්ඛ්‍යාතෙ වස්සකොටියෙ,
මෙත්තෙය්‍යො නාම නාමෙන— සම්බුද්ධො දිපදුත්තමො"යි.

මෙසේ වදාළසේක.

යම් කල්පයෙක්හි සර්වඥවරයෝ පස්දෙනෙක් උපන්නාහු වී නම් ඒ කල්පය අවශෙෂ කල්පයන්ට උතුම් වන

බැවින් භද්‍රකල්ප නම් වෙයි. එකමකල්පයක සවැනි වූ හෝ, සත්වැනි වූ හෝ, සර්වඥකෙනකුන්වහන්සේ නූපදනාසේක. යටත්පිරිසෙයින් එක්කෙනකුන්වහන්සේ උපදනාසේක. මධ්‍යමවශයෙන් දෙදෙනකුන්වහන්සේහෝ, තුන්දෙනකුන්වහන්සේහෝ, සතරදෙනකුන්වහන්සේ උපදනාසේක. උත්පිරිසෙයින් බුදුහු පස්දෙනකුන්වහන්සේ එක ම කල්පයක උපදනාසේක. එයින් මත්තේ නූපදනාහෙයින් මේකල්පය භද්‍රකල්ප නම් විය. මෙහි මහාකල්පය, අසංඛ්‍යකල්පය, අන්තඃකල්පය යි කල්පය ත්‍රිවිධ වන්නේය. එහි ගින්නෙන් ලොව නස්නාකල්හි පළමුකොට ම කල්පවිනාශය කරන්නා වූ විපත්තිකර මහා මෙඝයෙක් නගා කෙළලක්ෂයක් සක්වළ මහත්වූ ඝනවර්ෂාව වස්නේය. එ දැක තුටුපහටු වූ සිත් ඇති මනුෂ්‍යයන් විසින් තමන් තමන්ගේ සියලු බිජුවට ගෙන් පිටත්කොට කුඹුරුආදියෙහි වපුළකල්හි ක්‍රමයෙන් වැඩී ගොයම් සරක් තොලුගානා පමණ වූ කල්හි ගද්‍රභරවය කෙරෙමින් ගර්ජනා කොට එක්පොදබින්දුවකු ත් බිම නොහෙළෙන්නේය. එතැන්පටන් සිටුවාපු වැසි සම්පත්තිකරමහා මෙඝය දක්වා අතුරෙහි එකදවසකුත් නොවන්නේය. ඉක්බිත්තෙන් සංසාරවෘත්තයෙහි අනාගීත වූ සියලු සත්ත්වයන් අතුරෙන් හෙතුසම්පන්න වූ සමහරකෙනෙක් ධ්‍යාන උපදවා බ්‍රහ්මලොකයෙහි උපදනාහ. සමහරකෙනෙක් අපරාපර්‍යායවෙද්‍යකර්මයෙන් දිව්‍යලොකයෙහි ඉපැද එහි සිට ධ්‍යාන උපදවා බ්‍රහ්මලොකයෙහි උපදනාහ. ලොකයෙහි අපරාපර්‍යායවෙද්‍යකර්මයෙන් මිදුනු එක ද සත්ත්වයෙක් නම් නැත්තේය. වැසි සිටුවූ තැනින් මත්තෙහි බොහෝ කලක් ගියකල්හි දෙවැනි සූර්‍ය්‍යයෙක් පහළව ආකාශය දුම්වලා නැති කොට දර්පණතලයක් මෙන් නිර්මල කොට පඤ්චමහාගඞ්ගාව තබා අවශෙෂ වූ කුඩා මහත් ගංගා, වැව්, පොකුණු, හෙප්, වළවල් ආදියෙහි පැන් වියලෙන්නේය. තුන්වැනි සූර්‍ය්‍යයා පහළ ව ගඞ්ගා, යමුනා, අචිරවතී, සරභූ, මහීය යන පඤ්චමහාගඞ්ගාවන් වියළෙන්නේය. සතරවැනි සූර්‍ය්‍යයා පහළ ව අනවතප්තය, ඡද්දන්තය, කුණාලය, කර්ණමුණ්ඩය, රථකාරය, සිංහප්‍රපාතය, මන්දාකිනීය, යන මහවිල්සත වියළෙන්නේය. පස්වැනි සූර්‍ය්‍යයා පහළ ව මහාසමුද්‍රය වියළෙන්නේය. සවැනි සූර්‍ය්‍යයා පහළ ව සියලු සක්වළ එකධූම කරවන්නේය. සත්වැනි සූර්‍ය්‍යයා පහළව පෘථිවියෙහි එකජ්වාලා ඇවිළ මහ පොළොව, මහමෙර, සප්තකුලපර්වත, හිමවත් පර්වතාදීන් දවා චාතුර්මහාරාජිකාදි වූ සදිව්‍යලොකයෙහි රන්රිදී මැණික්මය වූ

විමන් දවන්නේය එසින් නැගී බ්‍රහ්මලෝක පහක් දවා ආභස්සර
බ්‍රහ්මලෝකය පැහැර සිටින්නේය. යම්සේ මේසක්වළ නසී ද,
එපරිද්දෙන් ම කෙළලක්ෂයක් සක්වළ සූර්‍යමණ්ඩල සතක්
සතක් පහළවීමෙන් නස්නේසි. ඉක්බිත්තෙන් සියලු සංස්කාර
ලෝකය දවා ගිනි නිවී ගියකල්හි යට අජටාකාශය හා මත්තෙහි
ආකාශය එක් වැ එකාන්ධකාර වන්නේය. ඊට මැත බොහෝ
කලක් ගියකල්හි සම්පත්තිකර මහාමේඝය නඟා තනඹතල්කඳ
සා ජලධාරා වස්මින් කෙළලක්ෂයක් සක්වළ. සියලු දැගිය තැන්
පුරා අන්තර්ධානවන්නේය. ඉක්බිත්තෙන් බ්‍රහ්මලෝකය-දිව්‍යලෝ
කය-මහපොළොවය- මහමෙරය- චක්‍රවාටපර්වතය- හිමාලයපර්ව
තය-සමුද්‍රය-පඤ්චමහාගඟාවය-සදත්දහතළාය-චන්ද්‍ර සූර්‍ය-
නක්ෂත්‍රතාරකාවෝය යන මේ සියල්ල පහළවන්නේය. මෙසේ
සින් සියලුලොව පළමු පරිද්දෙන් ම ප්‍රකෘතිවත් වන්නේය.
එහි විපත්තිකර මහාමේඝයෙහි පටන් ජ්වාලෝපච්ඡේදය දක්වා
මේ අසංඛ්‍යකල්පය සංවර්ත නම් වෙයි. ජ්වාලෝපච්ඡේදයෙහි
පටන් සම්පත්තිකර මහාමේඝය පහළවනතැන් දක්වා මේ
අසංඛ්‍යකල්පය සංවර්තස්ථායී නම් වෙයි. කෙළලක්ෂයක් සක්වළ
දිය පුරන්නා වූ සම්පත්තිකර මහාමේඝය පහළ වූ තැන් පටන්
චන්ද්‍රසූර්‍යයන්ගේ පහළවීම දක්වා මේ අසංඛ්‍යකල්පය විවර්ත
නම් වෙයි. චන්ද්‍රසූර්‍යයන්ගේ පහළවීමෙහි පටන් නැවත කල්ප
විනාශය කරන්නා වූ විපත්තිකර මහාමේඝය දක්වා මේ අසංඛ්‍ය
කල්පය විවර්තස්ථායී නම් වෙයි.

එසින් වදාළහ බුදුහු:-''චත්තාරිමානි භික්ඛවෙ කප්පස්ස
අසංඛෙය්‍යානි. කතමානි චත්තාරි? සංවට්ටො, සංවට්ටට්ඨායී විව
ට්ටො විවට්ටට්ඨායී''යි. එහි සංවර්ත නම් කප නැසීමය. සංවර්ත
ස්ථායී නම් නැසී සිටීමය. විවර්ත නම් කප අවගැන්මය. විවර්ත
ස්ථායී නම් අවගෙණ සිටීමය.

මෙසේ මෙබඳු සතර අසංඛ්‍යකල්පයකින් පිරිහුන්නා වූ
කල්පය මහාකල්ප නම් වෙයි. ඒමහාකල්පයෙහි සතරකොට්ඨාසය
සතරඅසංඛ්‍යකල්ප නම් වෙයි. එසින් ''විවර්තස්ථායී''ය යි කියන
ලද සතරවැනි භාගයෙහි ම සම්‍යක්සම්බුද්ධවරුන්වහන්සේ උපද
නාසේක. අවශේෂ වූ තුන්භාගයෙහි නූපදනාසේක. අන්‍යඃ
කල්පයක් මෙහි ම සම්භව වන්නේය. මෙසේ මෙබඳු වූ ත්‍රිවිධ
කල්පයන් අතුරෙන් ''විවර්තස්ථායී''යයි කියනලද අසංඛ්‍යකල්ප
යෙහි තොළොස් කෙළගණන් අවුරුදු මතුමත්තෙහි ඉපැද ඉකුත්

වූ කල්හි ද්විපදොත්තම වූ මෛත්‍රෙය නම් සර්වඥකෙනෙක් ලෝකයෙහි පහළවෙති, වදාළසේක. චක්‍රවර්ති රජ්ජුරුවෝය, සතර වරම් මහරජදරුවෝය- ශක්‍ර- සුයාම- සන්තුෂිතාදි වූ දෙවියෝය-බ්‍රහ්මයෝය-යන මේ දිව්‍යබ්‍රහ්මාදි වූ දෙපා ඇති සත්ත්වයන්ට උතුම්වන්නාහ. ඒ බ්‍රහ්මාදිවූ දෙවියන්ටත් වඩා උතුම්වන බැවින් සර්වඥයන්වහන්සේ ද්විපදොත්තම වනසේක.

දූත් වූකලි ද්විපදොත්තම වූ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේගේ කුශලසම්භාර ආදිය දක්වන්නාවූ තිලෝගුරු බුදුරජානන් වහන්සේ:—

"මහාපුඤ්ඤෝ මහාපඤ්ඤෝ-මහාඤාණී මහායසෝ,
මහබ්බලෝ මහාථාමෝ උප්පජ්ජිස්සති චක්ඛුමා,
මහාගති සති චේ'ව ධිතිමා බාහුසච්චවා,
සඞ්ඛාතා සබ්බධම්මානං ඤාතෝ දිට්ඨා සුපස්සිතෝ
පරියෝගාළ්හා පරාමට්ඨා උප්පජ්ජිස්සති සෝ ජිනෝ"යි,

මෙසේ වදාළසේක.

තවද ශාරිපුත්‍රස්ථවිරයෙනි! ඒ මෛත්‍රෙය බුදුහු තමන් විසින් කරණලද දානශීලාදි වූ කුශලයට සියලුලෝකවාසී සත්ත්වයන්ගේ කුශලය ලක්කබන්ටත් නොසෑහෙන හෙයින් මහත්වූ අප මණවූ කුසල් ඇත්තාහ. මහත්වූ සංස්කාර-විකාර-ලක්ෂණ-නිර්වාණ-ප්‍රඥප්තිය යි කියනලද පඤ්චවිධඥෙයමණ්ඩලය විෂය කොට පවත්නා වූ මහත් වූ ප්‍රඥාව ඇත්තාහ. අනන්‍යසාධාරණ වූ ෂට් අසාධාරණඥානාදි මහත් වූ ඥාන ඇත්තාහ දිව්‍යබ්‍රහ්මාදි සියලු සත්ත්වයන් පිරිවර කොට ඇති හෙයින් මහත් වූ යසපිරිවර ඇත්තාහ. කායබලදසයක් හා ඥානබලදසයක් ඇතිහෙයින් මහත් වූ බලඇත්තාහ. මහත් වූ චතුර්විධ සම්‍යක්ප්‍රධානවීර්‍ය්‍යසඞ්ඛ්‍යාත චෛතසිකවීර්‍ය්‍යී ඇතිහෙයින් මහත් වූ ශක්ති ඇත්තාහ. මහ මෙර වුවත් විනිවිද පවත්නා වජ්‍රායුධයක් මෙන් අතීතානාගත වර්ත්මාන සඞ්ඛ්‍යාත කාලත්‍රයවර්ත්ති සියලු ධර්මයන්කෙරෙහි අස්ඛලිත ව පවත්නා අනාවරණඥානසඞ්ඛ්‍යාත මහත් වූ ඥානගති ඇත්තාහ. ව්‍යාඝ්‍රාදීන්ට පෘථිවිය මෙන් සියලු සත්ත්වයන්ට පරම ප්‍රතිෂ්ඨාවන්නාහ. විදුරුපොළොව මතුකොට කැණ හිඳුවනලද ඉන්ද්‍රඛීලයක් මෙන් ප්‍රමාණාතික්‍රාන්ත වූ විෂයයෙහි නිශ්චල ව පිහිටන්නා වූ සර්වඥතාඥානය හා එක් වැ උපන්නා වූ නො ඉල් පෙන්නා වූ ස්වභාවය ඇති මහත්වූ ස්මෘතිශක්ති ඇත්තාහ.

දෘඪ වූ වීර්‍ය්‍යපාරමිතාවට කාරණව උපන්නා වූ උත්සාහය ස්වභාව කොට ඇති ඥානසම්ප්‍රයුක්ත උත්තම වූ වීර්‍ය්‍යයෙන් සමන්විත බැවින් මහත් වූ ධෛර්‍ය්‍ය ඇත්තාහ. දුඃඛ-සමුදය-නිරෝධය-මාර්ගය යි කියනලද චතුරාර්‍ය්‍යසත්‍යය- මාර්ගසත්‍යය- පරමාර්ථසත්‍යය යනාදි වූ බහුප්‍රකාරසත්‍යය ප්‍රතිවේධ කොට සිටිබැවින් බහුවිධසත්‍යයන් ඇත්තාහ. අතීත-අනාගත-වර්තමාන-සියලුධර්මයන් ප්‍රඥයෙන් පිරිසිඳ සිටිහෙයින් එම ධර්මයන් අතීතාංශඥානයෙන් මනාකොට ස්පර්ශකරන්නාහ. මෙම කාලත්‍රය වර්ත්තිවූ ඥානයෙන් සියලුධර්මනැමැති සාගරයෙහි පත්ලට බටහ. හස්තයෙන් පිරිමදනා රූපයක් මෙන් ඥානනැමැති හස්තයෙන් සියලු ධර්මයන් සර්වාකාරයෙන් පිරිමදනාහ. මෙබඳුවූ කුශලාදි ගුණසමෘද්ධියෙන් යුක්තවූ ඒ මෛත්‍රෙය සර්වඥයෝ තමන්ගේ ආනුභාවසමෘද්ධියෙන් දෙව්මිනිසුන් සහිතවූ ලොව පැතිරෙමින් අනාගතයෙහි උපදනෝ වේදැයි වදාළසේක

තවද ඒ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේ කවර සර්වඥයෙකුන්වහන්සේ සමීපයෙන් විවරණ ලැබ කෙතෙක්කල් පාරමීධර්මයන් පුරා ආසේක්ද? අනාගතයෙහි උපදනාසේක්ද? යත්: ඒ මෛත්‍රෙය සම්‍යක්සම්බුද්ධරජානන්වහන්සේ වූකලි පූර්වභාගයෙහි ජාති-ජරා-ව්‍යාධි සංඛ්‍යාත අනේකාදීනවයෙන් සමාකීර්ණ වූ අනවරාග්‍රසංසාරයෙහි ඇවිදිනාසේක් බුද්ධාදි කල්‍යාණමිත්‍රයන් සෙවනය, භජනය, පයුරුපාසනය කෙරෙමින් අනේක ජාතිකොටිශතසහස්‍රයක් මුළුල්ලෙහි ප්‍රතිරූපදේශවාස- සත්පුරුෂසේවන- සද්ධර්මශ්‍රවණ-යෝනිසොමනසිකාර-ධර්මානුධර්මප්‍රතිපත්තිය යි කියනලද මේ චතුශ්චක්‍රසම්පත්තිය පුරා මේකල්පයෙන් යට සොළොසාසඞ්ඛ්‍යකල්පලක්ෂයකින් මත්තෙහි උතුම්වූ ජම්බුද්වීපයෙහි ප්‍රභාවන්ත නම් චක්‍රවර්තිරජව ඉපද දෙදහසක් ක්ෂුද්‍රද්වීප පිරිවරකොට ඇති සතරමහාද්වීපයෙහි සත්ත්වයන් පඤ්චසීලයෙහි පිහිටුවා ප්‍රජාපරිපාලනය කෙරෙමින් වසන්නාහ. එකල ලෝකයෙහි මුහුත්ති නම් සර්වඥයෙකුන්වහන්සේ ඉපද ධම්මචක්කප්පවත්තන් සූත්‍රදේශනාව කොට නොයෙක් කෙළලක්ෂගණන් ආර්‍ය්‍යසමූහයා විසින් පිරිවරණලදුව සත්ත්වවිනයනය කරණසේක.

එකල ප්‍රභාවන්ත නම් චක්‍රවර්තිරජ්ජුරුවෝ බුදුහු ලොකයෙහි පහළවූසේක, යනු අසා සතිස්යොදනෙක පැතිරසිටියාවූ පර්ෂදින් පිරිවරණලදුව බුදුරජානන්වහන්සේ කරා එළඹ සත්රුවනින් පූජාකොට වැඳ පර්ෂත් හා සමඟ එකත්පස්ව හුන්නාහු ධර්මය අසා ප්‍රසන්නවූ සිත් ඇතිව චක්‍රවර්තිසම්පත්තිය හැර

මූහුණී නම සර්වඥයන්වහන්සේගේ ශාසනයෙහි මහණව රත්න සම්බිරයන් වහන්සේය යි මෙනමින් ආකාශතලයෙහි පූර්ණ චන්ද්‍රමණ්ඩලය මෙන් ප්‍රසිද්ධව ශීල-සමාධි-ප්‍රඥාගුණයෙන් යුක්තව පඤ්චාභිඥා-අෂ්ටසමාපත්ති-උපදවා සංසාරය හරණාකැමැතිසේ කුත් සත්වලෝකය බලා අක්මුල් දැකගතනොහැකි දිරාගිය අවුල්හුකැටියක් වැනිවූ, ගුලතම් පක්ෂීන්ගේ අවුල්කදල්ලක් වැනිවූ, දිරාගිය අවුල් මුදුතණ බබුස්තණ කැටියක් වැනිවූ, දෙ සැවදෑම්ව්‍යගණ සසර නො ඉක්ම චුතියෙන් ප්‍රතිසන්ධියය ප්‍රතිස න්ධියෙන් චුතියය යන නැවත නැවත චුතිප්‍රතිසන්ධි වශයෙන් ප්‍රතිසන්ධිග්‍රහණය කොට ජාති-ජරා ආදිවූ අනෙකප්‍රකාර දුඃඛ යෙන් මිදී සිදී ත්‍රිවිධභවය- චතුර්විධයොනිය- පඤ්චගතිය-සප්ත විඥාන ස්ථිතිය-නවසත්වාවාසය යන මෙහි ගොතලුවෙහි ලූ ගොන් මෙන් සිසාරා ඇවිදිනාවූ සත්වසමූහයා දැක කරුණා වෙන් කම්පිතවූ සිත් ඇතිව ඒ සංසාරදුඃඛයෙන් සත්වයන් ගොඩනගණු කැමැතිව සර්වඥතාඥානය ප්‍රාර්ථනාකොට දානශීලාදි පුණ්‍යසම්භාරයන් රැස්කෙරෙමින් මනුෂ්‍යාත්මභාවාදි අෂ්ටාඞ්ග යෙන් සමූපෙතව වියර්‍ථාධිකප්‍රඥාවත් බොධිසත්ත්වවිශෙෂයෙන් දානාධ්‍යාශය ඇතිව දානයෙහි ඇලී ජීවිතයත් පරිත්‍යාගකොට දන්දීමෙහි බලවත්ව අවගත්තාවූ උත්සාහ ඇතිසේක. එකල ධර්මසභාමණ්ඩපයෙහි රැස්ව උන්නාවූ භික්ෂූන්වහන්සේට සිති විල්ලෙක් උපදනේ, මේදානාධ්‍යාශය ඇති මහණ අනාගතයෙහි දිව්‍යව උපදී දෝහෝ, නොහොත් ශක්‍රව- මාරව- බ්‍රහ්මව- උපදී දෝහෝ, නොහොත් බුදුවේ දෝහොයි, යන මෙසේවූ සිතිවිල් ලෙක් උපන්නේයි. එසමයෙහි මුහුණීන නම් සර්වඥයන්වහන්සේ මනාකොට සරහා පිළියෙල කරණලද ධර්මසභාමණ්ඩපයෙහි මනාකොට පනවනලද උතුම් බුද්ධාසනමස්තකයෙහි සහස්‍ර රශ්මීන් සාගරකුක්ෂිය බබුළුවන්නාවූ තරුණසූර්යයාමෙන් සියලු ධර්මසභාමණ්ඩපය රුවන්රසධාරාවෙන් පරිෂෙක කරන් නාක්මෙන් නීල-පීත-ලොහිතා'වදාත- මාඤ්ජිෂ්ඨ-ප්‍රභාස්වරය සි ඛියතලද ෂඩ්වර්ණවූ ඝනබුද්ධරස්මිමාලාවෙන් බබුළුවමින් තාර කාසමූහයා විසින් පිරිවරණලද පූර්ණචන්ද්‍රමණ්ඩලය මෙන් භික්ෂු සමූහයා විසින් පිරිවරණලදුව වැඩහුන්සේක්, සුපිපිරත්පියුම් වනමධ්‍යයෙහි සඤ්චාරය කරන්නාවූ පස්වණක් පැහැයෙන් යොභි භ්‍රමරයුගලයක් වැනිවූ පස් පැ දිස්නා විසිතුරු ඇස්සඟ ළින් සියලු සබද බලා ඔවුන්ගේ අදහස් දැන සිවුදෑගඳපිරූ රුවන්කරඬුවක් හරණාකලක් මෙන් සමීත් සතුටුකරවමින්

ඕෂ්ඨපද්මය විවෘතකොට අෂ්ටාඞ්ගයෙන් සමන්විත බ්‍රහ්මස්වර විහිදුවා මහණෙනි! මේ රත්න නම් මහණ බුදුබිජුවටක එතෙම මේඝපටලයෙන් සැඟවුනාවූ සූර්‍ය්‍යමණ්ඩලය මෙන් ද, වලායෙන් වැසුනු පුන්සඳමඬල මෙන් ද, හලුවෙන් සැඟවී තුබූ ගිනිපුපුරක් මෙන් ද, පාංශුවෙන් සැඟවී තුබූ ජාතිරත්නමාණික්‍යයක් මෙන් ද, භූමියෙන් සැඟවී තුබූ මහානිධානයක් මෙන් ද, භවයෙන් සැඟවුනේය. විකාශයට ආසන්නවූ උතුම්වූ පියුම්කැකුලක් මෙන් ද, යුගන්ධරපීඨාසන්නවූ ළහිරුමඬලක් මෙන් ද, මකරලග්නාගමට ආසන්නව සිටි මහාසාගරය මෙන් ද, සර්වඥතාඥානයට ආසන්නව මහානුභාවසම්පන්නවූ මේ වීරපුරුෂතෙමේ මාගේ ශාසනයට වැද සත්රුවන්මසු නැවක් සමීපයෙහි සිටි රන්ගල්වතක් මෙන් ද, පූර්ණචන්ද්‍රමණ්ඩලසමීපයෙහි ඖෂධිතාරකාව මෙන්ද, මහාමේරුපර්වතරාජයා සමීපයෙහි පිහිටි යුගන්ධරපර්වතය මෙන් ද, ඡද්දන්ත නම් හස්තිරාජයා සමීපයෙහි සිටි ඇත්පැටවකු මෙන් ද, චක්‍රවර්තිරජ්ජුරුවන් සමීපයෙහි සිටි ප්‍රධාන පුත්‍රරත්නයක් මෙන් ද, මහාබ්‍රහ්මයා සමීපයෙහි සිටි බ්‍රහ්මකුමාරයකු මෙන් ද, මාසමීපයෙහි වසන්නේය. මෙතෙම එසේ මෙසේවූ සත්ත්වයෙක් නොවෙයි. යොධෂාසඞ්ඛ්‍යකල්පලක්ෂයකින් මත්තෙහි මෛත්‍රෙයබුදුවන්නේය. එබුදුන්ට ඒ ආත්මභාවයෙහි කෙතුමතීනම් රාජධානියෙක් වාසස්ථාන වන්නේය. බ්‍රහ්මවතීනම් බැමිණියක් මවුවන්නීය. සඞ්ඛනම් චක්‍රවර්ති රජ්ජුරුවන්ගේ සුබ්‍රහ්මනම් පුරොහිතබ්‍රාහ්මණයෙක් පියවන්නේය. අශෝකය, බ්‍රහ්මදේවය යන අග්‍රශ්‍රාවකයෝ දෙදෙනෙක් වන්නාහ. සීහනම් උපස්ථායක කෙනෙක් වන්නාහ. පදුමාය සුමනාය යන අග්‍රශ්‍රාවිකාවෝ දෙදෙනෙක්වන්නාහ. සුධනය සඞ්ඛනය යන උපාසකවරු දෙදෙනෙක් අග්‍රඋපස්ථායකයාවන්නාහ. යසවතීය සඞ්ඛය, යන උපාසිකාවරු දෙදෙනෙක් අග්‍රඋපස්ථායිකාවන්නාහ. නාගවෘක්ෂයෙක් බොධිවන්නේය අටාසූරියන් උසබුද්ධශරීරය වන්නේය. බුද්ධප්‍රභාමණ්ඩලය පස්විසියොදුනක් තැන පැතිර සිටිනේය. අසූදහසක්අවුරුදු ආයුෂයවන්නේය යි, මෙසේ විවරණදී වදාරා සතුතිකොට උනස්නෙත් නැඟී ගඳකිළියට වන්සේක.

ඉක්බිත්තෙන් ඒ මහාපුරුෂයානන් වහන්සේ තුටුපහටු සිත් ඇතිව දිව්‍යමනුෂ්‍යයන් විසින් පුදනලදුව බුද්ධකාරකධර්මයන් පරීක්ෂාකරණසේක් දශපාරමිතාවන් දැක, අනුලෝම ප්‍රතිලෝමාදිවශයෙන් සම්මර්ශනය කෙරෙමින් දසදහසක්සක්වළ

කම්පිත කරවා මෙයින් අන්‍යවූ බුඞකාරකධම්මයෙක් නම් නැත යි, නිපඤාවට පැමිණ දසඤමාදෘනය කොට එතැන්පටන් සියලු ලොකවාසීසත්ත්වයන් අතුරෙන් එකී එකී සත්ත්වයක්හු නිසා කපක්මුළුල්ලෙහිත් නරකයෙහි පැසී දුකින් මුදමියි, මෙසේ පවත්නා කරුණාවශයෙන් එසේම සියලුසත්ත්වයන් චක්‍රවර්ති රාජ්‍යශ්‍රීහි පිහිටුවමියි, මෙසේ පවත්නා අනුදදයාවශයෙන් ද, සියලු සත්ත්වයන් වතීදුඃඛයෙන් මුදා අභීත්ඵලයෙහි පිහිටුව මියි, මෙසේ පවත්නා අනුකම්පාවශයෙන් ත්‍රිවිධසමාදානය සමා දන්ව ප්‍රමාණාතික්‍රාන්තවූ ජාතිකොටිශතසහස්‍රයක් මුළුල්ලෙහි පාරමිධම්මයන් පුරමින් ආසේක.

ඒ පාරමිතාවෝ නම් කවුරුද? ඒ පාරමිතාධම්මයන් කෙසේ පිරියයුතුද? යත්:

මහත්වූ බොධිසත්ත්වවරයන්ගේ උත්තමප්‍රතිපත්තිය මා විසින් කියනු ලබන්නීය. එකගවූසිත්ඇතිව සත්පුරුෂයෙනි! මනා කොට අසව්.

දානශීලාදිගුණවිශෙෂය හා යෙදීම හෙතුකොටගෙණ සත්‍වො තතම බැවින් උත්කෘෂ්ටමහාසත්ත්වයෝ නම් බොධිසත්ත්ව වරයෝය ඔවුන්ගේ ස්වභාවය හා දානාදික්‍රියාව පාරමිතා නම්වේ. ඒ පාරමිතාවෝ දශවිධවන්නාහ. කෙසේද? යත්:—භාග්‍යවත්වූ සියලු ධම්මයන් අනාවරණඥානයෙන් දත්තාවූ සර්වඥතාඥාන යෙන් දත්තාවූ නිකෙලශීවූ ඒ සම්‍යක්සම්බුදුරජාතන් වහන්සේ විසින්,

"විචිනනෙතා තදා දක්ඛිං පඨමං දානපාරමිං,
පුබ්බකෙහි මහෙසීහි අනුචිණ්ණං මහාපථං"

සනාදි ක්‍රමයෙන් දානපාරමිතාය- ශීලපාරමිතාය- නෛෂ්ක්‍ර ම්‍යපාරමිතාය-ප්‍රඥපාරමිතාය-වීර්‍ය්‍යපාරමිතාය- ක්ෂාන්තිපාරමිතා ය-සත්‍යපාරමිතාය- අධිෂ්ඨානපාරමිතාය- මෛත්‍රීපාරමිතාය- උපෙක්ෂාපාරමිතාය යන දශවිධපාරමිතාධර්මයන් දක්වා මෙයින් මත්තෙහි අතීතාදි කාලත්‍රයවර්තිවූ අන් බුඞකාරකධම්මයෙක් නම් නැතැයි සනිටුහන් කොට,

"එත්තකායෙව තෙලොකෙ යෙධම්මා බොධිපාචනා,
තදු'ඞං නත්ථි අඤඤත්‍ර දළ්හං තත්‍ර පතිට්ඨභ.

වදාරණලද බැවින්ද, "කතිනුඛො භනෙත බුඞකාරකාධම්මා දස ඛො සාරිපුත්ත බුඞකාරකාධම්මා කතමෙදස! දානං ඛො සාරි

පුත්ත බුද්ධකාරකො ධම්මො සීලංඛො සාරිපුත්ත බුද්ධකාරකො ධම්මො නෙක්ඛම්මංඛො සාරිපුත්ත බුද්ධකාරකොධම්මො පඤ්ඤා ඛො සාරිපුත්ත බුද්ධකාරකො ධම්මො විරියං ඛො සාරිපුත්ත බුද්ධ කාරකොධම්මො ඛන්තී ඛො සාරිපුත්ත බුද්ධකාරකොධම්මො සච්චං ඛො සාරිපුත්ත බුද්ධකාරකොධම්මො අධිට්ඨානං ඛො සාරිපුත්ත බුද්ධකාරකොධම්මො මෙත්තා ඛො සාරිපුත්ත බුද්ධකාරකො ධම්මො උපෙක්ඛා ඛො සාරිපුත්ත බුද්ධකාරකො ධම්මො ඉමෙඛො සාරි පුත්ත බුද්ධකාරකා ධම්මා''ති මෙසේ බුදුරජාණන්වහන්සේ මේ දසපාරමිතාව වදාළසේක. මෙසේ වදාරා එසින් මත්තෙහි,

"දානං සීලඤ්ච නෙක්ඛම්මං පඤ්ඤා විරියෙන පඤ්චමං,
ඛන්ති සච්චමධිට්ඨානං මෙත්තු'පෙක්ඛා'ති තෙදස."

වදාරණ ලද බැවින්ද,

"දසතො පාරමී නත්ථි දසතො නත්ථි ඌනකා,
අනූනානාධිකා සබ්බා පූරිතා දසපාරමී."

වදාරණ ලද බැවින් ද, ඒ පාරමීධර්මයෝ දශවිධවන්නාහ. සියලුම පාරමිතාවෝ සාමාන්‍යයෙන් මෙරමාට අනුග්‍රහකිරීම ස්වභාවකොට ඇත්තාහ. මෙරමාට උපකාරකිරීම හා විකල්ප සහිත බව කෘත්‍යකොට ඇත්තාහ. හිතෛෂීබව හා බුද්ධත්වයම නුවණට වැටහීම් කොට ඇත්තාහ. මහාකරුණාව හා කරුණෝපාය ප්‍රඥාව ආසන්නකාරණ කොට ඇත්තාහ. විශේෂයෙන් වූ කලි යම්දෙයකින් කරුණාව හා උපාය ප්‍රඥාවෙන් පිරිසිඳ ගත් කාලද ආත්මොපකරණ පරිත්‍යාගචේතනාව දානපාරමිතා නම් වේද,

කරුණාව හා කාරණප්‍රඥාවෙන් පිරිසිඳගත්තාලද කාය වාක් සුචරිතයද, කාරණහෙයින් අකර්තව්‍යයෙන් වැළකීම හා කර්තව්‍යය කරන්නාවූ චේතනාව සීලපාරමිතා නම් වේද,

කරුණාව හා උපායප්‍රඥාවෙන් පිරිසිඳ ගත්තාලද ආදීනවය දැක්මකොට ඇති කාමභවයෙන් නික්මෙන්නාවූ සිතිවිල්ල නෛෂ්ක්‍රම්‍යපාරමිතා නම් වේද,

කරුණාව හා කාරණප්‍රඥාවෙන් පිරිසිඳ ගත්තාලද ධර්මයන්ගේ සාමාන්‍යාවබොධ හා විශෙෂාවබොධය කිරීම ප්‍රඥාපාරමිතා නම් වේද,

කරුණාව හා උපායකෞශල්‍යඥානයෙන් පිරිසිඳගත්තාලද කායින් හා සිතින් මෙරමාට වැඩකිරීමට උත්සාහකිරීම වීර්‍ය පාරමිතා නම් වේද,

කරුණාව හා උපායප්‍රඥාවෙන් පිරිසිඳගත්තාලද සංස්කාර යන්ගේ අපරාධසහනයකිරීම හා අද්වේෂය ප්‍රධානකොට ඇති තදාකාරප්‍රවෘත්ත චිත්තොත්පාදය ක්ෂාන්තිපාරමිතා නම් වේද,

කරුණාව හා උපායප්‍රඥාවෙන් පිරිසිඳගත්තාලද විරතිචෙතනාදීන්ගේ භේදය නො වැරදීම සත්‍යපාරමිතා නම් වේද,

කරුණාව හා කාරණයෙහි දක්ෂව පවත්නා නුවණින් පිරිසිඳ ගත්තාලද අචලසමාදානයෙහි අධිෂ්ඨාන හා ඒ ඒ ප්‍රකාරයෙන් පැවැත්තාවූ චිත්තොත්පාදය අධිෂ්ඨානපාරමිතා නම් වේද,

කරුණාව හා උපායකෞශල්‍යඥානයෙන් පිරිසිඳගත්තාලද ලොවට හිත සැප එළවීම හා කාරණගෙසින් සියලු සත්ත්වයන් කෙරෙහි වෙෂනොකිරීම මෛත්‍රීපාරමිතා නම් වේද,

කරුණාව හා කාරණප්‍රඥාවෙන් පිරිසිඳගත්තාලද අනුනය ප්‍රතිඝය නැසීම හා ඉෂ්ටානිෂ්ටයෙහිත් සත්ත්වසංස්කාරයන් කෙරෙහිත් සමප්‍රවෘත්ති ඇති බව උපෙක්ෂාපාරමිතා නම් වේද,

එසේහෙයින් දානය වස්තුපරිත්‍යාගය ලක්ෂණකොට ඇත්තේය. දෙයධම්මයෙහි ලොභ නැසීම කෘත්‍යකොට ඇත්තේය. තමා අයත්බව නැතිකිරීම හා භවසම්පත්තිය නුවණට වැටහීම් කොට ඇත්තේය. පරිත්‍යාගකටයුතුවස්තුව ආසන්නකාරණ කොට ඇත්තේය. ශීලය ප්‍රතිෂ්ඨාව ලක්ෂණකොට ඇත්තේය. දුශ්ශීල බව නැසීම කෘත්‍යකොට ඇත්තේය. සුචිබව නුවණට වැටහීම් කොට ඇත්තේය. භය ලජ්ජා දෙක ආසන්න කාරණ කොට ඇත්තේය. "නෛෂ්ක්‍රම්‍යය" කාමයෙන් හා භවයෙන් නික්මීම ස්වභාවකොට ඇත්තේය. කාමය හා භවයෙහි ආදීනව ප්‍රකාශකිරීම කෘත්‍යකොට ඇත්තේය. ඒ කාමයෙන් හා භවයෙන් පරාඞ්මුඛව නික්මෙන බවක් මෙන් වැටහීම් කොට ඇත්තේය. චිත්තොත්‍රාසය හා ශරීරකම්පාව ආසන්නකාරණ කොට ඇත්තේය. "ප්‍රඥාව" දක්ෂවූ දුනුවායක්හු විසින් විදිනාලද ශර වෙගයක් මෙන් යථාස්වභාව ප්‍රතිවෙධය හා අස්ඛලිත ප්‍රතිවෙධය ලක්ෂණකොට ඇත්තේය. ප්‍රදීපයක් මෙන් අරමුණුව බැබලීම කෘත්‍යයකොට ඇත්තේය. අරණ්‍යගත සුදෙසිකයක්හු මෙන් නුමුලාවීම වැටහීම් කොට ඇත්තේය. සමාධිය හා චතුරාර්‍ය්‍යසත්‍යය ආසන්නකාරණ කොට ඇත්තේය. "වීර්‍ය්‍ය" උත්සාහ ස්වභාවකොට ඇත්තේය, උපස්තම්භකත්වය කෘත්‍ය කොට ඇත්තේය. නො පසුබැස්ම නුවණට වැටහීම් කොට ඇත්තේය.

අෂටවිංශතිවසත්‍වව හා සංවෙගය ආසන්නකාරණකොට ඇත්තේය. "ක්ෂාන්තිය" ඉවසීම ස්වභාවකොට ඇත්තේය. ඉෂ්ටානිෂ්ට සහනය කිරීම කෘත්‍යකොට ඇත්තේය. ඉවසීම වැටහීම් කොට ඇත්තේය. අවිරොධය හා තත්වූ පරිද්දෙන් දැන්ම ආසන්නකාරණකොට ඇත්තේය. "සත්‍යය" අවිසංවාදය ස්වභාවකොට ඇත්තේය. යථාස්වභාවය ප්‍රකාශකරණ බව කෘත්‍යකොට ඇත්තේය. සාධුබව වැටහීම්කොට ඇත්තේය. විනීතබව ආසන්නකාරණකොට ඇත්තේය. "අධිෂ්ඨානය" බොධිසම්භාරයෙහි පිහිටුවීම ස්වභාවකොට ඇත්තේය. ඒබොධිසම්භාරයන්ගේ ප්‍රතිපක්ෂධර්මයන් මැඩපැවැත්ම කෘත්‍යකොට ඇත්තේය. ඒබොධිසම්භාරයන් කෙරෙහි නිශ්චලබව වැටහීම් කොට ඇත්තේය. බොධිසම්භාරය ආසන්නකාරණ කොට ඇත්තේය. "මෛත්‍රාව" සත්‍වයන්ට හිතකරණයෙන් පවත්නාබව ස්වභාවකොට ඇත්තේය. සත්‍වයන්ට අභිවෘද්ධි එළවනබව හා ආඝාත දුරුකරණ බව කෘත්‍යකොට ඇත්තේය. සෞම්‍ය බව වැටහීම් කොට ඇත්තේය. සත්‍වයන්ට මනාපබව දක්වීම ආසන්නකාරණ කොට ඇත්තේය. "උපෙක්ෂාව" මධ්‍යස්ථාකාරයෙන් පවත්නා බව ස්වභාවකොට ඇත්තේය. සාධාරණකොට දක්ම කෘත්‍යකොට ඇත්තේය. අනුනය ප්‍රතිඝය සන්හිඳීම නුවණට වැටහීම්කොට ඇත්තේය. කුශලාකුශලකර්මය ස්වසන්තක බැවින් ප්‍රත්‍යවෙක්ෂාකිරීම ආසන්නකාරණ කොට ඇත්තේය. මෙහි මනුෂ්‍යාත්මභාවය ප්‍රධාන කොට ඇති අෂ්ටධර්මයන්ගේ සමොධානවසයෙන් ද, "බුද්ධො බොධෙය්‍යං" යනාදි මූලප්‍රණිධානවශයෙන් ද, පැවැත්තාවූ ප්‍රථම ප්‍රණිධානය සියලු පාරමිතාවන්ට ප්‍රත්‍යය වන්නේය. ඒ අභිනීහාර ප්‍රවෘත්තියෙන් මත්තෙහි සියලු පාරමිතාවන්ගේ සෙවීමය, නුවණට වැටහීමය, සමාදානය, අධිෂ්ඨානය, නිෂ්පත්තිය යන මේ සියල්ල මහාපුරුෂවූ බොධිසත්‍වවරයන්ට සම්භ වනහෙයින් මූලප්‍රාර්ථනාව දානශීලාදි සියලු පාරමිතාවන්ට ප්‍රත්‍යයවන්නේය. ප්‍රථම ප්‍රාර්ථනාව යම්සේ ප්‍රත්‍යයවේද, එපරිද්දෙන්ම මහාකරුණාව උපායප්‍රඥාවද සියලු පාරමීධර්මයන්ට ප්‍රත්‍යය වන්නේය. යම්සේ මහාපුරුෂයන්ට ආත්මසැපයෙහි නිරපෙක්ෂබවද, නිරන්තරයෙන් අනුන්ට වැඩකිරීමෙහි තත්පර බවද, නො කොටගත හැක්කාවූ මහාබොධිසත්‍ව චරිතයෙන් භෙදයක් නැති බවද, බොධිසත්‍වචරිතයෙහි ප්‍රසාදය ඇතිබවද, ප්‍රසාදය වැඩීමද සත්‍වයන්ගේ දර්ශනාවස්ථාවය- ශ්‍රවණාවස්ථාවය- අනුස්මරණාවස්ථාවය යන මේ ත්‍රිවිධාවස්ථාවෙහිම සත්‍වයන්ට හිතසැප එළවීමට කාරණබව සිද්ධවන්නේය. ඒ එසේමැයි:-

ප්‍රඥාවෙන් බුද්ධත්වය සිද්ධවන්නේය. කරුණාවෙන් බුද්ධකාරක ධර්මය සිද්ධවන්නේය. ප්‍රඥාවෙන් තුමූ සසරින් එතරවෙති. කරුණාවෙන් අනුන් එතරකෙරෙති. ප්‍රඥාවෙන් අනුන්ගේ දුක් පිරිසිඳ දකිති. කරුණාවෙන් අනුන්ගේ දුකට පිළියම් කරන්ට පටන්ගණිති. ප්‍රඥාවෙන් දුඃඛයෙහි කලකිරෙති. කරුණාවෙන් දුඃඛය පිළිගණිති. ප්‍රඥාවෙන් නිර්වාණයට අභිමුඛවන්නේය. කරුණාවෙන් නිර්වාණයට නො පැමිණෙන්නේය. කරුණාවෙන් සංසාරයට අභිමුඛවන්නේය. ප්‍රඥාවෙන් ඒසංසාරයෙහි නො ඇලෙන්නේය. ප්‍රඥාවෙන් හැමතන්හි විරක්තවන්නේය. කරුණාවෙන් අනුවපවත්නා ඥානයක් බැවින් හැමසත්ත්වයන්ට අනුග්‍රහ කිරීමෙහි නො පවත්නේ නො වෙයි. කරුණාවෙන් සියලු සත්ත්වයන්ට අනුකම්පාකරන්නේය. කරුණාව අනුව පවත්නා නුවණ බැවින් හැමසත්ත්වයන් කෙරෙහි නො ඇලුනාවූ සිත් ඇත්තේ නො වෙයි. ප්‍රඥාවෙන් මමය මාගේය යන්නක් නැති බව සිද්ධවන්නේය. කරුණාවෙන් කුසීතබව හා බැගෑබව නැති වීම සිද්ධවන්නේය. ප්‍රඥාවෙන් ආත්මස්වාමී බව සිද්ධවන්නේය. කරුණාවෙන් මෙරමාහට පිහිටබව සිද්ධවන්නේය. ප්‍රඥාවෙන් ධෛර්‍ය්‍ය ඇතිබව සිද්ධවන්නේය. කරුණාවෙන් වීර්‍ය්‍ය ඇතිබව සිද්ධවන්නේය. ප්‍රඥාවෙන් තමා නො තවන බව සිද්ධවන්නේය. කරුණාවෙන් අනුන් නො තවනබව සිද්ධවන්නේය. ප්‍රඥාවෙන් තමහට වැඩ සිද්ධවන්නේය. කරුණාවෙන් අනුන්ට වැඩ සිද්ධවන්නේය. ප්‍රඥාවෙන් නිර්භීය බව සිද්ධවන්නේය. කරුණාවෙන් සංසාරයෙහි නො ඇලෙනබව සිද්ධවන්නේය. ප්‍රඥාවෙන් ධර්මයට අධිපතිබව සිද්ධවන්නේය. කරුණාවෙන් ලොවට අධිපතිබව සිද්ධවන්නේය. ප්‍රඥාවෙන් කෙලෙහි උපකාරදන්නාබව සිද්ධවන්නේය. කරුණාවෙන් පූර්වෝපකාර ඇතිබව සිද්ධවන්නේය. ප්‍රඥාවෙන් මොහවිනාශය සිද්ධවන්නේය. කරුණාවෙන් තෘෂ්ණා විනාශය සිද්ධවන්නේය. ප්‍රඥාවෙන් විදශීතඥතාදිවිද්‍යා. සිද්ධවන්නේය. කරුණාවෙන් ප්‍රාතිමොක්ෂසංවරශීලාදි චරණසිද්ධිය වන්නේය. ප්‍රඥාවෙන් ශ්‍රද්ධාබලාදි දශබල සිද්ධිය වන්නේය. කරුණාවෙන් අනතරායකර ධර්මාදියෙහි වෛශාරද්‍යසිද්ධිය වන්නේය. සියලු පාරමිතාඵලයට විශෙෂයෙන් උපාය බැවින් ප්‍රඥා කරුණා දෙක සියලු පාරමිතාවන්ට ප්‍රත්‍යය වන්නේය. මේ කරුණා ප්‍රඥා දෙක වූකලී දානශීලාදි වූ සියලු දශපාරමිතාවන්ට මෙන් "බුද්ධො බොධෙය්‍යං"යනාදි මූලප්‍රාර්ථනාවටද ප්‍රත්‍යය වන්නේය.

තවද: "කතිනු බො භන්තෙ බුද්ධභූමියො? චතස්සො බො සාරිපුත්ත බුද්ධභූමියො, කතමා චතස්සො? උස්සාහො ච හොති විරියං උම්මඞ්ගො ච හොති පඤ්ඤාභාවනා අවත්ථානං ච හොති අධිට්ඨානං මෙත්තාභාවනා ච හොති හිතචරියා ඉමා බො සාරිපුත්ත චතස්සො බුද්ධභූමියො" යි. දක්වනලද උත්සාහාදි චතුර්විධ බුද්ධභූමීහුද, "නෙක්ඛම්මජ්ඣාසයා බොධිසත්තා කාමෙසු දොසදස්සාවිනො පවිවෙකජ්ඣාසයා බොධිසත්තා සඞ්ගණිකාය දොසදස්සාවිනො අලොභජ්ඣාසයා බොධිසත්තා ලොභෙ දොසදස්සාවිනො අදොසජ්ඣාසයා බොධිසත්තා දොසෙ දොසදස්සාවිනො අමොහජ්ඣාසයා බොධිසත්තා මොහෙ දොසදස්සාවිනො නිස්සරණජ්ඣාසයා බොධිසත්තා සබ්බභවෙසු දොසදස්සාවිනො" යි. දක්වනලද මහබෝසතුන්ගේ අදහස් සයද, "කතිනු බො භන්තෙ බොධාය චරන්තානං බොධිසත්තානං අජ්ඣාසයා? දස බො සාරිපුත්ත බොධාය චරන්තානං බොධිසත්තානං අජ්ඣාසයා? කතමෙ දස දානජ්ඣාසයා සාරිපුත්ත බොධිසත්තා මච්ඡෙරෙ දොසදස්සාවිනො සීලජ්ඣාසයා සාරිපුත්ත බොධිසත්තා අසංවරෙ දොසදස්සාවිනො -පෙ- උපෙක්ඛජ්ඣාසයා සාරිපුත්ත බොධිසත්තා සුඛදුක්ඛෙ දොසදස්සාවිනො ඉමෙ බො සාරිපුත්ත බොධාය චරන්තානං බොධිසත්තානං දසඅජ්ඣාසයා" යි. දක්වනලද මහාබොධිසත්ත්වයන්ගේ දානාධ්‍යාශයාදි දශවිධ අධ්‍යාශයද, දානශීලාදි සියලු පාරමිතාවන්ට ප්‍රත්‍යය වන්නේය. එසේම වස්තූන්ගේ අපරිත්‍යාගයෙහි ආදීනවය හා පරිත්‍යාගයෙහි අනුසස් දැක්ම දානාදි පාරමිතාවන්ට ප්‍රත්‍යය වන්නේය.

ඒ දානශීලාදියෙහි ප්‍රත්‍යවෙක්ෂාක්‍රමය මෙසේ දතයුතුය කෙසේ ද? යත්:-

ක්ෂෙත්‍රවස්තු, හිරණ්‍යසුවර්ණ, ගව, මහිෂ, දාසි, දාස, පුත්‍රදාරාදි වස්තුවෙහි ඇලුනාවූ සිත් ඇති සත්ත්වයන්ට ක්ෂෙත්‍රාදිය බොහෝදෙනා විසින් ප්‍රාර්ථනාකටයුතු බැවින්ද, රජ දරුවන් සොරුන් සතුරන් ආදීන්ට සාධාරණ බැවින්ද, විවාදයට පිහිටවන බැවින්ද, සතුරන් ඇතිවන බැවින්ද, නිස්සාර හෙයින්ද, වස්තුලැබ රක්ෂාකිරීම ඇතිකල්හි අනුන්ට පීඩාවට කාරණහෙයින්ද, විනාශයට කාරණහෙයින්ද, ශොකාදිය ඇති කල්හි අනෙකප්‍රකාරදුක් එළවන හෙයින්ද, ඒ වස්තුවෙහි ඇලුම් මූලකාරණකොට ඇති මාත්සර්‍ය්‍යමලයෙන් වෙළඳනාලද සිත් ඇති සත්ත්වයන්ට අපායොත්පත්තිය වනහෙයින් දූ යි මෙසේ මේ අනීය නම්:-අනෙකප්‍රකාරවූ බොහෝ අවැඩ එළවන්නේය.

එසේහෙයින් ඒ වස්තූන්ගේ පරිත්‍යාගය කිරීම බලවත්වූ අභිවෘද්ධියකැ යි, වස්තුපරිත්‍යාගයෙහි අප්‍රමාද කටයුත්තේය.

තවද, වස්තුව ඉල්වන්නාවූ යාචකතෙමේ තමාගේ රහස ප්‍රකාශකොට කියන හෙයින් මට බලවත්විශ්වාස ඇත්තේය යි කියාද, හැරයායුතුවූ තොප සන්තක වස්තු පරලොවට ඇරගණ යවයි කියන හෙයින් මට උපදෙස් කියන්නාවූ කල්‍යාණමිත්‍රයෙකැ යි කියාද, ගිණිගෙණ දිලියෙන්නාවූ ගෙයක් මෙන් මරණාග්නියෙන් දිලිහෙන්නාවූ ලොකයෙහි එයින් මා සන්තකවස්තුව පිටත්කරන්ට සහායවන යහළුවෙකැයි කියාද, පිටත්කළ වස්තුව නො නස්නා පරිද්දෙන් නිධාන කොට තබන්ට ස්ථානව සිටියේ යයි කියාද, දානසඞ්ඛ්‍යාත කුශලකර්මයෙහි සහායවන බැවින්ද, සියලුසම්පත්තීන්ට අග්‍රවූ අතිදුර්ලභ බුද්ධභූමියෙහි සියලු ලොකොත්තර සම්පත්තියට කාරණ බැවින්ද, ඉල්වන්නාවූ යාචක උත්කෘෂ්ටවූ කල්‍යාණමිත්‍රයෙකැයි සැලකිය යුත්තේය.

තවද: මේ යාචකයා විසින් මම බලවත්වූ කාරියෙකින් සම්භාවනා කරණ ලද්දෙම් වෙමි. ඒ දානක්‍රියාවේහි ඒසම්භාවනා මා විසින් නො වරදවා කටයුතුය යි කියාද, ඒකාන්තයෙන් නස්නා සුලුවූ ජීවිතය යාචකයන් නො ඉල්වූවත් මා විසින් දියයුතුය. ඉල්වූ කල්හි කැලම දියයුතුය යි කියාද, උත්තමාධ්‍යාශය ඇති සත්ත්වයන් විසින් යාචකයන් සොයා ඇවිදත් දන් දියයුතුය. මාගේ කුශලයෙන් යාචකයා තෙමේම සමීපයෙහි පැමිණියේයයි කියාද, යාචකදානව්‍යාජයෙන් මටම අනුග්‍රහ කරන්නේය යි කියාද, මෙපරිද්දෙන්ම මේ සියලු ජනයා මා විසින් අනුග්‍රහ කටයුත්තේය යි කියාද, යාචකයක්හු නැතිකල්හි මාගේ දානපාරමිතාව කෙසේනම් පිරේද්ද යි කියාද, යාචකයන් නිසාම මා විසින් සියලු වස්තු සොයා තබියයුත්තේය යි කියාද, නො ඉල්වාම මා සන්තක වස්තුව යාචකයෝ තුමූ කවරකලක ඇරගණිද්දෝහෝයි කියාද, කෙසේ නම් මම යාචකයන්ට ප්‍රියවෙම්ද, මනවඩම්ද, ඒ යාචකයෝත් මට කෙසේ නම් ප්‍රියවෙද්ද, මන වඩද්දැයි කියාද, කෙසේ නම් මම දන්දෙමින් සිටත් දන්දී අනන්තයෙහිත් සතුටුවෙම්ද, බලවත්ව හටගත්තාවූ ප්‍රීතිසෞමනස්‍යයෙන් කෙසේ නම් ඔදවැඩි සිත් ඇතිවෙද්දැයි කියාදැයි උදාරවී බලවත්වූ දානාධ්‍යාශය ඇත්තෝය යි මට යාචකයෝ කෙසේවූ සිතිවිලි සිතද්ද, නො ඉල්විය දී මම යාචකයන්ගේ අදහස් දැන කෙසේ නම් සිත් පිනවා දන්

දෙම්දූයි කියාද, වස්තුවත් යාචකයනුත් ඇති කල්හි දන් නො දීමෙන් මට බලවත්ව තිඳු ඔස් උපදනේය යි කියාද, කෙසේ නම් මම මාගේ හස්තපාදාදි අවයවයන් හා ජීවිතය යාචකයන්ට පරිත්‍යාග කෙරෙම්දූයි කියාද සැලකියයුත්තේය.

තවද, මේ අඣයනම්:—යම්සේ හබැළිපණුවා නිරපෙක්‍ෂවූ බෙපහයා අනුව යේද, එපරිද්දෙන්ම නිරපෙක්‍ෂවූ දායකයා අනුව යන්නේයයි අඣිනිරපෙක්‍ෂතාවෙහි සිත් ඉපදවිය යුත්තේය. ඉල්වන්නාවූ සත්ත්ව වූකලි ඉදින් ප්‍රියපුද්ගලයෙක් වී නම් ප්‍රියපුද්ගලයා මා අතින් ඉල්වන්නේයයි සොම්නස් ඉපදවිය යුත්තේය. ඉදින් ඉල්වන්නාවූ සත්ත්ව තමහට උදාසීන පුද්ගලයෙක් වී නම් මා අතින් මේ වස්තු ඉල්වන තැනැත්තේ එකාන්තයෙන් මේ වස්තු පරිත්‍යාගය නිසා මට මිත්‍රවන්නේයයි සොම්නස් ඉපැදවිය යුත්තේය. දන්දෙන්නාවූ දායක තෙමේ බොහෝ යාචකයන්ට ප්‍රියවන්නේය. ඉදින් වෛරී පුද්ගලයෙක් ඉල්වා නම් පසමිතුරා මා අතින් ඉල්වන්නේයයි විශෙෂයෙන් සොම්නස් ඉපැදවියයුත්තේය. මෙසේ ප්‍රිය පුද්ගලයා කෙරෙහි මෙන් මධ්‍යස්ථ පුද්ගල වෛරී පුද්ගලයන් කෙරෙහිදු මෛත්‍රී පූර්වඞ්ගමකොට ඇති කරුණාව එළවාම දියයුත්තේය. ඉදින් ලොභය බොහෝ කලක් පුරුදුව ආබැවින් ඒබොධිසත්ත්වයන්ට දෙයධර්මය විෂයකොට ඇති බලවත් ලොභධර්මයා උපදීනම් ඒ බොධිසත්ත්ව ප්‍රතිඥ ඇත්තහු විසින් මෙසේ සැලකියයුත්තේය. කෙසේද? යත්: සත්පුරුෂයාණෙනි! සම්‍යක් සම්බොධිය ප්‍රාර්ථනාකරන්නාවූ තොප විසින් සියලු සත්ත්වයනට උපකාර පිණිස මේ ශරීරය හරණලද්දේ නොවේ ද? ඒශරීර පරිත්‍යාගයෙන් උපන්නාවූ කුශලයත් හරණලද්දේ නොවේද? එසේ වූ තොපට බාහ්‍යවස්තුවෙහි ඇල්ම ඉපදවී නම් ඇතුන්ගේ නැමක් හා සමවන්නේය. එසේහෙයින් තොප විසින් කිසිවස්තුවෙක ඇල්ම නො ඉපැදවිය යුත්තේය. යම්සේ අටගෙණ සිටි මහත්වූ බෙහෙත් රුකකින් මුල් කැමැත්තෝ මුල්ගෙණයෙද්ද, ගැට කැමැත්තෝ ගැට ගෙණයෙද්ද, සුඹුළු කැමැත්තෝ සුඹුළුගෙණයෙද්ද, කඳ කැමැත්තෝ කඳ ගෙණයෙද්ද, වෙළෙප් කැමැත්තෝ වෙළෙප් ගෙණයෙද්ද, අතුකැමැත්තෝ අතුගෙණයෙද්ද, කොළකැමැත්තෝ කොළගෙණයෙද්ද, මල්කැමැත්තෝ මල් ගෙණයෙද්ද, ඵලකැමැත්තෝ ඵලගෙණයෙද්ද, මාසනානකදෙය මේ සත්ත්වයෝ ගෙණ යෙතියි ඒබෙහෙත්රුකට කිසි විරොධ කල්පනාවක් නො වේද, එපරිද්දෙන්ම සියලු ලෝවැස්සන්ට

වැඩ පිණිස වීර්ය කරන්නාවූ මා විසින් දක්වූ කෙලෙහිගුණ නො දන්නාවූ හැම කල්හිම අපවිත්‍රවූ ශරීරය අනුන්ට උපකාර පිණිස පමුණුවනකල්හි ස්වල්පමාත්‍රවූ මමය මාගේයයි යන සිතිවිල්ලක් නො ඉපදවිය යුත්තේය. එකාන්තයෙන් බිඳෙන්නාවූ විසිරෙන්නාවූ නැසෙන්නාවූ ස්වභාව ඇති මේ අධ්‍යාත්මික බාහ්‍ය මහාභූතරූපයන් කෙරෙහි වෙනස කවරේද, මේ මාගේය මම නම් මේ ආත්මයය මේ මාගේ ආත්මය යන යම් මේ සිතිවිල්ලෙක් ඇත්නම්; එතෙමේ හුදක් මෝහයෙන් පැලඹීම පමණෙක් වන්නේය. එසේහෙයින් බාහ්‍යවස්තූවෙහි මෙන් අධ්‍යාත්මිකවූ හස්තපාද නේත්‍රාදියෙහිද, මාංසරුධිරාදියෙහිද, අපේක්ෂාවක් නැතිව ඒ හස්තපාදදිවූ සියල්ල කැමැති කැමැති කෙණෙක් ගෙණයෙත්වයි හරණලද සිත් ඇතිවිය යුත්තේය.

මෙසේ සලකන්නාවූ සම්‍යක්සම්බෝධියට මෙහෙයනලද සිත් ඇති කායජීවිතයෙහි අපේක්ෂාවක් නැති ඒ බෝධිසත්ත්වයන්ට නිරායාශයෙන්ම කායවචොමනඃ කර්මය විශෙෂයෙන් පිරිසිදුවන්නේය. පිරිසුදුවූ කායවාක්ප්‍රයොග ඇති, පිරිසුදුවූ ආජීව ඇති, ඒමහාබෝධිසත්ත්ව තෙමේ ත්‍යාග ප්‍රතිපත්තියෙහි පිහිටුවා අලමතා දෙය යයි නුවණින් හා ගතමනාදෙය යයි නුවණින් යුක්තව වඩවඩා දෙයධර්ම පරිත්‍යාගයෙන් හා අභයදාන ධර්මදානයෙන් සියලුසත්ත්වයන්ට අනුග්‍රහකරන්ට සමර්ථ වන්නේය. මේ වූකලි දානපාරමිතාවෙහි ප්‍රත්‍යවෙක්ෂාක්‍රම වන්නේය.

ශීලපාරමිතාවෙහි ප්‍රත්‍යවෙක්ෂාක්‍රම කෙසේ ද? යත්:—මේ ශීලය නම්:-ගඞ්ගා, යමුනා යනාදි පඤ්චමහාගඞ්ගාවන්ගේ ජලයෙන් හා සමුද්‍රයෙහි ජලයෙන් සුඩකරන්ට නොපිළිවන් වෛෂමලය පිරිසිදුකරන්නාවූ ජලයක් හා සමානවන්නේය. රත්වන් සඳුන් ගෝසී සඳුන් ආදිවූ ශීතල ද්‍රව්‍යයෙන්. දුරුකරන්ට නොපිළිවන් රාගාදි පරිලාහය සන්හිඳුවන්නාවූ ශීතල ද්‍රව්‍යයෙක මුත්හර ඔටුනු මිණිකොඬොල් ආදිවූ බොහෝ ජනයා සැරහෙන්නාවූ ආභරණයට වඩා අසාධාරණවූ සත්පුරුෂයන්ගේ සැරහීමට අලඞ්කාර විශෙෂයෙක.

තවද: ශීලය නම්: සියලුදිග හමනහෙයින් සඳුන්ආදි කිසිවෙකින් නො කරණලද හැමකලට සුදුසුවූ සුගන්ධද්‍රව්‍යයෙක. ක්ෂත්‍රිය මහාසාරය, බ්‍රාහ්මණ මහාසාරය ගෘහපති මහාසාරය, යනාදිවූ සියලු මනුෂ්‍යයන් විසින්ද, දිව්‍යබ්‍රහ්මාදි සියලු දෙවියන් විසින්ද,

වැදීම පිදීම ආදිය එළවන හෙයින් උත්කෘෂ්ටවූ වශීකරණමන්ත්‍රයෙක. චාතුම්මහාරාජිකාදි සදිව්‍යලෝකයට නැගෙණ පිණිස ලන ලද හිණිපෙතිපඞ්ක්තියක් හා සමාන වන්නේය. ප්‍රථමධ්‍යානාදි අෂ්ටසමාපත්තිය හා ඍද්ධිවිධාදි පඤ්චාභිඥාවට පැමිණීමට උපාය වන්නේය. නිර්වාණ නැමැති මහපුරයට පමුණුවන්නාවූ මාර්ගයක්හා සමානවන්නේය. ශ්‍රාවකසම්පත්තිය–ප්‍රත්‍යෙකබොධිසම්පත්තිය–සම්‍යක්සම්බොධිසම්පත්තිය යන මේ ත්‍රිවිධසම්පත්තීන්ගේ පිහිටීමට ආධාරභූමියක් හා සමාන වන්නේය. යමක් සිතුවොත් පැතුවොත් ඒ ඒ දෙය සමෘද්ධවන්ට උපායක් බැවින් මේ ශීලය චින්තාමාණික්‍යකල්පවෘක්ෂාදියත් ඉක්ම පවත්නේය.

එසේ හෙයින් වදාරණලදි:–"ඉජ්ඣිස්සති භික්ඛවෙ සීලවතො චෙතො පණිධි විසුද්ධත්තා"යි. "ආකඞ්ඛෙය්‍ය චෙ භික්ඛවෙ භික්ඛු සබ්‍රහ්මචාරීනං පියො චස්සං මනාපො ගරුච භාවනීයොති සීලෙසෙවස්ස පරිපූරකාරී" යනාදීන්ද, "අවිප්පටිසාරත්ථානි ඛො ආනන්ද කුසලානි සීලානි" යනාදීන්ද, "පඤ්චිමෙ ගහපතයො ආනිසංසා සීලවතො සීලසම්පදාය" යනාදීන් ද වදාරණලද පාලිවශයෙන් ශීලයෙහිගුණ විශෙෂයෙන් සැලකිය යුත්තේය.

තවද අග්ගික්ඛන්ධොපමසූත්‍රාදීන්ගේ වශයෙන් ශීලවිනාශයෙහි ආදීනවද සැලකියයුත්තේය. සීලය නම්:—ප්‍රීතිසෞමනස්‍යය එළවන්ට කාරණහෙයින්ද, අත්තානුවාදභය–පරානුවාදභය–දණ්ඩභය–දුර්ගතිභයාදිය නසන හෙයින්ද, නුවණැත්තන් විසින් ප්‍රශංසාකටයුතු බැවින්ද, විපිළිසර නොවීමට කාරණහෙයින්ද, ලෞකිකලෝකෝත්තර සම්පත් සඞ්ඛ්‍යාත අභිවෘද්ධි එළවන හෙයින්ද, කුලසම්පත්තිය–ධනසම්පත්තිය–අධිපතිසම්පත්තිය–රූපසම්පත්තිය–ස්ථානාන්තරසම්පත්තිය–බන්ධුසම්පත්තිය–මිත්‍රසම්පත්තිය යන මේ සියලුසම්පත්තීන් මැඩපවත්නාහෙයින්ද, සීලය උතුම්වූ ගුණඇත්තේයයි සැලකිය යුත්තේය.

තවද සිල්වත්හට තමාගේ ශීලසමෘද්ධිය නිසා මාවිසින් එකාන්තයෙන් කුසල්කරණලද කල්‍යාණවූ ක්‍රියාවක් කරණලද; භය පරිත්‍රාණයක් කරණලදැයි, මහත්වූ ප්‍රීතිසෞමනස්‍යය උපදනේය. තවද සිල්වත්හට "කච්චිනු ඛො මම අත්තා සීලතො න උපවදතීති"යි යුබැවින්ද, "කච්චිනු ඛො මං අනුවිච්ච විඤ්ඤූ සබ්‍රහ්මචාරී සීලතො න උපවදන්තී"යි යුබැවින්ද, අත්තානුවාදභය–පරානුවාදභය නැත්තේය. දණ්ඩභය–දුර්ගතිභය දෙක කැලම

නැත්තේය. සිල්වත්වූ පුද්ගල කලණවූ ධර්මයන් ඇත්තේයයි විඥයන් විසින් ප්‍රශංසා කටයුතුවන්නේය. තවද මාවිසින් එකාන්තයෙන් පාපයෙක් කරණලද රෞද්‍රවූ ක්‍රියාවෙක් කරණ ලද, කලුෂධර්මයෙක් කරණලදයි, දුස්සීලයහට යම් විප්‍රතිසාරයෙක් උපදීනම් ඒ සිත්කලකිරීම සිල්වත්හට නූපදනේය. තවද මේ ශීලයනම්:—අප්‍රමාදයට කාරණ හෙයින්ද, ඥාතිව්‍යසන-භොග ව්‍යසන-රොගව්‍යසනාදිය දුරුකරන්ට කාරණ හෙයින්ද, මහත් වූ වැඩ සාදනහෙයින්ද, අභිවෘඩිකාරණ බැවින්ද, උතුම්වූ මඟු ලක් හා සමාන වන්නේය. සිල්වත්වූ හීනජාතික සත්ත්වයෙකුත් ක්‍ෂත්‍රියමහාසාරාදීන් විසින් පිදියයුතු වන්නේය. ශීලසමෘඩිය කුලසම්පත්තිය මැඩපවත්නේය. තවද සොරුන්-සතුරන්-රජ දරුවන්-වෛයන්-මියන්-ගිනි-දිය ආදිවූ සියල්ලට අසාධාරණ හෙයින්ද, මිය පරලොව යන්නහු අනුව යන හෙයින්ද, මහා ඵල මහානිසංස ඇතිවන බැවින්ද, සමථවිදර්ශනාදි ගුණයන්ට පිහිටවන බැවින්ද, ශීලධනය බාහ්‍යධනය මැඩ පවත්නේය. උත්කෘෂ්ටවූ අනිමා ලඝිමාදිවූ චිත්තන ඓශ්වර්‍ය්‍යයට පිහිට වන බැවින් ශීලය ක්‍ෂත්‍රිය බ්‍රාහමණාදීන්ගේ ඓශ්වර්‍ය්‍ය මැඩපවත් නේය. ඒ ඒ සත්ත්වනිකායෙහි සත්ත්වයන්ගේ ඓශ්වර්‍ය්‍යය ශීල යම කාරණකොට ඇත්තේය.

"යොච වස්සසතං ජීවෙ දුස්සීලො අසමාහිතො
එකාහං ජීවිතං සෙය්‍යො-සීලවන්තස්ස ඣායිනො"

යුබැවින් දුශ්ශීල පුද්ගලයාගේ සියක්අවුරුදු ජීවත්වීමටත් වඩා සිල්වත්පුද්ගලයාගේ එකදවසකුත් ජීවත්වීම උතුම් වන් නේය. ශික්‍ෂාප්‍රත්‍යාඛ්‍යාතය කළ පුද්ගලයාගේ ජීවත්වීමට වඩා මරණම උතුම්වන්නේය යි, වදාළ බැවින් ශීලය ජීවිතයට වඩා විශිෂ්ටතර වන්නේය. වෛරීන්ටත් මනොඥබව ඵලවන බැවින්ද, ජරාරොග විපත්තියෙන් මැඩපැවැත්ත නොහැකි බැවින්ද, ශීලය රූපසම්පත්තිය ඉක්මපවත්නේය. ප්‍රාසාද-මණ්ඩ ප-කූටාගාර-සඳලු-මඩු ආදි ස්ථාන විශෙෂයන්ද, රජ—යුවරජ—සෙනෙවිරත් ආදිස්ථානාන්තර විශෙෂයන්ද ශීලය මැඩපවත්නේ ය සැපවිශෙෂයට පිහිටවන බැවින්ද, එකාන්තයෙන් වැඩසිඩක රණ හෙයින්ද, පරලොව යන්නහු අනුව යන හෙයින්ද, ස්වභාව යෙන් සෙනහිව අත්පා මෙහෙවර කරන්නවුන්ද, බන්ධුජනයන් හා මිත්‍රයන්ද, ශීලය ඉක්ම පවත්නේය.

එයින් වදාළහ. බුදුහු

"න තං මාතා පිතා කයිරා අඤ්ඤෙවා පිච ඤාතකා
සම්මා පණිහිතං චිත්තං සෙය්‍යසො නං තතො කරෙයි"

තවද හස්ති-අශ්ව-රථ-පදාති සඞ්ඛ්‍යාත චතුරඞ්ගිනී සේනාවෙන්ද, මන්ත්‍රෞෂධාදිවූ නොයෙක් ශාන්ති විධියෙන්ද, ආරක්‍ෂාව නොකට හැකි බැවින් ආත්මාධීන හෙයින්ද, අපරාධීන හෙයින්ද, මහත්වූ විෂය ඇතිබැවින්ද, ශීලයම විශිෂ්ටතර වන්නේය. එසින් වදාළහ බුදුහු:-

"ධම්මො හවෙ රක්ඛති ධම්මචාරිං
ධම්මො සුචිණ්ණො සුඛමාවහාති,
එසානිසංසො ධම්මෙ සුචිණ්ණෙ
නදුග්ගතිං ගච්ඡති ධම්මචාරී"යි.

මෙසේ ශීලය අනෙකප්‍රකාර ගුණයෙන් සමන්විතය යි සලකන්නාවූ පුද්ගලයාහට අසම්පූර්ණවූ ශීලය සම්පූර්ණබවට පැමිණෙන්නේය. නොපිරිසුදුවූ ශීලය පිරිසුදුවන්නේය. ඉදින් ඔහට බොහෝකලක් අභ්‍යාසයෙන් ශීලයට විපක්‍ෂවූ රාගද්වේෂාදි අකුශලධර්මයෝ අතරතුරෙහි උපදනාහු වීනම් ඒ බොධිසත්ත්වප්‍රතිඥ ඇත්තහු විසින් මෙසේ සැලකියයුත්තේය. කෙසේද? යත්:-

සත්පුරුෂය! තා විසින් සම්‍යක්සම්බොධිඥතය ප්‍රාර්ථනාකරණලද. ශීලපූරණයක් නැතිව ලෞකික සම්පත්තියටත් පැමිණෙන්ට නොපිළිවන, ලොකොත්තර සම්පත්තියට පැමිණෙන්ට කැලම නොපිළිවන. සියලු සම්පත්තීන්ට අග්‍රවූ සම්‍යක්සම්බොධියට පිහිටවූ ශීලයෙන් උත්කෘෂ්ටවූ බවට පැමිණිය යුතුනොවේද, එසේ හෙයින්.

"කිකීව අණ්ඩං චමරීව වාලධිං
පියංව පුත්තං නයනංව එකකං,
තථෙව සීලං අනුරක්ඛමානකා
සුපෙසලා හොථ සදා සගාරවා"යි.

යනාදීන් වදාරණලද ක්‍රමයෙන් මනාකොට ශීලසංරක්‍ෂණය කරන්නාවූ තොප විසින් ඉතා ප්‍රියශීලී වියයුතුය. තවද තොප විසින් ශ්‍රාවකයානය- ප්‍රත්‍යෙකබුඞයානය- සම්‍යක්සම්බුඞයානය යන ත්‍රිවිධයානයෙහි ධර්මදෙශනාවෙන් ඇතුලත්කිරීම හා ශීල-සමාධි-ප්‍රඥවෙන් මිහිකිරීම කටයුත්තේය. අපථ්‍යසෙවනය කරන්නාවූ පුරුෂයක්හට වෙදකු කරණ පිළියමක් මෙන් දුශ්ශීලපුද්ගලයාගේ වචනය සාරකොට නොගතයුත්තේය. එසේ හෙයින් මම කෙසේ නම් ඇදහිලි කටයුතුව සත්ත්වයන්ගේ ත්‍රිවිධවූ බොධියට ඇතුළත් කිරීම හා ශීල-සමාධි-ප්‍රඥවන්ගේ මිහි

කිරීම් කෙරෙම්දැයි, සවභාවයෙන් පිරිසුදු සිල් ඇතිවිය යුත්තේය. කිසිම ධ්‍යානාදි ගුණවිශෙෂයක් හා යෙදීම හෙතුකොට ගෙණ මාගේ සත්ත්වයන්ට උපකාර කරන්ට සමර්ථබවද, ප්‍රඥාපාරමිතාදීන්ගේ පිරීමද, ධ්‍යානාදිවූ ගුණධර්මයෝද ශීලපාරිශුද්ධිය නැතුව නොවන්නාහුයයි, මනාකොට ශීලය පිරිසුදු කට යුත්තේය.

තවද ගිහිගෙයි විසීම නම්:—ඉතා අවුල්වන්නේය ප්‍රව්‍රජ්‍යාව නම්:—රාජපථයක් හා සමාන වන්නේය යනාදීන් ගිහිගෙයි ආදීනවද, පඤ්චකාමයනම්:—ඇටසැකිල්ලකට බදුවූ උපමාඇත්තේය යනාදීන් කාමයෙහි ආදීනවද, පුරුෂයෙක් නයගෙණ වෙළඳුම්ආදිවූ ඒ ඒ කාරියෙහි යොදද යනාදින් කාමච්ඡන්දයෙහි ආදිනව දක්වීම පෙරදැරිකොට ප්‍රව්‍රජ්‍යාව නම්:–අභ්‍යවකාශයක් හා සමානවන්නේය. යනාදීන් පැවිදිවීමෙහි අනුසස් සැලකිම් වශයෙන් නෛෂ්ක්‍රම්‍ය පාරමිතාවෙහි ප්‍රත්‍යවෙක්ෂා කටයුත්තේය.

තවද ප්‍රඥාව නැතිව දානාදි කුශලධර්මයෝ පිරිසුදු නොවන්නාය. තමන් තමන්ගේ ක්‍රියාසිද්ධියෙහි සමර්ථ නො වන්නාහයි ප්‍රඥාවෙහි ගුණ සිහිකටයුත්තේය. යම්සේ ජීවිතය නැතිව ශරීර යන්ත්‍රය නොහොබීද, සථාන නිෂණ්ණාදිවූ ඒ ඒ ක්‍රියාවෙහි යෙදෙන්ට අසමර්ථවේද, යම්සේ චක්ෂුරාදිවූ පඤ්චෙන්ද්‍රියයෝ විඥානය නැතිව තමන් තමන්ගේ විෂයෙහි දර්ශනශ්‍රවණාදි කෘත්‍යයකරන්ට අසමර්ථවෙද්ද එපරිද්දෙන්ම ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයෝ ප්‍රඥාව හැර සව කෘත්‍යප්‍රතිපත්තියෑ අසමර්ථවන්නාහයි, ප්‍රඥාව පරිත්‍යාගප්‍රතිපත්තියෙහි ප්‍රධානකාරණයක් වන්නේය. දල්වනලද ප්‍රඥාඇමැති ඇස්ඇති, මහාබොධිසත්ත්වවරයෝ තමන්ගේ හස්තපාදාදිවූ අඞ්ගපරිත්‍යාග කොටත් ආත්මොත්කර්ෂය නොකෙරෙති. මෙරමා හට නින්දාත් නොකෙරෙති. බෙහෙත් රුකක් මෙන් විකල්පරහිත වන්නාහ. අතීතාදි කාලත්‍රයෙහිම හටගත්තාවූ සොම්නස් ඇති වනනාහ. ප්‍රඥාවශයෙන් උපායකෞශල්‍යඥානය හා යෙදීම හෙතු කොට ගෙණ පරිත්‍යාගය පරහිතප්‍රවෘත්තියෙන් දානපාරමිතාවට පැමිණෙන්නේය. තමා සඳහා භවභොගසම්පත් කැමැතිව දේ නම් 'යම් සේ වැට තෙල් ඇතතාක් පහණදිලියේද ඒ නැතිවිටම නිවේද, එපරිද්දෙන්ම කර්මශක්තිය ඇතිතාක්කල් විපාකදෙයි. ඒකර්මශක්තිය නැතිවිටම විපාක නොදෙන්නේය. මෙරමාට වැඩසඳහා දුනාදන වූකලි දානපාරමිතාභාවයට පැමිණ තුන්බොධියෙන එක්තරා බොධියක් දීමීස නො නවත්නේය. තවද ප්‍රඥාව

නැතිකල්හි තෘෂ්ණා-දෘෂ්ටි-මානාදි සංක්ලේශධර්මයන්ගේ නො නැසීම හෙතුකොට ගෙණ ශීලවිශුද්ධිය නොවන්නේය. ශීලවිශුද්ධිය නැතිකල්හි සර්වඥගුණයට පිහිටිබවක් කැලම නොවන්නේය. නුවණැත්තාවූ සත්පුරුෂයාට ගිහිගෙහි විසීමෙහි පඤ්චකාමගුණයෙහි සංසාරයෙහි ආදීනව හා ප්‍රව්‍රජ්‍යාවෙහි-ධ්‍යානසමාපත්තියෙහි-නිර්වාණයෙහි අනුසස් මනාකොට සලකන්නේ පැවිදිව ධ්‍යාන-සමාපත්ති උපදවා නිර්වාණයට යන්නාවූ සිත් ඇතිව අවශෙෂ සත්ත්වයනුත් ඒ ධ්‍යානසමාපත්ති ආදීයෙහි පිහිටුවන්නෙය. වීර්‍ය්‍යයත් ප්‍රඥාවත් නැතිව නුවණින්යුත් වීර්‍ය්‍යයක් නොවන බැවින් කැමැත්ත සිද්ධකොටගත නොහෙන්නේය. ප්‍රඥාවෙන් යුක්තනොවී කරන්නාවූ කාරියටත් වඩා නොකොට තබාපීමම උතුම්වන්නේය. ප්‍රඥාසහිතවීර්‍ය්‍යයෙන් කරන්ට පටන්ගත් කාර්‍ය්‍යයෙක් උපායෙන් යුක්තව කරණහෙයින් අතුරෙහි තිබී නොගොස් වහා සමෘද්ධවන්නේය. තවද නුවණැති පුද්ගලයාම අනුන් විසින් කරණ අනුපකාරාදි සහනය කරන්නේය. අප්‍රාඥසත්ත්වයා ඇසිල්ලකුත් නො ඉවසන්නේය. බලවත් ප්‍රඥා නැති සත්ත්වයාට මෙරමා විසින් කරණ ලද අපරාධ ක්ෂාන්තියට ප්‍රතිපක්ෂවම මතුමත්තෙහි වැඩෙන්නේය. නුවණැත්තාවූ සත්ත්වයාට අනුන් විසින් කරණ ලද අපරාධ ක්ෂාන්තියම මතුමත්තෙහි අභිවෘද්ධි කිරීම්වශයෙන් සම්පිරවිය පිණිස පවත්නේය. තවද ප්‍රඥාවෙන්ම වාක්සත්‍යය, විරතිසත්‍යය, පරමාර්ථසත්‍යය යන ත්‍රිවිධසත්‍යය ද, ඒ ත්‍රිවිධසත්‍යයන්ගේ උත්පත්තිකාරණ ද, ඔවුන්ට ප්‍රතිපක්ෂධර්මයන් ද, තත්වූපරිද්දෙන් දැන මෙරමාට වඤ්චාකොට වරදවා නො කියන්නේය. ප්‍රඥාබලයෙන් තමා උපස්තම්භ කොට ධෛර්‍ය්‍යසම්පත්තියෙන් සියලු පාරමිතාවෙහි අචලසමාදානයෙන් පිහිටන්නේය. තවදඃ ප්‍රඥාවෙන් ම ප්‍රිය මධ්‍යස්ථ වෛරී පුද්ගලයන් කෙරෙහි විභාගයක් නො කොට හැමසතුන් කෙරෙහි මෛත්‍රී එළවන්ට සමර්ථ වන්නේය. තවද, ප්‍රඥාවශයෙන් ලාභය-අලාභය-අයසය-යසය-නින්දා-ප්‍රශංසා-සුඛය-දුක්ඛය යන අෂ්ටලොකධර්මය තමහට පැමිණි කල්හි එහි නිර්විකාරීව මධ්‍යස්ථ වන්නේය. මෙසේ සියලුම පාරමිතාවන්ට ප්‍රඥාවම නිර්මල කාරණයෙනැයි ප්‍රඥාගුණය ප්‍රත්‍යවෙක්ෂා කටයුත්තේය.

තවදඃ ප්‍රඥාව නැතිව ප්‍රථමමාර්ගසම්පත්තියක් නොවන්නේය. දෘෂ්ටිසම්පත්තියත් නො වන්නේය. ශීලසම්පත්තියත් නොවන්නේය. ශීලදෘෂ්ටිසම්පත්තිය නැත්තාහට සමාධිසම්පත්තියත්

හැග්තේය. චිත්තසමාධිය කරන්ට අසමර්ථවූ පුද්ගලයා විසින් මාර්ගඵලාදි ආත්මහිතමාත්‍රයකුත් සිඩ කරන්ට නො පිළිවන. උත්කර්ෂයට පැමිණියාවූ පරහිතය කැලම සිඩකරන්ට නො පිළි වන් වන්නේයයි පරහිතප්‍රතිපත්තියෙහි යෙදෙන්නාවූ තොප විසින් සකස් කොට ප්‍රඥාව පිරිසුදුකිරීමෙහි අභ්‍යාස කටයුත්තේ යයි බොධිසත්ත්වයන් තමන් තමන්ට අවවාද කටයුත්තේය.

තවද: ප්‍රඥානුභාවයෙන් මහාබොධිසත්ත්වයෝ සත්‍යාධිෂ්ඨානය, ත්‍යාගාධිෂ්ඨානය, උපසමාධිෂ්ඨානය, ප්‍රඥාධිෂ්ඨානය යන චතුරධිෂ්ඨානයෙහි පිහිටා දාන, ප්‍රියවචන, අර්ථචරියා, සමානාත්මතාය යි කියනලද සතරසංග්‍රහ වස්තුවෙන් ලොවට අනුග්‍රහ කෙරෙමින් සත්ත්වයන් නෛර්‍යාණික මාර්ගයට ඇතුළත්කරන්නාහුය. ඒසත්ත්වයන්ගේ ශ්‍රඩාදි ඉන්ද්‍රියනුදු මුහුකුරුවන්නාහුය. තවද: ප්‍රඥාබලයෙන් රූපස්කන්ධය, වෙදනාස්කන්ධය, සංඥාස්කන්ධය, සංස්කාරස්කන්ධය, විඥානස්කන්ධය යන පඤ්චස්කන්ධයෙහිද, චක්ඛායතනය, සොතායතනාදි වාදසායතනයෙහි ද, චක්ඛුධාතු සොතධාතු ආදිවූ අෂ්ටාදශධාතුයෙහි ද, විහිවිද පවත්නා තුවන ඇතිව "අවිජ්ජාපච්චයාසංඛාරා" යනාදීන් දක්වනලද සංසාර ප්‍රවෘත්තිය හා "අවිජ්ජානිරොධා සංඛාරනිරොධො" යනාදීන් දක්වනලද සංසාරනිරොධය තත්වූ පරිද්දෙන් දැන දනාදි ගුණයන් විශෙෂයෙන් අභිවෘඩිකර බවට පමුණුවමින් බොධිසත්ත්වචරිතය සම්පූර්ණව කරන්නේය. යනාදීන් අනෙකප්‍රකාරයෙන් ප්‍රඥාගුණය මනාකොට සලකා ප්‍රඥාපාරමිතාව වැඩිය යුත්තේය.

තවද: පෙණෙන්නාවූ තිෂ්ඨාඇති ලෞකිකසත්ත්වයන් විසින් කලමනාවීර්‍ය්‍ය හීනවීර්‍ය්‍ය පුද්ගලතෙමේ කොටිනිමවාගත නො හෙන්නේය. දෘඪවීර්‍ය්‍ය ඇති දුක්පරීක්ෂා නො කරන්නාවූ පුද්ගලයාම පටන්ගත් කාරිය අතුරෙහි නො තබා කොට සමෘඩ කරන්නේය. තවද: හීන වීර්‍ය්‍ය සත්ත්ව තෙම සංසාර නැමැති මහවතුරෙන් සියලු සත්ත්වයන් එතර කෙරෙමි යි තිස්තරණයට පටන් ගැන්ම අසමර්ථවන්නේය. මධ්‍යමපුද්ගල පටන් ගෙණ අතුරෙහිම නිමාවට පැමිණෙන්නේය. උත්කෘෂ්ටවීර්‍ය්‍ය ඇති පුද්ගලවූ කලි ආත්මසැපයෙහි අපෙක්ෂාවක් නැතිව සසරසයුරෙන් එතර කරන්ට සිතූ සත්ත්වයන් පරතෙරට පමුණුවාම නිෂ්ඨාව දක්නේය යි වීර්‍ය්‍යසම්පත්තිය ප්‍රත්‍යවෙක්ෂා කටයුත්තේය. තවද: රාගාදිවූ දෙදෂසමූහයන් මදනැගි ඇතුන් පරිද්දෙන් නො වැදී

කිය හැකි බැවින්ද, ඒ රාගාදීන් මුල්කොට ඇති පාපකර්මයන්ගේ සමාදානය හිසගසන්නට ඔසවාගත් කඩු ඇති වධකපුරුෂයක්හු හා සමාන බැවින්ද, ඒ පාපකර්මය කාරණ කොට ඇති නරකාදි සතර අපාය හැමකල්හිම හලදොරව තිබෙන හෙයින් ද, ඒ අකුශලකර්මයෙහි යොදන්නාවූ පාපමිත්‍රයන් හැමකලම සමීපයෙහි ගැවසී ගෙණ සිටින හෙයින් ද, ඒ පාපමිත්‍රයන් නිවා කාරණ බැවින් අකුශලවිපාක එලවූ පෘථග්ජනබව ඇතිකල්හි සංසාරදුඃඛයෙන් තමාම මිදීයන්ට වටනේය, යන මිථ්‍යාවිතර්කීය වීර්‍යානුභාවයෙන් දුරුවන්නේයයි කියාද, ඉදින් ආත්මාධීන වීර්‍යයෙන් සම්‍යක්සම්බොධියට පැමිණෙන්ට පිළිවන් වී නම් එබඳු වූ වීර්‍ය කිරීමෙහි දුෂ්කර කවරේ ද? යනාදි ක්‍රමයෙන් වීර්‍ය ගුණය ප්‍රත්‍යවේක්ෂා කට යුත්තේය.

තවද: මේ ක්ෂාන්තිය නම්:-නිරවශෙෂ ගුණයට ප්‍රතිපක්ෂවූ ක්‍රොධය නසන හෙයින් ගුණසමෘධිය කිරීමෙහි සත්පුරුෂජනයන්ට තියුණුවූ ආයුධයක් හා සමාන වන්නේය. සතුරන් මැඩ පැවැත්මෙහි සමර්ථයන්ට සැරසීමක් හා සමාන වන්නේය. ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට බලසමෘධියක් හා සමානවන්නේය, ක්‍රොධ නැමැති වන්හිය නැසීමට ජලධාරාවක් හා සමාන වන්නේය. සුන්දරවූ කීර්තිඝොෂයට උත්පත්තිවේෂයක් හා සමානවන්නේය. පාපී පුද්ගලයන්ගේ වචන නැමැති විෂය නැසීමට මනොෟෂධයක් හා සමාන වන්නේය. සංවරයෙහි පිහිටියවුන්ට උත්කෘෂ්ටවූ වීර්‍යප්‍රකෘතියෙක් වන්නේය. ගම්භීර ප්‍රකෘති ඇතිබැවින් සමුද්‍රය හා සමානවන්නේය. වෛෂ නැමැති සාගරයට වෙරළක් හා සමාන වන්නේය. අපායෙහි දොරකඩ වැසීමට දොරපෝරුවක් හා සමාන වන්නේය, දිව්‍යබ්‍රහ්මලොකයට නැගීමට හිණක් හා සමාන වන්නේය, සිය ගුණයන්ගේ විසීමට භූමියක් හා සමාන වන්නේය, උතුම්වූ කාය-වාක්-මනඃ යන වාරත්‍රය පිරිසුදුකිරීමෙකැයි සැලකියයුත්තේය.

තවද මේ ලොකයෙහි සත්ත්වයෝ ක්ෂාන්තිසම්පත්තිය නැති බැවින් සන්තාපකරවූ ක්‍රොධධර්මය අනුව ගිය බව හෙතුකොට ගෙණ මෙලොවත් පරලොවත් නැවුලියට පැමිණෙන්නාහුය. ඉදින් මෙරමාට අනුපකාරයට කාරණවූ දුක් උපදීනම් ඒ දුඃඛයට ක්ෂෙත්‍රවූ ආත්මභාවයද, ඊට බීජුවටක් වැනිවූ කර්මයද, මා විසින්ම ඇතිකරණ ලදැයි කියාද, එම දුකට මේ ක්ෂාන්තිය දරදී නොවෙයි කියාද, අනුපකාර කරන්නක්හු නැතිකල්හි කෙසේ

නම් මට ක්‍ෂාන්තිසම්පත්තිය ලැබේදැයි කියාද,සැලකියයුත්තේය. ඉදින් දූන් මේ තෙම මට අනුපකාරී නමුත් පෙර මොහු විසින් මට මෙනම් උපකාරයෙක් කරණ ලද්දේවේදැයි අපකාරයම හෝ ක්‍ෂාන්තියට කාරණ බැවින් උපකාරී වන්නේයයි කියාද, මේ සියලුසත්ත්වයෝ මට පුත්‍රයන් හා සදෘශ වෙති. දරුවන් විසින් කරණලද අපරාධයකට කවරෙක් නම් කිපේදැයි කියාද, යම් ක්‍රොධය නැමැති යක්‍ෂාවේෂයකින් මේ පුද්ගලයා මට අපරාධ කරන්නේවීනම් ඒ ක්‍රොධය නැමැති යක්‍ෂාවෙසය මා විසින් දුරුකරන්ට යුත්තේයයි කියාද, යම් අපකාරයක් හේතු කොට ගෙණ මට මේ දුක්උපදින්නේ වී නම් අනුපකාරයටම මම කාරණ වෙමියි කියාද, යම් ධර්මකෙනකුන් කාරණ කොට ගෙණ අපරාධ කරණලද්දේ ද, යමක්හු විෂයෙහි අපරාධ කරණ ලද්දේද, ඒ සියල්ලෝ එකෙණෙහිම නිරුද්ධවූහ. දූන් වූ කලි මේ ක්‍රොධය කවුරුන් විෂයකොට කරන්නාවූ ක්‍රොධයෙක්දැයි සියලු ධර්මයන් ක්‍ෂණයෙක ඉපද නස්නා බැවින් කවරෙක් කවරක් හට අපරාධ කෙරේදැයි කියාද, ප්‍රත්‍යවෙක්‍ෂාකරන්නහු විසින් ක්‍ෂාන්තිසම්පත්තිය වැඩියයුත්තේය.

ඉදින් මෝහට බොහෝ කලක් පුරුදුවීමෙන් පරොපකාරය නිමිත්තකොට ඇති ක්‍රොධස සිත වැලද සිටිනේ වී නම් මෙසේ සැලකිය යුත්තේය.

කෙසේ දැ? යත්:-

මේ ක්‍ෂාන්තිය නම්:- අනුන් කළ අනුපකාරයට ප්‍රතිපක්‍ෂ ප්‍රවෘත්තියෙක, පරොපකාරය වර්ධනයකිරීමට නිසි උපකාරයෙක් නො වන්නේයයි කියාද, අපකාරයම මට දුක්ඉපදවීමෙන් සැදූ ඉපදවීමට හා සියලු ලොකයෙහි අනභිරති සංඥවට ප්‍රත්‍යය වන් නේයයි කියාද යන මේ ඉෂ්වා නිෂ්ට රූපාදි ආලම්බනය හා සංයොගයෙක් ඇත්නම් එතෙමේ චක්‍ෂුරාදි ඉන්ද්‍රියයන්ගේ ස්වභාව කෘත්‍යයෙක් වන්නේය. ඒ අනිෂ්ටවූ රූපාදි ආලම්බනයන් හා සංයොගය මට නො වන්නේය යන යම් සිතිවිල්ලෙක් ඇත්නම් එතෙමේ එකාන්තයෙන් එසේවූ සිතිවිල්ලම නො ලැබිය හැක් කේයයි කියා ද, ක්‍රොධවශයට පැමිණියාවූ සත්ත්වයා ක්‍රොධ යෙන් උන්මාදයට හා වික්‍ෂෙපයට පැමිණියේය, එසේවූ ක්‍රොධී සත්ත්වයා විෂයෙහි ප්‍රත්‍යුපකාර කිරීමෙන් ප්‍රයෝජන කවරේදැයි කියාද, මේ සියලු සත්ත්වයෝ සර්ඥයන් වහන්සේ විසින් ඖරස පුත්‍රයන් මෙන් රක්‍ෂාකරණ ලද්දූහ. එසේ හෙයින් එසේවූ

සත්ත්වයන් විෂයෙහි මා විසින් චිත්තකොපය නොකට යුත්තේයයි කියාද, අපරාධයත් ගුණයත් සම්ක්ෂට ඇත් නම් අපරාධය දුරුකොට ගුණවත්වූ මොහු කෙරෙහි මා විසින් කොප නො කටයුත්තේය යි කියාද, ගුණයක් නැතිකල්හි දයාකටයුතු හෙයින් කොපයෙන් මාගේ ගුණ හා යසස් පිරිහෙන්නේයයි කියාද, ක්‍ෂාන්ති වැඩිය යුත්තේය.

"එසින් වදාළහ බුදුහු:-"

> "අග්ගීව තිණකට්ඨස්මිං කොධො යස්ස පවඩ්ඪති
> නිහීයති තස්ස යසො කාළපක්ඛෙ ‘ව චන්දිමා"යි.

තවද කිපීමෙන් දුර්වර්ණදුඃඛශය්‍යාදිවූ සතුරන් සිත් පිණවන මිතුරන් සිත් තතවන අමනොඥස්වරූප පැමිණෙන්නේ යයි කියාද, ක්‍රොධය නම්: සියලු අවැඩට කාරණවූ සියලු වැඩ නසන්නාවූ බලවත් පසමිතුරෙකැයි කියාද, ක්‍ෂාන්ති ඇතිකල්හි සතුරුව සිටිනා කිසිකෙනෙක් නැතැයි කියාද, අපරාධ කළ එකක්හු විසින් තමා කළ අපරාධය කාරණකොට මත්තෙහි ලැබියුතු දුඃඛයට ක්‍ෂාන්තිය උපන් කල්හි එදුක් නො වන්නේ යයි කියාද, කිපෙන්නාවූ මා විසින් පසමිතුරාම අනුවර්තනය කරණලද්දේය යි කියාද, මා විසින් ක්‍ෂාන්තියෙන් ක්‍රොධය මැඩ පැවැති කල්හි ඒ ක්‍රොධයට දූස පසමිතුරා මනාකොට මඩනා ලද්දේය යි කියාද, ක්‍රොධයට කාරණවූ ක්‍ෂාන්තිගුණය හැරීම මට සුදුසු නො වෙයි කියාද, ගුණවිනාශය කරන්නාවූ ක්‍රොධය ඇති කල්හි මට ශීලසමාධ්‍යාදිවූ ගුණධර්මයෝ කෙසේ නම් පිරෙද්දැයි කියාද, ඒ ශීලාදිවූ ගුණධර්මයන් නැති කල්හි කෙසේ නම් මම සත්ත්වයන්ට උපකාර බහුලව ප්‍රතිඥානුරූප උතුම් බුදුබවට පැමිණෙම්දැයි කියාද ක්‍ෂාන්තියෙහි අනුසස් සැලකිය යුත්තේය.

තවද: ක්‍ෂාන්තිය ඇතිකල්හි සිතට වික්ෂෙපයක් නැති බැවින් එකඟවූ සිත්ඇත්තාහට සියලු සංස්කාරධර්මයෝ අනිත්‍යහෙයින් දුඃඛහෙයින් අනාත්මහෙයින් ද, නිර්වාණධර්මය අසංස්කෘතාමෘත ශාන්තප්‍රණීතාදි භාවයෙන්ද, අචින්ත්‍ය අප්‍රමෙයවූ මහිම ඇති බුද්ධධර්මයෝ අප්‍රමෙයාදිභාවයෙන්ද වැටහෙන්නාහ. එසේ හෙයින් මාර්ගානුලොමවූ ක්‍ෂාන්තියෙහි පිහිටියේ මේ සියලු සංස්කාරාදීහු ආත්ම ආත්මීය බවක් නැත්තාහු ධර්මමාත්‍රව තමන් තමන්ගේ ප්‍රත්‍යයෙන් උපදනාහුද, නස්නාහුද වෙති. කිසි

තෙනෙකින් නො එති, කිසි තෙනෙක නො පිහිටති. මේ ධර්ම්යන් අතුරෙහි කිසිවෙක් කිසිවක්හුගේ කාර්ය්‍යයෙහි ව්‍යාවෘත නො වන්නේය. මමය, මාගේය යන අහඞ්කාර මමඞ්කාරයට පිහිට නො වන බව නුවණට වැටහෙන්නේය.

තවද: යම් වැටහීමක් නිසා බොධිසත්ත්වයෝ සම්‍යක්සම්බොධියට නියතව නැවත පසුබස්නාවූ සවභාවයක් නැතිවෙද්ද, යනාදීන් ක්ෂාන්තිපාරමිතාවෙහි ප්‍රත්‍යවෙක්ෂාව දතයුත්තේය. තවද සත්‍යය නැතිව ශීල-සමාධි-ප්‍රඥ ආදිවූ ගුණධර්මයන්ගේ ලැබීමක් නැති හෙයින්ද, සත්‍යය නැතිව ප්‍රතිඥාවට සුදුසුවූ ප්‍රතිපත්තියෙහි පිහිටීමක් නැතිහෙයින්ද, සත්‍යධර්මය ඉක්ම පැවැති කල්හි සියලු පාපධර්මයන් අවුත් වදනා බැවින්ද, සත්‍යය උතුම් වූ ගුණ ඇත්තේය යි මෙනෙහි කටයුත්තේය. එයින් වදාළහ බුදුහු:—

“එකං ධම්මං අතීතස්ස මුසාවාදිස්ස ජන්තුනො,
විතිණ්ණ පරලොකස්ස නත්ථි පාපං අකාරියං.”

තවද අසත්‍යයෙන් ඔවුනොවුන් සඞ්ඛාතය කරන්නාවූ පුද්ගලයාගේ වචනය, කාරියට ඇදහිලි නො කළහැකි බැවින් ද, මත්තෙහිත් සත්පුරුෂයන් පිළිබඳ කාරියකට ඔහුගේ බස් නො ගත හැකිහෙයින්ද, සත්‍යසමාදානය ඇත්තාහට ශීලසමාධ්‍යාදි සියලුගුණයන් පිහිටවන බැවින්ද, සත්‍යාධිෂ්ඨානයෙන් සියලු බොධිසම්භාරධර්මයන් පිරිසුදුව සම්පූර්ණබවට පැමිණෙන හෙයින්ද, සත්‍යධර්මය නො වැරදවී මෙන් සියලු බොධිසම්භාරකෘත්‍යය සමෘඬ කරණ හෙයින්ද, සත්‍යධර්මයෙන්ම බොධිසත්ත්ව ප්‍රතිපත්තිය නිෂ්ඨාවට පැමිණෙන හෙයින්ද, යනාදීන් සත්‍යපාරමිතාවෙහි ආනිසංසසමෘඬිය ප්‍රත්‍යවෙක්ෂා කටයුත්තේය.

තවද දානාදියෙහි දෘඪසමාදානයක් නැතිව ඒ දානාදීන්ට ප්‍රතිපක්ෂධර්මයන් සන්තානයෙහි රුස්වූ කල්හි නිශ්චලව පිහිටීමක් නැතිව ඒ අචලාධිෂ්ඨානයෙහි දෘ ධීරවීරභාවයක් නැතිව දානාදිවූ බොධිසම්භාරධර්මයෝ සම්‍යක්සම්බොධියට කාරණ නො වන්නාහුය. යන මේ ආදි ක්‍රමයෙන් අධිෂ්ඨානපාරමිතාවෙහි ගුණ සැලකිය යුත්තේය.

තවද ආත්මහිතමාත්‍රයෙක පිහිටන්නහු විසිනුදු සත්ත්වයන් කෙරෙහි මෛත්‍රීසිතක් නැතිව ඓහලෞකිකසම්පත්තියට පැමිණෙන්ට නො පිළිවන් වන්නේය. සියලු සත්ත්වයන් නිර්වාණ

සම්පත්තියෙහි පිහිටුවන්ට සිතන්නහු විසින් සත්ත්වයන් නැතිව කැලම සියලුසම්පත්තියට පැමිණෙන්ට නො පිළිවන් වන්නේය යි කියා ද, පසුව සියලු සත්ත්වයන්ට ලොකොත්තර සම්පත්තිය කැමැත්තහු විසින් දූන් ලෞකිකසම්පත්තියෙහි ආකාඞ්ක්ෂාව සුදුසු ය යි කියා ද, දූන් ආසාපමණෙකින් මෙරමාට හිතසැප එළවන්ට අසමර්ථවූයෙම් වී නම් කවරකලෙක ප්‍රයොගශක්තීන් ඒ හිතසැපය සිඬකෙරෙම් දූයි කියාද, දූන් මාවිසින් ඉහාත්මභාවයෙහි සැපඑළවීමෙන් වර්ධනය කරණලද්දහු පසුව මට ධර්මසංවිභාගයට සහාය වන්නෝ වේදූයි කියාද, මේ සියලු සත්ත්වයන් නැතිව මට බොධිසම්භාරධර්මයෝ සමහ නොවන්නාහුයැයි කියාද, එසේහෙයින් සියලු සර්වඥගුණවිභූතිය සිඬකරන්ට කාරණ බැවින්ද, මේ සියලු සත්ත්වයෝ මට උතුම්වූ කුශලක්ෂෙත්‍රයෙක, නිරුත්තරවූ කුශල නැමැති රත්නයන්ට ආකරයෙක, උතුම්වූ ගෞරවස්ථානයෙකැයි කියා ඉතා විශෙෂකොට සියලු සත්ත්වයන් කෙරෙහි හිතාධ්‍යාශය එළවිය යුත්තේය. බොහෝ කොට කීමෙන් ප්‍රයෝජන කිම්ද? කරුණාවට පිහිට බැවින්ම සියලු සත්ත්වයන් කෙරෙහි මෛත්‍රීවර්ධනය කටයුත්තේය. නිරවධිව පවත්නා මෛත්‍රී සිතින් සියලු සත්ත්වයන් කෙරෙහි හිතසැප එළවීමට නිරතවන්නාහට ඒ සත්ත්වයන්ගේ චිත්තසන්තාපය කරන්නාවූ දුක් දුරුකරණු කැමැති බලවත්වූ මෛත්‍රී උපදනේය. ස්ථිරවූ මුල් ඇති කරුණාව සියලු බුඬකාරකධර්මයන්ට ප්‍රථමක්‍රියාවෙක, පාදයෙක, ප්‍රතිෂ්ඨාවෙක, මූලකාරණයෙක, උපායමාර්ගයෙක, යන මේ ආදි කාරණයෙන් මෛත්‍රියෙහි ගුණ සැලකිය යුත්තේය.

තවද: උපෙක්ෂාව නැති කල්හි සියලු සත්ත්වයන් විසින් කරණලද විප්‍රකාරය සිතට විකාර උපදවන්නේය. චිත්තවිකාරය ඇතිකල්හි දානශීලාදි බොධිසම්භාර ධර්මයන්ගේ ලැබීමෙක්ම නැතැයිකියාද, මෙත්තා-කරුණා-මුදිතා-සඞ්ඛ්‍යාත සෙනාගෙන් පිණවන ලද සිත්හි උපෙක්ෂාව නැතිව බොධිසම්භාරයෙන් පිරිසුදු බවෙක් නොවන්නේය යි කියාද, උපෙක්ෂා නැත්තේ බොධිසම්භාරයෙහි කුශලසම්භාරය හා එහි විපාකය හා සත්ත්වයන්ට වැඩ පිණිස පිරිනමන්ට අසමර්ථ වන්නේය යි කියාද, උපෙක්ෂාව නැතිකල්හි දායක-ප්‍රතිග්‍රාහක දෙදෙනා කෙරෙහි වෙනසක් නැතිකොට වස්තුපරිත්‍යාගය කරන්ට නොපිළිවන් වන්නේයයි කියාද, උපෙක්ෂාව නැති කල්හි ජීවිතප්‍රවෘත්තියට සුදුසු වස්තූන්

ගෙන් ජීවිතයෙහිත් අන්තරායසිහිනොකොට සිල්පිරිසුදුකරන්ට නො පිළිවනැයි කියාද, උපෙක්ෂාවශයෙන්ම වස්තුයෙහි ඇල්ම නොඇල්ම සඟනය කරන්නාහටම නෛෂ්කර්ම්‍යබලය සිඬවන හෙයින්ද, උත්පත්තිහෙයින් බැලීම් වශයෙන්ම බොධිසම්භාර කෘත්‍යය සමෘඬවන හෙයින්ද, අධිකවීර්‍ය්‍ය ඇත්තාහට උපෙක්ෂා නො කිරීමෙහි වීර්‍ය්‍යකෘත්‍යය ඔලිනව කරණ හෙයින්ද, උපෙක්ෂාවෙන් ශුක්කතයහටම ක්‍ෂමාචිත්තතාව සම්භවන හෙයින්ද, උපෙක්ෂා වශයෙන්ම සත්ත්වසංස්කාරයන් නො වරදවා කියන හෙයින්ද අෂ්ටලොකධර්මයන්ට උපෙක්ෂාවීමෙන් තමා විසින් සමාදන්වන ලද සියලු ධර්මයෙහි නිශ්චලපිහිටීම සිඬවන හෙයින්ද, පරොපකාරාදියෙහි අනාභොග වශයෙන්ම මෛත්‍රී පාරමිතාව සිඬවන හෙයින්ද, සියලු බොධිසම්භාරධර්මයන්ගේ සමාදානය-අධිෂ්ඨානය-පරිපූර්ණය-නිෂ්පත්තිය යන මේ සියල්ල උපෙක්ෂානුභාවයෙන්ම සමෘඬවන්නේය යන මේ ආදික්‍රමයෙන් උපෙක්ෂාපාරමිතාව ප්‍රත්‍යවෙක්ෂා කටයුත්තේය.

මෙසේ අපරිත්‍යාග පරිත්‍යාගාදියෙහි ක්‍රමයෙන් ආදීනවානෘශංස ප්‍රත්‍යවෙක්ෂාකිරීම දානාදි සියලු පාරමිතාවන්ට ප්‍රත්‍යයෙකැයි දතයුත්තේය.

තවද: මේ දශපාරමිතාවන් අතුරෙහි මේ දානයෙන් මම සියලු සත්ත්වයන්ට ආයුෂය-වර්ණය-සැපය-බලය-නුවණය යන මේ ආදීන්ගේ සමෘඬියද, සිත්කළුවූ අභීෂ්ටඵලසම්පත්තියද, සමෘඬ කෙළෙම් වීනම් යහපත් වන්නේය යි සිතා ඒ මහාබෝධිසත්ත්ව තෙම ආහාරදානය දෙන්නේය. සත්ත්වයන්ගේ කාමක්ලෙශ තැමැති පිපාසා සන්හිඳුවනු පිණිස පානවර්ගය දන් දෙන්නේය, රන්වන්වූ ශරීර සමෘඬිය පිණිස හා හයලජ්ජාදෙකට අලඞ්කාර පිණිස වස්ත්‍ර දන්දෙන්නේය. සෘඬිවිධඥතාදීන්ගේ නිෂ්පත්තිය හා නිර්වාණසැපසිඬවන පිණිස යානවාහන දන් දෙන්නේය. සර්වඥශීලසුගන්ධයාගේ නිෂ්පත්තිය පිණිස සුවඳ දන්දෙන්නේය. සර්වඥගුණශොභාව සිඬවන පිණිස සුවඳමල් සුවඳවිලවුන් දන්දෙන්නේය. බෝමඬ වජ්‍රාසනය ලබනු සඳහා ආසන දන්දෙන්නේය. සිංහශය්‍යාවෙන් සැතපීම ලබනු සඳහා ආස්තරණාදි ශය්‍යාවන් දන්දෙන්නේය. පසළොස්චරණධර්මයන්ගේ නිෂ්පත්තිය පිණිස වාසාගාරයන් දන්දෙන්නේය.

මසැස-පැණැස- බුදුඇස- දිවඇස- සමතැස යන පසැස් ලබනු සඳහා පහන්තෙල් පහන්කඩ ආදිය දන්දෙන්නේය. ව්‍යාමප්‍රභාමණ්ඩලය ලබනු සඳහා රූපදානයද, බ්‍රහ්මස්වර විශුද්ධවන්නාවූ ධර්මදෙශනාව නිසා ශබ්දදානයද, සියලු ලෝකවාසී සත්ත්වයන්ට ප්‍රියබව නිසා රසදානයද, සර්වඥසුඛුමාල බව පිණිස ප්‍රෂ්ටව්‍යදානයද දෙන්නේය. මත්තෙහි මරණ නැතිවන පිණිස බෙහෙත් දන්දෙන්නේය. කෙලෙශ නැමැති දසත්වයෙන් මිදෙන පිණිස දසයන් නිදහස් කරන්නේය. සද්ධර්මයෙහි බලවත්වූ ඇල්ම සඳහා නිරවද්‍යවූ ක්‍රීඩාභාණ්ඩ දන්දෙන්නේය. සියලුම සත්ත්වයන් ආර්‍යජාතියෙන් තමහට පුත්‍රභාවයට පැමිණෙනු සඳහා දරුවන් දන්දෙන්නේය. සියලු ලොවට ස්වාමිබවට පැමිණෙනු සඳහා දරයන් දන්දෙන්නේය. සුන්දරවූ සුප්‍රතිෂ්ඨිත පාදාදි පුරුෂලක්ෂණ සම්‍ෘද්ධිය සඳහා රන්, රිදී, මුතු, මැණික්, පබළු ආදිය දන්දෙන්නේය. අසූ අනුව්‍යඤ්ජන සමෘද්ධිය ලබනු සඳහා අනෙකප්‍රකාර ආභරණ දන්දෙන්නේය. සද්ධර්ම නැමැති භාණ්ඩාගාරය ලබනු පිණිස මුතු, මැණික් ආදී සැපත් පිරුණු බඩහල් දන්දෙන්නේය.

ධර්මරාජ්‍යය ලබනු සඳහා රාජ්‍යය දන්දෙන්නේය ධ්‍යාන සමාපත්ති ආදීන්ගේ සමෘද්ධිය සඳහා අරම්, උයන් ආදිවූ තපොවනයන් දන්දෙන්නේය. චක්‍රලක්ෂණයෙන් චිත්‍රිතවූ පාදයෙන් බෝමඬට එළඹෙනු සඳහා පාදයන් දන්දෙන්නේය. කාමෞඝාදි චතුරෞඝයෙහි ගැලී පීඩන්නාවූ සත්ත්වයන්ට සද්ධර්ම නැමැති හස්තය දික්කොට ගොඩ නගනු පිණිස හස්තයන් දන්දෙන්නේය. සද්ධෙන්ද්‍රියාදීන්ගේ ප්‍රතිලාභය පිණිස කන්නාසා ආදිය කපා දන්දෙන්නේය. සමතැස් ලබනු පිණිස ඇස් උපුටා දන්දෙන්නේය. දර්ශනය-ශ්‍රවණය-අනුස්මරණය-අත්පා මෙහෙවර කිරීමය යන මේ ආදියෙන් හැමකල්ම සියලු සත්ත්වයන්ට හිතසැප එළවන්නාවූ සියලු ලෝවැස්සන් විසින් සම්පයව පැමිණ ජීවත්වියහැක්කාවූ මාගේ ශරීරය සියලු සත්ත්වයන්ට ප්‍රයොජන වේවයි කියා, මස් ලේ ආදිය දන්දෙන්නේය. සියලු ලොකවාසී සත්ත්වයන්ට උතුම්වෙම්වයි කියා ඉස් දන්දෙන්නේය.

මෙසේ දන්දෙන්නාවූ ඒ මහාබොධිසත්ත්වයෝ වූකලි එක් විසි අන්වෙෂණයන් අතුරෙන් එක්තරා එසාකින් තුසුදුසු පරිද්දෙන් ප්‍රත්‍යය උපදවාගෙණ නොදෙන්නාහ. මෙරමාට හිංසාපීඩා කොටත් නොදෙන්නාහ. භයිනුත් නොදෙන්නාහ. ලජ්ජාවෙනුත්

නොදෙන්නාහ. දක්ෂිණාර්හ පුද්ගලයන් සොයාත් නො දෙන්නාහ ප්‍රණීතාහාරය ඇතිකල්හි කටුකාහාරය දන් නොදෙන්නාහ. තමන් උසස්කරණු සඳහාත් නො දෙන්නාහ. මෙරමාට නින්දා කරණු සඳහාත් නො දෙන්නාහ. කුශලඵලා පෙක්ෂාවෙනුත් නො දෙන්නාහ. යාචකයන්ගේ නින්දා සඳහාත් නොදෙන්නාහ. නිරාදරයෙනුත් නො දෙන්නාහ. වැළි කෙසේදන්දෙද්ද යත්:—

සකස්කොට දෙන්නාහ. යුක්තප්‍රාප්තකාලයෙහි දෙන්නාහ. එසින් වදාළහ බුදුහු.

"පඤ්චිමානි භික්ඛවෙ කාලදානානි කතමානිපඤ්ච? ආගන්තුකස්ස දානං දෙති ගමිකස්ස දානං දෙති ගිලානස්ස දානං දෙති දුබ්භික්ඛෙ දානං දෙති යානි තානි නවසස්සානි නවඵලානි තානි පඨමං සීලවන්තෙසු පතිට්ඨාපෙති ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච කාලදානානී"යි. දෙයධර්මයෙහි උත්සාහ ඇති ව දක්ෂිණාර්හපුද්ගලයන් කෙරෙහි ගෞරව ඇතිව දෙන්නාහ. මොහු උත්තමයහ, මොහු අධමයහ, යන විභාගයක් නොකොට සාමාන්‍යයෙන් දෙන්නාහ. දන්දෙන්නාහු පළමුකොටත් දන් දෙමින් සිටත් දන්දී අන්තයෙහිත් සතුටු සිතින්ම දෙන්නාහ. දන් දී පශ්චාත්තාපයකට නො පැමිණෙන්නාහ. එසින් වදාළහ බුදුහු.

"පුබ්බෙව දානා සුමනො දදං චිත්තං පසාදයං,
දත්වා අත්තමනො හොති එසා යඤ්ඤස්ස සම්පදා"යි.

ප්‍රතිග්‍රාහකයන්ගේ වශයෙන් මානාවමානයක් නො කරන්නාහ. දන්පිළිගන්නවුන්ට ප්‍රියතෙපුල් කියන්නාහ. යාචකයන්ගේ අදහස් දැන දෙන්නාහ. තවද යාචකයන්ගේ යාඥාවට සුදුසුව ඔවුන්ගේ අදහස් නො මැඩ විද්‍යමානවස්තුව සුදුසුපරිද්දෙන් දන්දෙන්නාහ. පිරිවරසහිතවූ දානසමෘද්ධිය සියලු ලොකවාසී සත්ත්වයන්ට හිතසැප පිණිස පමුණුවන්නාහ. තමන්ටත් අකොප්‍යවූ අර්හත්ඵලවිමුක්තියට පමුණුවන්නාහ. තවද ක්ෂය නොවන්නාවූ ඡන්දාධිපතියට ද, ක්ෂය නොවන්නාවූ වීර්‍ය්‍යාධිපතියට ද, ක්ෂය නොවන්නාවූ අමොහයට ද, ක්ෂය නොවන්නාවූ චිත්තසමාධානයට ද, ක්ෂය නොවන්නාවූ ප්‍රඥාවටද, ක්ෂය නො වන්නාවූ සම්‍යක් සම්බොධිඥානයට ද, පිරිනමා දන් දෙන්නාහ. මේ දානපාරමිතාව පුරන්නාවූ මහාබොධිසත්ත්වයන් විසින ජීවිතයෙහිත් වස්තුවෙහිත් අනිත්‍යසංඥාව එළවිය යුත්තේය. සත්ත්වයන් කෙරෙහිත් මහාකරුණාව එළවියයුත්තේය. මෙසේ විස්තාරය ඇරයන්නාවූ මහාබොධිසත්ත්වයෝ ගිහිගත් ගෙය

කින් පිටත්ව යන්නක්හු මෙන් වස්තුවත් තමනුත් පිටත්කෙරෙමින් කිසිවක් නොතබා නිරවශෙෂකොටම දන් දෙන්නාහුය. යම් හෙයකින් සර්වඥශීලාලඞ්කාරයෙන් සත්ත්වයන් සරහනු කැමැත්තහු විසින් පළමුකොට තමාගේ ශීලයම පිරිදුසු කට යුතුද, එසේහෙයින් සියලු සත්ත්වයන් කෙරෙහි යම්සේ ස්වපනයෙහුත් ආඝාතයෙක් නූපදිනම්, එපරිද්දෙන් දයාපරසිත් ඇතිවියයුත්තේය. පරොපකාරයෙහි නිරතබැවින් අනුන් සන්තක වස්තුව ආශීර්විෂයක්හු මෙන් නො ඇල්විය යුත්තේය. සප්තවිධ මෛථුනධර්මසංයොගයෙන් වැළකි බැවින් හා පරදාරගමනයෙන් කැලම වැලකි බැවින් අබ්‍රහ්මචරියාවෙනුදු දුරින් ම දුරුවේද, සත්‍යවූ හිතවූ ප්‍රියවූ පමණවූ ධර්මකථාව යුක්තප්‍රාප්ත කාලයෙහි කියන්නේ වේද, ලෝභී නොවේද, වෛෂී නො වේද, මිථ්‍යාදෘෂ්ටි නො ගණීද, සම්‍යක්සම්බුද්ධරජානන් වහන්සේ විෂයෙහි පිහිටියාවූ සැදෑ ඇත්තේ වේද, පිහිටියාවූ ප්‍රෙමඇත්තේ වේද, මෙසේ සතරඅපාය හා වෘත්තදුඃඛයෙන්ද, අකුශලකර්මපථයෙන්ද, වැලකා ස්වර්ගමොක්ෂමාර්ගයෙහිද, කුශලකර්මපථයෙහිද, පිහිටියාවූ පිරිසුදුවූ අදහස් ඇත්තහුගේ කායවාක් ප්‍රයොගයක් බැහින් සියලු සත්ත්වයන්ට හිතසැප එලවත්නාවූ මනොරථය මහබොධිසත්ත්වයන්ගේ ප්‍රාර්ථිතාවූ පරිද්දෙන් වග වහාම සමෘද්ධවන්නේය. ඒ මහාබොධිසත්ත්වතෙම ප්‍රාණඝාතයෙන් වැලැකි බැවින් සියලු සත්ත්වයන්ට අභයදාන දෙන්නේය. නිරායාසයෙන් ම මෛත්‍රීභාවනා වඩන්නේය. "සුඛං සුපති සුඛං පටිබුජ්ඣති" යනාදි එකොළොස් වැදෑරුම්වූ මෛත්‍රියෙහි අනුසස් ලබන්නේය. නිර්ව්‍යාධි වන්නේය, රොග නැතිවන්නේය, දීර්ඝායුෂ්ක වන්නේය, සැපබහුල කොට ඇතිවන්නේය, මහාපුරුෂලක්ෂණ හා අසූඅනුව්‍යඤ්ජන ලක්ෂණයට පැමිණෙන්නේය, වෙෂව්‍යාසතාවත් සිදුනේය.

තවද ඒ මහාබොධිසත්ත්ව තෙමේ අදත්තාදානයෙන් වැලැකිබැවින් සොරුන්, සතුරන්, රජදරුවන්, වේයන්, මීයන්, ගිනි ආදී සියල්ලට අසාධාරණවූ ප්‍රමාණාතික්‍රාන්තවූ සම්පත් ලබන්නේය. කිසිසත්ත්වකෙනකුන් විසින් සැක නො කටහැක්කේය. සියලුසත්ත්වයන්ට ප්‍රියවන්නේය. මනවඩන්නේය. සියල්ලවුන් විසින් විශ්වාසකටයුතුවන්නේය. සම්පත්තියෙහි අලගනාවූ සිත් ඇතිවන්නේය. පරිත්‍යාගශීලි වන්නේය. ලොභව්‍යසනයෙහි මුල්සිඳුනේය.

**අබ්‍රහ්මචරියාවෙන්** වැළැක් බැවින් වස්තුවෙහි ලොල් නොවන්නේය, සන්හුන්නාවූ කායප්‍රයොගය හා මනඃ ප්‍රයොග ඇත්තේය, සියලුසත්ත්වයන්ට ප්‍රියවන්නේය, මනවඩන්නේය, සංකානොකටයුත්තේය. ඔහුගේ සුන්දරවූ කීර්තිඝොෂය ලොකයෙහි පැතිර නැගෙන්නේය, අලගනාවූ සිත් ඇතිවන්නේය. ස්ත්‍රීවිෂයෙහි බලවත්වූ ලොභසිත් නැතිවන්නේය, නෛෂ්කර්ම්‍ය බහුල කොට ඇත්තේය, මහාපුරුෂලක්ෂණ හා අසූඅනුව්‍යඤ්ජන ලක්ෂණයට පැමිණෙන්නේය, ලොභවාසනාවෙහි මුල් සිඳුනේය.

**මුසාවාදයෙන්** වැළැකී බැවින් සියලුසත්ත්වයන්ට ප්‍රමාණ වන්නේය. සියලු සත්ත්වයන් විසින් ඇදහිලිකටයුතුවන්නේය. ඇදහිලිකටහැකිබස් ඇත්තේය, ගතහැකිබස් කියන්නේය. දෙවියන්ට ප්‍රියවන්නේය, මනවඩන්නේය, සුවඳැති මුඛඇති වන්නේය, විශෙෂයෙන් රැක්කහැකිවාක්සමාචාර ඇත්තේය. සුප්‍රතිෂ්ඨිත පාදාදි මහාපුරුෂලක්ෂණයටද පැමිණෙන්නේය. ක්ලෙශවාසනාවෙහි මුල්සිඳුනේය.

**කේලමෙන්** වැළැකී බැවින් පරොපක්‍රමයෙන් ඡෙද්‍යභෙද්‍යයට පැමිණවිය නොහැක්කාවූ ශරීර ඇතිවන්නේය, කිසිසත්ත්වයෙකුත් විසින් බිඳුවා විසුරුවාපිය නොහැකි පෂීත් ඇති වන්නේය, සද්ධර්මයෙහිත් භෙදයකට නො පැමිණෙන්නාවූ ඇදහිලි ඇතිවන්නේය, දෘඪසිත් ඇතිවන්නේය, භවාන්තරයෙහිත් පුරුදුවූ සත්ත්වයන්ට ඒකාන්තයෙන් ප්‍රියවන්නේය, ක්ලෙශ බහුල නො වන්නේය.

**පරුෂවාක්‍යයෙන්** වැළැකී බැවින් සියලු සත්ත්වයන්ට ප්‍රියවන්නේය, මනවඩන්නේය, සැපවිඳිනාසුලු වන්නේය, මිහිරි තෙපුල් ඇතිවන්නේය, සියලු සත්ත්වයන් විසින් සම්භාවනා කටයුතුවන්නේය, අෂ්ටාඞ්ගයෙන් සමන්විතවූ බ්‍රහ්මස්වර ඇති වන්නේය.

**සම්ඵප්‍රලාපයෙන්** වැළැකී බැවින් සියලුසත්ත්වයන්ට ප්‍රිය වන්නේය, මනවඩන්නේය, පාෂාණච්ඡත්‍රයක් මෙන් ගෞරව කටයුත්තේය, සියල්ලවුන් විසින් සම්භාවනා කටයුතුවන්නේය, ගතහැකිබස් ඇතිවන්නේය, පුරුදුවූබස් ඇතිවන්නේය, මහෙශාක්‍ය වන්නේය, මහානුභාව සම්පන්න වන්නේය, ස්ථානොචිත ප්‍රඥාවෙන් ප්‍රශ්නවිසර්ජන කරන්ට සමර්ථ වන්නේය, බුද්ධභූමියෙහිත් එකම වචනයකින් නොයෙක්භාෂාඇති සත්ත්වයන්ට නොයෙක් ප්‍රශ්න විසඳන්ට සමර්ථවන්නේය.

**ලොභී** නොවන බැවින් කැමැති කැමැති වස්තු ලබන සුලු වන්නේය, උදාරතරවූ **සම්පත්**තියෙහි අභිප්‍රාය උපදවන්නේය, ක්‍ෂත්‍රියමහාසාරාදීන් විසින් සම්භාවනා කටයුතු වන්නේය, පසමිතුරන් විසින් මැඩ පැවැත්ත නොහැක්කේය, චක්‍ෂුරාදි ඉන්ද්‍රිය වෛකල්‍යයට නො පැමිණෙන්නේය, තමාට වැඩිතරම් සත්ත්වයක්හු නැත්තවන්නේය, වෛෂසංඥවනැතිවන්නේය. සියලුසත්ත්වයන් විසින් සම්මානකටයුත්තේය, හිතයෙන්ම සතුටුකරවන බැවින් සියලුසත්ත්වයන් නිරායාසයෙන්ම පහදවන්නේය, රූක්‍ෂ සවභාවනැතිවන්නේය. මෛත්‍රීබ්‍රහ්මවිහාර සම්පත්තියෙන් යුක්ත බෝධිසත්ත්වද වන්නේය, මහානුභාවසම්පන්න වන්නේය.

**මිථ්‍යාදෘෂ්ටියක්** නැති බැවින් සොඳුරුවූ කීර්තිඝොෂය පවත් නේය, ශීඝ්‍රවෙජ්ජදයට පැමිණෙතුදු අකුශලකර්මයක් නොකරන් නේය, කර්මස්වභාවකොට ඇති බැවින් ප්‍රථමමාර්ගීය ලද්දක්හු මෙන් කෞතුහලමඞ්ගලිකා නොවන්නේය, සද්ධර්මයෙන් ඒ බෝධි සත්ත්වයන්ගේ ශ්‍රද්ධාව මූල්බටුවාක් මෙන් මනාව පිහිටන්නේය, සර්වඥවරයන්ගේ සතරආර්යමාර්ගඥත නැමැති බෝධිය අදහන් නේය, අපවිත්‍රවූ කසලගොඩක නො ඇලෙන්නාවූ රාජහංස යකු මෙන් දෙසැටදෘෂ්ටිආදිවූ සමයාන්තරයෙහි නො ඇලෙන් නේය, අනිත්‍යාදි ලක්‍ෂණත්‍රය පිරිසිඳ දක්නට සමර්ථ වන්නේය, කෙලවර අනාවරණඥතලාභී වන්නේය, යම්තාක් සම්‍යක් සම්බෝධියට නො පැමිණෙන්නේ නම් ඒ තාක් ඒ ඒ සත්ත්වනිකා යෙහි උත්කෘෂ්ට උත්කෘෂ්ටව ම උපදනේය උදාරතර උදාරතරවූම සියලු බුද්ධකාරකයට පැමිණෙන්නේය. මෙසේ **මේ ශීලය නම්.** සියලුසම්පත්තීන්ට ප්‍රතිෂ්ඨාවන්නේය. සියලු බුද්ධගුණ යන්ට උත්පත්තිභූමියක් වන්නේය, සියලු බුද්ධකාරකධර්මයන්ට ප්‍රථම පාදයෙක වාරයෙක, උපායෙකැයි බුහුමන් උපදවා කාය වාක් සංයමයෙහිද, ඉන්ද්‍රියදමනයෙහිද, ආජීවසම්පදායෙහිද, ප්‍රත්‍යයපරිභොගයෙහිද, සමෘතිප්‍රඥබලයෙන් අප්‍රමාදව ලාභයශ-සත්කාරය–කීර්ත්තිය යන මේ තුණ මිත්‍රයක්හු බදු මූබඇති සතු රක්හු සෙයින් සලකා "කිකීව අණ්ඩං" යනාදි ක්‍රමයෙන් මනා කොට ශීලසමෘද්ධිය කටයුත්තේය.

තවද මේ **ශීලය** නම්:—තමහට නරකාදි සතර අපායෙහි දුකින් මිදීමෙන් සුගතියෙහි රාජ්‍යසම්පත්තියක් පිණිසත් නො වන්නේය. චක්‍රවර්ත්ති රාජ්‍යශ්‍රීයක් පිණිසත් නො වන්නේය. දිව්‍යසම්පත්තියක්, ශක්‍රසම්පතක්, මාරසම්පතක්, බ්‍රහ්මසම්පතක්

ලබන පිණිසත් නො වන්නේය. තමහට ත්‍රිවිද්‍යා-අෂ්ටවිද්‍යා-ෂඩාභිඥ-පසළොස්චරණධර්ම සඞ්ඛ්‍යාත විශෙෂධර්මයන්ගේ ලැබීමක් පිණිසත් නොවන්නේය, ප්‍රත්‍යෙක බොධිඥානය ලබන පිණිසත් නොවන්නේය. වැළි කුමක් පිණිස ද? යත්:- සර්වඥබවට පැමිණීමෙන් සියලු සත්ත්වයන් නිරුත්තරවූ ශීලාලඞ්කාරයෙන් සරහනු පිණිස ම යයි, ශීලය සම්‍යක්සම්බොධියට පිරිනැමිය යුත්තේය.

තවද: සකලක්ලෙශයන්ට වාසස්ථාන බැවින්ද, පුත්‍රදාරාදීන්ගෙන් මහත්වූ පීඩා උපදනා හෙයින්ද, ගොවිකම්-වෙළඳාම් ආදිවූ අනෙකප්‍රකාර කර්මාන්තකිරීමෙන් වියවුල් වන බැවින්ද, ගිහිගෙහි විසීම නෛෂ්කර්ම්‍ය සැපයට අනවසරයයි සැලකිය යුත්තේය. පඤ්චකාමයන්ගේ වූකලි කඩුමුවාත ගල්වනලද මීබිඳු ලෙවීමක් මෙන් ස්වල්පවූ ආස්වාද ඇතිබව හා බොහෝ අවැඩ එළවන බැවින් විදුලිය ආලොකයෙන් ගතයුතු නැටීමක් මෙන් මඳ ඇසිල්ලක්ම යයි දතයුත්තේය. ගිහි රත්රනැයි සිතා අසුචි සඳුනැයි සිතා වලඳනා උමතු ඇත්තක්හු සෙයින් විපරීතසංඥාවෙන් අනුභව කටයුතුවන්නේය.

තවද: පඤ්චකාමය නම්:-මලමූත්‍රදෙක වසා සඟවා දුර්ගන්ධ නො ඇසීමෙන් වන සැපයක් මෙන් ප්‍රතිකාරයක් මෙන් ම සැප වන්නේය. පැනෙහි ඇඟිල්ලගලා ලෙහකිරීමෙන් පිපාසා නො යන්නාක් මෙන් අතෘප්තිකරය. සාකුස් ඇතිව අනුභවකරණ භොජනයක් මෙන් පීඩාසහිතය. බිලියෙහි අවුනනලද ඇමක් මෙන් වැසන එළවීමට කාරණ වන්නේය. වහ්නිසන්තාපයක් මෙන් අතීතාදි කාලත්‍රයෙහිම දුක් එළවීමට කාරණ වන්නේය. වඳුරුලැවක් මෙන් බන්ධනයට කාරණ වන්නේය. සතුරන් වසන ගමෙක විසීමක් මෙන් භයට කාරණ වන්නේය. සතුරන්ට කරණ පොෂ්‍යයක් මෙන් ක්ලෙශමාරාදීන්ට ගොදුරු වන්නේය. උත්සවසම්පත්තියක් මෙන් විපරිනාමදුක්ඛයෙන් දුක්වන්නේය. රුක්ඛිණයක වැදගත් වහ්නියක් මෙන් ඇතුළෙහි සිටම දවන්නේය. දිරාගිය කදල්ලෙක තුඹු අතින් ගණුත් අත් කැපෙන දිවෙන් ගණුත් දිවුකැපෙන බීරණනම් තණෙහි වැදගත් මී බිඳුවක් සෙයින් නොයෙක් ආදීනව ඇත්තේය. ලුණුපැන් පීමක් මෙන් පිපාසාවට කාරණ වන්නේය. රාමෙර පීමක් මෙන් හීනජනයන් විසින් සෙවුනා ලද්දේය. බල්ලකු ඩැහැගෙණ සපන ගොඇටයක් මෙන් ස්වල්පවූ ආස්වාද ඇත් බැවින් හා සර්

සාධාරණ බැවින් මස්වැදැල්ලකට බඳු උපමා ඇත්තේය යන් මේ ආදි ක්‍රමයෙන් කාමයෙහි ආදීනව සලකා ඒ කාමයට විපරීත ක්‍රමයෙන් නෛෂ්කර්ම්‍යයයි කියනලද ප්‍රව්‍රජ්‍යාවෙහි අනුසස් දක්නාහු විසින් නෛෂ්කර්ම්‍ය සැපය-විවේක සැපය-ව්‍යුපශම සැපය යන මේ ආදි සැපයෙහි නැමුනාවූ ප්‍රවණවූ ප්‍රාග්භාරවූ සිත් ඇතිව නෛෂ්කර්ම්‍යපාරමිතාව පිරිය යුත්තේය.

තවද යම් හෙයකින් අන්ධකාරය හා සමග නො පවත්නාවූ ප්‍රදීපාලෝකයක් මෙන් ප්‍රඥාව මෝහය හා සමග නො පවතීද, එහෙයින් පළමුකොට බෝධිසත්ත්වයන් විසින් මෝහයට නිසි කාරණ දුරුකටයුත්තේය ඒ මෝහයට නිසි කාරණ කවරේද? යත්:-උකටලී බවය-කාරියෙහි පමාබවය-මැලි ඇඹෙන බවය-අලසබවය-ගණසඞ්ගණිකායෙහි ඇලුම් ඇතිබවය-නිද්‍රාශීලීබවය-ඥාණාභිනිශ්චය නොකරණ සුලුබවය-කුහුල්බවය-කාමච්ඡන්දාදි පඤ්චනීවරණයන් ඇතිබවය- විපරීතාභිමානය- නො පිළිවිස කරණ කථා ඇතිබවය- කයට මනාකොට පරිහාර නොකිරීමය-එකගවූ සිත් නැතිබවය-අප්‍රාඥ පුද්ගලයන් සෙවනය කිරීමය-ප්‍රඥාවත් පුද්ගලයන් සෙවනය නො කිරීමය- තමාට අවඥා කිරීමය-විපරීත කල්පනාවය-කායදරථ බහුලබවය- විපරීතාභිනිවේශය- සංවේගශීලී නො වන බවය- සංක්ෂෙප හෙයින් යම් යම් අකුශලධර්මකෙනෙකුන් සෙවනය කරන්නාහට නූපන්නාවූ ප්‍රඥාව නූපදීද, උපන්නාවූ ප්‍රඥාව පිරිහේද, මෙසේ මෙබඳුවූ සම්මෝහයට නිසි කාරණයන් දුරුකරන්නහු විසින් බහුශ්‍රැත වීමෙහිද, ධ්‍යානාදියෙහිද, අභ්‍යාසකටයුත්තේය

එහි බහුශ්‍රැතවීමෙහි විභාග කවරේද? යත්:-රූපස්කන්ධාදී පඤ්චස්කන්ධය-චක්ෂුරායතනාදිවූ ද්වාදශායතනය-චක්ෂුර්ධාත්වාදි අෂ්ටාදශධාතුය-දුඃඛසත්‍යාදි චතුරාර්‍ය්‍යසත්‍යය-චක්ෂුරින්ද්‍රියාදි ද්වාවිංශතීන්ද්‍රියය- ද්වාදශාඞ්ගප්‍රතීත්‍යසමුත්පාදය-කායානුපශ්‍යනාදි සතරසතිපට්ඨානය-සතරසම්‍යක් ප්‍රධානය-සතර ඍද්ධිපාදය-පඤ්චෙන්ද්‍රියය පඤ්චබලය-සප්තබොධ්‍යඞ්ගය-ආර්‍ය්‍යාෂ්ටාඞ්ගිකමාර්ගය යන සියලු කුශලධර්ම ප්‍රභෙදයද, ලොකයෙහි නිරවද්‍යවූ යම් කිසි විද්‍යාස්ථාන කෙනෙක් ඇද්ද, සත්ත්වයන්ට හිතසැප එළවීමට කාරණවූ අක්ෂර, ලිඛිත, ගණිතාදි යම් චතුෂ්ෂෂ්ටිකලා විශෙෂයෙක් ඇද්ද මෙසේ මෙබඳුවූ ප්‍රකාර ඇති සියලුම ශාස්ත්‍රවිශෙෂ විෂයෑ උපාය කෞශල්‍යය පූර්වඞ්ගම්කොට ඇති ප්‍රඥාවෙන් සමෘති වීර්‍ය්‍යදෙකට උපස්ථම්භකාරණ හෙයින් සකස් කොට ඉගැණීමය, ඇසීමය,

දැරීමය, නැවත නැවත අභ්‍යාසකිරීමය, හොඳත් නැත් විචාරීමය යන මෙසින් දැන ඉගෙණ ඒ තමා උගත් ධර්මාදියෙහි මෙරමාට පිහිට වීමෙන් ශ්‍රුතමය ප්‍රඥාව ඉපදවිය යුත්තේය. තවද ස්කන්ධාදිවූ ස්වභාවධර්මයන්ගේ ආකාර කල්පනාකිරීම් මුඛයෙන් ස්කන්ධාදීන් නුවණට වටහන්නහු විසින් චින්තාමය ප්‍රඥාව ඉපදවියයුත්තේය. එම ස්කන්ධාදීන්ගේ ස්වභාව ලක්ෂණය සාමාන්‍ය ලක්ෂණය පිරිසිඳගැණීම් වශයෙන් ලෞකික ප්‍රඥාව උපදවන්නහු විසින් පූර්වභාග භාවනාප්‍රඥාව සමෘද්ධ කට යුත්තේය. මෙසේ කල්හි මේ නාමරූපමාත්‍රයෙක. සුදුසු සුදුසු පරිද්දෙන් ප්‍රත්‍යයෝ උපදනාහුත් නිරුද්ධවන්නාහුත් වෙති. මේ ශරීරය කරන්නාවූත්, කරවන්නාවූත් කිසි කර්තෘවෙක් නැත්තේය. ඇතිව නැතිවන්නාවූ අර්ථයෙන් අනිත්‍යය. උදාවියෙන් පෙළෙන්නාවූ අර්ථයෙන් දුක්ඛය තමා වශයෙහි නො පවත්නාවූ අර්ථයෙන් අනාත්මයයි, අධ්‍යාත්මික බාහ්‍ය රූපධර්මයන් නීරවශෙෂ කොට පිරිසිඳ දැන්මෙන් ඒ ශරීරයෙහි ආලය හැර අන්‍යසත්ත්වයනුදු ඒ ශරීරයෙහි ආලය හරවා හුදක් කරුණා වශයෙන්ම යම්තාක් බුද්ධගුණය හස්තතලයට සම්ප්‍රාප්ත වේද, ඒතාක් ශ්‍රාවක බොධි ආදිවූ යානත්‍රයෙහි සත්ත්වයන් ඇතුළත්කිරීමෙන් හා නුවණ මිහිකිරීමෙහි පිහිටුවමින් ධ්‍යානවිමොක්ෂ, සමාධි, සමාපත්තියෙන් වශග බවට පමුණුවන්නේය. ප්‍රඥාපාරමිතාවෙහි මස්තකප්‍රාප්තවන්නේය.

තවද: කයින්, වචසින්, මනසින් බොධිසම්භාරධර්මයන් අතුරක් නැතිව රැස්කරන්නහු විසින් බලවත්වූ වීර්‍ය්‍ය පැවැත්විය යුත්තේය. තවද අචින්ත්‍යවූ අපරිමිතවූ විපුලවූ උදාරතරවූ නිර්මලවූ උපමාවිෂයාතීක්‍රාන්තවූ ගුණසමූහයට නිධානවූ බුද්ධත්වය නො පසුබැස ඉදිරියට පැමිණ සමෘද්ධකරන්ට යොග්‍යවූ වීර්‍ය්‍යානුභාවය බොහෝජනයෝ අසන්වත් සම්භීනොවන්නාහ. ඒ එසේමැයි:—ත්‍රිවිධවූ අභිනීහාර චිත්තොත්පත්තිය චතුර්විධ බුද්ධභූමිය, සතරසඞ්ග්‍රහවස්තුය, කරුණාව ඒකකෘත්‍යකොට ඇතිබවය, බුද්ධධර්මගුණයන් නුවණට වැටහීමය, සියලු ධර්මයෙහි සඞ්ග්‍රහයක් නැතිබවය සංසාරදුඃඛයෙන් හෙදයකට නො පැමිණීමය, සියලු දැනවස්තුව පරිත්‍යාග කිරීමය, ඒ දැනයෙන් අභිමානය නැතිබවය, අධිශීලශික්ෂාව තරකොටපිරීමය, ඒ අධිෂ්ඨානයෙහි නිශ්චලබවය, මෙරමා විසින් කරණලද අනුපකාරයෙහි අවිකාරීබවය, ධීරවීරගුණ ඇතිබවය, වීර්‍ය්‍යාරම්භයෙහි ස්ථිරබවය, කුශලක්‍රියාවෙහි ප්‍රීතිප්‍රමොද්‍ය බහුලකොට ඇතිබවය,

විවේකයට නම්නවූ සිත් ඇතිබවය, ධ්‍යානධර්මයෙහි යෙදීමය, නිරවද්‍යවූ ශ්‍රැතයෙන් තෘප්තියකට නො පැමිණීමය, අසනලද සද්ධර්මය මෙරමාට දෙශනා කිරීමය, සියලු සත්ත්වයන් නැය ප්‍රතිපත්තියෙහි පිහිටුවීමය, සමාපත්තිසැපය වසගකොට ඇති බවය, පඤ්චාභිඥාවෙහි බලවත් පැවතුම් ඇතිබවය, අනිත්‍යාදි ලක්ෂණත්‍රය අවබොධකිරීමය, සතිපට්ඨානාදි ධර්මයෙහි අභ්‍යාස යෙන් ලොකොත්තරමාර්ගය ලැබීමට පාරමිතාවන් පිරීමය යන මේ ආදිවූ සියලු බොධිසම්භාර ප්‍රතිපත්තිය වීර්‍යානුභාවයෙන්ම සමෘද්ධවන්නේය සි ප්‍රථමප්‍රණිධානයෙහි පවත් යම්තාක් සම්‍යක් සම්බොධිඥානය සිද්ධවේද, ඒතාක් වීර්‍ය නො හරණහු විසින් සකස් කොට වීර්‍යපාරමිතාව පිරියයුත්තීය. වීර්‍ය සිද්ධවූකල්හි ක්ෂාන්තිපාරමිතා, දානපාරමිතාදිවූ සියලුම බොධිසම්භාර ධර්මයෝ ඒ වීර්‍ය අයත්වූ පැවතුම් ඇති බැවින් සමෘද්ධවූවාහු නම් වෙති. ක්ෂාන්තිපාරමිතාදියෙහිදු මෙම ක්‍රමයෙන් ප්‍රතිපත්ති දතයුත්තේය.

මෙසේ සම්‍යක්සම්බොධියට කරණ ලද ප්‍රාර්ථනා ඇති, මහා බොධිසත්ත්වයන් විසින් මා විසින් අද කවර කුශලසම්භාරයක් ඥානසම්භාරයක් රැස්කරණලදද, මාවිසින් අද කවර පරවැඩක් කරණලද්දේද සි, දවස දවස ප්‍රත්‍යවෙක්ෂා කොට සියලු සත්ත්ව යන්ට වැඩ සැප එළවීමට උත්සාහ කටයුත්තේය. සියලු සත්ත්ව යන්ට උපකාර පිණිස තමාගේ කායජීවිතය පරිත්‍යාගය කට යුත්තේය. සියලුම සත්ත්වයෝ අනොදිසො ඵරණ මෛත්‍රාවෙන් හා කරුණාවෙන් පැතිරිය යුත්තාහුය.

තවද, සියලු සත්ත්වයන්ට උපදනා යම් දුකෙක් ඇත් නම් ඒ සියලු දුක් තමා කෙරෙහි කැමැතිවිය යුත්තේය. සියල්ල වුන්ගේ කුශලය විශෙෂයෙන් අනුමෝදන් වියයුත්තේය. බුද්ධ මහත්ත්වය එක්වන් සැලකියයුත්තේය. කයින්, වචසින් යම් කිසි කුශල කර්මයක් කරන්නේ වීනම් ඒ සියලු කුශලකර්මය සම්‍යක් සම්බොධිඥානය පූර්වඞ්ගම කොට කටයුත්තේය. මෙසේ කරන්නාවූ මේක්‍රියාවෙන් බොධිසත්ත්වවරයන්ට ප්‍රමානාතික්‍රාන්තවූ කුශල සම්භාරය රැස් වන්නේය. තවද සියලු සත්ත්වයන්ට ප්‍රයෝජන පිණිස හා සියලු සත්ත්වයන් රක්ෂාකරණු පිණිසත් මාගේ ශරී රයත් ජීවිතයත් පරිත්‍යාග කොට ක්ෂුධාපිපාසා, ශීතොෂ්ණ,

වාතාතපාදි, දුඃඛප්‍රතිකාරය සෙවිය යුත්තේය. තවද ඒ මහා බොධිසත්ත්වතෙම යථොක්තවූ ක්ෂුධා පිපාසාදි දුඃඛප්‍රතිකාරයෙන් උපන්නාවූ යම් සැපයෙක් තෙමේ විඳීද එපරිද්දෙන්ම සිත්කලුවූ අරම, උයන, ප්‍රාසාදතලය, අරණ්‍යායතනය යන මේ සියලු ස්ථානයෙහි කයට, සිතට, තැවිලියක් නැති බැවින් නිවීයාවූ ආනම ඇත්තේ, සැපවිඳිනේය. තවදඃ ඒ මහාබොධිසත්ත්ව තෙමේ බුද්ධ, ප්‍රත්‍යෙකබුද්ධ, ආර්‍ය්‍ය ශ්‍රාවක බොධිසත්ත්වවරයන්ට ඉහාත්මභාවයෙහි සැපවිහරණය ඇත්තාවූ යම් ධ්‍යාන සමාපත්ති සැපයක් අසාද ඒ සියලු සැපය සියලු සත්ත්වයන් කෙරෙහි සාමාන්‍යයෙන් එළවන්නේය. තෙමේත් විද්‍යමානවූ ධ්‍යාන සමාපත්ති ආදිවූ විශෙෂයකට පැමිණේනම් උපන්නාවූ ප්‍රීතිසෞමනස්‍ය සැපය සියලු සත්ත්වයන් කෙරෙහි පිහිටුවන්නේය. තවද ඒ මහාබොධිසත්ත්වයන් විසින් මහත්වූ සංසාරදුඃඛයෙහි ඒ සංසාරදුඃඛයට කාරණවම ගැලුනාවූ සත්ත්වසමූහයා දූක එහිදු සිඳීම, බිඳීම, පැසීම, විසිරීම, නරකගින්නෙන් තැවීම යන මේ ආදියෙන් උපන්නාවූ තීව්‍රවූ කර්කශවූ දුඃඛවෙදනාවෙන් අතුරක් නැතිව බොහෝ කලක් දුක් විඳිනාවූ නාරකීය සත්ත්වයන්ද, ඔවුනොවුන්ට කිපීම, නැතිගැන්ම, පීඩාකිරීම, නැසීම, මෙරමා අයත්වීම යන මේ ආදියෙන් දුක්විඳිනාවූ තිරශ්චීනසත්ත්වයන්ද, වග්නිජ්වාලාවෙන් ගැවසීගන්නාවූ ශරීරඇති දෙහොත් හිසතබා මොරගා හඬන්නාවූ මුඛයෙන් නික්මෙන ගිනිසිළු ඇති ක්ෂුධාපිපාසාදියෙන් දන්නාවූ මෙරමා විසින් වමනය කරනලද ආහාරාදිය හා දමනලද කෙළ, සෙම්, සොටු ආදිය ආහාරකොට ඇත්තාවූ මහත් දුක් අනුභවකරන්නාවූ ප්‍රෙතයන්ද, වස්තුපයෙෂණය මුල්කොට ඇති, මහත්වූ අවඩව දුසට පැමිණෙන්නාවූ හස්තපාද, කර්ණ, නාසාදීන්ගේ ඡෙදනයෙන් දුක් කම්කටුලට පැමිණීමෙන්ද, දිළිඳුබව් ආදීයෙන්ද, ක්ෂුධාපිපාසාදියෙන් මිරිකීමෙන්ද, ප්‍රභූසත්ත්වයන් විසින් පීඩපවත්නා විසින්ද, අනුන් අයතිබැවින්ද, නාරකීයසත්ත්වයන්, ප්‍රෙතයන්, තිරශ්චීනයන් ඉක්මපවත්නාහුයයි, අපාය දුකට නො වෙනස්වූ මහදුක් අනුභවකරන්නාවූ මනුෂ්‍යප්‍රෙතයන්ද, පඤ්චකාමවිෂය අනුභවකිරීමෙන් වික්ෂිප්තවූ සිත් ඇති බැවින් රාගාදීන් දන්නාවූ මාරුතවෙගයෙන් නැඟි වග්නිජ්වාලාවෙන් සම්බන්ධවූ වියලී දරගොඩෙහි ඇවිලෙන වන්තිස්කන්ධයක් වැනිවූ නො සන්හුන් කාමාස්වාදය අයතිව පවත්නාවූ කාමාවචර දෙවියන්ද, මහත්වූ ව්‍යායාමයෙන් පක්ෂප්‍රහාර කොට

ඉතාදුරුවූ ආකාශයට නැඟී පක්ෂීන් මෙන්ද, ශක්තිසම්පන්න ධනුර්ධරයන් විසින් විදිනාලද ශරයන්මෙන්ද, කල්පායුෂ්කව බොහෝ කලක් පැවැතීම් ඇතිකල්හිදු අනිත්‍යය කෙළවර කොට ඇතිබැවින් ආයුකෙළවර බ්‍රහ්මලොකයෙන් පිරිහීම හෙතුකොට ගෙණ නොඉක්මුනාවූ ජාති, ජරා, මරණ ඇති රූපාවචර, අරූපාවචර දෙවියන්ද, දක්නාවූ මහාබොධිසත්වයන් විසින් සියලු සත්වයෝ සාමාන්‍යයෙන් මෙත්තා, කරුණා දෙකින් පැතිරිය යුත්තාහ.

මෙසේ, සියලු සත්වයන්ට සැපයට සුදුසුවූ උපකරණ දන් දීමෙන් නොයෙක් පරිද්දෙන් අනුග්‍රහකිරීම දානයෙන් වන්නාවූ ප්‍රතිපත්තිය. සියලු සත්වයන් ජීවිතය රැකීම, සම්පත් රැකීම, පුත්‍රදාරයන් රැකීම, කේලාම්ආදියෙන් ඔවුනොවුන් නොබිඳවීම, ප්‍රියතෙපුල් කීම, වැඩට නිසිබස්කීම, මැරීම් තැලීම් ආදිවූ හිංසාපීඩාවක් නොකිරීම යන මේ ආදි සීලයෙන් වන්නාවූ ප්‍රතිපත්ති නම් වන්නේය.

ඒ සියලු සත්වයන්ගේ ආහාරපානවගීාදි ආමිෂ පිළිගැන්ම හා ධම්මදානාදී නොයෙක් පරිද්දෙන් වැඩකිරීම නෛෂ්කර්ම්‍යයෙන් වන්නාවූ ප්‍රතිපත්තිය. ඒ සියලු සත්වයන්ට වැඩ සිඩ වන්ට සුදුසුවූ කරුණා ප්‍රඥා දෙක සන්තානයෙහි පිහිටිවීම ප්‍රඥාවෙන් වන්නාවූ ප්‍රතිපත්තිය. ඒ ප්‍රඥාප්‍රතිපත්තියෙහි උත්සාහය පවත්ගැන්මය-පටන්ගත් වීර්‍ය්‍යය නොනැසීමය යන මේ සියල්ල වීර්‍ය්‍යයෙන් වන්නාවූ ප්‍රතිපත්තිය. ඒ සියලු සත්වයන්ගේ අපරාධ සහනය කිරීම ක්ෂාන්තියෙන් වන්නාවූ ප්‍රතිපත්තිය. ඒ සියලුසත්වයන්ට අතිශයින් උපකාරකිරීමෙහි සම්වාදනය-අවිසංවාදය යන මේ ආදිය සත්‍යයෙන් වන්නාවූ ප්‍රතිපත්තිය. ඒ සියලු සත්වයන් අනුපකාරකිරීමෙන් තමහට අවැඩට පැමිණෙන කල්හිදු නිශ්චලව පිහිටීම අධිෂ්ඨානයෙන් වන්නාවූ ප්‍රතිපත්තිය. සියලු සත්වයන්ට හිතසැප වනසේ එක්වන් සිතීම මෛත්‍රියෙන් වන්නාවූ ප්‍රතිපත්තිය. ඒ සියලු සත්වයන් කරන්නාවූ උපකාර අපකාරදෙකෙහි වෙනසකට නොපැමිණ මධ්‍යස්ථාකාරයෙන් පැවැත්ම උපෙක්ෂාවෙන් වන්නාවූ ප්‍රතිපත්තියයි. මෙසේ ප්‍රමාණාතික්‍රාන්තවූ සත්වයන් අරභයා අනුකම්පාකරණලද සියලු සත්වයන් ඇති මහාබොධිසත්වයන් අවශෙෂ පෘථග්ජන සත්වයන් හා අසාධාරණවූ ප්‍රමාණාතික්‍රාන්තවූ කුශලසම්භාරය හා ප්‍රඥාසම්භාරය හා රැස්කිරීම මේ දානප්‍රතිපත්ති ආදිවූ

දශවිධප්‍රතිපත්තීන් නිසා වන්නේයයි දතයුත්තේය, මේ දශවිධපාරමිතාවන්ගේ යම්ප්‍රත්‍යයෙක් කියනලද්දේ වීනම් ඒ ප්‍රත්‍යයාගේ සතස් කොට සමාධකිරීම දශපාරමිතා ප්‍රතිපත්ති නම් වන්නේය. ඒ දශවිධපාරමිතා ධර්මයෝ වූකලි දශපාරමිතාය-දශඋපපාරමිතාය-දශපරමාර්ථපාරමිතාය යි,සමතිස් වැදෑරුම් වන්නාහ. කෙසේද? යත්:—පුත්‍රදාරයන් හා මුක්තාමාණික්‍යාදිවූ සියලු වස්තූන්ගේ පරිත්‍යාග පාරමිතා නම් වෙයි. තමාගේ අඞ්ගපරිත්‍යාගය උපපාරමිතා නම් වෙයි. තමාගේ ජීවිතපරිත්‍යාගය පරමාර්ථපාරමිතා නම් වෙයි කියා දානපාරමිතාවෝ තුන්දෙනෙක් වන්නාහ. පුත්‍රදාරාදිවූ ත්‍රිවිධපරිත්‍යාගයට හෙතු නොඉක්මීම් වශයෙන් ශීලපාරමිතාවෝ තුන්දෙනෙක් වන්නාහ. එම ත්‍රිවිධ වස්තුවෙහි ආලය සිඳ නික්මීම් වශයෙන් නෛෂ්කර්ම්‍යපාරමිතාවෝ තුන්දෙනෙක් වන්නාහ. උපකරණය-අඞ්ගය-ජීවිතය යන මේ තුනෙහි තෘෂ්ණාව නසා සියලු සත්ත්වයන්ට වැඩ අවැඩ නිශ්චයකිරීම් වශයෙන් ප්‍රඥාපාරමිතාවෝ තුන්දෙනෙක් වන්නාහ. යථොක්තවූ ප්‍රභෙද ඇති දානපරිත්‍යාගාදියට උත්සාහකිරීම් වශයෙන් වීර්‍ය්‍යපාරමිතාවෝ තුන්දෙනෙක් වන්නාහ. උපකරණය-අඞ්ගය-ජීවිතය යන මේ තුනට අනතරාය කරන්නවුන්ට ක්ෂමාකිරීම් වශයෙන් ක්ෂාන්තිපාරමිතාවෝ තුන්දෙනෙක් වන්නාහ. උපකරණය-අඞ්ගය-ජීවිතය නිසා සත්‍යය නො හැරීම් වශයෙන් සත්‍යපාරමිතාවෝ තුන්දෙනෙක් වන්නාහ. දානාදිපාරමිතාවෝ කොප්‍යයට නො හැකි අධිෂ්ඨාන වශයෙන්ම සම්බන්ධවන්නාහයි, උපකරණාදීන්ගේ විනාශයෙහිදු අචලාධිෂ්ඨානවශයෙන් අධිෂ්ඨානපාරමිතාවෝ තුන්දෙනෙක් වන්නාහ. උපකරණාදීන් විනාශකරන්නවුන් කෙරෙහි මෙත්තාව නොහැරීම් වශයෙන් මෛත්‍රීපාරමිතාවෝ තුන්දෙනෙක් වන්නාහ. යථොක්ත වස්තු තුනින් උපකාර අපකාර කරන්නාවූ සත්ත්වසංස්කාරයන් කෙරෙහි මධ්‍යස්ථවීම් වශයෙන් උපෙක්ෂාපාරමිතාවෝ තුන්දෙනෙක් වන්නාහ. මෙසේ සියලු දානාදි පාරමිතාවෝ සමතිස් වැදෑරුම් වන්නාහ.

ප්‍රතිඥානුකූල කොට සියලු පාරමිතාවන්ගේ පරිග්‍රහය, සත්‍යාධිෂ්ඨානය, එම සියලු පාරමිතාවන්ට ප්‍රතිපක්ෂධර්මයන්ගේ පරිත්‍යාගය ත්‍යාගාධිෂ්ඨානය, සියලුපාරමිතාගුණයේ සන්හුන් බව ව්‍යුපශාමාධිෂ්ඨානය, එම පාරමිතාවන් විසින් පරවැඩකිරීමට උපායකෞශල්‍යය ප්‍රඥාධිෂ්ඨානයයි, ඒ සියලු පාරමිතාවන්ගේ අධිෂ්ඨානයෝ සතර දෙනෙක් වන්නාහ. තුමද

සියලු පාරමිතාවෝ සත්‍යයෙන් ප්‍රශවකරණලදහ. ත්‍යාගයෙන් ප්‍රකාශකරණ ලදහ. උපායෙන් වර්‍ධනය කරණ ලදහ. ප්‍රඥාවෙන් සිරිසිඳුකරණ ලදහ. තවද සියලු පාරමිතාවන්ට සත්‍යය උත්පත්තිකාරණය, ත්‍යාගය පරිග්‍රාහක හෙතුය. උපසමය. අභිවෘද්ධියට හෙතුය. ප්‍රඥාව පිරිසිදු බවට හෙතුය. යම්සේ චතුරාධිෂ්ඨානයෙන් සියලු පාරමිතාවන්ගේ සංග්‍රහය වේද, එපරිද්දෙන් කරුණා ප්‍රඥාදෙකින් සියලු පාරමිතාවන්ගේ සංග්‍රහ වන්නේය. සියලුම බොධිසම්භාරධර්‍මයා කරුණා ප්‍රඥා දෙකින් පිරිසිඳ දන්නා ලද්දේය. කරුණා ප්‍රඥාදෙකින් සංග්‍රහ කරණලද දානාදි ගුණධර්‍මයෝ මහාබොධිසම්භාර නම් වන්නාහ. බුද්ධත්වයාගේ සිද්ධියත් කෙලවර කොට ඇත්තාහ. සියලු පාරමිතා පිරීමෙන් බුද්ධත්වයට පැමිණීමට කරණලද ප්‍රාර්ථනා ඇති මහාබොධිසත්ත්වයන්ට යථාස්වභාවය දනීමෙන් සියලු ධර්‍මයෙහි නො ඇලීම හෙතුකොටගෙණ ආත්මස්නෙහය නිරවශෙෂයෙන් සිඳී යන්නේය. මහාකරුණාසමාවෙශයෙන් සියලු සත්ත්වයන් ප්‍රියපුත්‍රයන් මෙන් දක්නාවූ ඒ මහාබොධිසත්ත්වයන්ට සියලු සතුන් කෙරෙහි කරුණාස්නෙහය මතුමත්තෙහි වර්‍ධනයවන්නේය. ඉක්බිත්තෙන් ඒ ඒ අවස්ථාවට සුදුසුව ස්වසන්තාන පරසන්තානයෙහි ලොභ, ද්වෙෂ, මොහ පහකිරීමෙන් දුරුකරණලද මාත්සය්‍ර්‍යාදි ප්‍රතිපක්ෂධර්‍මයන් ඇති මහාපුරුෂතෙමේ දාන, ප්‍රියවචන, අර්ථචය්‍ර්‍යා, සමානාත්මතා සංඛ්‍යාත සතරසංග්‍රහ වස්තුවෙන්ද, සත්‍යාධිෂ්ඨානාදි චතුරධිෂ්ඨානයෙන්ද, අතිසයෙන් ජනයාට සංග්‍රහකිරීමෙන් සද්ධර්‍මයට අවතීර්ණ ජනයන්ගේ ශීලාදි ගුණයෙන් මිහිකිරිවීමද, අනවතීර්ණ ජනයන්ගේ සතරසංග්‍රහ වස්තුවෙන් ඇතුළත් කිරීමද, කරන්නේය. එසේහෙයින් කියනලදී:-

"සච්චවාදී උපසන්තො පඤ්ඤවා අනුකම්පකො
සම්භතසබ්බසම්භාරෙ කංනාමත්ථං නසාධයෙ

මහාකාරුණිකො සත්ථා හිතෙසීච උපෙක්ඛකො
නිරපෙක්ඛොච සබ්බත්ථ අහො අච්ඡරියො ජිනො.

විරත්තො සබ්බධම්මෙසු සත්තෙසුච උපෙක්ඛකො
සදාසත්තහිතෙයුත්තො අහො අච්ඡරියො ජිනො"යි

මහාබොධිසත්ත්වවරයෝ වූකලී මහාකරුණා මහා ප්‍රඥාවෙන් හා දාන, ප්‍රිය වචන, අර්ථචය්‍ර්‍යා, සමානාත්මතාය යි කියන ලද සතර සංග්‍රහ වස්තුවෙන් සැරහී සිටිනාහ. කාලවිශෙෂය

වූකල්හි යටත් පිරිසෙයින් සතර අසඞ්ඛ්‍යයක් හා කප්ලක්‍ෂයෙක. මධ්‍යමපරිච්ඡෙදයෙන් අට අසඞ්ඛ්‍යයක් හා කප්ලක්‍ෂයෙක. උත්කෘෂ්ටපරිච්ඡෙදයෙන් සොළොස් අසඞ්ඛ්‍යයක් හා කප්ලක්‍ෂයෙක. මෙබඳුවූ මේ කාලවිභාගය ප්‍රඥාධික, ශ්‍රද්ධාධික, වීර්‍ය්‍යාධික බොධිසත්ත්වවරයන්ගේ වශයෙන් දතයුත්තේය. ප්‍රඥාධික බොධිසත්ත්වවරයන්ට ශ්‍රද්ධාවමධ්‍යමවන්නේය. ප්‍රඥාව තීක්ෂ්ණවන්නේය. ශ්‍රද්ධාධික බොධිසත්ත්වයන්ට ප්‍රඥාව මධ්‍යමවන්නේය. ශ්‍රද්ධාව තීක්ෂ්ණ වන්නේය. වීර්‍ය්‍යාධික බොධිසත්ත්වවරයන්ට ශ්‍රද්ධාව මධ්‍යම වන්නේය. වීර්‍ය්‍ය තීක්ෂණවන්නේය. සාමාන්‍යයෙන් අර්හත් ඵලවිමුක්තිය මුහුකුරුවන්නාවූ ධර්මයන්ගේ තීක්ෂණ, මධ්‍යම මෘදු භාවයෙන් මේ ත්‍රිවිධවූ ප්‍රභෙදය දතයුත්තේය.

උග්ඝටිතඥය, විපඤ්චිතඥය, නෙය්‍යය යන මොවුන්ගේ ප්‍රභෙද හෙයින් ත්‍රිවිධවූ බොධිසත්ත්වවරයෝ අභිනීහාරලක්‍ෂණයෙහි සම්භවවන්නාහ. ඔවුන් අතුරෙන් උග්ඝටිතඥ බොධිසත්ත්වතෙමේ සම්‍යක් සම්බුද්ධරජාණන් වහන්සේ සමීපයෙන් සතරපදයෙන් යුක්තවූ ගාථාවක් අසන්නේ තුන්පදයක් අසා නිමවන්නාවූ පළමු කොටම ෂඩ්අභිඥා හා සමග අර්හත් ඵලයට පැමිණෙන්ට සමර්ථවූ උපනිශ්‍රය ඇතිවන්නේය. විපඤ්චිතඥ බොධිසත්ත්වතෙමේ සර්වඥයන්වහන්සේ සමීපයෙන් එකම ගාථාවක් අසන්නේ සතරපදය අසා නිමවන්නාට පළමු කොටම ෂඩ්අභිඥා හා සිවුපිළිසිඹියා හා සමග අර්හත් ඵලයට පැමිණෙන්ට සමර්ථවූ උපනිශ්‍රය ඇතිවන්නේය. නෙය්‍ය බොධිසත්ත්වතෙමේ සර්වඥයන්වහන්සේ සම්මුඛයෙන් සතරපදයෙන් යුක්තවූ ගාථාවක් අසා නිමවන්නාට පළමු කොටම ෂඩ් අභිඥා හා චතුපටිසම්භිදා හා සමග අර්හත්ඵලයට පැමිණෙන්ට සමර්ථවූ උපනිශ්‍රය ඇතිවන්නේය.

මෙසේ කරණලද ප්‍රාර්ථනා ඇති ලබන ලද විවරණ ඇති බොධිසත්ත්වවරයෝ පාරමී ධර්මයන් පුරන්නාහු ක්‍රමයෙන් යථොක්තවූ කාලවිභාගයෙන් සම්‍යක්සම්බොධියට පැමිණෙන්නාහුය. ඒ ඒ කාලවිභාගය සම්පූර්ණවන්නාට පළමුකොට ඒ මහා බොධිසත්ත්වවරයෝ දවසක් දවසක් පාසා විශ්වන්තර දානය හා සමානවූ දන් දෙන්නාහුද, එබඳුවූම ශීලසංරක්‍ෂණාදී සියලු පාරමීධර්මයන් රැස්කරන්නාහුද, කර්මක්‍ෂයකර ඥානය මුහුකුරා නොගිය බැවින් අතුරෙහි බුද්ධත්වයට නො පැමිණෙන්නාහුය. කාලට පැසෙන්නාවූ ගොයමක් මෙන් සම්‍යක්සම්බොධියට

නිශ්චය කරණලද කාලවිශෙෂයාගේ නිෂ්පත්තීන්ම සම්බන්ධ වන්නේය. යථොක්තවූ කාලයට නොපිළිවන් වන්නේයයි, පාරමී ධර්මයන්ගේ පූරණය යථොක්ත වූ කාලවිශෙෂයෙන්ම සිද්ධවන්නේය සි, දතයුතුය.

තවද: කරණලද ප්‍රණිධාන ඇති ඒ මහාබොධිසත්ත්වවරයෝ අවීචිමහනරකයෙහි නූපදනාහ. ඔසුපත්නරකයෙහි උත්පත්ති නො වලකතලද්දේය. තවද ලොකාන්තරික මහනරකයෙහි නූපදනාහුය. රුක්සිදුරුවල අතුරක් නැතිව ඇවිළෙන්නාවූ වහ්නිජ්වාලාවෙන් පහරණලදුව බලවත් පීඩාවට පැමිණෙන්නාවූ නිජ්ඣාමතෘෂ්ණිකානම් ප්‍රෙතලොකයෙහි නූපදනාහ. ඔසුපත්නරකයෙහි නොයෙක් බුද්ධාන්තරවල ක්ෂුධාපිපාසායෙන් යුක්තවූ ක්ෂුත්පිපාසා ප්‍රෙතව නූපදනාහ. ගිනිගෙණ දිලියෙන්නාවූ ආයුධයෙන් ඔවුනොවුන් පැහැර පැසෙන්නාවූ කාලකඤ්ජක අසුර නම් ප්‍රෙතනිකායෙහිත් නූපදනාහ. වටුකුරුල්ලන් පමණින් මුත් ක්ෂුද්‍රප්‍රාණීවත් නූපදනාහ. ජාතිබධිර නොවන්නාහ. ජාතිමූග නො වන්නාහ. ජාතියෙන් පිළි නො වන්නාහ. ස්ත්‍රී නො වන්නාහ. පණ්ඩක නො වන්නාහ. නපුංසක නො වන්නාහ. සොවාන්-සෙදගැමි-අනගැමි-රහත් යන සතරමඟ සතරඵලයට නො පැමිණෙන්නාහ. මාතෘඝාතක-පිතෘඝාතක- අර්හන්තඝාතක- ලොහිතුප්පාදක- සඞ්ඝභෙදක ය යන පඤ්චානන්තරියකර්මය නො කරන්නාහ. නියත මිථ්‍යාදෘෂ්ටි නො වන්නාහ. අසංඥතලයෙහි නූපදනාහ. පඤ්චශුද්ධාවාසයෙහි අනාගාමීන්ම උපදනා හෙයින් එහි උත්පත්තියට හෙතුවෙක්ම නැත්තේයයි, මේ අටළොස් අභව්‍යස්ථානයට ඒ මහාබොධිසත්ත්වවරයෝ නො පැමිණෙන්නාහ.

තවද: “සතො සම්පජානො ආනන්ද බොධිසත්තො තුසිතා කායා චවිත්වා මාතුකුච්ඡිං ඔක්කමති” යනාදීන් දක්වනලද සොළොස්වැදෑරුම්වූ ආශ්චර්ය්‍යාද්භූත ධර්මයෝද, “ජායමානෙ සාරිපුත්ත බොධිසත්තෙ අයං දසසහස්සී ලොකධාතු සංකම්පති සම්පකම්පති සංපවෙධති” යනාදීන් දක්වනලද දෙතිස් පූර්වනිමිත්තද, යම් අතිකුත් බොධිසත්ත්වවරයන්ගේ අභිප්‍රාය සිද්ධියක් හා වසිතාප්‍රාප්තිප්‍රභෙදයක් ඇත්තාම් ඒ සියලු ආනිසංසත් දතයුත්තේය.

තවද: මහත්වූ කාරුණා ඇති අෂ්ටලොකධර්මයෙන් අකම්පතවූ ස්වභාව ඇති සියලු ලොකවාසීන්ට අසහායබන්ධුවූ මහානුභාවසම්පන්නවූ මේ මහාබොධිසත්ත්වවරයෝ මෙසෙ මෙබඳුවූ

ආශ්චර්‍යඅද්භූතවූ ගුණධර්‍මයන් ඇතිවන්නාහ. හැම කල්හි සද්ධර්‍මය ගොචරකොට ඇති නිර්‍මලවූ සංකල්පප්‍රවෘත්ති ඇති මහාබොධිසත්ත්වවරයෝ සර්‍වඥයන්වහන්සේ හැර අන්‍යසත්ත්වයන් විසින් සිතිනුත් නො සිතියහැකි මහත්වූ ප්‍රතාප තේජස් ආනුභාව ඇත්තාහ. මහත්වූ චණ්ඩමාරුතයෙන් ගසා උඩනඟන ලද තරඞ්ගමාලාවන් ඇති මහාසාගරය වෙලාන්තරය යම්සේ නො ඉක්මේ ද, එපරිද්දෙන්ම මහාබොධිසත්ත්වවරයෝත් තමන්ගේ ධර්‍මතාව ඉක්ම නො පවත්නාහ. ලොකයෙහි ඉපැද වැඩියාවූත් ඒ මහාබොධිසත්ත්වවරයෝ වඩනාලද භාවනාමනසකාර ඇතිබව හෙතුකොට ගෙණ අලපත නෙළුම්පත ඔත් දියත්තක් මෙන් අෂ්ටලොක ධර්‍මයෙන් වෙන්ව එහි නො ඇලෙන්නාහ. යම් බොධිසත්ත්ව කෙනෙකුන්ට ඉදින් තමන් කෙරෙහි ස්නෙහය යම් යම් පරිද්දෙකින් අඩුවන්නේ වී නමුත් සියලු සත්ත්වයන් කෙරෙහි කරුණාසෙනහය ඒ ඒ පරිද්දෙන් අඩුනොවී මතුමත්තෙහි වර්‍ධනය වන්නේය. යම්සේ චිත්තය තමා වශයෙහි පවතීද, එපරිද්දෙන් මහාබොධිසත්ත්වවරයෝ තමන්ගේ චිත්තවසඟව සිතුවක් නො කරන්නාහ. යම්සේ සෘද්ධිවිධඥනාදිවූ පඤ්චාභිඥා සඞ්ඛ්‍යාත සෘද්ධිවිශෙෂය අධිෂ්ඨාන වශිතාදි වශයෙන් තමාවශයෙහි පවත්නේ වී නමුත් එපරිද්දෙන් මහාබොධිසත්ත්වවරයෝ සෘද්ධ්‍යානුභාවයෙන් යුක්තයමෝ වේදුයි සිතූ සිතූ පරිද්දෙන් අණිමා ලඝිමාදි සෘද්ධිවිශෙෂය නො දක්වන්නාහ. බොධිසම්භාරධර්‍මයන් පුරා ඇවිදිනාවූ පුරුෂශ්‍රෙෂ්ඨවූ ප්‍රාඥවූ බොධිසත්ත්වවරයෝ රාගාදි දොෂයන් විසින් නො මඩනා ලැබෙති. රාගාදි දොෂයෝ කිසිසේත් ඒ බොධිසත්ත්වවරයන් නැසියත් නොහෙන්නාහ. මෙබඳුවූ උත්තමබොධිසත්ත්වවරයන් විෂයෙහි චිත්තප්‍රසාදය කොට සියලු සත්ත්වයන් විසින් සංසාර දුඃඛයෙන් මිදෙන්ට උත්සාහ කටයුත්තේය. ඒ බොධිසත්ත්වවරයන්ගේ උත්තමවූ ප්‍රතිපත්තිමාර්ගය දැන ඉගෙණ ඒ ප්‍රතිපත්තිවූ පරිද්දෙන් පිළිපැද සකලකෙලශයන් නසා අර්හත්ඵලඥානය සමධිගමය කරන්ට උත්සාහකටයුත්තේය.

තවද: සංක්ෂෙපයෙන් බුද්ධත්වය සිද්ධකිරීම සියලු පාරමිධර්‍මයන්ගෙ ඵල වන්නේය. විස්තරහෙයින් දෙතිස් මහාපුරුෂලක්ෂණ අසූඅනුව්‍යඤ්ජන, ව්‍යාමප්‍රභාදි නොඑක් ගුණ සමූහයෙන් බබළන්නාවූ රූපකායසමෘද්ධිය හා දසබල-චතුර්වෛශාරද්‍ය-ෂට්අසාධාරණ ඥාන-අෂ්ටාදශ ආවෙණිකධර්‍මාදී බුද්ධගුණයන්ට පිහිටවූ

නොඑක් කෙලලක්ෂගණන් ගුණධර්මසමූහයෙන් හොබනාවූ ධර්මකාය ශ්‍රී සමෘද්ධියදූයි ලොවුතුරා සම්‍යක් සම්බුදුරජාණන්වහන්සේ විසිනුත් ශ්‍රී මුඛයෙන් කියා නිමවන්ට නො පිළිවන් වන්නේය යි කියූ මේ රූපකාය සම්පත්තිය හා ධර්මකායසම්පත්තිය ඒ දානාදි සියලු පාරමිධර්මයන්ගේ මුඛ්‍යවිපාකයෙකැයි දතයුත්තේය.

තවද: මේ පාරමිතාවෝ නම් කවුරුද? කවර අර්ථයෙකින් පාරමිතා නම්වූද මේ පාරමිතාවෝ කවර ප්‍රකාරයක් ඇත්තාහුද? මොවුන්ගේ ක්‍රම කවරේද? ලක්ෂණ–රස–ප්‍රත්‍යුපස්ථාන–පදස්ථාන කවරේද? මොවුන්ට ප්‍රත්‍යය කවරේද? සංක්ලේශ කවරේද? නිර්මල බව කවරේද? ප්‍රතිපක්ෂධර්මයෝ කවුරුද? ප්‍රතිපත්ති කවරේද? විභාග කවරේද? සංග්‍රහ කවරේද? පාරමිතාධර්මයන් සිද්ධකරන්නාවූ උපාය කවරේද? කොපමණ කලෙකින් සිද්ධ කට හැකිද? ඒ පාරමිධර්මයන්ගේ අනුසස් කවරේද? ඵල කවරේදැයි මාතෘකාපද තබා මහාබෝධිසත්ත්ව ප්‍රතිපත්තිසූත්‍රය ත්‍රිපිටකයෙහි විභාග කොට දක්වනලද. අතිවිස්තර හෙයින් මා විසින් ඒ සියලු බෝධිසත්ත්වප්‍රතිපත්තිය විස්තර කොට නො කියනලද්දේය. එතකුදු වුවත් මෙසේ සංක්ෂේප හෙයින් බෝධිසත්ත්ව ප්‍රතිපත්තිය නුවණැති සත්ත්වයන් විසින් දතයුත්තීය ඒ මෛත්‍රෙය නම් මහාබෝධිසත්ත්වයෝ වුතලී මුහුණීනම් සර්වඥයන්වහන්සේ සමීපයෙන් ලබනලද විවරණ ඇති ව සොළසාසඞ්ඛ්‍යකල්පලක්ෂයක් මුළුල්ලෙහි මෙසේ මෙබඳු වූ පාරමිතාධර්මයන් පුරන්නාහු අවීචි මහානරකයෙහි එලන්නෝ ඇත්තමුත් දන්දීම කඩ නොකරන්නාහ. අඟපසඟ කපා කැබැලි කොට උක්යතෙක ලා මඩිනා උක් කැබිලිමෙන් පෙලා පීඩාකෙරෙමින් සිටියත් සිල් කඩ නො කරන්නාහ. සතර මහාවීපයෙහි ඓශ්වර්‍ය්‍යී හැර විවේකවාසය යි කියනලද් තවුස්වෙස් ම ගන්නාහ. සියලු සක්වළපුරා සිටි ගිනි රඟුරු මැඩගෙණ මුත් නුවණැත්තවුන් කරා ගොස් කුශලා කුශලාදි ධර්මයන් ම පිළිවිස්නාහ. පවන්වේගයෙන් අලැලීගියාවූ දුහිමෝරු ආදි චණ්ඩ මත්ස්‍යයන් විසින් ගැවැසීගත් මහාසමුද්‍රය බාහුවෙන් පැහැර පිහිනා ගෙණ ගොසිනුත් නිර්වාණ නැමැති පරතෙරට පැමිණෙන්ට වීර්‍ය්‍ය නොපසුබස්වා පවත්වන්නාහ. කඩුමුවහතින් කන් නාසා කපමින් සිටියදීත් අනුන් කෙරෙහි කොප නො කරන්නාහ. කඩුපතින් ඉසගසා සිඳිමින් සිටිය දීත් බොරු නො කියන්නාහ. සකලශරීරය සුණු විසුණු කොට විසුරුවමින් සිටියදීත් අධිෂ්ඨානය නොහරින්නාහ. තමා සන්තක රාජ්‍යය උදුරාගත් රජක්හු උත්කෘෂ්ට වූ ප්‍රියපුත්‍රයක්හු මෙන්

දූත මෛත්‍රී කරන්නාහ. අනුන් විසින් කරණ ලද සුවදුක් දෙකෙහි අනුනය ප්‍රතිඝය නැතිව, මධ්‍යස්තව පවත්නාහ. සතර දිග සිට නොයෙක් සියදහස්ගණන් කඩුගත් අත්ඇති පුරුෂයන් විසින් හා යක්ෂරාක්ෂසාදි භයඞ්කරස්වරූප ඇති සත්ත්වයන් විසින් භය සන්ත්‍රාස උපදවමින් සිටියදීත් නැති නො ගෙණ කුසල්ම කරන්නාහ. ජීවිතපරිත්‍යාගය කොටත් පාරමිතා සම්පාදනය නොඉක්මවන්නාහ.

මෙසේ මෙතෙක්කල් මුළුල්ලෙහි දශපාරමිධර්මයන් සලක්ෂණ වශයෙන් පුරන්නාවූ ඒ මෛත්‍රෙය බොධිසත්ත්වයෝ විශ්වන්තරාත්මභාවය හා සදෘශවූ පශ්චිමාත්මභාවයට පැමිණ සියලු පාරමිධර්මයන් මස්තකප්‍රාප්ත කොට එයින් චුතව අපගේ සර්වඥයන් වහන්සේ බුදුවන්නාට පළමු කොට ම තුෂිතදිව්‍ය ලොකයෙහි ඉපැ ද අප්‍රමාණවූ දිවසැපත් අනුභව කොට දෙවියන්ටත් ධර්ම දෙශනා කෙරෙමින් ඒ තුෂිත දිව්‍යලොකයෙහි සහපිරිවරින් වාසයකරන්නාහුය.

දූන් වූ කලී ඒ මෛත්‍රෙය සර්වඥයන්ට උත්පත්තිස්ථාන වූ රාජධානිය දක්වන්නා වූ තිලෝගුරු සම්‍යක්සම්බුදුරජාතන් වහන්සේ මෙසේ වදාළසේක. කෙසේදයත්:—

"තදා කෙතුමතී නාම රාජධානී භවිස්සති
ද්වාදසයොජනායාමා සත්තයොජන විත්ථතා,
ආකිණ්ණා නරනාරීහි පාසාදෙහි විචිත්තිතා
සෙවිතා සුඛසත්තෙහි අජෙය්‍යා ධම්මරක්ඛිතා"යි.

ඒ මෛත්‍රෙය බුදුන් බුදුවන සමයෙහි දිගින් නැගෙනහිර වාසල එළිපත පටන් බස්නාහිරවාසල එළිපතට අතුර දොළොස් යොදනක් පමණ ඇත්තා වූ, පුළුලින් දකුණුදිග වාසල එළිපත පටන් උතුරුදිග වාසල එළිපතට අතුර සත්යොදනක් පමණ ඇති කෙතුමතී නම් රාජධානියක් වන්නීය.

තවද ඒ කෙතුමතී නම් රාජධානිය ක්ෂත්‍රිය-බ්‍රාහ්මණය-වෛශ්‍යය-ශූද්‍රය යන සතර පක්ෂයෙහි වූ ස්ත්‍රීපුරුෂයන් හා නො එක් රූපසංස්ථාන ක්‍රියාවෙන් යුක්ත වූ අවශෙෂ ස්ත්‍රීපුරුෂයන් විසින් ගැවැසීගත්තීය. එක්මාල්-දෙමාල්-තුන්මාල්- සතරමාල්-පස්මාල්-සමාල්-සත්මාල් ආදි වූ මහල්වලින් හා වටය-සිව්රැස-දිගය-අටැස-සොළොසැස ගුරුළුපියා සටහන යනාදි නොඑක් සටහනින් විසිතුරුවූ මහදොර-සුළුදොර-සිව්මැදුරුකවුළු ආදියෙන් හෙබියා වූ පදනමින් හා රන්රසුදලින් වටකරණලද්දා වූ

දොරටු තොරණ- කෙසෙල්ගස්- ධජ- පතාකා- පුන්කලස් ආදී යෙන් පිරිවරණ ලද්දා වූ සිංහපඞ්ක්තිය, ව්‍යාඝ්‍රපඞ්ක්තිය, මෘග පඞ්ක්තිය, හස්තිපඞ්ක්තිය, අශ්වපඞ්ක්තිය, දිව්‍යරූපපඞ්ක්තිය, යනාදී වූ චිත්‍රකම්මරූපපඞ්ක්තියෙන් විචිත්‍ර වූ නීල-පීත- ලෝහි තොදාතාදි ප්‍රභාසමූහයෙන් දිලිසෙන්නාවූ රන්, රිදී, මැණික් මය වූ පර්වතකූටයන් හා සදෘශවූ අනෙකප්‍රකාර කෙළලක්ෂගණන් ප්‍රාසාදයෙන් විසිතුර වන්නීය. කුශල නැමැති ජලයෙන් පවිත්‍ර කරණලද අකුශල නැමැති කලුෂ ඇතිබැවින් පිරිසුදුවූ චිත්ත සන්තානයෙන් යුක්ත ශුද්ධසත්ත්වයන් විසින් සෙව්නාලද්දීය. නරෙන්ද්‍ර, සුරෙන්ද්‍ර, අසුරෙන්ද්‍රාදි කිසි පසමිතුරුකෙනකුන් විසින් වැද ජයගෙණ පලායා නොහැක්කිය. කුශලධම්ම, රාජධම්ම යෙහි නියුක්ත වූ රජදරුවන් හා අමාත්‍යාදීන් විසින් රක්ෂාකර ණලද බැවින් ධර්මිෂ්ට සත්ත්වයන්ගෙන් කරණලද ආරක්ෂා ඇත්තීය. මෙසේ කිසිසත්ත්වකෙනකුන් විසින් ජයගත නො හැක්කා වූ ශුද්ධසත්ත්වයන් විසින් සෙව්නාලද ප්‍රාසාදයෙහි විසි තුරු වූ සත්පුරුෂයන් විසින් ගැවැසීගත්තා වූ සත්යොදනක් පළල ඇති දෙළොස්යොදනක් දිග ඇති කෙතුමති නම් රාජ ධානියක් එකල්හි වන්නීය.

තවද ඒ කෙතුමතීනම් රාජධානිය කවරකලෙකැ කෙපමණ ආයුෂයක් ඇති මනුෂ්‍යයන් සමයෙහි වේ ද?යත්:—අසූදහසක් අවුරුද්දට ආයුෂය ඇති මනුෂ්‍යයන් සමයෙහි වන්නීය.

කෙසේද?යත්:—

ස්වර්ගමොක්ෂසැප සාද දෙන්නාවූ මේ ශාසනය පඤ්චප්‍රකාර අන්තර්ධානයෙන් අන්තර්ධානවූ කල්හි ලොකයෙහි අකුශලය උත්සන්න වන්නේය. වැදූමැණියෝය, කුඩාමැණියෝය, නැගි ණියෝය, බෑනණියෝය, පියානන් නැගිණියෝය, මයිලනුවන් ගේ ප්‍රජාපතීය යන මේ නුසුදුසු වූ ස්ථානයෙහි සත්ත්වයෝ රාගය උපදවන්නාහ. අනුභවකටයුතු වූ ප්‍රියවස්තුවෙහි ඉතා බලවත් වූ ලොභය උපදවන්නාහ. පුරුෂයන්ට පුරුෂයන් කෙරෙහි ඡන්දරගය හා ස්ත්‍රීන්ට ස්ත්‍රීන් කෙරෙහි බලවත් වූ ඡන්දරාගය උපදනේය. මවුන්ට හිත නො වන්නාහ. පියන්ට හිත නොවන්නාහ. මහණධම් නො කරන්නාහ. බඹසරවස් නො කරන්නාහ. කුලදෙටුවන් නුපුදන්නාහ. එකල අනුක්‍රම යෙන් අකුශලය උත්සන්නවීම් හේතුකොට ගෙණ අවුරුදු සිය යෙකින් පිරිසුන්නා වූ ආයුෂය පිරිහී දසඅවුරුද්දට ආයුෂය

වන්නේය. එසමයෙහි පස්මැසිකුමාරවරුන්ට පස්මැසිකුමාරිකාවන් ගෙණ හැර ආවාහ විවාහ කරන්නාහ. "චක්‍රවර්තිසූත්‍රය දෙසන්නා වූ බුදුහු එහෙයින් වදාළහ.

"දසවස්සායුකෙසු භික්ඛවෙ මනුස්සෙසු පඤ්චමාසිකා කුමාරිකා අලම්පතෙය්‍යා භවිස්සන්ති"යි.

එසමයෙහි සියලුරස අන්තර්ධාන වෙයි. ඇල්වී අන්තර්ධාන වෙයි. අමුසාල් වරාසාල් ආදිවූ අනුලෝමධාන්‍යයෙහි බත් රජදරුවන්ට අග්‍රභොජන වන්නේය. "එයින් වදාළහ බුදුහු:—
එම සක්විති සූත්‍රයෙහි, "දසවස්සායුකෙසු භික්ඛවෙ මනුස්සෙසු ඉමානි රසානි අන්තරධායිස්සන්ති සෙය්‍යථීදං සප්පි නවනීතං තෙලං මධුඵාණිතං ලොණං දසවස්සායුකෙසු භික්ඛවෙ මනුස්සෙසු කුද්‍රූසකො අග්ගභොජනානං භවිස්සති සෙය්‍යථාපි භික්ඛවෙ එතරහිසාලිමංසොදනො අග්ගාභොජනානං"යි.

එසමයෙහි ප්‍රාණඝාතාදි දශඅකුශලකර්මපථය අතිශයෙන් දීප්තිමත් වන්නේය. ප්‍රාණඝාතයෙන් වැළකීම් ආදිවූ දශකුශලකර්මපථය අන්තර්ධානවන්නේය. කුශලය යන නාමමාත්‍රයකුත් නැති වන්නේය. කුශලොත්පත්තිය කැලම නො වන්නීය. 'එසින් වදාළහ. බුදුහු'—

"දසවස්සායුකෙසු භික්ඛවෙ මනුස්සෙසු දසකුසලකම්මපථා සබ්බෙන සබ්බං අන්තරධායිස්සන්ති දසඅකුසකම්මපථා අතිවිය දිප්පිස්සන්ති දසවස්සායුකෙසු භික්ඛවෙ මනුස්සෙසු කුසලන්තිපි න භවිස්සති කුතො පන කුසලස්ස කාරකො'යි.

එකල මනුෂ්‍යයෝ අසවල්පුරුෂයා විසින් මවු මරණලද්දීය. පියා මරණලද්දේය. මහණබමුණෝ ජීවිතයෙන් තොරකරණලද්දුහ. කුලදෙට්ටුවන් ඇතිබවත් නොදන්නේය. එසේහෙයින් මෙතෙම ඉතා ආශ්චර්‍ය්‍යවත් සපත් පුරුෂයෙකැයි ඔහු ම පුදන්නාහුත් වෙති. ප්‍රශංසාකරන්නාහුත් වෙති. "එයින් වදාළහ බුදුහු:—

"දසවස්සායුකෙසු භික්ඛවෙ මනුස්සෙසු යෙ තෙ භවිස්සන්ති අමත්තෙය්‍යා අපෙත්තෙය්‍යා අසාමඤ්ඤා අබ්‍රහ්මඤ්ඤා න කුලෙ ජෙට්ඨාපචායිනො තෙ පුජ්ජා ච භවිස්සන්ති පාසංසා ච"යි.

එකල මනුෂ්‍යයෝ භයලජ්ජා නැති වැ ආචාරධර්මය ඉක්ම මෑණියෝය, දියනියෝය, නැගනියෝය, බුහුනෑනියෝය යනාදී සංඥ නූපදවා බලු කැණහිලුන් මෙන් නිර්ලජ්ජ වන්නාහ.
"එයින් වදාළහ බුදුහු:—

"දසවස්සා'යුකෙසු භික්ඛවෙ මනුස්සෙසු න භවිස්සන්ති මා'තා, ති වා මාතුච්ඡා'ති වා මාතුලානී'ති වා ආචරියභරියා'ති වා ගරූනං දාරා'ති වා සම්භෙදං ලොකො ගමිස්සති යථා අජෙළකා කුක්කුට සූකරා සොණසිගාලා"ති.

එකල මනුෂ්‍යයන්ට ඔවුනොවුන් කෙරෙහි බලවත් වූ කොපය නැවත නැවත උත්පත්තිවශයෙන් එළඹ සිටියේය. "වදාළේ මැනෝ:—

"දසවස්සායුකෙසු භික්ඛවෙ මනුස්සෙසු තෙසං සත්තානං අඤ්ඤමඤ්ඤම්හි තිබ්බො ආඝාතො පච්චුපට්ඨිතො භවිස්සති තිබ්බො ව්‍යාපාදො තිබ්බො මනොපදොසො තිබ්බං වධකචිත්තං මාතු'පි පුත්තම්හි පුත්තස්සපි මාතරි පිතුපි පුත්තම්හි පුත්තස්සපි පිතරිභාතුපි භාතරි භාතුපි භගිනියා භගිනියා'පි භාතරි"ති.

එසමයෙහි ශස්ත්‍රාන්තඃකල්පය වන්නේය. අන්තඃකල්පය තෙමේ දුර්භික්ෂාන්තඃකල්පය රොගාන්තඃකල්පය ශස්ත්‍රාන්තඃ කල්පය යි ත්‍රිප්‍රකාර වන්නේය. ඒ ත්‍රිවිධ වූ අන්තඃකල්පයන් අතුරෙන් සත්ත්වයන්ට ලොභය අධික වූ සමයෙහි දුර්භික්ෂාන්තං කල්පය වන්නේය. මොහය අධික වූ සමයෙහි රොගාන්තඃ කල්පය වන්නේය ද්වෙෂය අධික වූ සමයෙහි ශස්ත්‍රාන්තඃ කල්පය වන්නේය. ඒ හෙයින් දුර්භික්ෂාන්තඃකල්පයෙන් නටුවා වූ සත්ත්වයෝ ආහාරතෘෂ්ණාව බලවත්බව හෙතුකොට ගෙණ බොහෝසේ ප්‍රෙතලොකයෙහි උපදනාහ. රොගාන්තඃකල්පයෙන් නටුවා වූ සත්ත්වයෝ අප කෙරෙන් අන්‍ය වූ සත්ත්වයන්ට මෙබඳු වූ රොගයෙක් නුවූයේ වී නම් යහපත් වන්නේය යි මෙත්සිත් උපදනා හෙයින් බොහෝසේ ස්වර්ගයෙහි උපදනාහ. ශස්ත්‍රාන්තඃකල්පයෙන් නටුවාවූ සත්ත්වයෝ ඔවුනොවුන් කෙරෙහි බලවත්වූ ආඝාත ඇතිබැවින් නරකයෙහි උපදනාහ. මේ ත්‍රිවිධවූ අන්තඃකල්පයන් අතුරෙන් මෙතැන්හි ශස්ත්‍රාන්තඃකල්පය දතයුත්තේය.

එකල මනුෂ්‍යයෝ ඔවුනොවුන් කෙරෙහි මෘගසංඥා ඇතිවැ කොල තෙල මුවා ගණුව, මරව, හසුකරව යනාදීන් කුඩුවැඩියා බණන්නාහ. අතින් ඇල්වූ පමණක්න් තණපත් පරණලාපත් සියුම්මුවහත් ඇති කඩුපත්සේ මැවි යෙයි. එයද සත්ත්වයෝ ඔවුනොවුන් ඒ ආයුධයෙන් මරන්නාහ. "වදාළේ මැනෝ:—

"දසවස්සායුකෙසු භික්ඛවෙ මනුස්සෙසු සත්තාහං සත්ථන්තරකප්පො භවිස්සති. තෙ අඤ්ඤමඤ්ඤම්හි මිගසඤ්ඤං, පටිලභිස්ස

න්ති. තෙසං තිණ්හානි සත්ථානි හත්ථෙසු පාතුභවිස්සන්ති. තෙ තිණ්හෙන සත්ථෙන එස මගො එස මිගො,ති අඤ්ඤමඤ්ඤං ජීවිතා වොරොපෙස්සන්ති”යි.

ඒ සත්ත්වයන් අතුරෙන් යම් කෙනෙක් නුවණැත්තෝ වී නම් ඒ නුවණැති මනුෂ්‍යයෝ පළමු කොට ම මේ විනාශය අසා මේ ලොකවිනාශය පැමිණ සිටියේය. දෙදෙනකු එක තෙනකැ හිඳ ජීවත්වන්ට නො පිළිවන් වන්නේය යි සිතා ගල්ගුහා පර්වත ගුහා ආදියෙහි සතියක් පමණව සෑහෙන ආහාරපාන ගත්අතුරව වනලැහැප් අතුරට පර්වතගුහාවට දිවයින්වලට වැද දෙදෙනෙක් ඔවු‘නොවුන්ට නොපෙණෙනපරිද්දෙන් සැඟවී ඉඳිනාහුය. “වදාළේ මැ තෝ”:—

“තෙ තිණගහණං වනගහණං රුක්ඛගහණං නදීවිදුග්ගං පබ්බතවිසමං පවිසිත්වා සත්තාහං වනමූලඵලාහාරා යාපෙස්සන්ති”යි.

ඒ වනාන්තර, පර්වතගුහා, ගල්ගුහා ආදියෙහි වන්නාවූ සත්ත්වයන් හැර අවශෙෂ සත්ත්වයෝ ඔවු‘නොවුන් ආයුධයෙන් කොටාගන්නාහුය. සියලු පොළොව එක මස්කළුවිටක් මෙන් වන්නීය. ඉක්බිත්තෙන් සත්වැනිදවස් ඉකුත්වූ කල්හි තමන් තමන් සැඟවුනාවූ ස්ථානවලින් නික්ම ඔවු‘නොවුන් වැළඳ මම් යම්සේ ජීවත්ව උන්හෙයින් තොප විසින් දක්නාලද්දෙම් වෙම් ද? පින්වත් වූ සත්ත්වය, එපරිද්දෙන්ම තොපත් ජීවත්ව උන් හෙයින් මා විසින් දක්නාලද්දෙහි වේ දැ යි මෙසේ සමග සතුටු වන්නාවූ කථාවෙන් සුවදුක් කියා ඔවු‘නොවුන් අස්වසා නොමිය උන්හෙයින් ඔවු‘නොවුන් ඇස දකපූමෝ වේ දැ යි සතුටුව සමඟ වන්නාහුය. “වදාළේ මැ තෝ:-

“තෙ තස්ස සත්තාහස්ස අච්චයෙන තිණගහණා වනගහණා රුක්ඛගහණා නදීවිදුග්ගා පබ්බතවිසමා නික්ඛමිත්වා අඤ්ඤමඤ්ඤං ආලිඞ්ගිත්වා සභාගායිස්සන්ති. සමස්සා සිස්සන්ති. දිට්ඨා හො සත්ත ජීවසි දිට්ඨා හො සත්ත ජීවසී”යි මෙසේ ඒ සත්ත්වයෝ ඔවුනොවුන් සමඟ බවට පැමිණ පින්වත්වූ සත්ත්වයෙනි, අධික වූ අකුශලකර්මය හේතු කොට ගෙණ අපගේ නෑයෝ අපකියමන් නො ගෙණ ඇම්දෙන ම නටහ. උපායෙන් අපි ජීවත් වූම්හ. එසේහෙයින් අපි කුසල් කළමෝ වී නම් යහපත් වන්නේය යි කියා ප්‍රාණඝාතයෙන් වළක්නාහ ඒ ප්‍රාණඝාත යෙන් වැළැක්කාවූ දසඅවුරුද්දම ආයුෂය ඇති දරුවෝ උපදනාහ. “වදාළේ මැතෝ.

"අථඛො භික්ඛවෙ තෙසං සත්තානං එවං භවිස්සති. මයං ඛො අකුසලානං ධම්මානං සමාදානහෙතු එවරූපං ආයතං ඤාතික්ඛයං පත්තා. යන්නූන මයං කුසලං කරෙය්‍යාම. කිං කුසලං කරෙය්‍යාම යන්නූන මයං පාණාතිපාතා පටිවිරමෙය්‍යාම. ඉදං කුසලධම්මං සමාදාය වත්තෙය්‍යාමා'ති තෙ පාණාතිපාතා පටිවිරමිස්සන්ති. ඉදං කුසලධම්මං සමාදාය වත්තිස්සන්ති. තෙ කුසලානං ධම්මානං සමාදානහෙතු ආයුනා'පි වඩ්ඪිස්සන්ති. වණ්ණෙනපි වඩ්ඪිස්සන්ති. තෙසං ආයුනා'පි වඩ්ඪමානානං වණ්ණෙනා'පි වඩ්ඪමානානං දසවස්සායුකානං මනුස්සානං වීසති වස්සායුකා පුත්තා භවිස්සන්ති"යි

ඉක්බිත්තෙන් ඔවුන්ගේ දරුමුණුබුරෝ ක්‍රමයෙන් අදත්තාදානයෙන් වළකුම්හ, කාමමිථ්‍යාචාරයෙන් මෘෂාවාදයෙන් ප්‍රියශූන්‍යවචනයෙන්, පරුෂවාක්‍යයෙන්, සවර්ගමොක්ෂයට බාධක වූ ව්‍යර්ථකථාවෙන්, අධික ලෝභයෙන්, අධික ද්වේෂයෙන්, විපරීත දෘෂ්ටියෙන් වළකුම්හ. මේ දශකුශලකර්මපථය සමාදන්ව පවතුම්හ. දෙමව්පිය ආදීන් කෙරෙහි උපදනා අධර්මරාගය, ප්‍රයෝජන විනාදයුතු ප්‍රියවස්තු වහි අධිකාව උපදනා විෂමලෝභය, පුරුෂයන් පුරුෂයන්කෙරෙහි ස්ත්‍රීන්ට ස්ත්‍රීන් කෙරෙහි බලවත් වූ ඡන්දරාගවශයෙන් උපදනා මිථ්‍යාධර්මය යන මේ ත්‍රිවිධ වූ ධර්මයන් දුරුකරම්හ. මවුන්ට හිතවම්හ. පියන්ට හිතවම්හ. මහණුවම් කරම්හ. බඹසරවස් රකුම්හ. කුලදෙටුවන් පුදම්හ යි කියා ඒ කුශලධර්මයන් පුරන්ට පටන්ගන්නාහ.

මෙසේ මතුමත්තෙහි වඩ වඩා ඒ සත්ත්වයන් කුශලධර්මයෙහි හැසිරෙන්ට පටන්ගත් කල්හි විසිඅවුරුද්දට ආයුෂය ඇති මනුෂ්‍යයන්ට තිස්අවුරුද්දට ආයුෂය ඇති දරුවෝ උපදනාහ. තිස්අවුරුද්දට ආයුෂය ඇත්තවුන්ට සතළිස් අවුරුද්දට ආයුෂය ඇති දරුවෝ උපදනාහ. සතළිස්අවුරුද්දට ආයුෂය ඇත්තවුන්ට පණස් අවුරුද්දට ආයුෂය ඇති දරුවෝ උපදනාහ යනාදී ක්‍රමයෙන් දෙසියයක් අවුරුද්දට ආයුෂය ඇති වන්නාහ.

ඒසමයෙහි මේ ජම්බුද්වීපය හුනාවනයක් බටවනයක් මෙන් අතුරු නැති වැ මනුෂ්‍යයන්ගෙන් ගැවැසීගන්නේය. කුකුළුපතනා ගම්නියම්ගම් රාජධානීයෙන් සමෘද්ධවන්නේය. සයලු ජනපදයෝ සොරුන් සතුරන්ගෙන් භය නැති හෙයින් සුභික්ෂ වන

නාහ. එකල මේ බරණෑස්නුවරට එම නම වන්නේය. ඉක්බිත්තෙන් දෙසියයක්අවුරුද්දම ආයුෂය ඇති මනුෂ්‍යයෝ කුශල කර්මවිපාකය දක්නාහු වඩ වඩා මතුමත්තෙහි දානසීලාදි කුශල ධර්මයන් පුරන්නාහ. ඉක්බිත්තෙන් අනුක්‍රමයෙන් ආයුෂය මතු මත්තෙහි කුශලධර්මසමාදානයෙන් වැඩෙමින් තුන්සියයෙක, සාරසියයෙක, පන්සියයෙකැයි කියාද, ඉක්බිත්තෙන් අවුරුදු දහසෙක, දෙදහසෙක, තුන්දහසෙක, සාර දහසෙක, පන් දහසෙකැයි කියාද ඉක්බිත්තෙන් දසදහසෙක, විසිදහසෙක, තිස්දහසෙක, සතලිස්දහසෙක, පණස්දහසෙක, සැටදහසෙක, සැත්තෑදහසෙක, අසූදහසෙක, අනූදහසෙකැයි කියාද, ආයුෂය මතුමත්තෙහි වැඩෙන්නේය. අනූදහසක් අවුරුද්දම ආයුෂය ඇතිකල්හි බරණෑස්නුවර නම් පෙරළී යොදනක් පමණ උතපලනම් නුවරෙක් වන්නේය. ඉක්බිත්තෙන් මනුෂ්‍යයන් අධිකතරව දශකුශලකර්මයෙහි හැසිරෙන්ව පටන්ගත් කල්හි ලක්‍ෂයක් අවුරුද්දම ආයුෂය වන්නේය.

එකල උතපලනම් නුවර නම් පෙරලී සත්යොත්නක පමණ පදුමනම් නුවරෙක් වන්නේය. ඉක්බිත්තෙන් සත්ත්වයන් වඩ වඩා කුශලධර්මය පුරන්ට පටන්ගත්කල්හි කෙළලක්‍ෂයක් අවුරුද්දම ආයුෂය වන්නේය. ඉක්බිත්තෙන් සත්ත්වයන්ගේ කුශලකර්මසමාදානයෙන් මතුමත්තෙහි ආයුෂය වඩාගෙණ ගොස් අසංඛ්‍යයක් අවුරුද්දට ආයුෂයවන්නේය. එසමයට පදුමනම් නුවර න.ම් පෙරළී දොළොස්යොදනක් පමණ මඤ්ජූර නම් නුවරෙක් වන්නේය. එසමයෙහි මිනිස්ලොව දෙව්ලොවටත් වඩනේය. උපන්කල් නොදනිති, මියෙන කල් නොදනිති, ජරා විලිපිලිනැත, රොගාන්තරාය නැත. එසේ හෙයින් නොපෙණෙන්නාවූ ජරා මරණ ඇති සත්ත්වයෝ නරකාදුකින් බලවත් පීඩාවිඳි සත්ත්වයන් ස්වර්ගලොකයෙහි ඉපද දුක්සිහිනැතිවීමෙන් කුශල් කිරීමට ප්‍රමාදවන්නාක් මෙන් නැවතත් කුශලධර්ම පූරණයෙහි ප්‍රමාදවන්නාහ. නැවත අකුශලකර්මයෝ සත්ත්වසන්තානයෙහි පහළවන්නාහ. හලාහලවිසම්ශ්‍ර ජලය වැදීමෙන් අමෘතජලය පිටත්ව පලායන්නාක් මෙන සත්ත්වයන්ගේ සන්තානයෙහි අකුශලකර්මය වැදීමෙන් කුශලධර්මය පිරිහෙන්ට පටන්ගන්නෙය. ඒ කුශලධර්මය පිරිහෙනට පටන්ගත්කල්හි ආහාරජ රූපයන්ගේ පිරිහීමෙන් අවශෙෂවූ කර්මජ-චිත්තජ-ඍතුජ-රූපයන් තුනදෙනාගේ පරිහාණිය මෙන් ආයුෂය පිරිහෙන්නේය. එකල අසංඛ්‍යයක් අවුරුද්දම ඇති ආයුෂය ක්‍රමයෙන් පිරිහී කෙළ

ලක්ෂයක් අවුරුද්දට ආයුෂය වන්නේය. එයින් ක්‍රමයෙන් පිරිහී
ලක්ෂයක් අවුරුද්දට ආයුෂය වන්නේය. එයින් ක්‍රමයෙන් පිරිහී
අනූදහසක් අවුරුද්දට ආයුෂය වන්නේය. ඒ අනූදහසක් අවුරුදු ක්‍රමයෙන් පිරිහී අසූදහසක් අවුරුද්දට ආයුෂය ඇතිව සිටින්නේය. එසමයෙහි මනුෂ්‍යයෝ අසූදහසක් අවුරුද්දට ආයුෂය ඇතිවන්නාහ. පන්සියයක් හැවිරිදි කුමාරයාට පන්සියයක් හැවිරිදි කුමාරිකාවගෙන් සැර ආවාහ විවාහ කරන්නාහ. එකල සියලු ජම්බුද්වීපයෙහි උත්තමාධමවූත් සියලු සත්ත්වයෝ ආහාරපානවර්ගීය, ඛාද්‍යය, භෝජ්‍යය, ලෙය්‍යය, පෙය්‍යය යන චතුර්විධ ආහාරවර්ගීයෙන්ද, වස්ත්‍රාභරණ සුවඳමල් සුවඳවිලවුන් ආදියෙන්ද, මුක්තාමාණික්‍යාදි දශවිධ රත්නයෙන් හා ශාලිව්‍රීහ්‍යාදි සප්තවිධ ධාන්‍යයෙන් හා අපරියන්තවූ උපභෝගපරිභෝග සම්පත් පිරිවර ආදියෙන්ද, දිව්‍යවූ පංචකාමකොට්ඨාසයක් හා සමානවූ ඉෂ්ටවූ කාන්තවූ මනවඩන්නාවූ සැපවිඳින්ට සුදුසුවූ රූප-ශබ්ද-ගන්ධ-රසස්ප්‍රෂ්ටව්‍ය සංඛ්‍යාත පඤ්චකාමගුණයෙන්ද යුක්තවන්නාහ. වර්ෂාවත් දෙපෝයෙන් දෙපෝය, දසදවසින් දසදවස, පස්දවසින් පස්දවස, මධ්‍යමයාමයෙහි ගුම්රසය වඩමින් වස්නේය.

එකල මඬුර නම් නුවර නම්පෙරළී දිග දෙළොස්යොදුන් පුළුල සත්යොදුන් යටකී සියලු සම්පතින් සමෘද්ධවූ කේතුමතී නම් රාජධානියෙක් වන්නේය. "එයින් වදාළහ බුදුහු":

"අසීතිවස්සසහස්සායුකෙසු භික්ඛවෙ මනුස්සෙසු අයං බාරාණසී කෙතුමතී නාම රාජධානී භවිස්සති. ඉද්ධාචෙව ඵීතාච, බහුජනාච, ආකිණ්ණමනුස්සාච, සුභික්ඛාච අසීතිවස්සසහස්සායුකෙසු භික්ඛවෙ මනුස්සෙසු ඉමස්මිං ජම්බුදීපෙ චතුරාසීති නගරසහස්සානි භවිස්සන්ති කෙතුමතීරාජධානි පමුඛානී"යි.

මෙසේ ඒ කේතුමතී නම් රාජධානිය අසූදහසක් අවුරුද්දට ආයුෂය ඇති මනුෂ්‍යයන් සමයෙහි වන්නේය.

මෙසේ කේතුමතී නම් රාජධානියෙහි උත්පන්නය දක්ෂා දූන් එනුවර සංඛ නම් රජ්ජුරුකෙනෙක් සතරමහද්වීපයට අධිපතිව එකාතපත්‍රකොට චක්‍රවර්ති රාජ්‍යශ්‍රී අනුභව කෙරෙමින් අපරියන්තවූ සේනාවාහණයෙන් හා සත්රුවනින් හා නොයෙක් ආනුභාවයෙන් යුක්තව උපදනාහුයයි, දක්වන්නාවූ ත්‍රෛලොක්‍යගුරු සම්‍යක්සම්බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළසේක.

"සඞ්ඛො නාම සො රාජා අනන්තබලවාහනො,
සත්තරතන සම්පන්නො චක්කවත්ති මහබ්බලො
ඉද්ධිමා යසසා චෙව සබ්බකාම සමප්පිතො,
හතපච්චත්ථිකං ඛෙමං අනුසාසති ධම්මතො"යි.

ඒ රජ්ජුරුවෝ කෙබඳුවූ ශ්‍රීසමෘද්ධියක් ඇත්තාහුද?යත්:— ඒ රජ්ජුරුවෝ චූකලි ඇත්සෙනඟය, අස්සෙනඟය, රථසෙනඟය, පාබලසෙනඟය,යන අපමණවූ සිව්රඟසෙනඟින් ගැවසී ගත්තාවූ සතිස්යොදනෙක පැතිර සිටිනාවූ නිරන්තරයෙන් උපස්ථාන කරන්නාවූ පිරිසුදුවූ අවිකලාඞ්ගවූ පුරුෂපරාක්‍රම සඞ්ඛ්‍යාතබලයෙන් යුක්තවූ නොයෙක් සේනාවාහන ඇත්තාහ. චක්‍රරත්නය-හස්තිරත්නය-අශ්වරත්නය- මාණික්‍යරත්නය- ස්ත්‍රීරත්නය- ගෘහපතිරත්නය- පරිනායකරත්නය යන සප්තරත්නයෙන් සමන්විතයහ. දහසක් දැවිඇති නිම් වළළුසහිත නැබසහිත සර්වාකාරයෙන් සම්පූර්ණ චක්‍රරත්නය දෙදහසක් කොදෙවු පිරිවර කොට ඇති සතරමහාද්වීපයෙහි පවත්වන්ට සමර්ථවූ චක්‍රවර්ති රාජානුභාවය ඇත්තාහ. අවශේෂජනයන්ගේ බලයට වඩා අධිකවූ මහත්වූ කායබල ඥානබල-කුශලබියෙන් සමන්විතයහ. රජ-බමුණු-වෙළඳ-ගොවි සතරකුලෙහි ප්‍රභූසත්ත්වයන් හා අධිකාර සෙනෙවිරත්-ඈපා-මාපා-මඩලී යන පඤ්චප්‍රධානයන් හා අන්තඃපුර-පිටිපුර-සම්මිත්තන් ආදි නොයෙක් පරිවරජනයන් ගෙන් පිරිවැරුම් ඇත්තාහ.

ඒ සඞ්ඛනම් චක්‍රවර්තිරජ්ජුරුවන්ගේ ශරීරයෙන් සඳුන් සුවඳ වහණය වන්නේය. මේ එක්සෘද්ධියෙක. මුඛයෙන් මහනෙල්මල් සුවඳ පැතිරෙන්නේය. මේ දෙවනසෘද්ධිය. දිව්‍යපුත්‍රයෝ සතරදෙනෙක් සතරදිග හැමකල්හි කඩුගත් අත් ඇතිව රැකවල් ගෙණ සිටිනාහ. මේ තුන්වැනිසෘද්ධියෙක. ආකාශචාරී වන්නාහ. මේ සතරවැනිසෘද්ධිය. තවද දිව්‍යරූපයට නොපැමිණියාවූ මනුෂ්‍යරූපය ඉක්ම සිටියාවූ විශිෂ්ටවූ රූපඇත්තාහ. මේ එක්සෘද්ධියෙක. අනුභවකළ ආහාර පානවර්ගය ඇඹුල් නොවී සමව පාකය කරන්නාවූ කර්මජතෙජොධාතුවෙන් යුක්තයහ. මේ දෙවැනිසෘද්ධිය ජීවිතාන්තය දක්වාත් සියලු ලෝවැස්සන් දැක සෑහීමකට නො පැමිණෙන්නාවූ ශ්‍රීසමෘද්ධිය ඇත්තාහ. මේ තුන්වැනිසෘද්ධිය. සිතුසිත හා සමග ආකාශයට පැනනැගී කැමැති දිගන්තට යන්ට සමර්ථ වන්නාහ. මේ සතරවැනිසෘද්ධිය මෙසේ සිව්ප්‍රකාර චතුර්විධසෘද්ධියකින් සමන්විතයහ. ඇසින් දැක ඇලුම් කටයුතුවූ ඉෂ්ට- කාන්ත- මනාප-රූප- ශබ්ද- ගන්ධ-රස-

ස්ප්‍රෂ්ටව්‍ය සඞ්ඛ්‍යාත පඤ්චකාමගුණයෙන් හා දිව්‍යසැපතක් හා සමානවූ ආස්තරණ-ප්‍රාපූරණ-දුසි-දූය හා දිව්‍යසැපතක් හා සෙෂ ත්‍රුවස්තු සඞ්ඛ්‍යාත වස්තුකාමයෙන් සමන්විතවූහ. නසනලද පසමිතුරන් ඇති නිර්භයවූ සුභික්ෂවූ සියලු පෘථිවීමණ්ඩලය මහත්වූ යසපිරිවරින් හා ආනුභාවයෙන් යුක්තව දසරාජධර්මයෙන් අකොප්‍යව දාන-ප්‍රියවචන-අර්ථචර්‍ය්‍යා- සමානාත්මතා යයි කියනලද සතරසංග්‍රහවස්තුවෙන් ජනරජනය කෙරෙමින් අනුශාසනාකරන්නාහුය.

“එසේහෙයින් වදාළහ බුදුහු”

“අසීතිවස්සසහස්සායුකෙසු භික්ඛවෙ මනුස්සෙසු කෙතුමතී යා රාජධානියා සඞ්ඛො නාම රාජා උප්පජ්ජිස්සති චක්කවත්ති ධම්මිකො ධම්මරාජා චාතුරන්තො විජිතාවී ජනපදත්ථාවරියප්පත්තො සත්තරතනසමන්නාගතො තස්සි’මානි සත්තරතනානි භවිස්සන්ති සෙය්‍යථීදං? චක්කරතනං, හත්ථිරතනං, අස්සරතනං, මණිරතනං, ඉත්ථිරතනං, ගහපතිරතනං, පරිණායකරතනමෙව සත්තමං; පරොසහස්සං ඛො පනස්ස පුත්තා භවිස්සන්ති සූරා, වීරඞ්ගරූපා පරසෙනප්පමද්දනා සො ඉමං පථවිං සාගරපරියන්තං අදණ්ඩෙන අසත්ථෙන ධම්මෙන අභිවිජිය අජ්ඣාවසිස්සතී”ති.

මෙසේ සඞ්ඛනම් චක්‍රවර්තිරජ්ජුරුවන්ගේ උත්පත්තිය දක්වා දැන් ඒ රජ්ජුරුවන් වසන්නාවූ ප්‍රාසාදසමෘද්ධිය දක්වන්නාවූ බුදුරජාණන්වහන්සේ මෙසේ වදාළසේක:—

“පාසාදො සුකතො තස්ස දිබ්බවිමානසාදිසො.
පුඤ්ඤකම්මාභිනිබ්බත්තො නානාරතනවිචිත්තිතො
වෙදිකාහි පරික්ඛිත්තො සුවිභත්තො මනොරමො
පභස්සරච්චුග්ගතො සෙට්ඨො දුද්දික්ඛො චක්ඛුමූසනො
රඤ්ඤො මහාපනාදස්ස, පච්චුත්ථො රතනාමයො
තං යූපං උස්සාපෙත්වාන සංඛරාජා වසිස්සති”යි

ඒ කෙතුමතී නම් රාජධානියෙහි මහාපනාදරජ්ජුරුවන් හා සඞ්ඛනම් රජ්ජුරුවන් හා දෙදෙනාගේ කුශලකර්මයෙන් උපන්නාවූ දිව්‍යප්‍රාසාදයක් හා සමානවූ ප්‍රාසාදශ්‍රේණියක් පහළවූයේය. ඒ ප්‍රාසාදය කෙබඳුද? යත්:—අනෙකප්‍රකාර සත්රුවන්කර්මාන්තයෙන් විසිතුරුවන්නේය. පබළුමය, මැණික්මය, රන්රිදීමය, ලෝහිතඞ්කමය, මැසිරිගල්මය, පිළිව්හණමය, වෛරළුමිණිමය, සත්රුවන්මය, පිළිපදනම් වල්ලෙන් හා තිසුවත්තෙන් වටකර

කළේද්දේය. මහදොර, සුළුදොර, මහකවුළු, සීමැදුරුකවුළු, හිණිමන්පංකති, පියනැවපංකති, එක්මාල්, දෙමාල්, තුන්මාල්, සතරමාල්, පස්මාල්, කන්කුලු, ආහඳු ආදී වින්‍යාසයෙන් මනාකොට විභාගකරණ ලද්දේය. ඒ ප්‍රාසාදය බලන්නාවූ සත්ත්වයන් නමාහැර අන්තැනකට යා නොදී සිත්අලවන හෙයින් ඉතා සිත්කලු වන්නේය. නභෝමධ්‍යගත සූර්යමණ්ඩලය මෙන් දසදිස පැතිරෙන්නාවූ රශ්මිඇතිව ඉතා පැහැසර වන්නේය. උසින් පස්විසියොදනක් පමණ ඇත්තේය: උත්තමසත්ත්වයන් විසින් වාසය කටයුතු හෙයින් හා ප්‍රාර්ථනා කටයුතු හෙයින් ශ්‍රේෂ්ඨ වන්නේය. දිලියෙන්නාවූ තේජස් ඇතිබැවින් ඇසරුජා වත් ඇස මධ්‍යාහ්නවේලේ වැදගත් හිරුරැසක් මෙන් ඇසකත ඇස දල්වා බැලිය නොහැක්කේය, ඒ ප්‍රාසාදය බලන්නාවූ සත්වයන්ගේ ඇස් පැහැරගන්නාක් මෙන් තමහට විමුඛවිය නොදෙන හෙයින් පිටිපෑ යා නොදෙන්නේය.

මෙසේ මෙබඳුවූ පෙර මහාපනාද නම් රජ්ජුරුවන් වාසය කළාවූ සප්තරත්නමයවූ විචිත්‍රවූ ප්‍රාසාදය නංවා සඞ්ඛ නම් චක්‍රවර්ති රජ්ජුරුවෝ ඒ ප්‍රාසාදයෙහි වාසයකරන්නාහ. ඒ ප්‍රාසාදය සඞ්ඛ නම් චක්‍රවර්ති රජ්ජුරුවන්ට කෙසේ පහළවීද? යත්:-

යටගිය දවස බරණැස්නුවර වසන්නාවූ කුළුපතුදෙපුතු පියකෙනෙක් නුවරින් නික්ම හුණවතයට වන්නාහ. එතෙකෙහි එක් පසේබුදු කෙනකුන් වහන්සේ හිමාලවනයේ ගඳමාදන්පව්වේ නන්දමූලක නම් ප්‍රාග්භාරයෙහි වසනසේක් සත්ත්වයන්ට අනුග්‍රහකරණු කැමැතිව උදෑසනම නැඟීසිට සිරුරු පිළිදැගුම් කොට අනවතප්ත ජලයෙන් මූඛය සොධා නාළිය දැවට්ටු වළඳා සත්යොදනක් පමණ ඇති රත්ගල්තලා මුදුනෙහි සිට ගැටවට්ටුගන්වා ඉඳුනිල්මිණිවන් පාත්‍ර අතින් ගෙණ සෘධියෙන් ආකාශයට පැනනැඟී පස්වණක් වලාපඞ්කති මඩිමින් අවුත් බරණැස්නුවරට නුදුරු තැනකට බැස නුවරට අභිමුඛව නික්මුණුසේක. ඒ කුළුපතුදෙපුතුපිය දෙදෙන නුවරට සිඟා වඩනාවූ ඒ පසේබුදුන් වහන්සේ දැක පසගපිහිටුවා වැඳ පාත්‍රය ගෙණ ගෘහතරට වඩාගෙණ ගොස් දවල් කම්මානනයට ගෙණගිය ලාබත් වළඳවා වළඳා අනන්තයෙහි සවාමීනි කොතනකට වඩනාසේක් දැයි විචාළහ, එබස් අසා පසේබුදුන්වහන්සේ උපාසකවරිනි, දූන් ඇතවස පැමිණියේය. එසේහෙයින් වස්සාරමන වසන්ට සුදුසුවූ ස්ථානයක් පරීක්ෂාකොට ඇවිදුම්හයි වදාළසේක.

එබස් අසා දෙපුතුපියෝ ස්වාමීනි! අපි නුඹවහන්සේට
වසන්ට සුදුසුවූ ස්ථානයක් කරම්හයි කියා දිඹුල්දණ්ඩෙන් පාහිඳු
වා හුණදණ්ඩෙන් භිත්ති බැඳ තණකොළින් උඩ සොයා මැටි
ගසා දොරළි දොරබා ලා පන්සල පසේබුදුන් වහන්සේට පිළි
ගන්වා කුළුආදිය විකොට කලවිටිපොළා පිදුරුසලා කරල් අවුලා
ලබතලද ධාන්‍යයෙන් සාල් ගෙණ බත් පිස ලත්ලත් සැරියේ
මුංකොමු යවකොමු මත්ස්‍යමාංස පලාකොල ආදිවූ සූපව්‍යඤ්ජන
හා සමඟ බත් දන්දී මෙසේ තුන්මසක් මුළුල්ලෙහි උපස්ථාන
කොට වස්ඉක්ඛිති පවරා අනතයෙහි පසේබුදුන් වහන්සේ
වඩනා අවස්ථාවෙහි තුන්සිවුරු සපයා පිළිගන්වා යවූහ. මෙම
ක්‍රමයෙන් සත් ඇතවසෙක සත්පසේබුදු කෙනකුන්වහන්සේ
එම්පන්සල වස්වා සිව්පසයෙන් උපස්ථාන කළහ. ඒ දෙපුතු
පියෝ ආයුපමණින් මනුෂ්‍යලොකයෙහි සිට කළුරිය කොට
තවුතිසා භවනයෙහි ඉපැද තුන්කෙළසැටලක්‍ෂයක් හවු
රුදු මුළුල්ලෙහි මහත්වූ දිව්‍යසම්පත් අනුභවකොට ඒ ආයු
ෂය ගෙවා කළාවූ කුශලය ගෙවී නො ගියහෙයින් එයින් මත්
තෙහි යාමදිව්‍යලොකයෙහි ඉපද තුදුස්කෙළසතලිස්ලක්‍ෂයක්
අවුරුදු මුළුල්ලෙහි මහත්වූ දිව්‍යසැපත් අනුභවකොට එහි ආයු
ෂය ගෙවා කළකුශල් නො ගෙවුනුහෙයින් මත්තෙහි තුෂිත
දිව්‍යලොකයෙහි ඉපද සත්පණස්කෙළසැටලක්‍ෂයක් හවුරුදු
මුළුල්ලෙහි මහත්වූ දිව්‍යසැපත් අනුභවකොට එහිත් ආයුෂය
ගෙවා කළකුශල් නො ගෙවුනු හෙයින් එයින් මත්තෙහි නිර්මාණ
රතී දිව්‍යලොකයෙහි ඉපැද දෙසියතිස්කෙළසතලිස්ලක්‍ෂයක්
හවුරුදු මුළුල්ලෙහි දිව්‍යඓශ්වර්‍ය්‍ය අනුභවකොට එහිත් ආයු
ගෙවා කළකුශල් නො ගෙවුනහෙයින් එයින් මත්තෙහි පරනිර්
මිතවශවර්ති දිව්‍යලොකයෙහි ඉපැද නවසියඑක්විසිකෙළසැ
ටලක්‍ෂයක් හවුරුදු මුළුල්ලෙහි මහත්වූ දිව්‍යඉසුරු වළඳා එහිත්
ආයුෂය ගෙවා කළකුශල් නො ගෙවුන හෙයින් නැවත එයින්
පාත නිර්මාණරතී දිව්‍යලොකයෙහි ඉපැද එහි ආයුපමණින් දිව
සැපත් අනුභවකොට එයින් පාත තුෂිත දිව්‍යලොකයෙහි ඉපැද
එහිත් ආයුපමණින් දිවසැපත් අනුභව කොට එයින් යට යාම
දිව්‍යලොකයෙහි ඉපැද එහිත් ආයුපමණින් දිවසැපත් වළඳා එ
යින් පාත තවුතිසා දිව්‍යලොකයෙහි ඉපැද එහිත් ආයුපමණින්
දිවඉසුරු වළඳා මෙසේ සදිව්‍යලොකයෙහි අනුලොම ප්‍රතිලොම
වශයෙන් මහත්වූ ශ්‍රීවිභූති අනුභව කෙරෙමින් ඇවිදිනාහුය.

“කීයේ මැනෝ?

“තත්ථ චිත්තෙ පසන්නම්හි අප්පිකා නාම දක්ඛිණා,
තථාගතෙ වා සම්බුද්ධෙ අථවා තස්ස සාවකෙ”ති.

මෙසේ ඒ දෙපුතුපියන් ස්වර්ගසම්පත් අනුභව කෙරෙමින් සිටියදීම මහාසම්මතවංශයෙහි මිසුළුනුවර සුරුචි, නම් රජ්ජුරුකෙනෙක් වූහ. ඒ රජ්ජුරුවෝ පුතනුකෙනකුන් ලැබ ඒ පුතනුවන්ටත් සුරුචිකුමාරයෝය යි කියා ම නම් තිබූවාහුය. පුරාතනයෙහි රජදරුවෝ වූකලි තමන්ගේ දරුවන් මෙසේකල්හි මොහු නිහතමානීව, එඩි දප් නැතිව ශීඝ්‍රතාණක්සම්ව ලොක චාරිත්‍ර දැනගන්නාහු වෙති යි, සිතා තමන්ගේ නුවර දිශාපාමොක්ආචාරීන් ඇතිව තිබැදීත් සිල්පඋගන්නා පිණිස දුරු අන්‍යරාජ්‍යයකට යවන්නාහ.

එසේහෙයින් ඒ සුරුචිරජ්ජුරුවෝත් සොළොස්හැවිරිදි පුතණුවන් සමීපයට කැඳවා ගෙන්වා ගෙණ එක්පටවහන් සඟලක්, පත්කුඩයක් හා මස්සෙන් දහසක් දී පුත! තක්සලානුවරට ගොස් සිල්ප උගණුවයි යවූහ. ඒ සුරුචිකුමාරයෝ යහපතැයි කියා දෙමවුපියන් වැඳ නුවරින් නික්ම ක්‍රමයෙන් තක්සලානුවරට ගොස් නුවර වාසල්දොර ශාලාවෙක උන්හ. බරණැස් රජ්ජුරුවන්ගේත් පුත්‍රවූ බ්‍රහ්මදත්ත නම් කුමාර කෙනෙක් එසේ ගොස් සුරුචිකුමාරයන් හුන් පෝරුව මත්තෙහිම හුන්හ. ඔහු දෙදෙන ඔවුනොවුන්ගේ නම් ගොත් විචාරා විශ්වාසීව එක්වම ආචාරීන් සමීපයට ගොස් ආචාරීකොඨාසය දී සිල්ප උගන්ට පටන් ගෙණ නොබෝකලකින්ම සිල්ප ඉගෙණ නිමවා ආචාරීන් පිළිවිස මඳතැනක් දක්වා මාර්ගයේ එක්වම ගොස් සද මංසන්ධියෙහි සිට ඔවුනොවුන් වැළඳ මිත්‍රධර්මය රක්නා සඳහා, කතිකාවක් කරන්නාහු ඉදින් මට පුතණු කෙනෙක් උපන්නාහු වී නම් තොපට දියනි කෙනෙක් උපන්නාහු වී නම් හෝ තොපට පුතණු කෙනෙක් මට දියනි කෙනෙක් උපන්නාහු වී නම් හෝ ඔවුන් දෙදෙනා ඔවුනොවුන්ට ආවාහ විවාහ කරම්හයි, මෙබඳුවූ කතිකාවක් කළහ. මෙසේ කතිකා කොට ඒ දෙදෙනා තම තමන්ගේ රාජ්‍යවලට ගොස් රාජ්‍යය කරණ කල්හි සුරුචිමහ රජ්ජුරුවන්ට පුතණු කෙනෙක් උපන්නාහුය. උන්ට සුරුචි කුමාරයෝයයි කියාම නම් තුබූහ. බ්‍රහ්මදත්තරජ්ජුරුවන්ට දියණි කෙනෙක් උපන්නාහුය. උන්ට සුමෙධාදෙවී යයි නම් තුබූහ. සුරුචිකුමාරයෝ වැඩිවියපැමිණ තක්සලානුවරට ගොස් සිල්ප ඉගෙණ ආවාහුය. ඉක්බිත්තෙන් ඒ කුමාරයන් පියරජ්ජුරුවෝ

රාජ්‍යයෙන් අභිෂේක කරණු කැමැතිව මාගේ යහළුවූ බරණැස් රජ්ජුරුවන්ගේ දියනි කෙණෙක් ඇත, ඒ කුමාරිකාවන්ම මේ කුමාරයන්ට අගමෙහෙසුන් කෙරෙමියි සිතා ඒ බ්‍රහ්මදත්තරජ්ජුරුවන්ට බොහෝ පඬුරු දී අමාත්‍යයන් යවූහ. යවූ අමාත්‍යයන් එන්නාව පළමු කොටම බරණැස්රජ්ජුරුවෝ බිසවුන් අතින් විචාරන්නාහු සොඳුර! ස්ත්‍රීන්ට බලවත් දුක් නම් කවරේදැයි විචාළහ. දේවයන්වහන්ස! ස්ත්‍රීන්ට සපත්නී රොෂය බලවත් දුක් වන්නේය යි කීහ. එබස් අසා රජ්ජුරුවෝ සොඳුර! එසේ වී නම් අපගේ එකම එක දියනියන් සුමේධාදේවීන් ඒ සපත්නී රොෂ දුකින් මුදා යම් රජ්ජුරුකෙණෙක් මේ කුමාරිකාවන් තනිවම පාවාගණීත් නම් එසේවූ රජ්ජුරුකෙණෙකුන්ට පාවාදෙමි හයි කීහ. ඒ බරණැස්රජ්ජුරුවෝ සුරුචිරජ්ජුරුවන්ගේ අමාත්‍යයන් අවුත් කුමාරිකාවන්ගේ නම කීකල්හි දරුවෙතිඒකාන්තයෙන් මා විසින් පළමු මාගේ යහළුවානන්ට කුමාරිකා කෙණෙක් උපන්නාහු වීනම් පාවා දෙමියි ප්‍රතිඥා කෙළේ නියමය, එතකුදු වුවත් මේකුමාරිකාවන් බොහෝ ස්ත්‍රීසමූහයා මධ්‍යයෙහි ලන්නාට නොකැමැත්තම්හ. යම් රජ්ජුරු කෙණෙක් මේ කුමාරිකාවන් තනිවම පාවාගනිත් නම් එසේවූ රජ්ජුරු කෙණෙකුන්ට පාවා දෙනු කැමැත්තම් හයි කීහ.එබස් ඇසූ අමාත්‍යයෝ තමන්ගේ රජ්ජුරුවන්ට එපවත් දන්වා යවූහ. සුරුචිරජ්ජුරුවෝ එබස් අසා අපගේ රාජ්‍යය ඉතාම මහත, සත්යොදනක් පමණ මිවුළුනුවර වන්නේය. තුන්සියයක් පමණ රාජ්‍යපරිච්ඡේදය වන්නේය, යටත්පිරිසෙසින් සොළොස් දහසක්පුරාඞ්ගනාවන් ලද මැනවැයි කියා නොකැමැතිවූහ. සුරුචිකුමාරයෝ වූ කල් සුමේධාදේවීන්ගේ රූපසම්පත්තිය අසා ශ්‍රවණසංසර්ගයෙහි බැඳී මම ඒ කුමාරිකාවන් තනිවම පාවාගණිමි. මට බොහෝ ස්ත්‍රීසමූහයාගෙන් ප්‍රයෝජන නැත්තේය. ඒ කුමාරිකාවන්ම ගෙන්වා පාවාදුන මැනවැයි මවුපිය දෙදෙනාට කියා යවූහ. එබස් අසා ඒ මවුපිය දෙදෙන සුරුචිකුමාරයන්ගේ අදහස් නො මිරිකා බොහෝ වස්තු යවා මහපෙරහරින් ගෙන්වා කුමාරයන්ට අගමෙහෙසුන් කොට එක්වම අභිෂේක කළහ. ඒ කුමාරයෝ සුරුචි කුමමහරජව දසරාජධර්මයට කොපයක් නොකොට සතර සංග්‍රහ වස්තුවෙන් ජනරජනය කෙරෙමින් රාජ්‍යශ්‍රී අනුභව කරන්නාහු ඒ සුමේධාදේවීන් හා සමග ප්‍රියසංවාසයෙන් විසූහ.

ඒ සුමේධාදේවී වූ කලි දසදහසක් අවුරුදු මුළුල්ලෙහි ඒ රජ්ජුරුවන් සමීපයෙහි වැස පුතණු කෙණකුන් වත් දියණ්

කෙණකුන් වත් නොලද්දාහුය. ඉක්බිත්තෙන් නුවරවාසීන් රැස්ව රාජාඞ්ගනයෙහි සිට මූරගා මේ කිමෙක්දැයි විචාළ කල්හි අනික් දෙෂයෙක් නැත, නුඹවහන්සේගේ රාජවංශය රක්නට සුදුසුවූ පුතණු කෙණකුන් වහන්සේ නැත, නුඹවහන්සේට ඇති සේක්, එකම එක බිසෝකෙණකුන් වහන්සේය, රජදරුවන් වහන්සේට නම් යටත්පිරිසෙයින් සොළොස් දහසක් පුරාඞ්ගනාවන් වුව මැනව, එසේහෙයින් රජ්ජුරුවන්වහන්ස! ස්ත්‍රීසමූහයා ඇතිකල මැනව, ඉන් එක්කෙණෙක් කුශල් ඇත්තෝ වී නම් පුතණු කෙණෙකුන් වහන්සේ ලබන්නෝ වේදැයි කීකල්හි දරුවෙනි; කුමක් කියවුද, අන් ස්ත්‍රීකෙණකුන් නොගෙණෙමියි ප්‍රතිඥා දී මා විසින් මේ බිසොව ගෙන්වන ලදුවාය. එසේහෙයින් බොරුකියන්ට නොපිළිවන. මට ස්ත්‍රීසමූහයාගෙන් ප්‍රයෝජන නැතැයි රජ්ජුරුවන් විසින් ප්‍රතික්ෂෙප කරණලද, නුවරවාසීහු තම තමන්ගේ ගෙවලටම ගියාහුය.

සුමෙධාදේවී එබස් අසා රජ්ජුරුවන්වහන්සේ වූ කලි තමන් වහන්සේ සත්‍යවාදී බැවින් අන්ස්ත්‍රීකෙණකුන් නො ගෙන්වන සේක. මම්ම ඒ රජ්ජුරුවන් වහන්සේට ස්ත්‍රීන් ගෙන්වමි යි සිතා රජ්ජුරුවන්ට මෑණිකෙණකුන් හා සමානවූ බිසෝතනතුරෙහි සිට තමන්ගේ අභිප්‍රායයෙන් ම රාජකන්‍යාවන් දහසෙක අමාත්‍යකන්‍යාවන් දහසෙක, ගෘහපතිකන්‍යාවන් දහසෙක, සර්ව සාධාරණ නාටකස්ත්‍රීන්ගෙන් දහසෙකැයි සාරදහසක් ස්ත්‍රීන් ගෙන්වූහ.

ඔහු හැමදෙනාත් දසදහසක් හවුරුදු මුළුල්ලෙහි රජගෙයි වැස පුතණු කෙණකුන් වත් දියණි කෙණකුන් වත් නො ලත්හ. මෙම ක්‍රමයෙන් නැවත තුන්වාරයෙක සාරදහසක් සාරදහසක් ස්ත්‍රීන ගෙන්වූහ. ඔහු හැමදෙනාත් රජගෙයි වැස පුතණු කෙණකුන් වත් දියණි කෙණකුන් වත් නො ලත්හ. මෙසේ හැම එක්කොට සොළොස්දහසක් පුරාඞ්ගනාවෝ වූහ. සතලිස් දහසක් හවුරුදු ඉකුත්වූයේය. ඒ සතළිස්දහසක් හවුරුදු සුමෙධාදේවීන් තනිව විසූ දසදහසක් හවුරුදු හා සමග පණස්දහසක් හවුරුදු වන්නේය.

ඉක්බිත්තෙන් නුවරවාසීහු රැස්ව නැවත මූරගා සිට මේ කිමෙක්දැයි විචාළ කල්හි රජ්ජුරුවන්වහන්ස! නුඹවහන්සේගේ ස්ත්‍රීන්ට දරුවන් පනන්ට විධාන කළ මැනවැයි කීහ. රජ්ජුරුවෝ යහපතැයි නුවරවැස්සන්ගේ බස් පිළිගෙණ සොඳුරුවූ

ස්ත්‍රීනි! පුතුන් පතවයි විධාන කළහ. ඒ ස්ත්‍රීහු එතැන් පටන් පුතුන් ප්‍රාර්ථනා කොට නොයෙක් දෙවීයන්ට නමස්කාර කෙරෙමින් නොයෙක් ව්‍රතසමාදානය කරන්නාහ. එතකුදුවුවත් දරුකෙණෙක් නූපන්නාහුය. ඉක්බිත්තෙන් රජ්ජුරුවෝ සුමෙධාදේවීන්ට සොඳුර! තොපිත් දරුකෙණෙකුත් පතමයි විධාන කළහ. ඒ සුමෙධාදේවී රජ්ජුරුවන්ගේ බස් යහපතැයි මුදුනෙන් පිළිගෙණ පසළොස්වක් දිනයෙහි අෂ්ටාඞ්ගයෙන් යුක්තවූ උපොෂිතශීලය සමාදන්ව ශ්‍රීයහන් ගබඩාවට වැද තමන් රක්‍ෂාකරන්නාවූ ශීලය ආවර්ජනා කෙරෙමින් කුරුයහනේ උන්නාහුය. අවශෙෂ ස්ත්‍රීහු අජව්‍රත ගෝව්‍රත සමාදන්ව උයනට ගියාහුය. සුමෙධාදේවීන්ගේ ශීලතේජසින් ශක්‍රභවනය කම්පිතවිය. ඒ බව දැන ශක්‍රදෙවෙන්ද්‍රයෝ කිමෙක්දෝහෝයි, පරීක්‍ෂාකොට සුමෙධාදේවී දරුවන් පතති. උන්ට පුතණුකෙනකුන් දෙමි. දෙන්නාවුත් මට එසේ මෙසේවූ පුතණුකෙනකුන් දෙන්ට නො පිළිවන, ඒ කිසවුන්ට සුදුසුවූ පුතණුකෙනකුන් පරීක්‍ෂාකෙරෙමියි, පරීක්‍ෂා කරන්නාහු ඒ නළකාරදිව්‍යපුත්‍රයන් දෙදෙනා තව්තිසාදිව්‍යලොකයෙහි ආයුෂය ගෙවා තව කළාවූ කුශලය නො ගෙවුන හෙයින් මත්තෙහි දිව්‍යලොකයෙහි උපදනා කැමැති බව දැන ඔවුන් අතුරෙන් එක් කෙනකුන්ගේ| විමන්දොරට ගොස් තමන් සමීපයට අවුත් සිටි තැනැත්තන්ට නිදුකානෙනි! තොප විසින් මනුෂ්‍යලොකයට යන්ට වටනේයයි කීහ. මහරජ්ජුරුවන්වහන්ස! මනුෂ්‍යලොකය නම් ජුගුප්සා කටයුතුය. ඉතා පිළිකුල් කටයුතුය. ඒ මනුෂ්‍යලොකයෙහි සිට දානාදී පින්කම් කොට දෙව්ලොව උපදනට ප්‍රාර්ථනා කරන්නාහ. එසේවූ මනුෂ්‍යලොකයට ගොස් කුමක් කෙරෙම් දැයි කීහ. නිදුකානෙනි! දිව්‍යලොකයෙහි අනුභව කටයුතුවූ සියලු සම්පත් මනුෂ්‍යලොකයෙහිදී අනුභව කරව. පස්විසියොදුන් උස ඇති සත්රුවන් ප්‍රාසාදයෙක. වාසයකරව. එසේහෙයින් මාකිව ඉවසවයි කීහ. ඒ දිව්‍යපුත්‍රතෙමේත් ශක්‍රදෙවෙන්ද්‍රයන් කීබස් යහපතැයි මුදුනෙන් පිළිගෙණ ගිවිස්සේය. ශක්‍රදෙවෙන්ද්‍රයෝ ඒ දිව්‍යපුත්‍රයාගෙන් ප්‍රතිඥ ගෙණ ඉතා සිත්කළුවූ තපස්වී වෙශයකින් රාජොද්‍යානයට ගොස් ඒ අන්තඃපුරස්ත්‍රීන් සිටිතැනට උඩ ආකාශයෙහි සක්මන් කෙරෙමින් සිට තමන දක්වා කවුරුන්ට පුත්‍රවරයක් දෙම්ද? කවරකෙනෙක් මා අතින් පුත්‍රවරයක් ගනිද්දැයි කීහ.

එසඳ ස්වාමීනි! මට දුනමැනව මට දුනමැනවැයි කියා සොළොස්දහසක් පුරාඞ්ගනාවෝ මිණිවළල්ලෙන් සැරහුණාවූ දෑතිස්

දහසක් අත් ඔසවා හිස්මුදුනේ තුබූහ. ඉක්බිත්තෙන් ශක්‍රදේවෙන්ද්‍රයෝ කියන්නාහු මම සිල්වත් කෙනකුන්ට දරුවන් දෙම. තොප රක්‍ෂාකරන්නාවූ ශීලය කවරේද? ආචාර සමාචාර කවරේදැයි කීහ. එබස් අසා සොලොස්දහසක් පුරාඞ්ගනාවෝ ඔසවාගත් අත් අකුළුවා ඉදින් නුඹවහන්සේ සිල්වත් කෙනකුන්ට දරුවන් දෙනු කැමැතිසේක් වී නම් සුමෙධාදේවීන්වහන්සේ සමීපයට වැඩිය මැනැවැයි කීහ. එබස් අසා ශක්‍රදෙවෙන්ද්‍රයෝ ආකාශයෙන්ම ගොස් ඒ සුමෙධාදේවීන් වසන්නාවූ ප්‍රාසාදයෙහි සීමැදුරුකවුළුව සමීපයෙහි සිටියාහ. එසඳ බිසවුන් සමීපයට ගොස් කියන්නාහු දේවීන්වහන්ස! එක් තපස්වී කෙනෙක් නුඹවහන්සේට පුත්‍රවරයක් දෙමි ආකාශයෙන් අවුත් මේ සීමැදුරුකවුළුව සමීපයෙහි සිටිතියි කීහ. එබස් අසා සුමෙධාදේවි තමන් වසන්නාවූ ශ්‍රීයහන් ගබඩාවෙන් නික්ම මහත්වූ පෙරහරින් බලවත්වූ ශ්‍රීසමෘධියෙන් ගොස් සීමැදුරුකවුළුව හරවා සැබෑද? ස්වාමීනි! නුඹවහන්සේ සිල්වත් කෙනකුන්ට පුත්‍රවරයක් දෙනසේක් දැයි විචාළහ. එසේය දේවීනි. සිල්වත් කෙනකුන්ට පුත්‍රවරයක් දෙමියි ශක්‍රදෙවෙන්ද්‍රයන් කීකල්හි එසේ වී නම් මට දුනමැනැවැයි කීහ. තොප රක්‍ෂාකරන්නාවූ ශීලය කවරේද? මට කියාලව. ඉදින් මට අභිප්‍රාය වී නම් තොපට පුත්‍රවරයක් දෙන්නෙමි වේදැයි කීහ. ඒ සුමෙධාදේවී ශක්‍රදෙවෙන්ද්‍රයන්ගේ බස් අසා එසේ වී නම් ඇසුව මැනවැයි කියා තමන්ගේ ශීලගුණය ප්‍රකාශ කොට කීහ. තවද ඒ සුමෙධාදේවී පළමුකොට තමන්ගේ ස්වාමිපුත්‍රානන් කෙරෙහි පිළිපදනා ක්‍රම දක්වන්නාහු මම පස්දහසක් අවුරුදුමුළුල්ලෙහි මාගේ රජ්ජුරුවන්වහන්සේට පෙරටව හොත්තැතින් නැඟී සිට එදවස් කළමනා කාරිය විධාන කෙරෙමි. රාත්‍රියේ සැතපෙන වේලෙහිත් ඇමට පළමුකොට නොසැතපී රජගෙයි බත් කැවමනා යම්ම කෙනෙක් ඇත් නම් උන් ඇමදෙනා කෑපූ ඇත විචාරා හැමදෙනා කා බී ඉක්බිතිවූ කල රජ්ජුරුවන්වහන්සේගේ දෙපය සෝදා සුවඳ තෙල් ගල්වා අත පය මැඩ ඇමදෙනාට පසුව යාමෙන් සැතපෙමි. කුමක් කෙරෙම්ද? දේවයන්වහන්සැයි! රජ්ජුරුවන්වහන්සේ පිළිවිස උන්වහන්සේ වදාළදෙයක් යහපතැයි මුඳුනෙන් පිළිගෙණ උත්තරයක් නොකියා හැමදවස් කළමනා කාරිය කෙරෙමි. යමෙක් රජ්ජුරුවන්වහන්සේට සිත්කලු වී නම් ඒ සිත්කලුවූ කාරියම කෙරෙමි. යම් බසක් කීකල මා කෙරෙහිත් අවශෙෂයන් කෙරෙහිත් පෙම් වඩන්නේ වී නම් එසේ වූ ප්‍රියතෙපුල්ම කියමි. රජ්ජුරුවන්වහන්

සේ මා මුණබැලූ ගමනේ මුත්වහන්සේ මෙසේවූ අභිප්‍රායෙකින්
මා මුහුණ බැලූයේයයි රජ්ජුරුවන්වහන්සේගේ ඉඟි දැන සියලු
කාරිය කරන්ට කරවන්ට සමර්ථයෙමි. පණස්දහසක් හවුරුදු
මුළුල්ලෙහි මේ රජගෙයි වසන්නෙම් සම්මුඛයෙහි වත් පරාඞ්මුඛ
යෙහි වත් කයින්-වචසින්-මනසින් මාගේ රජ්ජුරුවන්වහන්
සේ ඉක්ම නො පැවැත්තෙමියි කියා සත්‍යක්‍රියා කරන්නාහු
ස්වාමීන්වහන්ස! මේ සත්‍යක්‍රියාව හේතුකොට ගෙණ මට පුතණු
කෙනෙක් උපදිත්වයි. ඉදින් මම බොරුවක් කීයෙම් වී නම්
මාගේ ඉස සත්කඩක්ව පැලී යේවයි කියා සත්‍යක්‍රියා කොට
හැදිමයිලන් කෙරෙහි පිළිපදිනා ක්‍රම හා ඔවුන්ට කළමනා
වතාවත් දක්වන්නාවූ සුමෙධාදේවී මාගේ ස්වාමිපුත්‍රවූ රජ්ජුරු
වන්වහන්සේගේ දෙමවුපියෝ යම්තාක් ජීවත්ව උන්නාහු වී
නම් ඒතාක් මම රුදුවල් නො පමාව අත්පා මෙහෙවර කෙළෙමි
එසේ කරන්නාවුන් මම ඕබාදියට නො කොට ඇදිහිලි ඇතිව
ආදරසම්භාවනා ඇති ව සකස්කොට උපස්ථාන කෙළෙමියි
කියා පළමු පරිද්දෙන්ම සත්‍යක්‍රියා කොට සපත්නීන් කෙරෙහි
පවත්නා ක්‍රම දක්වන්නාහු මා හා සමග එකරජ්ජුරුවන්වහන්
සේට භාර්‍යාවූ යම් සොළොස්දහසක් පුරාඞ්ගනාවෝ ඇත් නම්
ඔවුන් කෙරෙහි ඊර්ෂ්‍යාවක් වත් කොපයෙක් වත් මට එකදවස
කුත් නොවූ විරිය. යමෙක් ඒ පුරාඞ්ගනාවන්ට හිතවී නම් ප්‍රියවී
නම් ඔවුන්ට ප්‍රියවූ වැඩට තිසිවූ කාර්‍යයෙන්ම මමත් සතුටු
වෙමි· ලෙහිලා වැඩූ දූන් මෙන් ඒ සොළොස්දහසක් පුරාඞ්ගනා
වන් දැක සතුටු යෙමි. ඔවුන් අතුරෙන් එක්කෙනෙකුත් මට
අප්‍රිය කෙනෙක් නම් නැත. සියල්ලෝම ප්‍රියවූ දැකුම් ඇත්තාහ.
ප්‍රෙමසහිතවූ මොළොක් සිතින්ම ඒ සොළොස්දහසක් පුරාඞ්ගනා
වන්ට මට සතන්තාක් මෙන් සෙනහීවැ දයාපරවැ කරුණා ඇතී
වැ මෛත්‍රී කෙරෙමියි කියා පළමු පරිද්දෙන්ම සත්‍යක්‍රියා කොට
කෙල්ලන් කොල්ලන් හා බැලමෙහෙ කරන්නන් ආදිවූ සත්ත්ව
යන් කෙරෙහි පවත්නා විධි දක්වන්නාවූ සුමෙධාදේවී යමෙක්
යම් මෙහෙවරක් කරන්ට සමර්ථ වන්නේ වී නම් ඔහු ඒ කර්මා
න්තයෙහිම යොදමි. මෙහෙවරට යවන්නාවුන් මම නිරන්තර
යෙන් සතුටුසිත් ඇතිව පෙම්බරදැස් දල්වා ඔවුන් මුහුණ බලාම
මෙහෙවරට යවමි. එම්බල දුෂ්ටකොල්ල! තෝ මෙතම් කාරියක්
කරවයි කියා කිපී මා විසින් එකදවසකුත් කිසිකෙනෙකුත් කිසි
තැනකට යවූවිරූ නැතැයි කියා පළමු පරිද්දෙන්ම සත්‍යක්‍රියා
කොට, මහණබමුණන් කෙරෙහි පිළිපදනා ක්‍රම දක්වන්නාහු
මම ඇමදවස්ම දන්දෙන්ට දික්කළ අත් ඇතිව ඇමවේලෙහිම

මහණබමුණන් ආදීන්ට බත්පැන්ලා ෂේදීමෙන් තෙත් වූ අත් ඇතිව මසිපි වූ උතුම් වූ අනෙකප්‍රකාර වූ බොහෝ ආහාරපාන වර්ගයෙන් හැමකලම ශ්‍රමණබ්‍රාහමණාදීන් සතුටු සිතින් සන්තර්ප්ණය කෙළෙමි යි කියා පළමු පරිද්දෙන්ම සත්‍යක්‍රියා කොට, පෙහෙවස් රක්නාවූ ක්‍රම දක්වන්නාහු, මම පෙහෙවස් රක්‍ෂාකරන් නෙම් අටවක, තුදුස්වක, පසළොස්වක, පෙරගමන්, පසුගමන් වශයෙන් එකිඑකී පෝයකට දෙපිටින් දෙදවසක් තියායෙන්ම මසකට දසසතරදවසක් අෂ්ටාඞ්ගශීලය සමාදන්ව පෙහෙවස් රක්‍ෂාකෙරෙමි යි කියා පළමු පරිද්දෙන්ම සත්‍යක්‍රියා කොට, නිත්‍යශීලය දක්වන්නාහු, මම පචශීලයෙන් සංවෘතවැ ඒ පඤ්ච ශීලයෙහි හැසිර රක්‍ෂිත ගොපිත වූ ආත්මභාව ඇතිවැ වෙසෙමි. වධකචිත්තයෙන් උකුණකු, පමණකුත් නො මැරූ විරීමි. සොර සිතින් අසුරෙන් සුණුත් නො ගත් විරීමි. රාගසිතින් අන්පුරුෂයන්හුගේ ඇඟ පමණකුත් නො ඇල්වූ විරීමි. කෙළිපිණිසත් බොරුවක් නො කී විරීමි. පිණිබින්දුවක් සාත් රාපෙතක් දිවග නො තිබූ විරීමි යි කියා, සත්‍යක්‍රියා කොට, මේ සත්‍යවචනයෙන් මට පුතණු කෙනෙකෙණෙක් උපදීත්වයි ස්වාමීන්වහන්ස! ඉදින් මම බොරුවක් කීයෙම් වී නම් මාගේ ශිස සත්කඩක්ව පැළී යේවයි කියා සත්‍යක්‍රියා කළහ.

ඒ සුමෙධාදේවින් තමන්ගේ ගුණවර්ණනා කරමින් සිටියදීම ශක්‍රදෙවෙන්ද්‍රයෝ දිව්‍යලොකයෙහි තමන්ගේ බොහෝ කාරිය ඇති බැවින් ඒ සුමේධාදේවීන්ගේ කථාව සිඳ තොපගේ ගුණ ඉතාම ආශ්චර්යයීය. ඉතා අද්භූතය යි උන්ට ප්‍රශංසා කොට පුත්‍ර වර දෙන්නාහු මාතෘපිතෘ දෙපක්‍ෂයෙන් සත්වැනි මුතුන් පරම්පරාව දක්වා කිසි ඌනතාවක් නැතිහෙයින් විශිෂ්ට වූ ජාති ඇති ප්‍රමාණාතික්‍රාන්ත වූ යසපිරිවර ඇතිවැ දෙරටවාසීන්ගේ ධර්මරාජන් වූ ජාතිසම්පන්න වූ රාජකුමාරයෙකෙනෙක් සුමෙධාදේවිනි! තොපට උපදනෝ වේදැයි කීහ.

ඒ ශක්‍රදෙවෙන්ද්‍රයන්ගේ බස් අසා බලවත් වූ සොම්නසට පැමිණී ඒ සුමෙධාදේවි ශක්‍රදෙවෙන්ද්‍රයන් අතින් විචාරන්නාවූ තෙපි ස්වර්ගලොකයෙන් ආවාවූ ආනුභාවසම්පන්න වූ දෙවතාවාකකෙනෙක්ද,නොහොත්,මහත්වූ ඍද්ධ්‍යනුභාවඇති තපස්වී කෙනෙක්ද,මෙතනට පැමිණියාවූ තෙපි කවුරුද,තොපවූ|පරිදි මට ප්‍රකාශ කොට කියව යි කීහ. එබස් අසා ශක්‍රදෙවේන්ද්‍රයෝ සුමෙධාදේවින්ට කියන්නාහු සොඳුර! සුධර්මා නම් දිව්‍යසභාවට රැස්වූ

දිව්‍යසමූහයා යම් කෙනෙකුන්ට නමස්කාර කෙරේද, දහසක් නුවණැස් ඇති හෙයින් සහශ්‍රාක්ෂය යන නම් ඇති ඒ ශක්‍රදේවේන්ද්‍රයෝ නම් මමය. තොප සමීපයට කිසිකාරියක් නිසා ආමි යි කීහ.

මෙසේ තමන් ශක්‍රයාව කියා මත්තෙහි සුමේධාදේවීන්ට ස්තුති කරන්නාහු මෙසේ කියත්. යම් ස්ත්‍රියක් මනුෂ්‍යලොකයෙහිදී ප්‍රාණඝාතාදි දශඅකුශලකර්මයෙහි නො යෙදී දානශීලාදී දශකුශලකර්මයෙහි හැසිරෙද්ද, යම් ස්ත්‍රියක් ස්ථානෝචිත ප්‍රඥාවෙන් යුක්තද, පඤ්චශීලාදි ශීලසංරක්ෂණය කෙරේද, නැදිමයිලන් දෙවතාතනතුරෙහි තබා වෙසේද, පතිව්‍රතාධර්මය රක්ෂා කෙරේද, එබඳුවූ නිර්මල වූ ක්‍රියා ඇති මනුෂ්‍යස්ත්‍රිව සිටි ඒ සුමේධාදේවීන්ගේ දක්මට මහේශාක්‍ය වූ දේවතාවෝ කැමැති වන්නාහ. සොඳුර! තෙපි පූර්වජන්මයෙහි මනාකොට පුරුදුකරණ ලද කුශලකර්මානුභාවයෙන් මේ රාජවංශයෙහි සියලු වස්තුකාම ක්ලේශකාමයෙන් සමෘද්ධව උපනුව. තවද රාජමහිෂිකාවෙනි! තොපට දිව්‍යලොකයෙහි ඉපැද දිවසැපත් අනුභව කරණ හෙයින් එක් ජයෙක. මේ මනුෂ්‍යලොකයේදී සුමේධාදේවී උතුම්වූ ශීලාදි ආචාරයෙන් යුක්තයෝය. ස්ත්‍රීජාතියෙහි උන් හා සමාන කෙනෙක් නැතැයි සියලු සත්ත්වයන්ගේ තුඩතුඩ පැතිරෙන්නාවූ උතුම්වූ යසස් හා කීර්ති ඇති බැවින් මෙලොව ජයයි. මෙසේ මෙලෝ පරලෝ දෙක්හි ම තොපට ජයගැන්ම වන්නේය. සුමේධාදේවීනි! තෙපි බොහෝ කලක් සුවපත්වම තොප රක්ෂාකරමින් සිටි කුශලධර්මය කඩ නො කොට මතුමත්තෙහි වර්ධනය කෙරෙමින් රක්ෂාකරව. තොප සිල්වත් ගුණවත් හෙයින් තොපගේ දක්ම මට ඉතාම ප්‍රියය. හැමවේලෙහිම තොප දක දකා හිඳිනා අභිප්‍රාය ඇත්තෙමි. එතකුදුවුවත් දිව්‍යලොකයෙහි මාගේ බොහෝ කාරිය ඇත. එසේ හෙයින් මම දිව්‍යලොකයට යෙමි. තෙපි කුශල් කිරීමෙහි අප්‍රමාදවවයි කියා ඒ බිසවුන්ට අවවාද කොට ඒ ශක්‍රදෙවෙන්ද්‍රයෝ තමන්ගේ ශක්‍රභවනයටම ගියාහුය.

නළකාරදිව්‍යපුත්‍ර තෙමේ අලුයම් වේලෙහි චුතවැ අවුත් ඒ සුමේධාදේවීන්ගේ කුස පිළිසිඳ ගත්තේය. බිසවු ඒ බව දැන රජ්ජුරුවන්ට දන්වූහ. රජ්ජුරුවෝ ගබ්පෙරහර දුන්හ. ඒ සුමේධාදේවී දසමසක් ඇවෑමෙන් කුමාරයකු වැදූහ. උන්ට මහාපනාද කුමාරයෝය යි නම් තුබූහ. වැඳුරට වාසීය, කසීරට වාසීය, යන උභයපක්ෂයේ මනුෂ්‍යයෝ අපගේ ස්වාමිපුත්‍රයානන්

වහන්සේට කිරිමිල වන්නේය යි කියා එකිඑකී නහවණුවක් රාජාඞ්ගනයට දැමූහ. මහත් වූ වස්තුරාසිය වූයේය. එවිට රජ්ජුරුවන් විසින් තොපගේ වස්තුවෙන් අපට ප්‍රයෝජන නැත. තොප තොපගේ වස්තු තෙපි තෙපිම ඇරගෙණ යව යි ප්‍රතික්ෂෙප කොට කී කල්හිත් අපගේ ස්වාමිපුත්‍රයානන් වහන්සේ වැඩිවිය පැමිණ රාජ්‍යශ්‍රියට පැමිණි කල්හි සේනාවට වැටුප්වියදමට සැලසෙන්නේය යි කියා නොගෙණම ගියාහ මහාපනාද කුමාරයෝ මහපෙරහරින් වැඩිවිය පැමිණ සොළොස්හැවිරිදි වයසට පැමිණි කල්හි අක්ෂරලිඛිතාදි සූසැටකලාවෙහිත් ශ්‍රැතිශාස්ත්‍රාදි අෂ්ටාදශ විද්‍යාස්ථානයෙහිත් තීක්ෂපත්තියට පැමිණියාහ. සුරුචිරජ්ජුරුවෝ පුතණුවන්ගේ වයස බලා සොඳුර! මාගේ පුතණුවන්ට රාජ්‍යාභිෂෙකයෙන් අභිෂෙක කරන්ට කල් වන්නේය. උන්ට සිත්කලුවූ ප්‍රාසාදයක් කොට අභිෂෙකකෙරෙමි යි කීහ. සුමෙධාදේවීත් කී රජ්ජුරුවන් බසට සතුටුව යහපත දේවයන් වහන්ස!අභිෂෙක කරන්ට මේ සුදුසු කල්වේදැයි රජ්ජුරුවන් කී බස්මුදුනෙන් පිළිගත්හ. රජ්ජුරුවෝ වාස්තුවිද්‍යාචාරීන් කැඳවා ගෙන්වාගෙණ කියන්නාහු එම්බා සගයෙනි! වඩුවන් හැරගෙණ අපගේ මාලිගාවට නුදුරුතෙන මාගේ පුතණුවන්ට ප්‍රාසාදයක් කරව. ඒ ප්‍රාසාදය කරවා කුමාරයන් රාජ්‍යයෙන් අභිෂෙක කෙරෙමි යි කීහ. වාස්තුවිද්‍යාචාරීවරු රජ්ජුරුවන්ගේ බස් යහපතැයි පිළිගෙණ මාලිගා කරන්නට තිසි බිමක් පරීක්ෂා කොට ඇවිදිනාහ. එකෙණෙහි ශක්‍රදෙවෙන්ද්‍රයන්ගේ දිග සැටයොදුන් පුළුල පණස්යොදුන් බොල පසලොස්යොදුන් හුන්කල නාභිය දක්වා ගැලී යන්නාවූ නැගී සිටි කල බෙරඇසක් සේ නැනී යන්නා වූ බඳුවදම්ලෙක පැහැ සමානවූ ශොභා ඇති පාණ්ඩුකම්බලශෛලාසනය ඒ ශක්‍රදෙවෙන්ද්‍රයන් උන් කල්හි නො කැමැති පරිද්දෙන් හුණුව ගියේය. ශක්‍රදෙවෙන්ද්‍රයෝ මාගේ අස්න මා නොකැමැත පරිද්දෙන් හුණුවන්ට කරණා කිමෙක් දෝහෝයි පරීක්ෂාකරණ නැතැත්තෝ මහාපනාද කුමාරයන්ට මාලිගාවක් කරණු පිණිස වාස්තුවිද්‍යාචාරීවරුන් මාලිගාබිම් පරීක්ෂා කොට ඇවිද්නා නියාව දැන විශ්වකර්මදිව්‍යපුත්‍රයා කැඳවා කියන්නාහු දරුව මහාපනාද කුමාරයන්ට දිගින් පුළුලින් අඩයොදනක් පමණ ඇති, උසින් පස්විසි යොදුන් පමණ ඇති, සියක්මාල් ඇති රණධජ රිදීධජ ආදිවූ නොයෙක් ධජමාලාවෙන් ගැවැසී ගත්තා වූ කුඳුනිල්මිණි කවුළු සීමැදුරු කවුළු ආදියෙන් හෙබියාවූ සත් රුවන්මය වූ ප්‍රාසාදයක් මවා එව යි කියා විධාන කොට යවූහ.

ඒ විශ්වකර්මදිව්‍යපුත්‍රයා ශක්‍රදෙවේන්‍ද්‍රයන්ගේ බස් යහපතැයි පිළි ගෙණ වඩුවෙසක් මවා ගෙණ මාලිගාබිම් බලා ඇවිදිනාවූ වඩු වන් සම්පයට අවුත් තෙපි හැම පෙරවරු බත් අනුභව කොට එව යි කියා ඔවුන් හැමදෙනා ම යවා උතුම් භූමිප්‍රදෙශයක් බලා රියන්දණ්ඩෙන් බිමට ගසාලූයේය. එකෙණෙහිම් යථොක්ත ප්‍රකාර ඇති සපිරත්නමය වූ ප්‍රාසාදයෙක් පොළොව පළාගෙණ නැංගේය. මහාපනාද කුමාරයන්ට ගෙවදනා මඟුල, ඡේසත් මඟුල, විවාහ මඟුල යන මේ මඟුල් තුණ එකදම කළහ. මඟුල් කරණ තෙනට දෙරට වැස්සෝ රැස්ව මඟුල් කෙළි කෙළිමින් සත්හවුරුද්දක් ඉකුත් කළහ. ඒ තාක්කල් මුළුල්ලෙහි රජ්ජුරුවෝ තොප තොප වසන තැන්වලට යව යි සංවිධානයක් නො කළහ. ඒ දෙරට වැසි මනුෂ්‍යයන්ට වස්ත්‍රාභරණ ඛාද්‍යභොජ්‍යාදිවූ සියල්ල රජ්ජුරුවන්ගෙන් ම පසුන්හ. ඒ සියලූ සත්ත්වයෝ සත්අවුරුද්දක් ඇවෑමෙන් මූරගා සුරුවි මහරජ්ජුරුවන් විසින් මේ කිමෙක්දැයි විචාල කල්හි මහරජ්ජුරුවන්වහන්ස! අප මඟුලේ කා ඇවිදිනාවූන්ට සත්අවුරුද්දෙක් ඉකුත්වූයේය. මේතාක් කල් මුළුල්ලෙහි නුඹවහන්සේ සන්තක වස්ත්‍රාභරණාදී සියල්ල හැරගෙණ ප්‍රයොජනවූනුම්හ. කවරදවසෙක මඟුල් නිමාදැයි විචාළහ.

එබස් අසා රජ්ජුරුවෝ කියන්නාහු දරුවෙනි! මාගේ පුතණුවන් මෙතෙක්කල් මුළුල්ලෙහි සිනාසුනුවිරූ නැති. යම් දවසෙක ඒ මාගේ පුතණුවෝ සිනාසුනවූ නම් එදවස් තෙපි හැම දෙන තොප තොපගේ වාසස්ථානවලට යව යි සම්මත කළහ. ඉක්බිත්තෙන් මහාජනයෝ රටනුවර බෙර හසුරුවා නාටකයන් රැස්කරවූහ. සදහසක් පමණ නාටකයෝ රැස්ව සත්කොටසක් ව නටන්නාහු රජ්ජුරුවන් සිනාසෙවන්ට අසමර්ථවූහ. ඒ මහාපනාද රජ්ජුරුවන බොහෝ කලක් දිව්‍යනළුවන්ගේ නැටුම් දුටු හෙයින් ඒ මනුෂ්‍යනාටකයන්ගේ නෘත්‍යය රජ්ජුරුවන්ට ප්‍රිය නොවන්නේය. එකල භණ්ඩුකණ් පණ්ඩුකණ් නම් නළුවෝ දෙදෙනෙක් අපි දෙදෙන රජ්ජුරුවන් වහන්සේ සිනාසෙවම්හ යි කියා රඟමඩලට වන්හ. ඔවුන් දෙදෙනා අතුරෙන් භණ්ඩුකණ් නම් නාටකයා රජ්ජුරුවන්ගේ සෙණ්ඩුවාලුයෙහි මහත්වූ "අතුල"නම් අඹගසක් මවා ඒ අඹගසට හූපටක් දමා අත්තෙක එල්වා හුය ඔස්සේ අතුල නම් අඹගසට නැංගේය. ඒ අතුල අඹය නම් වෙසමුණුරජ්ජුරුවන්ගේ අඹගසෙක්ල. එසඳ ඒ වෙසවුණු රජ්ජුරුවන්ගේ දාසවූ යක්ෂරාක්ෂසයෝ භණ්ඩුකණ් නම් නාටකයා

අඞ්ගස උඩදී ම අල්වා ගෙණ අත පය ආදිවූ සියලු අඟපසඟ කප්පා සිඳ ඔගුරුවාපූහ. අවශෙෂ නාටකායෝ ඒ අතුල් පතුල් ආදිවූ අවයව අවුලා එක්කොට ගෙණ පැන් ඉසලූහ. එසඳ ඒ ගණ්ඩුකණ්ණ නම් නාටකයා මල්පටක් හැඳ මල්පටක් පෙරවා ගෙණ නටමින් ම උඩනැංගේය. මහාපනාද රජ්ජුරුවෝ ඒ ආශ්චර්ය්‍යය දැකත් සිනා පහළ නො කළාහුය. පණ්ඩුකණ්ණ නම් නාටකයා රාජාංගනයෙහි දරසෑයක් බඳවා තමාගේ පඹිද් හා සමග ගිනි වන්නේය. දරසෑය දැ තිවීගිය කල්හි අළුගොඩට පැන් ඉසලූහ. එසඳ ඒ පණ්ඩුකණ්ණ නම් නාටකයා පඹිත් හා සමග මල්පටක් හැඳ මල්පටක් පෙරවා ගෙණ නටනටා ම උඩපැනනැගේය. මහාපනාදරජ්ජුරුවෝ ඒ ආශ්චර්ය්‍යය දැකත් සිනා පහළ නො කළාහුය.

මෙසේ ඒ රජ්ජුරුවන් සිනාසෙවන්ට අසමර්ථවූ මනුෂ්‍යයෝ නොයෙක් උපායයෙන් නොයෙක් කාරිය දක්වා පීඩිතව ගියාහ. එකල ශක්‍රදෙවේන්ද්‍රයෝ ඒ කාරණය දැන යා දරුව! මහාපනාද රජ්ජුරුවන් සිනාසෙවා එව යි කියා දිව්‍යනළුවකු යවූහ. ඒ දිව්‍යනාටකයා තමාගේ පඹිද් හා සමග ගොස් රාජාංගනයේ ආකාශයෙහි සිට 'අඞ්රඞ්ග' නම් වූ නෘත්‍යයක් දැක්වීය ඒ කෙසේද? යත්:—

එකම අතෙක් සැලෙයි, එකම පයෙක් සැලෙයි, එකම ඇසෙක් නටයි, එකම බැමයෙක් සැලෙයි, එකම රවුලෙක් නටයි, සැලෙයි, වෙවුලයි, ශරීරයෙහි අන්භාගයේ අත-පය-ඇස්-බැම-රවුල නොනටයි, නො සැලෙයි, නො වෙවුලයි. ඒ ආශ්චර්ය්‍යවත් වූ නෘත්‍යය දැක මහාපනාද රජ්ජුරුවෝ මඳක් සිනාසීපූය. මහාජනයෝ සිනාසෙන්ට පටන් ගෙණ සිනාසී ම සිනාරඳවන්ට වත් සිහි එළවන්ට වත් අසමර්ථව අතපය දමා රාජාංගනයෙහි ම වැතිර ගියාහ. එකල මඟුල් සමාප්තව ගියේය.

මහාපනාදරජ්ජුරුවෝ ඒ ප්‍රාසාදයෙහි සත්තෙනක සිට නටන්නාවූ සදසක් නළුවන් හා සොළොස්දහසක් පුරාඞ්ගනාවන් හා නොයෙක් දහස්ගණන් අමාත්‍යමණ්ඩලයා විසින් පිරිවරණ ලදුව අසංඛ්‍යයක් අවුරුදු මුළුල්ලෙහි මහත්වූ සම්පත් අනුභව කොට ආයුකෙළවර කළපින් ගෙවී නො ගිය බැවින් දිව්‍යලෝකයට ම ගියාහුය. ඒ ප්‍රාසාදය වූකලි දෙදෙනාට සාධාරණවූ කර්ම්ම ප්‍රත්‍යයෙන් උපන්නේය. අන්‍යදිව්‍යපුත්‍රයා විසින් ප්‍රාසාදසම්පත් තිය අනුභව නො කළ බැවින් අන්තර්ධාන නොවී පොළොවින් අහසට නැගී ගංගා නම් ගංගාවෙහි සටිගා බලා හුනුයේය.

ඉක්බිත්තෙන් ඒ මහාපනාද නම් දිව්‍යපුත්‍රයා චාතුර්මහාරාජිකාදි සදිව්‍යලොකයෙහි පළමු පරිද්දෙන් ම දිව්‍යසැපත් අනුභව කොට ඇවිදිමින් සිටියදී ම අපගේ සර්වඥයන්වහන්සේ ලොකයෙහි ඉපද සත්ත්වයන් සංසාරසාගරයෙන් එතර කෙරෙමින් ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එසමයෙහි මහාපනාද දිව්‍යපුත්‍ර තෙමේ අප විසින් දිව්‍යසැප අනුභවකරණ ලද, නිවත් සැපත් අනුභව කරමිහ යි දිව්‍යලොකයෙන් චුතව අඟුරට භද්දිය නුවර අසූකෙළක් සම්පත් ඇති භද්දිය නම් සිටාණන්ට පුත්ව උපන්නේය. ඔහට භද්දිය කුමාරයෝය යි නම් තුබූහ. කුමාරයන්ට ප්‍රාසාද තුනෙක් වූයේය. ඉන් එක් ප්‍රාසාදයෙක් හේමන්ත කාලයෙහි වසන්ට සුදුසු වන්නේය. එක් ප්‍රාසාදයෙක් ග්‍රීෂ්මකාලයෙහි වසන්ට සුදුසු වන්නේය. එක් ප්‍රාසාදයෙක් වර්ෂාකාලයෙහි වසන්ට සුදුසු වන්නේය. දිව්‍යවිමන් හා සමාන වූ රන්රසුදැල් හා රන්ධජ-රිදීධජ ආදි නොයෙක් සැරහුමෙන් සැරහුණාවූ එකි එකි ප්‍රාසාදයෙක දිව්‍යාප්සරාවන් හා සදෘශවූ සර්වාභරණයෙන් සැරසුනාවූ නැටීම්-ගීකිම් ආදියෙහි දක්‍ෂවූ නොයෙක් දහස්ගණන් නාටකයන් විසින් පිරිවරණ ලදුව සාරමසක් සාරමසක් වාසය කරන්නාහුය. ඒ භද්දිය කුමාරයෝ එක් ප්‍රාසාදයෙක වැස නළුවන් පිරිවරා මහත්වූ යසපිරිවරින් අනික් ප්‍රාසාදයකට යන්නාහ. එකෙණෙහි කුමාරයන්ගේ ශ්‍රී සමෘද්ධිය බලමෝහ යි සියලු නුවර වාසීහු ඇලලී පැනනැගෙන්නාහ. මනුෂ්‍යයෝ එක් ප්‍රාසාදයකින් ප්‍රාසාදයකට අතුරෙහි සක්පිට සක් මැසිපිට මැසි බැඳ මැසිආදියට නැගී භද්දියකුමාරයන්ගේ යසස් සමෘද්ධි බලන්නාහ. එකල භාග්‍යවත්වූ බුදුරජාණන්වහන්සේ ජේතවනමහාවිහාරයෙහි වැඩවසන සේක් භද්දියකුමාරයන්ට සංග්‍රහ කෙරෙමි යි භික්ෂුසඞ්ඝයා වහන්සේ විසින් පිරිවරණ ලදුව සැරිසරා වඩනා සේක් භද්දියනුවරට පැමිණ ජාතියාවනයෙහි භද්දියකුමාරයන්ගේ ඥානපරිපාකය බලමින් තුන්මසක් මුළුල්ලෙහි විසූසේක.

සර්වඥයන්වහන්සේ තුන්මසක් වැස අපි යමිහ යි නුවරවාසීන්ට වදාළසේක. නුවරවාසීහු ස්වාමීනි! සෙටදවස් වැඩිය මැනැවැයි කියා සර්වඥයන්වහන්සේට ආරාධනා කොට දෙවෙනි දවස් බුදුපාමොක් මහසඟපිරිසට මහදන් සරහා නුවරමැද මණ්ඩපයක් කොට සරහා අසුන් පණවා කල්දැන්වූහ.

සර්වඥයන්වහන්සේ භික්ෂුසඞ්ඝයා පිරිවරා ඒ මණ්ඩපයට ගොස්වැඩහුන්සේක. එසඳ මනුෂ්‍යයෝ මහදන්දුන්හ. බුදුරජාණන්වහන්සේ වළඳා අනතුරෙහි මිහිරවූ කටහඬින් අනුමෙවෙනි

ධර්මදෙශනා කරන්ට පටන්ගත්සේක. එකණෙහි භද්‍රීයකුමාරයෝ ප්‍රාසාදයකින් ප්‍රාසාදයකට නික්මුනාහ. ඒ කුමාරයන්ගේ යසස් සමෘද්ධිය දක්නා පිණිස එදවස් කිසිකෙනෙක් නො ගියහ. උන් තමන්ගේ මනුෂ්‍යයෝම පිරිවරා ගෙණ ගියාහ. ඒ කුමාරයෝ මනුෂ්‍යයන් අතින් විචාරන්නාහු සෙසුදවස් මා ප්‍රාසාදයෙන් ප්‍රාසාදයකට යන කල්හි සියලු නුවර ඇලලී යන්නේය. සක්පිට සක්මැසිපිට මැසි බැඳ ඒ මැසිආදීයට නැගී මාගේ ඓශ්වර්‍යශ්‍රීය බලන්නාහුය. අදවූ කලි මාගේ මනුෂ්‍යයන් හැර අනික් කිසි කෙනෙක් නැත. ඊට කාරණ කවරේදැයි විචාළහ. එසඳ මනුෂ්‍යයෝ කියන්නාහු ස්වාමීනි! බුදුරජානන්වහන්සේ මේනුවර නිසා තුන්මසක් වැස අද වඩනාසේක. ඒ සර්වඥයන්වහන්සේ ආහාර කෘත්‍යය කොට නිමවා මහාජනයාට ධර්මදෙශනා කරණසේක. සියලු නුවරවාසීහු ඒ බුදුරජානන්වහන්සේගෙන් ධර්මය අසන්නාහුය යි කීහ.

එබස් අසා භද්‍රිය කුමාරයෝ එසේවී නම් වරෝ යම්හ අපිත් බණ අසම්හ යි කියා සර්වාභරණයෙන් සැරහී මහත්වූ පෙරහරින් බුදුරජානන්වහන්සේ කරා එළඹ පිරිස් කෙළවර සිට බණඅසා සකලක්ලේශයන් නසා අග්‍රවූ අර්හත්ඵලයට පැමිණියාහ. බුදුරජානන්වහන්සේ භද්‍රියසිටානන්ට ආමන්ත්‍රණය කොට වදාරණසේක් මහසිටාණෙනි! තොපගේ පුතණුවෝ සර්වාභරණයෙන් සැරහී සිට මාගේ ධර්මය අසා අර්හත්ඵලයට පැමිණියෝය. එහෙයින් උන්ට අදම මහණවන්ට හෝ පිරිනිවන් පාන්ට හෝ වුවමැනවැයි වදාළසේක. එසඳ සිටාණෝ ස්වාමීනි! මාගේ පුතණුවන්ට පිරිනිවන් පෑමෙන් ප්‍රයෝජන නැත. උන් මහණ කරවා ගෙණ සෙට අපගේ ගෙට වැඩවදාළොත් යහපතැයි කීහ. සර්වඥයන්වහන්සේ ආරාධනාව ඉවසා ඒ කුලපුත්‍රයානන් කැඳවා ගෙණ විහාරයට වැඩ මහණ කරවා උපසම්පදා කැරවූසේක. ඒ කුලපුත්‍රයානන්ගේ දෙමව්පියෝ සතියක් මුළුල්ලෙහි බුදුපාමොක් මහසඟපිරිසට මහදන් දුන්හ. බුදුහු සතියක් මුළුල්ලෙහි වැස කුලපුත්‍රයාණන් කැඳවා ගෙණ සැරිසරා වඩිනාසේක් කොටිග්‍රාමයට පැමිණිසේක. ඒ කොටිග්‍රාමවාසීහු බුදුන් ප්‍රධාන කොට ඇති භික්ෂුසඞ්ඝයාවහන්සේට මහවතුරක් වඩනා කලක් මෙන් මහදන් දුන්හ. බුදුරජානන්වහන්සේ වදාළ අනතයෙහි සත්ත්වයන් සිත්සතුටු කරවමින් අනුමෙවෙනි ධර්මදෙශනාවට පටන්ගත්සේක. ඒ කුලපුත්‍රයානන් වහන්සේ අනුමෝදනාව කාරණ මෙලෙහි ගමින් පිටත ගොස් සර්වඥයන්වහන්සේ මෙත

තව වැඩිවිට නැඟීසිටිම්හි ඉටා ගංතෙරට සමීපයෙහි එක් රුක්මුල නිරොධසමාපත්තියට සමවැද වැඩහුන්සේක. බාධකික්ෂුන්වහන්සේ අවුත් වැඩසිටියදීත් නැඟී නොසිට සර්වඥයන් වහන්සේ සමීපයට වැඩිවිටම සමාපත්තියෙන් නැඟීසේක. එසඳ පෘථග්ජන භික්ෂූන්වහන්සේ මේ පැවිද්දේ පෙරපරිද්දෙන් ම මහණවස් මහතෙරුවන් වහන්සේ අවුත් සිටියදී බල බලාම නැඟී නො සිටිති යි කිපිසේක. කොපිග්‍රාමවාසීනු සර්වඥයන් වහන්සේ ගංගා නම් ගාංගා වෙත් එතරවනු සඳහා නැව් අඟුළු බැන්දහුය. එසඳ සර්වඥයන් වහන්සේ අඟුලට නැඟී වැඩසිට භද්‍රජිස්ථවිරයෝ? කොයිද්දැයි විචාළසේක. ස්වාමීනි! මම මෙතැනැඟි කීකල්හි වරයි භද්‍රජිති අප හා සමඟ එකනැවට නැඟෙවයි වදාළසේක. එසඳ භද්‍රජි මහතෙරුන් වහන්සේ අභිඥාපාදක චතුර්ථධ්‍යානයට සමවැද ඒ අභිඥචිත්තය හා සමඟ අහසට පැණනැඟී සෘද්ධියෙන් ගොස් බුදුරජානන් වහන්සේ නැඟි එකනැවම වැඩසිටිසේක. එසඳ නැව ගංගාමධ්‍යයට ගියකල්හි සර්වඥයන් වහන්සේ එතැන්හිදී ඒ පෘථග්ජනභික්ෂූන්වහන්සේ පහදවනු කැමැතිව භද්‍රජිස්ථවිරයෙනි! තොප මහාපනාදරජ කල බොහෝ දවසක් විසූ ප්‍රාසාදය කොයිදැයි විචාළසේක. ස්වාමීනි! මේ ස්ථානයේ ගැලීතබුයේසි. දුන්වූකල්හි පෘථග්ජනභික්ෂූන් වහන්සේ නැවතත් උජ්ඣායනා කලසේක. එසඳ සර්වඥයන් වහන්සේ එසේ වී නම් භද්‍රජිස්ථවිරයෙනි! සබ්‍රම්සරුන්ට උපන් සැක දුරුකරවයි වදාළසේක. එකෙණෙහි තෙරුන්වහන්සේ සර්වඥයන්වහන්සේට නමස්කාර කොට ආකාශයට පැණනැඟී සෘද්ධිබලයෙන් දිය දෙබේකොට ප්‍රාසාදයෙහි මැණික්මයවූ කොත් කැරැල්ල පය ඇඟිලි අස්සෙන් අවුළුවා පස්විසියොදුන් පමණ රුවන්පාය ඔසවා ගෙණ ආකාශයට පැනනැඟීසේක. පැනනැඟී නැතත් තමන්වහන්සේම ප්‍රාසාදය යටසිටියවුන්ට ප්‍රාසාදය පලා ගෙණ පෙණූනුසේක. ඒ තෙරුන්වහන්සේ එක්යොදනක් දෙ යොදනක් තුන්යොදනක් දියෙන් ප්‍රාසාදය උඩනැඟූසේක. එකල භද්‍රජිමහතෙරුන්වහන්සේගේ පූර්වජන්මයෙහි නෑයෝ ප්‍රාසාදයෙහි ලොභයෙන් මස්-කැසුප්-මඬු ආදි තිරිසන්තිකායට පැමිණ ඒ ප්‍රාසාදයෙහි උපන්හ. ඒ මඬු ආදි සත්ත්වයෝ ප්‍රාසාදය උඩනැගෙත් පෙරලාගෙණ දියෙහි දියෙහිම වැගිරගියාහ. සර්වඥයන්වහන්සේ පෙරළි පෙරළි වැටෙන්නාවූ මස්-කැස්බත් ආදි වූ සත්ත්වයන් දැක භද්‍රජිස්ථවිරයෙනි! තොපගේ නෑයෝ බොහෝ පීඩාවට පැමිණෙති යි වදාළසේක. තෙරුන්වහන්සේ සර්වඥයන් වහන්සේ වදාළබස් අසා ඔසවන්ට පටන්ගත් ප්‍රාසාදය හැරපූ

සේක. ඒ ප්‍රාසාදය පළමු පරිද්දෙන් ම ගොස් යථාස්ථානයෙහි පිහිටියේය. මේ ලොකයෙහි සියලු සත්ත්වයෝ ලොභ-ද්වේෂ-මොහයෙන් නරකාදි සතර අපායෙහි උපදනාහ. අලොභ-අද්වේෂ-අමෝහයෙන් ස්වර්ගයෙහි උපදනාහ. එසේහෙයින් කිසිවස්තුවෙක ලොභයක්වත්, කිසි කෙණෙකුන් කෙරෙහි ද්වෙෂයක් වත්, කිසි වස්තුවෙක මොහයක්වත්, නො කට යුත්තේය. ආභරණ පාපුරණදියෙහි ලොභයෙන් එහි ඉණිකුණු ආදිව උපදනාහ. ඇඳපුටුආදියෙහි ලොභයෙන් එහි මකුණු ආදිව උපදනාහ. කෙත්වත් ආදීයෙහි ලොභයෙන් එහි ඌරුආදිව උපදනාහ. ගෘහපරිෂ්කාරයෙහි ලොභයෙන් එහි ගරඬි ආදිව උපදනාහ. වැව් ආදියෙහි ලොභයෙන්එහි මිඹු ආදිව උපදනාහ. ධනධාන්‍යයෙහි ලොභයෙන් එහි සර්පමූෂිකාදිව උපදනාහ. උයන් ආදියෙහි ලොභයෙන් ගොමපැණි ආදීව උපදනාහ. මාතුගාමාදීන් කෙරෙහි ලොභයෙන්ඔවුන් කුස පණුවන් ආදිව උපදනාහ. ද්වෙෂයෙන් නාගරාක්ෂසාදිව උපදනාහ. මානයෙන් වඳුරු ආදිව උපදනාහ.

“වදාළේ මැනෙ:—

“කොධෙන පන්නගො හොති අති කොධෙන රක්ඛසො,
මානෙන මක්කටො හොති අති මානෙන කුක්කුරො’ යි.

ඇතිරිලි-පරුක්කන් ආදි ආභරණ පාපුරණාදියෙහි ලොභයෙන් එහි ඉණිකුණු ආදිව කෙසේ උපදිද්ද? යත්:—

භාග්‍යවත්වූ බුදුරජාතන් වහන්සේ ජෙතවනමහාවිහාරයෙහි වැඩවසන කල්හි සැවැත්නුවර වාසී එක් කුලපුත්‍රයෙක් ශාසනයෙහි මහණව ලබනලද උපසම්පදා ඇතිව තිස්ස ස්ථවිරයන් වහන්සේය යි මෙනමින් ප්‍රසිඬවූයේය. ඒ තෙරුන්වහන්සේ කල්යාමකින් දනව්වෙහෙරක වස්වැස අටරියන් දළඹලි සළුක් ලැබ වස්අන්තයෙහි සැවැත්නුවරට ගොස් නැගනියන් අතට දුන්සේක. ඒ නැගිනියෝ මාගේ බෑණන් වහන්සේට සිව්රුකොට වළඳින්ට මේ දළඹලියළ සුදුසු නො වන්නේය යි එකඩ සිවුම් මුවහත් ඇති වෑයෙකින් කපා කපා සුණුවිසුණු කොට වතලා කොටා අඹරා පෙළා සීන් හු කැට කඩක් වියවූහ. තෙරුන්වහන්සේත් හු ඉදිකටු සපයා සිව්රුගෙත්තමට සුදුසු ලදරුභික්ෂූන් හා සාමණෙරනැන් රැස්කරවා නැගණියන් සමීපයට ගොස් මා තොපසමීපයේ තුබූ වස්ත්‍රය දෙවා සිව්රක් කර වන්නා කැමැත්තෙමි කීසේක. එසඳ ඒ නැගණියෝ තමරියන් ඹලියළ මැත්කොට ගෙණවුත් බෑණන්වහන්සේ අතතිබූහ.

ඒ තෙරුන්වහන්සේ එකඩ අල්වා ගෙණ විදහා මාගේ වස්ත්‍රාං දළව තිබෙයි. අවරියනෙක. මේ වූ කලි ඉතා සිත් නවරියනෙක. එසේ හෙයින් මෙකඩ මාගේ නොවෙයි. තොපගේ කඩෙක් වන්නේය. මට මින් ප්‍රයොජන නැත. මාගේ කඩ මට දෙවයි කීසේක.

එසඳ නැගනියෝ ස්වාමීනි! මේ කඩ නුඹවහන්සේගේමය, ගත මැනවැයි කියා දුන්නුය. එසඳ තෙරුන්වහන්සේ නො ඉව සූසේක්මය. ඉක්බිත්තෙන් ඒ නැගිනියෝ තෙරුන්වහන්සේට තමන් කළ කාරිය මුළුල්ලම කියා ස්වාමීනි! මේ ඉණකඩ නුඹවහන්සේගේමය. ගත මැනවැයි කියා දුන්නුය. එසඳ තෙරුන්වහන්සේ ඒ නවරියන් ඔලියළ ඇරගෙන විහාරයට ගොස් සිව්ර ගෙත්තමට පටන්ගැන්වූසේක. එකල උන්වහන්සේගේ නැගනියෝ සිව්ර ගෙත්තම්කරණ භික්ෂූන්වහන්සේට කැඳ අවුළු පත්-බත්-මාලු-ආදිවූ දෙය සකස්කොට දුන්හ. ඒ සිව්ර ගෙත්තම් කොට රඳ නිම්දවස් සෙසුදවසටත් වඩා අතික කොට සත්කාර කැරවූසේක. ඒ තෙරුන්වහන්සේ රඳනිම් සිව්ර බලා ඒ සිව්රෙහි උපන්නාවූ බලවත් ලොභ ඇතිව සෙට පාන්වූකල වළදිම්හි සිව්ර පත්කොට සිව්රුවසෙහි තබා එදවස් වැළඳු ආහාරය දිරාගත නොහී රාත්‍රියෙහි කාලක්‍රියා කොට එම සිව්රෙහි ඉණිකුණුව උපන්සේක. ඒ තෙරුන්වහන්සේගේ නැගණියෝ බෑණන්වහන්සේ කාලක්‍රියාකළ නියාව අසා අවුත් භික්ෂූන්වහන්සේගේ දෙපත්ලෙහි වැටී පෙරළී අඬන්නට පටන්ගත්හ. එදස භික්ෂූන්වහන්සේ එක්ව තෙරුන්වහන්සේගේ ආදාහණ කෘත්‍යය කොට ගිලානුපස්ථායකයෙක් ලෙඩබැලූ තැනක් නැතිහෙයින් සංඝයාවහන්සේටම ඒ සිව්ර පැමිණෙන්නේය. එසේහෙයින් ඒ මතකසිව්ර බෙදම්හයි සිව්ර මැත්කරවූසේක. එසඳ ඒ ඉණිකුණු තෙමේ භික්ෂූන්වහන්සේ මාසන්තක සිව්ර උදුරාගෙණ කපානසනසේකැයි කියා සිව්රෙහි ඈතමෑත දිවන්නේය. සර්වඥයන්වහන්සේ ගඳකිළියෙහි වැඩහිඳම දිවකණින් ඒ ඉණිකුණා කියන්නාවූ කථාශබ්දය අසා අනඳ මහතෙරුන්වහන්සේට වදාරණසේක් ආනන්දසථවිරයෙනි! තිස්සයාගේ සිව්ර නොබෙදා සතියක් තබන්නට කියව යි වදාළසේක. අනඳ මහතෙරුන්වහන්සේත් එපරිද්දෙන්ම කැරවූසේක. ඒ ඉණිකුණු සිව්රේම වැශ ලොභය දුරුකොට සත්වැනිදවස් මිය තුෂිතදිව්‍යලොකයෙහි උපන්නේය. සර්වඥයන්වහන්සේ අටවැනිදවස් තිස්සයාගේ සිව්ර බෙදාගන්නට කියවයි විධාන කැරවූසේක. භික්ෂූන්වහන්සේත් බුදුන් වදාළ ලෙසම අටවැනිදවස් සිව්ර බෙදා ගත්සේක. මෙසේ

සිවුර බෙදාගෙණ බුදුරජාණන්වහන්සේ කරා ගොස් විචාරණසේක්, ස්වාමීනි! තිස්සස්ථවිරයන්ගේ සිවුර සත්දවසක් තබා අටවැනි දවස් බෙදාගන්ට අනුදත්තේ කුමක්නිසාදැයි විචාළසේක. එසඳ සර්වඥයන්වහන්සේ වදාරණසේක් මහණෙනි! තිස්සයා තමාගේ සිවුරෙහි හිණිකුණුව උපන්නේය. තොප ඇම එක්ව සිවුර බෙදන්නට වන්කල්හි මේ භික්ෂූහු මාසනතක සිවුර උදුරා ගණිතියි මුරගාමින් ඇතමෑත දිව්වේය. ඒ හිණිකුණු සැබැවින් එදවස් තොප ඇම ඒ සිවුරකපා බෙදා ඇරගතොත් තොප ඇම කෙරෙහි සිත් කළකිරුවා නිරයෙහි උපදනේය. එසේ හෙයින් මම ඒ සිවුර කපා එදවස් බෙදාශක නොහී තබවාපීමි. දැන්වූ කලි ඒ තෙමේ තුෂිතදිව්‍යලොකයෙහි උපන්නේය. එසේහෙයින් තොප ඇමට අටවැනිදවස් සිවුර බෙදාගන්ට මා විසින් අනුදත්තේ මේ කාරණයෙනැයි වදාළසේක. මෙසේ ආස්තරණ-පාවුරණාදියෙහි ලොභයෙන් එහි හිණිකුණු ආදිව උපදනාහ.

කොත්වත් ආදියෙහි ලොභයෙන් හූරුආදිව උපදනා පරිදි කෙසේද? යත්:-

එක්තරා පුරුෂයකුගේ පුතුන් දෙබෑකෙනෙකුන් හා එකම දුවක් වූව. ඒ දෙබෑයන්ගෙන් වැඩිමහලු පුතනුවෝ සම්පවිහාරයෙක භික්ෂූන්වහන්සේ වදාරන්නාවූ බණ අසා මහණව රහත් වූහ. කුඩාපුතනුවෝ ගිහිගෙයිම විසූහ. උන්ගේ පියාණෝ තමන්ගේ වැවෙහි, කුඹුරෙහි ලොභකොට මිය ගොස් එහි ඌරුව උපන්නාහ.

මැණියෝ වළන් ආදියෙහි ලොභකොට මිය එගෙයිම ගැරඬි දෙන්ව උපන්නාහ. නැගනියෝ දියකෙළියෙහි ලොභ කොට මිය එම වැව මැඬිව උපන්නාහ. එක්දවසක් ගරවිල්දෙන් ගොදුරුසොයා වැවටගිය තැනැත්තී ඒ මැඬිදූව ගැලපූව. ගොදුරු හා තීක්මෙන ගරවිල්දෙන හූරු ගිලීය. කරල්කන්ට බස්නා ඌරා කුඩාපුතනුවෝ විද මරාපූය. හූරා විද මරා මේ හූරුමස් මාගේ බෑතන් වහන්සේටත් දී අනුභවකළ මැනවැයි සිතා උදෑසනම විහාරයට ගොස් ඌරුමසක් ලදිමි. එසේහෙයින් අදමාගේ ගෙයිදී වළදන්ට වැඩියහොත් යහපතැයි කිවූය. එසඳ තෙරුන් වහන්සේ කෙසේ හූරුමසෙක්දෝහෝයි පරීක්ෂා කොට බලා පලමු පැවති සියලු කාරියම නුවණැසින් දැක ධර්මසංවේගයට පැමිණ මා මොහුහට පිරිවහල්වූව මැනවැයි සිතා අප එනතෙක් හූරා මස් නො කරවයි කියා මලනුවන් යවා උදෑසන කළමනා පැදීම් පිදීම් ආදි සියලූකාරිය කොට නිමවා ගැවවවුගත්වා

පාත්‍රය අතින් ගෙණ මලනුවන්ගේ ගෙට ගොස් හූරා බලමින් සිටි කල්හි යහපත ස්වාමීනියි කියා මලනුවෝ හූරාගෙණ හැර පාවාහුය. එසඳ තෙරුන්වහන්සේ එතන සිට මේ හූරා බඩ ගරඬි දෙනෙක් ඇතැයි කියා හූරා බඩ පළවා ගරවිල්දෙන මෑත් කර වූසේක. නැවත මේ ගරවිල්දෙන බඩ මැඩියක් ඇතැයි කියා ගරවිල්දෙන බඩපළවා මැඩියා මෑත්කරවා හූරා සමීපයෙහි ගරවිල්දෙන හොවා ගරවිල්දෙන සමීපයෙහි මැඩියා හොවා මේ හූරා නම් තොපගේ පියානෝය. මේ ගරවිල්දෙන් නම් තොපගේ මෑණියෝය. මේ මැඩිපැටි නම් තොපගේ නැගණියෝය යි කීසේක. එසඳ මලනුවෝ භයපත්ව ස්වාමීනි! මූ හැම කුමක් නිසා මෙබඳුව උපන්හුදැයි විචාළහ. තෙරුන්වහන්සේ එබස් අසා විදාරණසේක් තොපගේ පියානෝ විසර ලොභ කොට මිය එහි හූරුව උපන්නාහ. තොපගේ මෑණියෝ ගෙයි වළන් ආදියෙහි ලොභ කොට මිය එහි ගැරඬිදෙන්ව උපන්හ තොපගේ නැගනියෝ දියකෙළියෙහි ලොභ කොට මිය ඒ වැව මැඩිව උපන්හ. මැඩිය ගරවිල්දෙන ගිළුව; ගරවිල්දෙන හූරු ගිළීය. හූරා තොපි ගිළින්ට සිටියාවේදැයි වදාළසේක. එසඳ මලනුවෝ භයින් ත්‍රස්තව ස්වාමීනි!ජාතියෙන් වෙන්වූ කලම මෙසේ වන තීයාවේද? මෙසේ වනබව පළමු මම නොදත්මියි වෙවුලන්ට වන්හ. තෙරුන්වහන්සේ මලනුවන්ගේ බස් අසා සසර අක්මුල් නැති පරිදි දක්වමින් "අනමතග්ගසංයුක්තය" වදාළසේක. මලනුවෝ තෙරුන්වහන්සේ වදාළ බණ අසා බෑනන්වහන්සේ සමීපයෙහි මහණව රහත්වූහ.

ධනධාන්‍යාදියෙහි ලොභයෙන් එහි සර්පමූෂිකාදිව උපදනා පරිදි කෙසේද? යත්:-

බරණැස්නුවර වැසි එක් සිටානකෙනෙක් ගංගාතීරයෙහි සතලිස්කෙළක් වස්තු නිධාන කොට තබා ලොභයෙන් මිය වස්තුව පිට සර්පව උපන්නාහ. එමනුවර අනික් සිටානකෙනෙක් තිස්කෙළක් වස්තු නිධානකොට තබා ධනලොභයෙන් මිය ධන පිට මූෂිකව උපන්නාහ. මෙහි විස්තර එකකනිපාතයෙහි "සවම්ංකිරජාතකයෙන්" දත යුක්තේය. උයන් ආදියෙහි ලොභයෙන් ගොම පැණි ආදිව උපදනා පරිදි කෙසේද? යත්:-නව ගියදවස කසීරට පොතලී නම් නුවරෙක් විය. එහි අස්සක නම් රජ්ජුරුකෙනෙක් රාජ්‍යයකරන්නාහ. ඒ රජ්ජුරුවන්ගේ උබ්බරී නම් බිසෝකෙනෙක් වූහ. ඒ බිසව්වි සිනවූ රූ ඇත්තෝය.

මනාවූ දුකුම් ඇත්තෝය. බැලුබැලූවන්ට ප්‍රසාද එළවති. උතුම්වූ රූපසෞභාග්‍යයෙන් සමන්විතයෝය. මනුෂ්‍යරූපය ඉක්ම දිව්‍යරූපයට නො පැමිණි උතුම්වූ රූපශ්‍රී ඇත්තාහ. එබඳුවූ රූපශ්‍රීසෞභාග්‍යයක් ඇති බිසව් කිසියම් ව්‍යාධියකින් අභිනව යෞවනයෙහි ම කළුරිය කළාහ. ඒ බිසවුන් කළුරිය කළපසු රජ්ජුරුවෝ ශෝකයෙන් මඩනාලද්දුව බලවත් වූ දුක්දොම්නසට පැමිණ බිසවුන්ගේ ශරීරය දෙනකබහාලා එහි තෙල්පුරා මහාර්ඝවූ ශ්‍රී යහන යට තබාගෙණ නිරාහාරව හඬ හඬා කඳුලු පෙර පෙරා හෝනාහුය. එසඳ දෙමවුපියෝ ය, අවශේසඥාතියෝ ය, මිත්‍රයෝය, අමාත්‍යයෝ ය, බමුණෝ ය, සිටුවරුය යන මේ ආදීහු මහරජ්ජුරුවන් වහන්ස, තුඹවහන්සේ අපකීර්තියට රුහැණි තුව මැනව, සියලු සංස්කාරධර්මයෝ ම අනිත්‍යය. යම්සේ වැලිසත්තකින් උඩනැගෙන්නේ මුදුනේවැලි තබාගෙණම නැගේ; එපරිද්දෙන් ම උපදනාවූ සත්ත්ව මරණත් කැටුවම ගෙණ උපදනේය. එසේහෙයින් මහරජ්ජුරුවන්වහන්ස, නැත්තාසුළුවූ වස්තුවනට තුඹවහන්සේ නොකානොබී වැලප වැලප වැහැස වැහැස හෙම්මෙන් ප්‍රයෝජන නැත. අපහැම්දෙනා කීවා නොකොට බිසවුන්වහන්සේ ආදාහන කරවා තුඹවහන්සේ ඉස්සෝධා නහා මේ නිම්වා සංග්‍රහතාපීණය කලමැනවැයි අවවාද කළහ ඔවුන් හැම්දෙනා මෙලෙසින් අවවාද කළත් රජ්ජුරුවෝ නො සන්හිඳෙත්මය. මෙසේ හඬන්නාවූ රජ්ජුරුවන්ට සත්දවසක් ඉකුත්වූයේය. එකල අප මහබෝසතාණෝ ධ්‍යානලාභී තාපසව හිමාලය වනයෙහි වසන්නාහු ආලෝක වඩා දිවසින් දක්දිබලා ඒ අස්සක නම් රජ්ජුරුවන් මෙසේ වලප්නා බව දැක ඒ රජ්ජුරුවන්ට මා පිහිටහල්වුව මැනවැයි සිතා ඍද්ධියෙන් ආකාශයට පැන නැඟිගොස් රාජෝද්‍යානයට බැස මඟුල් සල්සල පිට මත්තෙහි සත රන් පිළිමයක් මෙන් උන්නාහ. එසඳ එනුවර වැසි බමුණුදරුවෙක් උයනට ගිය නැනැත්තේ ඒ මහාබෝධිසත්ත්වයන් දුටු වැඳ එකත්පස්ව හුන්නේය. එසඳ මහබෝසතාණෝ ඒ බ්‍රාහ්මණ කුමාරයා හා සමග සුවදුක් කථාකොට කිමෙක්ද? මෙනුවර රජ්ජුරුවෝ ධර්මිෂ්ඨයෝ දැයි විචාළහ. එබස් අසා බමුණුදරු කියන්නේ ස්වාමීනි! තපස්වීන වහන්ස? රජ්ජුරුවනවහන්සේ ධර්මිෂ්ඨභාවට කිසි අඩුවෙක් නැත, ප්‍රජාසංග්‍රහණයෙහි නිරතසේක. සත්ත්වකරුණා ඇත්තේක. එතකුදුවුවත් උන්වහන්සේගේ බිසවුන්වහන්සේ කළුරියකළසේක. ඒ මෘතකලේබරය දෙනකබහා තෙල්දත් කොට පියන්පතගසා යහනයට තබා වැලප වැලප වැද හෝනාසේක. මෙසේ හඬ හඬා වැදහෝනා රජ්ජුරුවන්

වහන්සේට අදින් සත්දවසෙක් ඉකුත්වූයේය. නුඹවහන්සේ මෙබඳු ධර්මිෂ්ඨ රජ්ජුරුකෙනකුන් වහන්සේ මොනාදුකක් විඳි මින් සිව්ඇදි එදුකින් නුමුදන්ට කාරණ කවරේද? නුඹවහන්සේ එබඳුවූ සිල්වත් ගුණවත් මිනිසුන් ලොව ඇතුව ඉන්දද්දී මෙසේවූ ධර්මිෂ්ට රජ්ජුරුකෙණකුන්වහන්සේ දුක්විඳිනවා යහපත්දැයි කීය. එසඳ මහබෝසතාණෝ කියන්නාහු දරුව! මම රජ්ජුරුවන් නොහඳුනම්, ඉදින් ඒ රජ්ජුරුවන් අවුත් මා අතීත් එළාලේ වී නම් මම ඒ රජ්ජුරුවන්ට බිසවුන් උපන්තැන් කීයා රජ්ජුරුවන් අභිමුඛයෙහිම කථාකරවන්නෙම් වේ දැයි කීහ.

එසඳ බමුණුදරු එසේ වී නම් සාමිනි! නුඹවහන්සේ මා ගොස් රජ්ජුරුවන්වහන්සේ කැඳවාගෙණ එන තෙක් මේතනට වැඩහින්ට වුවමැනවැයි මහාබොධිසත්ත්වයන් ගිවිසවාගෙණ රජ්ජුරුවන් කරා ගොස් එපවත් රජ්ජුරුවන්ට දන්වා ඒ දිවැස් ඇති තපස්වින් කරා එන්ට වුවමැනවැයි රජ්ජුරුවන්ම දැන්වීය. එසඳ රජ්ජුරුවෝ උබ්බරිය දක්නෙම් වේ දැයි සතුටුව සරසා පිළියෙලකරණලද රථයකට පැනනැගී උයනට ගොස් මහබෝසතානන් දැක වැඳ එකත්පස්ව හිඳ විචාරන්නාහු තපස්වීන් වහන්ස! නුඹවහන්සේ අපගේ බිසවුන් මිය උපන්තැන්දන්නෝ සැබෑදැයි විචාළහ.

මහබෝසතානෝ දනිමි, මහරජ්ජුරුවෙනි! කීහ. කොහී උපන්නුදැයි විචාළකල්හි මහරජ්ජුරුවෙනි! ඒ බිසවුන් සුරාමදයෙන් මත්ව ප්‍රමාදවාසයට පැමිණ කුසල් නො කොට අකුසල් කොට මෙම උයන ගොම පැණි යොනියෙහි උපන්නෝ වේදැයි කීහ. රජ්ජුරුවෝ නුඹවහන්සේගේ බස් මා අදහාගන්නේ නැතැයි කීහ. එසඳ මහාබෝධිසත්ත්වයෝ එසේ වීනම් ඒ බිසවුන් තොපට දක්වා උන්ලවා කථාකරවම්දැයි කීහ. යහපත සාමිනීයි කීකල්හි මහබෝසතානෝ තමන්ගේ ආනුභාවයෙන් ඒ ගොමපැණීයා හා ඇට වල්ලහවූ ගොමපණු හා දෙදෙනා ගොම්පිඩක් වටකොට පෙරල පෙරලා රජ්ජුරුවන් අභිමුඛයට එත්වයි අධිෂ්ඨානකළාහ. මහබෝසතානන්ගේ අධිෂ්ඨානය හා සමග ඔහුදෙදෙනාත් ගොම්පිඩක් පෙරල පෙරලා රජ්ජුරුවන් අභිමුඛයට පැමිණියාහුය. එසඳ මහබෝසතානෝ ඔවුන් දෙදෙනා රජ්ජුරුවන්ට දක්වා මහරජ්ජුරුවෙනි! මේ ඉදිරියෙහි උබ්බරිදේවීය. ගොමවට පෙරල පෙරලා පසුපස්සේ එන්නේ ගොමපණුවාය. මොවුන් දෙදෙනා බලවයි කීහ. රජ්ජුරුවෝ බෝධිසත්ත්වයන්ට කියන්නාහු සාමිනි! උබ්බරිදේවී ගොමපැණීයා

ෂයෙහි උපදනාම පුද්ගලවූ කෙනෙක් නො වේත්. මම තුඹවහන්
සේගේ බස් අදහා නො ගණිමි කීවුය. එසේ වී නම් මම ඈ ලවා
කථාකරවම්ද? මහරජ්ජුරුවෙනියි කීකල්හි කථාකැරවුව මැන
ව තුපස්වීන්වහන්සැයි කීහ. මහබෝසතාණෝ තමන්ගේ ආනු
භාවයෙන් ඈ ලවා කථාකරවන්නාහු උබ්බරී නියි කීහ. ඕතො
මෝ මනුෂ්‍යභාෂාවෙන් කිවමැනව සවාමිනි යි කීවා; තී මේත
නට පූර්වජන්මයෙහි කෙබඳුව උපනීදැයි විචාළහ.

සවාමීනි, මම මේ අස්සක රජ්ජුරුවන්වහන්සේට අගමෙ
හෙසුන්ව උබ්බරී නම් බිසව්ය යි මේ නමින් ප්‍රසිද්ධවීමි යි කීව. එසද
මහබෝසතාණෝ කිමෙක්ද? දැන් තිට අස්සක රජ්ජුරුවෝ
ප්‍රියයෝද? නොහොත්, ගොම්පණුවා ප්‍රියදැයි කීහ. සවාමිනි ඒ
මාගේ පූර්වජන්මය එකල මම මේ උයන්හි රූප-ශබ්ද-ගන්ධ-
රස-ප්‍රෂ්ටව්‍ය යන පඤ්චකාමය අනුභව කොරමින් ඇවිද්
දෙමි. දැන් මා අතීත් ජන්මයකට ගියබැවින් ඒ රජ්ජුරුවන්
ගෙන් මට ප්‍රයොජන කවරේද? දැන්වූ කලි මම අස්සකරජ්ජු
රුවන් මරවා උන්ගේ ගලලෝහිතයෙන් මට වල්ලභවූ ගොම්
පණුවාගේ පය සෝදවනු කැමැත්තෙමි. අස්සකරජ්ජුරුවන්ට
වඩා ශතගුණයෙන් සහස්‍රගුණයෙන් ගොම්පණුවා මට ප්‍රියවන්
නේය යි පර්ෂත් මධ්‍යයෙහි මනුෂ්‍යභාෂාවෙන් කථාකළාය.

ඒ අසා අස්සක රජ්ජුරුවෝ විපිළිසරබවට පැමිණ කුණපය
ගෙන් පිටත් කරවා ඉස්සෝධා නහා මහබෝසතාණන් වැඳ නුව
රට ගොස් අතීත් බිසෝකෙනකුන් අගමෙහෙසුන් තනතුරෙහි
තබා දූහැමෙන් රාජ්‍යය කළාහුය. මහබෝසතාණෝ රජ්ජුරු
වන්ට අවවාද අනුශාසනා කොට සොක සන්හිඳුවා තමන් වසන්
නාවූ හිමාලය වනයට පැමිණියාහුය. මෙසේ උයන් ආදියෙහි
ලෝභකොට ගොම්පැණි ආදිව උපදනාහුය.

මාගමුන් කෙරෙහි ලෝභකලවුන් ඇතුළුකුස පණුවම උප
දනා පරිදි කෙසේද? යත්:—

යම්සේ අවීචියෙහි උපදනා සත්ත්වයෝ එකම අකුශලකර්මාන්
කින් නො ඉපද නොයෙක් අකුශල කර්මයෙන් උපදිද්ද? එපරිද්
දෙන්ම ස්ත්‍රීන්කෙරෙහි ලෝභයකලාවූ සත්ත්වයෝ උන්ගේ කුස
පණුවම උපදනාහ. සෙසු අකුසල් කල සත්ත්වයෝත් මාගමුන්
කුස පණුව උපදනාහ. පියුම්-පුන්සඳ-තිලිපුල් හා සමකොට දුග
ද පිළිකුල් මාගම්සිරිරු නුවණමඳ සත්ත්වයෝත් පස්කම්රාලෝ

කිත් වණ්ණනුවන එබඳු අඥානයෝ බොහෝම ඔවුනොවුන්ගේ රූප වර්ණනාකිරීමෙන් ලෝභ උපදවා ඒ මාගමුන්කුස පණුව උපද නාහ.

වෛෂයෙන් නාගව උපදනා පරිදි කෙසේද? යත්:-

පියංගුවෙහෙර වසන්නාවූ තෙරදෙදෙනකු වහන්සේ ඔවුනොවුන් වහන්සේ කෙරෙහි දෙමනස් ඇතිවූසේක. ඉන්එක් කෙනෙකුන් වහන්සේ කාලක්‍රියාවට වැදහෙව අනික් තෙරුන් වහන්සේ ක්ෂමාකරවනුකැමැතිව එන්ට කියා යැවූසේක. ඒ තෙරුන්වහන්සේ ක්ෂමාකැරපීමට නොලැබුනුසේක. ක්ෂමාකර වන්ට උත්සාහකල තෙරුන්වහන්සේ මිය ගොස් දඹදිව එක් විලෙක නාරජව උපන්සේක. ක්ෂමාකැරපීමට නොලැබුණු තෙරුන් වහන්සේ ඇතුළුව දෙලොස්දෙනකු වහන්සේ ශ්‍රීමහා බොධින්වහන්සේ වඳිනා කැමැතිව මධ්‍යමණ්ඩලයට වඩනා සේක් ඒ විල්තෙරට පැමිණ රාත්‍රියෙහි විල්තෙර රුකක්මුල පැන් පෙරහාවළඳ වැඩහුන්සේක. ඒ විල වසන්නාවූ නාගරාජයා තමන් වසන්නාවූ භවනයෙන් නික්ම ආනෙතනත්තේ සඞසයා වහන් සේ දැක හැඳින මානවක වේශයක් මවාගෙණ ගොස් වැද එ කත්පස්ව සිට පූර්වජන්මයෙහි තමාගේ නම සලකුණු කියා ඒ තෙරුන්වහන්සේ තමා කෙරෙහි ක්ෂමාකරවන්නට සඞසයා වහන්සේ ලවා යාඥාකරවා ක්ෂමා නො කරන්නේ නැවතත් නොයෙක් පරිද්දෙන් යාඥාකොට වෙහෙසීය. තෙරුන්වහන්සේ හුනස්නෙන් නැගී යන්නට වන්කල්හි මානවකවේශය හැර සර්ප වේශය මවාගෙණ නාගරාජයා තෙරුන්වහන්සේගේ පිටපත් ලට පෙණයෙන් ගසා ලූයේය. එවිගස තෙරුන්වහන්සේ මිය ඖපපාතික නාගරාජව ඉපැද ක්‍රොධයෙන් දුම් දිලිහී උනුන්කා ගොස් විලදියෙහි උපන්න. මෙසේ වෛෂකිරීමෙන් නාගරාජන් ව උපදනාහ.

අධිකවෛෂයෙන් රාක්ෂසව උපදනාපරිදි කෙසේද? යත්:-

අතීතයෙහි වාසුදෙව, බලදෙවාදි දසබෑරාජකුමාරවරුන් හංසවති නම් නුවර මල්ලයුඹයට බටකල්හි ඔවුන් අතුරෙන් බලදෙව නම් රාජකුමාරයෝ මුට්ඨිකමල්ලව නම් මල්ලවයා බැඳ ගෙණ මිරිකා මරනට වන්න. එසඳ මුට්ඨිමල්ලවයා මම මල්ලව යෙක් නොවෙම්යි කීය. ඔහු එසේ කීවත් බලදෙව නම් රාජකු මාරයෝ තා මල්ලව නියාවත් මල්ලව නො වන නියාවත් මම නො දන්මියි, ඔහුගේ බස් නො ගිවිස මිරිකා මරා පූන. ඒ මල්ලවයා

මියන ගමනේ ද්වේෂයෙන් තා කා මැරිය හෙම්වයි පතා මිය ගොස් කාලමත්තිකා නම් අරණ්‍යයෙහි රාක්ෂයව ඉපැද ඒ බල දේව නම් රාජකුමාරයන් තමා කල ප්‍රාර්ථනා නියාවටම කා මැරූයේය. මෙහි විස්තර සානජාතකයෙන් දත යුත්තේය. මෙසේ අධික ද්වේෂය කිරීමෙන් රාක්ෂසව උපදනාහ.

මානයෙන් වඳුරුව උපදනාපරිදි කෙසේය යත්:—

රජගහනුවර ගොපකමොග්ගල්ලාන නම් එක් බමුණෙක් එක්දවසක් කසයින් මහතෙරුන්වහන්සේ ගිජුකූළපව්වෙන් වඩනා දැක මේ මහාකාලවඳුරකු වැන්නේයයි කීය. බුදුරජාණන් වහන්සේ ඔහුගේ බස් අසා ඉදින් මේ තෙම කසයින් මහතෙරුන් ක්ෂමාකැරවූයේ වී නම් යහපත්වන්නේය. ක්ෂමා නො කැරවූයේ වී නම් මේ වෙළුවනයෙහි මහාකාලවඳුරුව උපදනේ වේදැයි විදාළසේක. බමුණු එපවත් අසා මානයෙන් ක්ෂමා නො කරවා ශ්‍රමණභවත් ගෞතමයන් වහන්සේ කීවා ඒ කාරණයෙන් සැබෑ වේමැයි මා වඳුරුම උපන්කල කැහැක්කේවී දැයි වෙළුවන යෙහි නොයෙක් ඵලරුක් හිඳුවා රුකවල් ලැවීය. පසුව ඒ බමුණු කල්‍යාමකින් මිය ගොස් ඒ වනයෙහි මහාකාලවඳුරුව උපන්නේය. මෙහි විස්තර මැදුම්සඟියෙහි ගොපකමොග්ගල්ලාන සූත්‍රයෙන් දතයුත්තේය. මෙසේ මානය කිරීමෙන් මහාකාල වඳුරුව උපදනාහ.

අභිමානයෙන් බළුව උපදනා පරිදි කෙසේද? යත්:-

බුදුරජාණන්වහන්සේ ජේතවනමහාවිහාරයෙහි වැඩවසන කල්හි සැවැත්නුවරට නුදුරුතෙන තුදිනම් ගමෙක් ඇත. එ ගමට අධිපතිවන බැවින් තොදෙය්‍ය නම් බමුණෙක් කොසොල් රජ්ජුරුවන්ට අග්‍රපුරෝහිතවිය. ඒ බමුණුතෙමේ සතාසූකෙළක් ධන ඇත්තේය. එතකුදුවුත් ඉතා මසුරුය.

"අඤ්ජනානං ඛයං දිස්වා උපචිකානං ච ආචයං
මධූනං ච සමාහාරං පණ්ඩිතො ඝරමාවසෙ."

යන මේ ගාථාව තමාගේ පුතුට උගන්වා කිසිවක්හට කිසිවක් නොදෙන පරිද්දෙන් හික්මවන්නේය. සමීපවිහාරයෙහි වැඩවසන්නාවූ සම්‍යක්සම්බුද්ධරජාණන් වහන්සේ යමක්පිරිනෙයින් හැඳැසාළුවක් පමණ වේවයි බත්තෙමතස්සක් පමණ වේවයි නොදී ධනලෝභයෙන් මිය එම ගෙයි තිරිසන්ව උපදනා

නැතැත්තේ අස්මිමානයෙන් බලුව උපන්නේය. ඔහු පිත් සුභ
මානවක නම් බමුණුදරු ඒ බල්ලාට බලවත්වූ සෙනහ ඇතිව
තමා අනුභවකරණ සැපියේ රසම්සවුලෙන් යුක්තවූ ආහාරය
ලන්නේය. කසාසදුන්සුවඳ ආදියෙන් නහවා උතුම් යානෙක
හොවන්නේය. එසමයෙහි බුදුරජානන්වහන්සේ අලුයම්වේ
ලෙහි ලොව බලා වදාරණසේක් ඒ බල්ලා දැක, තොදෙය්‍ය නම්
බමුණු වස්තුලොභයෙන් මිය තමාගේ ගෙයි බලුව උපන්නේය.
අද මා එතනට ගියකල්හි මා දැක බලු බුරයි. ඔහට මම එක
බසක් කියමි ඒබලු ශ්‍රමණභවත් ගෞතමයන් වහන්සේ මා හැඳි
නිසේක්වතැයි ගොස් ලිප්දොර හෝනේය. ඒ කාරණයෙන් සුභ
නම් මානවකයාහට මාහා සමග කථාසල්ලාපයෙක් වන්නේය.
සුභ නම් මානවකයා මාගෙන් බණ අසා සරණසීලයෙහි පිහිටයි.
බලු මිය ගොස් නරකයෙහි උපදනේය යි නුවණැසින් දැක ශර
ණසීලයෙහි පිහිටන මානවකයා කෙරෙහි අනුකම්පාවෙන් එද
වස් උදෑසන කලමනා සියලු දිනචරියාව කොට නිමවා එකලාව
ගොස් ඒ තුදී නම් ගමට වැද මානවකයා කිසි කාරියක් නිසා
ගමින් බැහැර ගියවේලේ ඔහුගේ දොරට වැඩවදාළසේක. එසඳ
ඒ බලුදු සම්‍යක්සම්බුදුරජානන්වහන්සේ දැක බුර බුරා සමීපයට
ගියේය. බුදුහු ඔහට වදාරණසේක් තොදෙය්‍යය! තෝ පූර්වජන්ම
යෙහි මට භො භො යනාදීන් ආක්‍රොශපරිභව බැණ බලුව උපන්
නෙහිය. දැන් මට බුරා අවීචිමහානරකයෙහි යෙන්නේ වේදැයි
වදාළසේක. බලු එබස් අසා ශ්‍රමණභවත්ගෞතමයන්වහන්සේ
මා හැඳිනිසේක් වතැයි කලකිරීමට පැමිණ කරනමාගෙණ ගොස්
උදුන්අතුරෙහි හළුපිට හොත්තේය. මනුෂ්‍යයෝ ඔහු නගාසිටුවා
යහනේ වැදහෙවන්ට අසමර්ථවූහ. සුභනම් මානවකයා අවුත්
මේ බල්ලා යහනින් බිමලූවෝ කවුරුදැයි විචාළේය. මනුෂ්‍යයෝ
ඔහට තමන්නැම යහණින් බිම බල්ලා නුලූනියාව කියා සර්වඥ
යන්වහන්සේ ඔහට වදාළ බස් කීහ. මානවකයා එබස් අසා
මපියානනවහන්සේ බ්‍රහ්මලොකයෙහි උපන්සේක. තොදෙය්‍ය
නම බල්ලෙක් ඇත්තේ නොවෙයි. ශ්‍රමණභවත් ගෞතමයන්
වහන්සේ මපියානන් බලුකරණසේක. ඒ බුදුහු නම් මුඛාවණ්‍ය
වූදෙයක් ම කියනසේකැයි කියා බුදුන් මුසවායෙන් මඩනකැමැ
තිව මානවකයා විහාරයට ගොස් එපවත් විචාළේය. බුදුහු ඔහට
පළමු තමන්වහන්සේ වදාළ ලෙසම වදාරා ඒ නිබොරු පරිදි
දක්වනු සඳහා දරුව! තාගේ පියා තට නො කී වස්තුවක් ඇද්
දැයි විචාළසේක. එසඳ මානවකයා ශ්‍රමණභවත් ගෞතමයන්

වහන්ස! මපියාහන් මට නො කී වස්තු ඇතැයි කියා කරේදැයි බුදුන් විචාල කල්හි ලක්ෂයක් වටනා රත්මාලාවෙක, ලක්ෂයක් වටනා රුවන්මිරිවැඩිසඟලෙක, ලක්ෂයක් වටනා රත්පලසෙක මසුරන් ලක්ෂයෙක යන මේ සියලුවස්තු මපියාහන් මට නො කී වස්තුය යි කීය.

එසඳ බුදුහු වදාරණසේක් දරුව! තෝ ගොස් ඒ බල්ලාව කිරිබත් කවා යහනේ හොවා මඳතින්දක් නිදන්ව ගත්කල්හි නොකී වස්තු විචාරව ඒ බලු පූර්වජන්මයෙහි තමා නොකී සියලු වස්තුව තට කියයි. එසඳ ඔහු තා පියබව් දැනගණැයි වදාළසේක. සුභ නම් බ්‍රාහමණ මානවකයා ඉදින් බුදුන් බස් සැබෑවී නම් වස්තු ලැබෙමි. බොරුවී නම් මුසවාදයෙන් නිග්‍රහ කෙරෙමියි දෙකරුණෙන්ම සතුටුව තමාගේ ගෙට ගොස් . මනාකොට කිරිබත් පිසවා බල්ලා බඩපුරා අනුභවකරවා යානේ හොවා මඳතින්දක් නිදන්ට වන්කල්හි පළමු තමාට නොකී වස්තු විචාළේය. එසඳ බලු තමා හැඳිනිබවට දැන හුං හුං යන අනුකරණයෙන් ධවනි පවත්මින් ධන තිබූ තැනට ගොස් පසුරෙන් හීව කැන සලකුණු කෙළේය. ඒ සලකුණෙන් මානවකයා එම වස්තු ගොඩ නගා ගෙණ භවයෙන් සැගවී තිබෙන්නාවූ අති සූක්ෂමවූ ජාත්‍යන්තර යෙහි කාරිය පවා ශ්‍රමණභවත් ගෞතමයන්වහන්සේට ප්‍රත්‍යක්ෂ ව දැනෙන්නේය. එසේහෙයින් උන්වහන්සේ ඒකාන්තයෙන් සර්වඥසේකැයි බුදුන් කෙරෙහි පැහැද දහම්පඬුරු ගෙණගොස් ශ්‍රමණභවත් ගෞතමයන්ගෙන් ප්‍රශ්නවිචාරන්ට වුවමැනවැයි දෙවෙනි වාරයේ යනගමන් ප්‍රශ්න තුදුසක් සිතින් සතිවූනත් කොට ගෙණ බුදුන් කරා එළඹ කථාකොට එකත්පස්ව හිඳ ප්‍රශ්න විචාරන්නේ මෙසේ විචාළේය. භවත් ගෞතමයන් වහන්ස! මනුෂ්‍යයන් කෙරෙහි අල්පායුෂකසත්ත්වයෝද, පෙණෙති, බහ්වාබාධසත්ත්වයෝද, පෙණෙති. අල්පාබාධසත්ත්වයෝද, පෙණෙති. දුර්වර්ණසත්ත්වයෝද, පෙණෙති. සුවර්ණසත්ත්වයෝද, පෙණෙති. අල්පේශාක්‍යයෝද, පෙණෙති. මහේශාක්‍යයෝද, පෙණෙති. අල්පභොගසත්ත්වයෝද, පෙණෙති. මහාභොගසත්ත්වයෝද, පෙණෙති. අකුලීනසත්ත්වයෝද, පෙණෙති. කුලීන සත්ත්වයෝද, පෙණෙති. නුවණනැතිසත්ත්වයෝද, පෙණෙති. නුවණඇතිසත්ත්වයෝද, පෙණෙති. මොහු කවර කාරණයකින් හීනොත්කෘෂ්ට වෙද්දැයි විචාළේය.

එසඳ බුදුහු වදාරණසේක් මානවකය! මෙලෝකයෙහි සත්ත්වයෝ කර්මය ස්වකීයකොට ඇත්තාහ. කර්මය දායාදයහ. කර්ම

යෝනියෝ. සාම්ම බන්ධුන. සාම්ම ප්‍රතිශරණයන. එහෙයින් කර්මය සියලු සත්ත්වයන් හීනප්‍රණීතකොට බෙදන්නේය යි වදාළසේක. එසඳ බමුණුදරු සතපිළීපටකින් මුහුණවසා බැඳ අභිමුඛයෙහි මධුරභොජනයක් තබාලූ කලක් මැතිවිය. බුදුරජාතන්වහන්සේ සංක්‍ෂෙපයෙන් කුමක් පිණිස වදාරණසේක්ද? යත්:-

ඒ බමුන්දරු පණ්ඩිතමානීය. තමා හා සමාන කෙනකුන් ලොව නැතැයි සිතා හිඳිනේය. ශ්‍රමණභවත් ගෞතමයන්වහන් සේ කියන්නේ කිම්ද? මම යමක්දනිම් නම් ඒම උන්වහන්සේ කියනසේක. උන්වහන්සේ යමක්දන්නාසේක් වී නම් ඒසියල්ල මම දනිමි. මටවඩා උන්වහන්සේ දන්නාදෙයක් නැතැයි අභිමානපරව හිඳිනේය. එසේහෙයින් බුදුහු ඔහුගේ මන්ඕඳිනා පිණිස පළමුකොට ඔහු නොදතහැකි පරිද්දෙන් කියමි. පසුව ඔහුගේ ආරාධනාවෙන් විස්තරකොට දක්වමි යි සංක්‍ෂෙපයෙන් වදාළසේක.

එසඳ බමුණුදරු සැකෙවින් කීබසැ අර්ථ මට නො දැනෙයි. විස්තරවශයෙන් මා දතහැකිසේ දෙසුව මැනවැයි ආරාධනා කෙළේය. එසඳ විස්තරවශයෙන් පැහ විසදන්නාවූ බුදුරජාතන් වහන්සේ දරුව! යම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ ප්‍රාණඝාත ය කළේවී නම් ඒ සත්ත්ව නරකයෙහි ඉපද බොහෝ දුක් විඳ ඉදින් මනුෂ්‍යජන්මයෙහි උපන්නේ වී නම් උපන්තැන්ම අල්පා යුෂ්ක වෙයි, තරුණවයසෙහි ම මරණ ලැබෙන්නේය. යමෙක් ප්‍රාණවධ නො කොට සත්ත්වයන් කෙරෙහි කරුණා ඇතිව වෙසේද, ඒ සත්ත්ව දිව්‍යලොකයෙහි ඉපද බොහෝ සුව විඳ මිනිසත්බවට පැමිණියේ වී නම් උපනුපන් තැන්හි දීර්ඝායුෂ්කව බොහෝකල් ජීවත්ව ඉඳිනේය. යමෙක් සත්ත්වයන්ට අතින් හෝ, පයින් හෝ දණ්ඩෙන් හෝ,පහණින් හෝ,ශස්ත්‍රයෙන් හෝ, පීඩාකෙරේද ඒ සත්ත්ව නරකයෙහි ඉපද බොහෝ දුක විඳිමින් මිනිස්පියට ආයේ වී නම් උපනුපන්තැන්හි බව්හාබාධවෙයි. රෝගීවෙයි. යමෙක් සත්නට පීඩා නො කෙරේද, ඒ සත්ත්ව දිව්‍ය ලොකයෙහි ඉපද බොහෝ සුවවිඳ මිනිස්බවට ආයේ වී නම් උප නුපන්තැන්හි අල්පාබාධවෙයි. නිරොගීවෙයි.

යමෙක් ක්‍රොධබහුලව මදබසෙකිතිදු කිපෙන්නේ වී නම් ඒ සත්ත්ව නරකයෙහි ඉපද බොහෝ දුක්විඳ මිනිස්පියට ආයේ වී නම් උපනුපන්තැන්හි දුර්වර්ණවෙයි. විරූපී වෙයි. යමෙක්

ක්‍රොධ නො කරන්නේ වී නම් ඒ සත්ත්ව දිව්‍යලොකයෙහි ඉපද බොහෝ සුවවිඳ මනුෂ්‍යජන්මයට පැමිණියේ වී නම් උපනුපන් තැන්හි සුවණ්ණවණ්ණ වෙයි. අභිරූපවෙයි.

යමෙක් අනුන්ගේ ඓශ්වය්‍ය්‍යීයද, අනුන්ට කරණ සත්කාරයද ඉවසිය නොහී ඊර්ෂ්‍යා කෙළේ වී නම් ඒ සත්ත්ව නරකයෙහි ඉපද බොහෝ දුක් විඳ මිනිස්පියක් ලද්දේ වී නම් උපනුපන් තැන්හි අල්පෙශාක්‍ය වෙයි. විගතානුභාව වෙයි. වහලු වෙයි. යමෙක් අනුන්ගේ ඓශ්වය්‍ය්‍යීයෙහිද, අනුන්ට කරණ සත්කාරයෙහිද ඊර්ෂ්‍යා නො කොට ප්‍රශංසා කෙළේ වී නම් ඒ සත්ත්ව දිව්‍යලොකයෙහි ඉපද දිවසුව වළඳා මිනිස්පියට ආයේ වී නම් උපනුපන්තැන්හි මහෙශාක්‍ය වෙයි. මහානුභාව වෙයි. මහත් පිරිවර ඇතිවෙයි. යමෙක් මහණබමුණන්ට අන්නපානාදියෙන් සංග්‍රහ නො කරන්නේ වී නම් ඒ සත්ත්ව නරකයෙහි ඉපද බොහෝ දුක්විඳ මිනිසත්බවකට පැමිණියේ වී නම් උපනුපන් තැන්හි අල්පභොග ඇතිවෙයි. දරිද්‍රවෙයි. යමෙක් අන්නපානාදියෙන් මහණබමුණන් පිණවූයේ වී නම් ඒ සත්ත්ව දිව්‍යලොකයෙහි ඉපද බොහෝ සුව විඳ මනුෂ්‍යාත්මභාවයට පැමිණියේ වී නම් උපනුපන්තන්හි මහාභොග ඇතිවෙයි. සුවපත් වෙයි. යමෙක් මානස්ථබ්ධව අභිමානයෙන් වැන්දමැනවුන්ට නො වඳීද, පිදුවමැනවුන්ට නුපුදද, හුනස්නෙන් නැගමැනවුන්ට අස්නෙන් නොනැගේද, හිඳිනා අසුන් දුනමැන වුන්ට අසුන් නොදේද, මඟහැර පහවුව මැනවුන්ට මඟ නොහරීද, සත්කාර කළමැනවුන්ට සත්කාර නො කෙරේද, ගරුකාර කළමැනවුන්ට ගරුකාර නො කෙරේද, ඒ සත්ත්ව නරකයෙහි ඉපද බොහෝ දුක්විඳ මිනිස්පියක උපන්නේ වී නම් හීනකුලයෙහි උපදන්නේය. හැමදෙනා විසින් ගර්හිත වන්නේය.

යමෙක් මානස්තබ්ධ නොව අභිමාන නොකොට වැන්දමැනවුනට වඳීද, පිදුවමැනවුන්ට පුදද, දුනහුනස්නෙන් නැඟමැනවුන් දුන හුනස්නෙන් නැගේද, හිඳිනාඅසුන් පණවාදේද, සත්කාර ගරුකාර නමස්කාර කෙරේද, ඒ සත්ත්ව දිව්‍යලොකයෙහි ඉපද බොහෝ සුව විඳ මිනිස්පියෙහි උපන්නේ වී නම් උතුම් කුලයෙහි උපදී. හැමදෙනා විසින් පූජ්‍යවෙයි.

යමෙක් මහණබමුණන් කරා එළඹ වහන්ස! කුසල් කවරේද? අකුසල් කවරේද? කුමක් කටයුතුද? කුමක් නො කටයුතුද? කුමක කළකල දුගතියෙහි දුකපැමිණේද? කුමක් කළකල සුග

නිරයෙහි සැප පැමිණේදැ යි තෝ පිළිවිසීද, ඒ සත්ත්ව නරකයෙහි ඉපද බොහෝ දුක්විඳ මිනිස්පියට ආයේ වී නම් උපනුපන් තැන්හි අඥාන වන්නේය.

යම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ මහණබමුණන් කරා එළඹ වහන්ස! කුසල් කවරේද? අකුසල් කවරේද? යනාදීන් විචාරාද ඒ සත්ත්ව දිව්‍යලෝකයෙහි ඉපද බොහෝ සුවවිඳ මනුෂ්‍ය ජන්මයට පැමිණියේ වී නම් පොළොව හා සමාන මහනුවණ ඇති වන්නේය. මාණවකය! මෙසේ අල්පායුෂ්කවන්ට තිසිපිළිවෙත් අල්පායුෂ්කබවට පමුණුවයි. දීර්ඝායුෂ්කවන්ට තිසිපිළිවෙත් දීර්ඝායුෂ්කබවට පමුණුවයි. බව්හාබාධවන්ට තිසිපිළිවෙත් බව්හාබාධබවට පමුණුවයි. අල්පාබාධවන්ට තිසිපිළිවෙත් අල්පාබාධබවට පමුණුවයි. දුර්වර්ණවන්ට තිසිපිළිවෙත් දුර්වර්ණබවට පමුණුවයි. සවර්ණවර්ණවන්ට තිසිපිළිවෙත් සවර්ණවර්ණබවට පමුණුවයි. අල්පේශාක්‍යවන්ට තිසිපිළිවෙත් අල්පේශාක්‍යබවට පමුණුවයි. මහේශාක්‍යවන්ට තිසි පිළිවෙත් මහේශාක්‍යබවට පමුණුවයි. අල්පභෝගවන්ට තිසි පිළිවෙත් අල්පභෝගබවට පමුණුවයි. මහාභෝගවන්ට තිසිපිළිවෙත් මහාභෝගබවට පමුණුවයි. අකුලීනවන්ට තිසිපිළිවෙත් අකුලීනබවට පමුණුවයි. කුලීනවන්ට තිසි පිළිවෙත් කුලීනබවට පමුණුවයි. නුවණනැතිවන්ට තිසි පිළිවෙත් නුවණ නැතිබවට පමුණුවයි. නුවතැතිවන්ට තිසි පිළිවෙත්නුවණැතිබවට පමුණුවයි.

මෙසේ සත්ත්වයෝ කර්මස්වකීයහ. කර්මදායාදයහ. කර්මයෝනීහ. කර්මබන්ධුහ. කර්මප්‍රතිශරණයහ. එසේ හෙයින් කර්ම තෙමේ ම සියලු සතුන් හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ අල්පායුෂ්කවූ හෝ දීර්ඝායුෂ්කවූ හෝ බව්හාබාධවූ හෝ අල්පාබාධවූ හෝ දුර්වර්ණවූ හෝ සවර්ණවර්ණවූ හෝ අල්පේශාක්‍යවූ හෝ මහේශාක්‍යවූ හෝ අල්පභෝගවූ හෝ මහාභෝගවූ හෝ අකුලීනවූ හෝ කුලීනවූ හෝ නුවණනැතිවූ හෝ නුවණ ඇතිවූයි හීනෝත්කෘෂ්ට කොට බෙදන්නේය. කර්මය මිස සත්ත්වයන් හීනප්‍රණීත කොට විභාගකරවන්ට තිසි අන්කිසිවෙක් නැතැයි වදාළසේක.

දේශනාවසානයෙහි සුභ නම් මාණවකයා අන්‍යලබ්ධිය හැර ශරණශීලයෙහි පිහිටියේය.

තවද ඒ සුභමාණවකයා සතාසූකෙළක් ධන හැර ඒ තොදෙය්‍ය නම් බල්ලා මිය නිරා තිරිසන් අපායේ උපතුදු වළකන්ට නො පොහොසත්වූයේය. එසින් වදාළහ. බුදුහු:-

"පුත්තාමත්ථි ධනම්මත්ථි ඉති බාලො විහඤ්ඤති,
අත්තාහි අත්තනො නත්ථි කුතොපුත්තා කුතො ධනං සි"

මෙසේ අධිකමානයෙන් බලූව උපදනාහ. මෙහි අලොභාදිවූ ධර්මයෝ සඳෙහ නොයෙක් දොෂ දුරුකරණ හෙයින්ද, නොයෙක් ගුණ එලවන හෙයින්ද සත්ත්වයන්ට බොහෝ උපකාරී වන්නාහ. විශෙෂයෙන් යොගාවචරයන්ට බහූපකාරී වන්නාහ. ඒ එසේ මැයි. අලොභය මාත්සර්‍ය්‍යමලයට ප්‍රතිපක්ෂය, අද්වෙෂය දෞශ්ශීල්‍යමලයට ප්‍රතිපක්ෂය, අමොහය කුශලධර්මයෙහි අභාවනාවට ප්‍රතිපක්ෂය. අලොභය දානයට හේතුය. අද්වෙෂය ශීලයට හේතුය. අමොහය භාවනාවට හේතුය. අලොභයෙන් ප්‍රියවිප්‍රයොගදුඃඛය නොවන්නේය. අද්වෙෂයෙන් අප්‍රියසම්ප්‍රයොගදුඃඛය නො වන්නේය. අමොහය රාගවශයෙන් පැමිණීම නසන්නේය. අලොභය ලොභවශයෙන් පැමිණීම නසන්නේය. අද්වෙෂය ද්වෙෂවශයෙන් පැමිණීම නසන්නේය. අමොහය මොහයවශයෙන් පැමිණීම නසන්නේය. අලොභය ත්‍යාගයෙන් භොගප්‍රතිලාභය වනහෙයින් භොගසම්පත්තියට ප්‍රත්‍යය වන්නේය. අද්වෙෂය මෛත්‍රියෙන් මිත්‍රප්‍රතිලාභ වනහෙයින් මිත්‍රසම්පත්තියට ප්‍රත්‍යය වන්නේය. අමොහය යම්හෙයකින් අමූඪවූ තෙතත්තේ තමහට වැඩම කෙරෙමින් ආත්ම සමාධිය කෙරේද, එහෙයින් ආත්මසම්පත්තියට ප්‍රත්‍යය වන්නේය. අලොභයෙන් ජාතිදුඃඛය නො වන්නේය. අද්වෙෂයෙන් ජරාදුඃඛය නොවන්නේය. අමොහයෙන් මරණදුඃඛය නො වන්නේය. අලොභයෙන් ප්‍රෙතලොකයෙහි උත්පත්තිය නො වන්නේය. අද්වෙෂයෙන් නරකයෙහි උත්පත්තිය නො වන්නේය. අමොහයෙන් තිරිසන්යොනියෙහි උත්පත්තිය නො වන්නේය. මෙසේ වර්ණනා කරණලද නුගුණ ඇති ලොභ-ද්වෙෂ-මොහ තුනින් සත්ත්වයෝ අපායේ උපදනාහ. මෙසේ වර්ණනා කරණලද ගුණ ඇති අලොභ-අද්වෙෂ-අමොහ තුනින් සත්ත්වයෝ ස්වර්ගයෙහි උපදනාහ. එසේහෙයින් ස්වර්ගයට යනුකැමැති සත්ත්වයන් විසින් සිල්සමාදන්ව කිසිවෙක ලොභයක්වත් කිසිවක්හට ද්වෙෂයක්වත් කිසිවෙක මොහයක්වත් නොකටයුත්තේය. මේ කාරණය හේතුකොටගෙණ බුදුරජාණන්වහන්සේ එකල ඒ හද්දජිස්ථවිරයන්ගේ පූර්වජන්මයෙහි නෑයෝ ප්‍රාසාදලොභයෙන් මස්, කැසුප්, නා'මඩු ආදිව එම ප්‍රාසාදයෙහි උපන්නෝ වේදැයි වදාළසේක. ඉක්බිත්තෙන් භාග්‍යවත්වූ බුදුරජාණන්වහන්සේ ප්‍රාසාදය උඩනැගෙත් නැගෙත් පෙරළි පෙරළී දියෙහි වැගිර පීඩාවට පැමිණෙන්නාවූ හද්දජිස්ථවිරයන්

වහන්සේගේ පූර්වඥතීත්දූක ප්‍රාසාදය උඩනැගී නොදී හරවා ගංගාවෙන් එතර වැඩිසේක. එසඳ සර්වඥයන්වහන්සේට ගත් තෙරම් අස්නක් පැණවූහ. බුදුරජාණන්වහන්සේ පණවනලද උතුම්වූ බුඩාසනමස්තකයෙහි යුගඳුරුමුදුනෙහි දිලියෙන්නාවූ ළහිරුමඩලක් මෙන් සවණක්රැස් විහිදුවමින් දිලිහි දිලිහී වැඩ උන්සේක ඉක්බිත්තෙන් භික්ෂූන්වහන්සේ එවේලෙහි ස්වාමිනි! මේ ප්‍රාසාදය භද්දජිස්ථවිරයන් පෙරවිසූ ප්‍රාසාදයෙක් දැයි විචාළ සේක. එසඳ බුදුරජාණන්වහන්සේ මහණෙනි! භද්දජිස්ථවිරයන් පෙර මහාපනාදකාලයේ විසූ ප්‍රාසාදය වේදැයි වදාරා යටකියන ලද ක්‍රමයෙන් පූර්වචරිතය දෙශනාකොට දුඃඛ සමුදය නිරොධ මාර්ගය යන චතුරාර්‍ය්‍යසත්‍යය ප්‍රකාශකොට නොයෙක් කෙළදහස් ගණන් දිව්‍යමනුෂ්‍යයන් මාර්ගඵලයට පමුණුවා එසමයෙහි "මහාපනාදරජ්ජුරුවෝ නම්" දැන් භද්දජිස්ථවිරයෝය. සුමෙධාදේවී නම් විසාඛාවෝය. විශ්වකර්මදිව්‍යපුත්‍රයානම් ආනන්දස්ථවිරයෝය. ශක්‍රදෙවෙන්ද්‍රයෝ නම් තිලෝගුරු සම්‍යක්සම්බුදුරජවූ මම්මවේ දැයි තමන්වහන්සේ දක්වා වදාරා දෙශනාව නිමවා හුනස්නෙන් පැනනැගී ආර්‍ය්‍යසමූහයා විසින් පිරිවරණ ලදුව ජෙතවනමහා විහාරයට වැඩවදාළසේක. භද්දජිස්ථවිරයන්වහන්සේ ආයුපමණින් සිට අතිමධුරවූ ඵලසමාපත්තිසැපය අනුභව කොට ආයු කෙළවර සසරදුක් හැර නිරුපධිශෙෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවන්පෑ වදාළසේක.

අන්‍යවූ නලකාරදිව්‍යපුත්‍ර වූ කලි යම්තාක් මෛත්‍රෙයසර්වඥයන්වහන්සේ උපදනාසේක් වී නම්: ඒතාක් ම කුශලකර්මවිශෙෂයෙන් සදිව්‍යලොකයෙහි අනුලොම ප්‍රතිලොම වශයෙන් මහත් වූ දිව්‍යඓශ්වර්‍ය්‍ය අනුභව කොට ඇවිද අනාගතයෙහි අසූදහසක් අවුරුද්දට ආයුෂය ඇති මනුෂ්‍යයන් සමයෙහි දිව්‍යලොකයෙන් චුතව කෙතුමතී නම් රාජධානියෙහි අසම්භින්නවූ ක්ෂත්‍රිය වංශ ඇති රාජවංශයෙහි ඉපද මහපෙරහරින් වැඩීවිය පැමිණ සඞ්ඛ නම් චක්‍රවර්තිරජව මහාපනාදරජ්ජුරුවන් පෙර විසූ රුවන්පාය නංවා එහි වසන්නේය. එසේහෙයින් වදාළහ බුදුහු:-

චක්‍රවර්ති සූත්‍රයෙහි: අථ ඛො භික්ඛවෙ සඞ්ඛො රාජා යො සො යූපො රඤ්ඤා මහපනාදෙන කාරාපිතො තං යූපං උස්සාපෙත්වා වසිස්සතී''ති.

ඒ ප්‍රාසාදය වූ කලි සඞ්ඛ නම් චක්‍රවර්ති රජ්ජුරුවන්ගේ කුසලානුභාවයෙන් ගංගා නම් ගංගාවෙන් උඩනැගී ආකාශයෙන්

අවුත් කේතුමතී නම් රාජධානිමධ්‍යයෙහි පිහිටන්නේය. ඒ රජ්
ජුරුවන්ගේ කුශලානුභාවයෙන් උඩනැංගාවූ ප්‍රාසාදය උන්
තමන්විසින්ම නංවනලද්දේ නම් වෙයි කියා රතනප්‍රාසාද නංවා
එහි වාසයකරන්නාහයි, මේ කාරණයෙන් කියන ලද්දේය.

ඒ සඞ්ඛ නම් චක්‍රවර්තිරජ්ජුරුවන්ට දිව්‍යප්සරාවන්ගේ
රූපශෝභා සමාන වූ රූපසෞන්දර්‍ය්‍යයී ඇති පෙරහර, පාදාඞ්ගුලි,
පාඩගම්, පාදසූත්‍ර, පාසලඹ, පාදකිඞ්කිණිකා, පාදජාලා, පාදවකු,
පස්රූ, පස්වළලු ආදිවූ අනේකප්‍රකාර ආභරණ පළන්නාවූ,
නැටීම්-ගීකීම්-බෙරවැයීම්-වස්කුලල් ආදිය පිඹීම් ආදිවූ චතු
රඞ්ගසඞ්ගතයෙහි දක්‍ෂවූ හාවභාවලීලා කටාක්‍ෂමන්දස්මිතයෙන්
යුක්තවූ ප්‍රිය තෙපුල් කියන්නාවූ සුවාසූදහසක් නාටකස්ත්‍රී වන්
නාහුය. පුත්‍රයන් දහසක්දෙනාට ප්‍රධානවූ පරිනායකරත්න වූ
අජිත නම් කුමාරයෙක් ප්‍රධානපුත්‍ර වන්නේය. දොළොස්
යොදනෙක පැතිර සිටිනාවූ ආතතය-විතතය-ඝනය-සුසිරය-
යන පඤ්චාඞ්ගිකතූර්‍ය්‍යනාදයන් පවත්වන්නාවූ රඟමඬල වන්
නේය. පස්විසියොදනෙක පැතිරසිටිනාවූ බ්‍රාහ්මණමඬලය වන්
නේය. අටසාළිස්යොදනෙක පැතිර සිටිනාවූ සර්වාභරණයෙන්
සැරහුනාවූ පඤ්චායුධසන්නද්ධවූ නොයෙක් වෙස් ගත් අමාත්‍ය
මණ්ඩලය වන්නේය. අනූයොදනෙක පැතිරසිටිනාවූ පර්ෂත්
මණ්ඩලය වන්නේය. පන්සියක් යොදනෙක පැතිර සිටිනාවූ
සත්රුවන් කර්මාන්ත කරනලද විචිත්‍ර මණ්ඩපමාලාවෙන් සපිරු
ණාවූ මහාසේනාව වන්නේය. හාත්පසින් සතරදිග සුවාසූදහ
සක් පමණවූ හස්ත්‍යශ්වාදි චතුරඞ්ගිනීසේනාව වන්නේය.

එසමයෙහි දඹදිව සුවාසූදහසක් පමණ රාජධානි වන්
නේය. එහි අනූකෙළලක්‍ෂයක් අභිෂේකපලන් රජදරුවෝ වන්
නාහ. ඒ සියලු රජදරුවෝම නිරන්තරයෙන් සඞ්ඛ නම් චක්‍ර
වර්තිරජ්ජුරුවන් පිරිවරා සිටිනාහ. මෙසේ ඒ සඞ්ඛ නම් චක්‍ර
වර්තිරජ්ජුරුවෝ මෙබඳුවූ දිව්‍යසම්පත්තිය ඉක්ම පවත්නාක්
වැනිවූ සියලු සම්පත්තීන් යුක්තව ඒ ප්‍රාසාදයෙහි වෙසෙමින්
සියලු පෘථිවීමණ්ඩලයට අනුශාසනා කරන්නාහ.

දැන් ඒ කේතුමතී නම් රාජධානියෙහි වීථි, සල්පිල්, පොකුණු
තාලපන්ති, කල්පවෘක්‍ෂ, ආභරණාදිවූ සමෘද්ධිය දක්වන්නාවූ
සර්වඥයන්වහන්සේ:-

"අපා'පි තස්මිං නගරෙ නානාවීථි තහිං තහිං
සුමාපිතා පොක්ඛරණී රමණීයා සුපතිට්ඨා"

යනාදීන් මෙසේ වදාළසේක.

තවද ඒ කෙතුමතී නම් රාජධානියෙහි ඒ ඒ තැන නොයෙක් වීථි, රන්ධජපතාකා, කෙසෙල්ගස්, රන්තොරණ, රිදීතොරණ, මල්ඇගෑ පුන්කලස් ආදියෙන් ගැවසී ගන්නේය. ඇත්මුළු-අස්මුළු-රියපෙළ-යොධමුළු-පෞරරය යන මලලචමුළු-මෙබෙළු-තිරෙළු-පලෙලු-වෘෂභ-ස්ත්‍රී පුරුෂ සමූහාදීන් ගෙන් තුසුනාවූ සඤ්චාර ඇත්තේය.

තවද ඒ වීථි රන්වන් සඳුන්-කළුවැල්-කොට්ටම්-දෙවුදුරු-තකුල්-තැන්- කපුරු ආදිවූ සුවඳසල් පිළිත්ද, දූසමන් ඉද්ද මහනෙල් සපු නා දෙඹ පලොල්මල් ආදී මල්පිලින්ද, තිහිරිපිළී කපුපිළී බොමදෙශයෙහි, පත්තුන්නදෙශයෙහි, චීනදෙශයෙහි, උපන් සිළී දුහුල්පිළී සොමාරදෙශයෙහි උපන් පිළී ආදිවූ නොයෙක් පිළී සල්පිලින්ද, සුවඳහැල් රත්හැල්-මහවී ආදිවූ නොයෙක් ධාන්‍යසල් පිලින්ද, මුතු මැණික් රන්රිදී-සක්-සලපබලු ආදී අනෙකප්‍රකාර රත්නාපණයෙන්ද, සශ්‍රීක වන්නේය.

තවද ඒ ඒ තැන්හි නොයෙක් වීථි නිම්ලවූ පැහැසරවන්වූ වැල්ලෙන් අතිධවල වන්නේය. නිරන්තරයෙන් පවත්නාවූ මනොඥවූ සුගන්ධයෙන් එකසුගන්ධවන්නේය. නන් විසිතුරු පිලිපලඳනාශොභාවෙන් විශෙෂයෙන් බබලන්නේය. මෙසේ මෙබඳුවූ අනෙකප්‍රකාර කුදුමහත් වීථී ඒ ඒ තන්හි සැරහී සිටිනේය.

තවද එනුවර ඒඒ තන්හි සිත්කලුවූ පොකුණු තුඹුත් ඉවුරු ඇත්තේය. මඩ නැත්තේය. නොයෙක් පැහැයෙන් දිලියෙන්නාවූ සර්වරත්නමයවූ ශොභමානවූ පියගැට පංක්තියෙන් හෙබියාවූ සැපසේ සියලු සත්ත්වයන් බැස ස්නානපානය කටැ හැකි තොටින් යුක්තවන්නේය. ප්‍රසන්නවූ නිම්ලවූ මිහිරිවූ සිහිල්වූ හැමකල මනා සෘතුසම්පන්නවූ පත්මොත්පලාදී පුෂ්පගන්ධයෙන්ද, හැමකලම එකසුගන්ධවූ පැන් ඇත්තේය.

තවද ඒ පොකුණුවල පැන් සමපූර්ණව පිරී තිබෙනබැවින් පොකුණු මියරහුත් කපුටුවන් කර දික් නොකොටම බොන්නට සුදුසු වන්නේය. පිරිසුදු මටසිලුටු වැලිතලාවෙන් ගැවසීගත්තේය. රක්තෝත්පලය, නීලොත්පලය, සෙවතොත්පලය යන ත්‍රිවිධ උත්පලයන් හා රක්තපද්මය, සෙවතපද්මය, නීලපද්මය යන ත්‍රිවිධ පද්මයෙන් මනාකොට ගැවසීගත්තේය.

තවද ඒ පොකුණුවලපැන් හැමකලම සෘතුසම්පන්න බැවින් ආවරණයක් නැතිබැවින් සර්වසාධාරණ බැවින් කැමැති කැමැති සත්ත්වයන් ඝොස් ප්‍රයොජන විඳින්ට සුදුසු වන්නේය.

මෙසේ මෙබඳු දෙරටු අටලු පව්රුපදනම් ආදියෙන් සුරක්ෂිතව සුගොපිතව නිරන්තරයෙන් සෘතුසම්පන්නව තිබෙන්නේය. පැන් ඇති පොකුණු නුවර ඒ ඒ තන්හි බැබලිතිබෙන්නේය.

තවද එනුවර සිත්කලුවූ විසුරුනාවූ වැලි ඇති සමතලවූ භූමි ප්‍රදෙශ ඇති සත්රුවන්මයවූ පවුරු අතුරෙහි පිහිටියාවූ අසූරියන් උස ඇති සතරන්මය-රිදීමය-වෛඩූර්‍යමාණික්‍යමය-ස්ඵටිකමාණික්‍යමය-ලොහිතඞ්කමාණික්‍යමය-මසාරගල්ලමාණික්‍යමය සර්වරත්නමය තාලපඞ්ක්තීහු සත්දෙනෙක් වන්නාහ.

ඒ තල්ගස්පඞ්ක්ති සතින් සවර්ණමයවූ තාලපඞ්ක්තිය සවර්ණමයවූ ප්‍රාකාරසමීපයෙහිම පිහිටන්නේය. රජතමයවූ තාලපඞ්ක්තිය රජතමයවූ ප්‍රාකාර සමීපයෙහි පිහිටන්නේය. වෛඩූර්‍යමයවූ තාලපංක්තිය වෛඩූර්‍යමයවූ ප්‍රාකාර සමීපයෙහි, පිහිටන්නේය. ස්ඵටිකමයවූ තාලපංක්තිය ස්ඵටිකමයවූ ප්‍රාකාර සමීපයෙහි පිහිටන්නේය.

ලොහිතඞ්කමයවූ තාලපඞ්ක්තිය ලොහිතඞ්කමයවූ ප්‍රාකාරසමීපයෙහි පිහිටන්නේය. මැසිරිගල්මයවූ තාලපඞ්ක්තිය මැසිරිගල්මයවූ ප්‍රාකාර සමීපයෙහි පිහිටන්නේය. සර්වරත්නමයතාලපඞ්ක්තිය සර්වරත්නමයවූ ප්‍රාකාරසමීපයෙහි පිහිටන්නේය. තවද එනුවර හාත්පසින් සත්රුවන්මයවූ ප්‍රභාසම්පන්නවූ සත්පවුරු වළල්ලක් නුවර සිසාරා පිහිටන්නේය.

ඉන් එක්පවුරුවළල්ලෙක් සතරන්මයය, එකෙක් රිදීමයය, එකෙක් වෛරඑම්ණිමයය, එකෙක් පිළිවඟණම්ණිමයය. එකෙක් ලොහිතඞ්කමයය, එකෙක් මැසිරිගල්මයය, එකෙක් සත්රුවන්මයවූ පවුර උසින් සැටරියනක් ඇතිව මධ්‍යයෙහි පිහිටන්නේය. රන්-රිදී-වෛරඑම්ණිමය තුන් පවුර ඒසත්රුවන්මය පවුරෙන් පිටත අනුක්‍රමයෙන් එකෙක් එකකට මිටිව පිහිටන්නේය. පිළිවගන-ලොහිතඞ්ක-මැසිරිගල්මය තුන් පවුර සත්රුවන්මය පවුරට ඇතුළෙහි අනුක්‍රමයෙන් එකෙක් එකකට මිටිව පිහිටන්නේය. යටගියදවස මහාසුදර්ශන නම් චක්‍රවර්ති රජ්ජුරුවන් විසූ කුසාවතී නම් රාජධානිය හා සමානව ඒ මෛත්‍රෙය සර්වඥයන් උපදනා සමයෙහි කෙතුමතී නම් රාජධානිය සර්වකොහඳුව බැලූ බැලූවන්ට ප්‍රසාද එළවන්නේය.

තවද එනුවර සතරවාසල්දොර හා වීථිචතුෂ්කොණ ආදිවූ තැන්හි සර්වරත්නමයවූ දිව්‍යානුභාවයෙන් යුක්තවූ සඞ්ඛ නම් චක්‍රවර්තිරජ්ජුරුවන්ගේ කුශලානුභාවයෙන් නොයෙක් කප්රුක්

පොළොව පලාගෙණ නැඟෙන්නේය. ඒ කප්රැක්වල දෙවියන්ගේ දිව්‍යවස්ත්‍ර හා සමානවූ කිසිකෙනෙකුන් විසින් නො වියන ලද දිව්‍යානුභාවයෙන් යුක්තවූ නිල්පිළිය, රත්වත්පිළිය, සුදුපිළිය, පචවර්ණපිළිය යන මේ සියලු පිළිද, රත්තෝඩු, රත්මාලා, අගුපලඳනා, හස්තකවක, පාසලඹ ආදි නොයෙක් පලඳනාද- අවශෙෂවූ උපභොගවස්තුද යන මේ සියල්ල එකප්රැක්වල එලෙන්නේය.

තවද එනුවර යම් ශාලාවෙක හිඳ කෙළනා කැමැති සත්ත්වයෝ කෙළිද්ද, හෝනාකැමැති සත්ත්වයෝ වැද හොවිද්ද? අධිකරණ විනිශ්චයකරණු කැමැතිසත්ත්වයෝ අධිකරණ විනිශ්චය කෙරෙද්ද, බණ අසනුකැමැති සත්ත්වයෝ බණ අසද්ද, එබඳු සතරදොරක් ඇති චතුශ්ශාලාවෙකින් යුක්තවූ මහත්වූ ශොභාවෙක් ඒ කෙතුමතී නම් රාජධානි මධ්‍යයෙහි වන්නේය.

යටගියදවස සංඛ නම් චක්‍රවර්තිරජ්ජුරුවන් පසේබුදුවරයන්වහන්සේට දුන් දානමය කුශලකර්මවිපාකයෙන් උපදනාවූ කල්පවෘක්ෂයෙක් ඒ චතුශ්ශාලා දොරකඩ පොළොව පලාගෙණ නැඟෙන්නේය.

තවද කපුපිළිය-තිහිරිපිළිය-ඛොම දෙශයෙහි කොටුම්බර දෙශයෙහි පිළි හා සමානවූ පිළිය, පත්තුණ්ණදෙශයෙහි චීනදෙශයෙහි උපන් පිළිබඳු පිළිය, දුහුල්පිළිය යන මේ සියලු වස්ත්‍රයෝ සංඛ නම් චක්‍රවර්තිරජ්ජුරුවන් පූර්වජන්මයෙහි කළ කුශලානුභාවයෙන් උපන්නාවූ නුවර සතරවාසල්දොරය, වීථි සන්ධිය, නුවර මැදය, චතුශ්ශාලාදොරකඩය යන මේ හැමතැන්හි ම පොළොව පලාගෙණ නැඟි කල්පවෘක්ෂයෙහි එලෙන්නාහුය.

අස්තලබෙරය-මිහිගුබෙරය-පනාබෙරය-ගැටපහවූබෙරය-සිව්රුස්බෙරය- සමුනුබෙරය-දැල්ලිය-තප්පුය-කළබෙරය-යනාදි මේ සියලු භෙරිජාතිය කුශලකර්මානුභාවයෙන් ඉපිද කප්රැක්වල එලෙන්නේය. අතපැලැන්දයුතු හස්තකවකාදී පෙරහර පලඳනාය- කයපැලැන්දයුතු කෙයූරාභරණාදී පලඳනාය-කරපැලැන්ද යුතු ගැටහුපලඳනා-මුක්තාහාර- එකාවැල ආදී සත්රුවන්මය පලඳනාජාතිය- හිසපැලැන්දයුතු තලල් පට-රුවන් තෝඩු-ඔටුනු ආදිපලඳනාය. මූබය හොබවන්නාවූ රන්පට-තිලකාභරණ-කුණ්ඩලාභරණ-රුවන් තෝඩු ආදි පලඳනාජාතිය- අඟුපලඳනාය-මිණිමෙවුල්දම්ය-පාදඟුලිය-පාදජාලාය-පාසලඹය යනාදි අනෙකප්‍රකාර ආභරණජාතිහු කුශලකර්මයෙන් ඉපැද එකප්රැක්වල එලෙන්නෝය.

තවද සත්ත්වයන්ගේ කුශලානුභාවයෙන් උපන්නාවූ සීසෑ නොවපුරණ ලදුව තෙමේ තමාම හටගත්බැවින් නිරායාසයෙන් උපනනාවූ කුඩු සුන් සාල් නැති තෝ නැති පිරිසිදුවූ සිව්ඳූ ගඳ හා සමානවූ සොඳුරුවූ සුවඳ ඇති ඇල්සාල් රන්බඳුනෙහි ලා මැණික් උදුනෙහි තබා ජ්‍යොතිපාෂාණයෙන් නැගි ගින්නෙන් බත්පැසුනු කල්හි එබත් රසමසවුලෙන් යුක්ත කොට එසමයෙහි මනුෂ්‍යයෝ අනුභවකරන්නාහ. සත්ත්වයන්ගේ කුශලකර්මයෙන් එක් බිජුවටක් හුනුනෙනින් කරල්කපා මැඩිකල දෙදහස් දෙසිය දෙසැත්තෑ ගැලක් පුරා සොළසාමුණු අටලාස්සෙස් සාල් ඉතිරි වන්නේය.

තවද ඒ සඞ්ඛ නම් චක්‍රවර්ති රජ්ජුරුවන්ගේ ආඥා පවත්නාවූ ස්ථානයෙහි උපන්නාවූ සත්ත්වයන් හා කෙතුමතී නම් රාජධානියෙහි වසන්නාවූ ස්ත්‍රී පුරුෂයෝ ඒ ඒ තන්හි මිහිරි සිහිල් පැන් පිරුණාවූ පිරිසිදු ධවල වැලිතලාවෙන් ගැවසීගත් තීර රේඛා ඇති මඩනැති සත්රුවන් පියගැටපඞ්ක්තියෙන් ගැවසීගත් මිනහර කොට ඇති හංස චක්‍රවාකාදි නොයෙක් පක්ෂි සමූහයා විසින් රැව්පිළිරැව්දෙනලද ජලතලා ඇති ඇඹුල් උපුල එල්මැලි රත්නෙළුම් හෙලනෙළුම් ආදිනොයෙක් පද්මයෙන් ගැවසීගත් පොකුණුවිල්හි තමන්තමන්ගේ අභිප්‍රායවූපරිද්දෙන් ජලස්නානය කොට දිවසුවඳ විලවුන් ඇඟ ගල්වා දිවමල් පැලඳ කප්රුකින් තමන්ට අභිප්‍රායානුකූලවූ දිවපිළී හැඳපෙරව දිව්‍යාභරණයෙන් තමන් සරහා උක්තප්‍රකාර සුවඳඇල්සාළ් බත් අනුභවකොට දිවයහන් හා සමානවූ නොයෙක් ඇතිරිලි අතුරණලද මාහැඟි යහන්හි වැදහෙව දිව්‍යගන්ධර්වයන් හා සමානවූ නැටීම් ගීකීම් බෙරවැයීම් ආදිය බලමින් අසමින් සැපසේ නිඳා නැවතත ගසනා ඝණ්ඨා හඬින් පිබිද සුවඳතෙල්පහන් ආලෝකයෙන් තමන්ගේ සම්පත් හා ශ්‍රීසමෘද්ධිය දක්නාහු ධන ධාන්‍ය හස්ති අශ්ව දාසිදාස කර්මාන්තාදි සමෘද්ධිය සිහිකරමින් විශේෂයෙන සතුටුවූ සිත ඇතිව සම්පූර්ණවූ උපභෝග පරිභෝග වස්තු ඇති බැවින කායික චෛතසික සැපයෙන් යුක්තව හැමකල්හි මහතවූ අධික සැප අනුභව කරන්නාහුය.

මෙසේ කෙතුමතී නම් රාජධානියෙහි ශ්‍රී සමෘද්ධිය දක්වා දූන් ජම්බුද්වීපයෙහි ශ්‍රී සමෘද්ධිය දක්වන්නාවූ තිලොගුරුබුදුරජාණන් වහන්සේ:-

"දස යොජන සහස්සානි ජම්බුදීපො භවිස්සති
අකණ්ටකො අගහණො සමොසරිතසද්දලො"

යනාදීන් මෙසේ වදාළසේක.

එසමයෙහි දසදහසක් යොදුන් ජම්බුවීපය චොරකණ්ටක විරහිතබැවින්ද, නිල්තීතණ මොලොක් වැලි ආදියෙන් ගැවසීගත් බැවින්ද, පය ඇනෙන්ට කිසි කටුනැති බැවින්ද නිෂ්කණ්ටක වන්නේය. මිථ්‍යාදෘෂ්ටි සමූහයන්නැතිබැවින්ද, අලඞ්කෘතොද්‍යාන යක් මෙන් සිත්කලු බැවින්ද, කණ්ටක යනාදීන් නැතිබැවින්ද, අගහණය. හෙරිතලයක් හා සමානවූ භූමිප්‍රදෙශ ඇති බැවීන්ද සමතලවන්නේය. රතිඳුගොවූවන් සහිත නිල් මොලොක් සුව පහස් ඇති තීතණයෙන් ගැවසී ගත්තේය.

තවද ඒ ජම්බුවීපයෙහි සත්ත්වයන්ට අටඅනූවක් රොගඅතු රෙන් ඇසරුජා බඩරුජා ආදිවූ එක්තරා එක්රොගයෙක් නො වන්නේය. වැළි මොවුන්ට රොග නම් කවරේද? යත්:-

ඉච්ඡාය-අනසනය-ජරාය යන මේ රොග තුන වන්නේය. ඒ තුනින් සියලු පෘථිවි මණ්ඩලයෙහි සියලු සත්ත්වයන්ට සම්පත් නැත්තේවේදැයි, මුතුමැණික් ආදිවූ උපභොග පරිභොග වස්තු පැතීමක් එසමයෙහි නැති බැවින් බත් අනුභව කරණ වෙලෙහි උපදනා අනුභව කරණු කැමති තෘෂ්ණාව ඉච්ඡාරොග නම්වන් නේය. අතිමධුර භොජනය අනුභව කිරීමෙන් ඒ ආහාරානුභවය කරන්නාවූ සත්ත්වයන්ට භුක්තාලස්‍යය නිසා නැවත නොකනු කැමත්බව උපදවන්නාවූ කායදුර්වලත්වය ඇතිව කය තෙමරිකිරීම අනසනරොග නම් වන්නේය. ආයුකෙළවර වලිත පලිත දන්ත ශෛථිල්‍යාදි වශයෙන් ප්‍රකාශව පෙණෙන්නාවූ ජරාව ජරාරොග නම් වන්නේය. මෙතුන් රොගය හැර එසමයෙහි සත්ත්වයන්ට අන් රොගයක් නම් නැත්තේය.

පන්සියක් ඇවිරිදි කුමාරයාට පන්සියක් ඇවිරිදි කුමාරිකාව අන්කුලයකින් ගෙණහැර පාවාදීම් වශයෙන් ආවාහ කරන් නාහ.

මෙසේ කරණලද ආවාහවිවාහ ඇති ස්ත්‍රීපුරුෂයෝ සමගතු වූව හැමකලම මටසිලුටුබස් ඇතිව ඔවුනොවුන්ට ප්‍රියතෙපුල් බෙණෙමින් කලහ විග්‍රහ නැතිව වාසයකරන්නාහුය.

තවද සියලු පෘථිවිමඩලයෙහි නැංනාවූ ලතාජාතිහද, සිත් කලුවූ නිෂ්කණ්ටකවූ ගහණ නොවන්නාවූ වනලැහැප් රුක්

ආදියද, හැමකල්ම පුෂ්පඵලයෙන් සම්බන්ධව සම්පූර්ණ වන්නේය. මුළු පොළොව ඉඹුල්පුළුන් කපුපුළුන් සා මොළොක්වූ පත්ලට සැපළපදවන්නාවූ සතරඟුල් පමණ උසනැඟී තෘණජාතිය ඇති වන්නේය. එසමයෙහි සත්ත්වයන්ගේ ශරීරයට පීඩාකරන්නාවූ සත්ත්වයන්සිතට අනභිප්‍රායවන පමණ සීතයෙක්වත් උෂ්ණයෙක් වත් නොවන්නේය. එක් ජනපදයක වැසිවැස එක්ජනපදයක නො වස්නේද, බිම් තෙමෙන පමණකටවස්නේද, වැම්ගර පොකුණුම්යර ආදිය බිඳ ගෙණ මහවිතුරු මැඩගෙණ යන පරිද්දෙන් වස්නේද, කලටනො වස්නේද, නො කලට වස්නේද, විෂමවර්ෂා නම් වෙයි. එසේනොවැස වැව් පොකුණු ගං හෝ ආදිය පිරෙණ පමණක් කොටපසළොස්දවසින් දසදවසින් පස්දවසින් සියලු සත්ත්වයන් කා බී සැරසීසුත් පසු මධ්‍යමරාත්‍රියෙහි වස්නා වර්ෂා සමවර්ෂා නම් වෙයි. එසමයෙහි එබඳු සමවර්ෂා වස්නේය. ගේසෙවෙනි බිඳීම් හා මහරුක් අතුපතර බිඳීම් ආදිය ඇති කොට තදව විෂමව පවන්නැමීම් නැතිවන්නේය. වටාපත් පවන් බඳු මඳ මඳ පවන් සත්ත්වයන්ගේ ශරීරයට අභිප්‍රාය පමණ කට හමන්නේය. හැමකල්හිම හිම-ශිශිර-වසන්ත- ග්‍රීෂ්ම-වර්ෂා- ශරත් යන ෂට්සෘතුව ඒ ඒ කලට අවිරුද්ධ කල්වූපරිද්දෙන් සම්බන්ධව තිබෙන්නේය. වැව්පොකුණු ගං හෝ කඳුරැලි මහවිල් තටාක හෙප් වළ ආදිය පැන් පිරූ බඳනක් මෙන් ජලභරිතව සම්පූර්ණව තිබෙන්නේය. ඒ ඒ භූමිප්‍රදෙශයෙහි නො තද නො රළු සිනිඳු මටසිලුටු පිරසුදු ධවල වැලිතැනී තිබෙන්නේය. ඉන් දළ වැලි කලත් ඇට පමණ වන්නේය. සීන්වැලි මුඟැට පමණ වන්නේය. උක්තප්‍රකාර වැලි මූතුකැබිලි බඳුය. ඒ ඒ තැන්හි විසිර පැතිර තිබෙන්නේය.

චක්‍රවර්තිරජ්ජුරුවන්ට සරහා පිළියෙල කරණලද උතුම්වූ උයන්බිමක් මෙන් සියලු ජම්බුද්වීපයෙහි භූමිප්‍රදෙශය සිත්ඇලෙන්ට සුදුසු වන්නේය.

උපභොග පරිභොග වස්තුවෙන් හා මනුෂ්‍යාදීන් ගෙන් විශෙෂයක් නැතිව අප්‍රසිද්ධවූයේ ගම් නම් වෙයි. උපභොග පරිභොගාදියෙන් හා මනුෂ්‍යාදීන්ගෙන් විශෙෂ ඇතිව ප්‍රසිද්ධවූයේ නියම්ගම් නම් වෙයි. මෙබඳු ගම්, නියම්ගම්, වස්ත්‍රාභරණ, ධනධාන්‍යාදීන් සම්පූර්ණව හුණවන බටවන පරිද්දෙන් ඝනීභූතව ඒ ඒ තන්හි ඉතා ආසන්නව පිහිටන්නේය. තවද එක්ගමෙක ගෙවල සෙවෙනිපිටින් අනික්ගම ගෙවල සෙවෙනිපිට කුකුළන් පක්ෂ ප්‍රහාරකොට ඝොස් වැටෙන්ට සුදුසු බැවින්ද, නොහොත් එක්

ගමකින් එක්ගමකට කුකුළන් පයින්ම පලායන්ට සුදුසු සෙයින්ද, කුකුළුපියාසරගමැයි, ප්‍රසිද්ධවූ මහත්වූ ගම්, නියම්ගම් ජම්බුද්වීපයෙහි එකල බොහෝ වන්නේය. අවීචිමහනරකය මෙන් ද, නළෙලකපුරාලූ කුඹසුණු පරිද්දෙන් ද මනුෂ්‍යයන්ගෙන් අතුරක් නැත්තේය. පිරී තිබෙන්නේය.

තවද ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදි චතුර්වර්ණයෙහි ස්ත්‍රීපුරුෂයන් ගෙන් නිරන්තරව ඝනව තිබෙන්නේය. සුවඳබඩුආදි නොයෙක් උපකරණයෙන් අතුරුනැතිව පිරී තිබෙන්නේය. පිළිසඹඩම්ආදි නොයෙක්උපකරණයෙන් අවිකලබැවින් වෙළඳුන් අතින් බඩු ගන්නෝ නැත. එහෙයින් වෙළඳුන්ගේ භාණ්ඩයෙහි අගය නැති වන්නේය.

තවද ඒ දඹදිව සියලු සත්ත්වයෝ රන්සන්නාහ රන් සැට්ට යෙන් සන්නද්ධව සැරසී අනර්ඝවූ කුණ්ඩලාභරණ පැළඳ සිරිකත් සිරොජාලා, රන්මාලා ආදියෙනුදු සැරසී සකල ශරීරයෙහි රන් වන්සුවඳැති සඳුන් විලවුන් ගල්වා උතුම්වූ අනර්ඝ කසීවස්ත්‍රයන් හැඳ පෙරව ඇවිදිනාහුය.

තවද ඒ සියලු දඹදිව මනුෂ්‍යයෝ මුක්තාමාණික්‍යාදි දශ විධරත්නයෙන්ද, ශාලිව්‍රීහ්‍යාදි සප්තවිධ ධාන්‍යයෙන්ද, අඩුවක් නැතිබැවින් විපුලවූ වස්ත්‍රාභරණ ධනධාන්‍යාදීන් සමෘද්ධව රාත්‍රින්දිනයෙහි අතුරු නැතිව පවත්නාවූ දිව්‍යගන්ධර්වයන් හා සමාන විචිත්‍රගන්ධර්වනාදයෙන් හා වීණා, වස්කුලල්, කංසතාලම, සින්තාලම්, අත්තල ආදී නොයෙක් ශබ්දයෙන් පොබයන ලද් දනු තිබීයව රෝගොපද්‍රවයක් නැතිව හැමකල්හි පඤ්චකාමරති යෙහිත් රාජවිල්ආදි අනෙකප්‍රකාර ක්‍රීඩාවෙහිත් නිරත බැවින් තුට්ඨපහට්ඨව ඔදවැඩී කුල්මත්ව නකත්කෙළි කෙළනාවුන් පරිද් දෙන් උත්සවයෙන් යුක්තව නිරන්තරයෙන් කායික චෛතසික සැපයෙන් යුක්තව වාසය කරන්නාහුය.

තවද ඒ දඹදිව්වැසි සත්ත්වයන් අනුභවකරන්ට සුදුසුවූ බත් සූපාසූප රසමස් ආදිය හා බුලත් පුවක් කාඩ කස්තුරු කපුරු ලමිඟ සාකුල් ආදිය සුලභ වන්නේය. එසමයට දඹදිව චාතුර්මහා රාජිකදෙවියන්ගේ ආලකමන්දා නම් රාජධානිය මෙන්ද, කුවෙර නම් වෙසවුණුරජ්ජුරුවන්ගේ විෂාණා නම් රාජධානිය මෙන්ද, කුරුරට වාසීන්ගේ උත්තරකුරුද්වීපය මෙන්ද, ඉතා සිත්කලු වන්නේය.

තවද එසමයෙහි සියලු ජම්බුද්වීපය ඉන්ද්‍රනීලමාණික්‍යමය භූමියක් මෙන් සතරඟුල් පමණ උස නැගි ගිරාවන් නිල්හීතණින් ගැවසී ගත්තේය. හැම කල්හි සුපුෂ්පිතවූ පුෂ්පයන් ඇති වෘක්ෂලතා වන ලැහැප් ආදියෙන් ගැවසී ගෙණ කුකුළුපියාසර ගම් නියම් ගම් ආදියෙන් අතුරු නැතිව චෞරකණ්ටක විරහිතවූ මිථ්‍යාදෘෂ්ටිසත්ත්වයන්ගෙන් ගහණ නොවන්නාවූ රාජධානියෙන් බබලමින් උතුරුකුරු, ආලකමන්දා විශාලා රාජධානි මෙන් පරමරමණීයව සප්තරත්නයෙන් සම්පූර්ණව ජලයෙන් පිරුණු ගං හෝ වැව් පොකුණු ආදියෙන් යුක්තව බොහෝ ඛාද්‍ය භොජ්‍ය ලෙය්‍ය පෙය්‍ය මත්ස්‍ය මාංස සුරාපානාදි ආහාරපාන වර්ගයෙන් සුභික්ෂව වස්ත්‍රාභරණාදි උපභොගපරිභොග වස්තුවෙන්ද, සම්බාධව භෙරිශබ්දය මෘදඞ්ගශබ්දය ශඞ්ඛශබ්දය පණවශබ්දය සම්මශබ්දය තාලශබ්දය හස්තිශබ්දය අශ්වශබ්දය නාව බොව යනාදි මේ සියලු ශබ්දයෙන් එකාතිඝෝෂව එකනින්නාද වන්නේය. සියලු පෘථිවිමණ්ඩලය උත්සවකෙළි කෙළනා පිණිස ඝොෂණය කරණ ලද දිව්‍යපුරයක් මෙන්ද, සරහා පිළියෙල කරණලද නන්දනවනොද්‍යානය මෙන්ද, පරසතුමදාරාමල්කෙළි නකත්කෙළි ආදියෙන් යුක්තවූ සුධර්මා නම් දිව්‍යසභාව මෙන්ද, ඉතා සශ්‍රීකව සියලු ලොකයෙහි ශ්‍රීසමෘද්ධිනාක් ගෙණහැර එක් තැනෙක රැස්කොටලූවාක් මෙන් උතුම්වූ ශ්‍රී සෞන්දර්යයෙන් අග්‍රප්‍රාප්තවන්නේය.

මෙසේ ජම්බුද්වීපයෙහි ශ්‍රීසමෘද්ධිය දක්වා දැන් ඒ ජම්බුද්වීපයෙහි මෛත්‍රෙය සර්වඥයන්වහන්සේගේ උත්පත්තිය දක්වන්නාවූ තිලොගුරුබුදුරජානන්වහන්සේ:—

“අජිතො නාම නාමෙන මෙත්තෙය්‍යො දිපදුත්තමො,
අනුබ්‍යඤ්ජනසම්පන්නො වත්තිංසවර ලක්ඛණො”.

යනාදීන් මෙසේ වදාළසේක. කෙසේද? යත්:-

“සුප්පතිට්ඨිතපාදො හෙට්ඨාපාදතලෙසු චක්කානි ජාතානි සහස්සරානි සනෙමිකානි සනාභිකානි සබ්බාකාර පරිපූරානි ආයතපණ්හි දීඝඞ්ගුලී මුදුතළුන හත්ථපාදො ජාලහත්ථපාදො උස්සඞ්ඛපාදො එණිජඞ්ඝො ඨිතකො අනොනමන්තො උභොහි පාණිතලෙහි ජණ්ණුකානි පරිමසති පරිමජ්ජති කොසොහිතවත්ථගුය්හො සුවණ්ණවණ්ණො කඤ්චනසන්නිභත්තචො සුඛුමච්ඡවි සුඛුමත්තා ඡවියා රජොජල්ලං කායෙ න උපලිම්පති එකෙකලොමො එකෙකානි ලොමානි ලොමකූපෙසු ජාතානි උද්ධග්ගලොමො උද්ධග්ගානි

ලොමානි ජාතානි නීලානි අඤ්ජනවණ්ණානි කුණ්ඩලාවත්තානි පදක්ඛිණාවත්තකජාතානි බ්‍රහ්මුජ්ජුගත්තො සත්තුස්සදො සීහපුබ්බද්ධකායො චිතන්තරංසො නිග්‍රොධපරිමණ්ඩලො යාවතක්වස්ස කායො තාවතක්වස්ස ව්‍යාමො යාවතක්වස්ස ව්‍යාමො තාවතක්වස්ස කායො සමවට්ටක්ඛන්ධො රසග්ගසග්ගී සීහහනු චත්තාලීසදන්තො සමදන්තො අවිවරදන්තො සුසුක්කදාඨො පහූතජිව්හො බ්‍රහ්මස්සරො කරවීකභාණී අභිනීලනෙත්තො ගොපඛුමො උණ්ණාභමුකන්තරෙ ජාතා ඔදාතා මුදුතූලසන්නිභා උණ්හීසසීසො" යන මේ දෙතිස දෙතිස් මහාපුරුෂලක්ෂණ නම් වන්නේය. මෙසේ මේ දෙතිස් මහාපුරුෂලක්ෂණය කර්මය-කර්මසාදෘශ්‍යය-ලක්ෂණය-ලක්ෂණානුශංසය යන මේ සතර කොට්ඨාසයෙන් එකි එකී ලක්ෂණය දක්වා විස්තර කළ කල්හි මහත්කොට කියනලද්දේ නම් වෙයි. එසේ හෙයින් එහි මුඛමාත්‍රයක් දක්වා කියම්හ. ඒ කවරේද? යත්:—

ඒ භාග්‍යවත්වූ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේ පළමු සසර ඇවිදිනාසේක් අපමණ වූ දහස් ගණන් ජාතියෙහි දශකුශල කර්මපථයෙහි දෘඪසමාදානය ඇතිවූසේක. කිසි ශ්‍රමණයකු විසින් හෝ, බ්‍රාහ්මණයකු විසින් හෝ, දෙවියකු විසින් හෝ, මාරයකු විසින හෝ, බ්‍රහ්මයකුවිසින් හෝ, උන්වහන්සේගේ ඒ කුශලසමාදානය හරවන්ට නො පිළිවන්නේය. එහෙයින් ස්වර්ගයෙහි ඉපද දිව්‍යවූ ආයුෂයෙන්, දිව්‍යවූ වර්ණයෙන්, දිව්‍යවූ සැපයෙන්, දිව්‍යවූ යසසින්, දිව්‍යවූ අධිපතිභාවයෙන්, දිව්‍යවූ රූපයෙන්, දිව්‍යවූ ශබ්දයෙන්, දිව්‍යවූ ගන්ධයෙන්, දිව්‍යවූ රස ස්ප්‍රෂ්ටව්‍යයෙන්, සෙසු දෙවියන් මැඩපවත්වමින් ප්‍රමාණාතික්‍රාන්තවූ කාලයක් මුළුල්ලෙහි ස්වර්ගසම්පත් අනුභවකොට එයින් චුතවූසේක් එසමයෙහි 'සුප්‍රතිෂ්ඨිත පාදතල ඇතිව උපදනාසේක.

අභ්‍යන්තරයෙහි රාගාදී ක්ලේශයන් විසින් වේවයි, බාහ්‍යවූ ශ්‍රමණ බ්‍රාහ්මණාදි පසමිතුරන් විසින් වේවයි, අලලා මැඩ පැවැත් වනොහැකි විනසේක. මෙපමණෙකින් කර්මය කර්මසාදෘශ්‍යය-ලක්ෂණය-ලක්ෂණානුශංසය යන මේ සතර සංක්ෂෙපයෙන් කියනලද්දේය.

තවද එහි කර්මය නම්:- ඒ මෛත්‍රෙය බුදුන් විසින් සොළොස සංඛ්‍යකල්පලක්ෂයක් මුළුල්ලෙහි දුෂ්කරව කළාවූ දානාදි කුශල කර්මයය. කර්මශාදෘශ්‍යය නම්:-දුෂ්කරව් කළබව දෙවිමිනිසුන් සත්ත ලොකවාසීහු දනිත්වයි කියන්නාක්මෙන් උපන්නාවූ සුප්‍රතිෂ්ඨිත

මහාපුරුෂලක්ෂණය. ලක්ෂණනම්:-සුප්‍රතිෂ්ඨිත පාදයන් ඇතිබවය. ලක්ෂණානුශංසනම්:-පසමිතුරන් විසින් මැඩපැවැත්ත නොහැකි බවය. මේ සතරසොළොසය සියලු මහාපුරුෂලක්ෂණයට ම යොදා දතයුත්තේය.

ඒ භාග්‍යවත්වූ සර්වඥයන් වහන්සේ පූර්වජන්මාන්තරයෙහි සියලු ජනයාට සැප එළවූසේක. උද්වෙග=භය-සන්ත්‍රාස නූපදවා ධාර්මිකවූ රක්ෂාවරණගුප්තිය කොට සියලු සත්ත්වයන්ට අභය දානය දී පිරිවරසහිත මහදන් දුන්සේක. එහෙයින් අනන්තාපරියන්ත කාලයක් මුළුල්ලෙහි ස්වර්ග සැප අනුභව කොට එසමයෙහි චක්‍රලක්ෂණයෙන් විචිත්‍රිතවූ පාදතල ඇතිවනසේක.

භික්ෂු- භික්ෂුණී- උපාසක-උපාසිකා- දිව්‍ය-මනුෂ්‍ය- අසුර-ගන්ධර්ව-නාග-සුපර්ණාදීහු ඒ භාග්‍යවත්වූ සර්වඥයන් වහන්සේට පිරිවර වන්නාහ. ඒ ලොකනාථකවූ සර්වඥයන් වහන්සේ පූර්වජන්මාන්තරයෙහි ප්‍රාණඝාතයෙන් වැලකීසේක. සියලු ප්‍රාණීන් කෙරෙහි හිතයෙන් අනුකම්පාකළසේක. එහෙයින් උන්වහන්සේට දික්විළුම් දික්ඇඟිලි ඇති බවය, බ්‍රහ්මයාටබඳු සෘජුගාත්‍ර ඇතිබවය යන මේ මහාපුරුෂලක්ෂණ තුන ඇතිවන්නේය. දීර්ඝායුෂ්ක ද වනසේක. කිසි පසමිතුරු කෙනෙකුන් විසින් උපන් තැන් පටන් පිරිනිවන් පානාදක්වා උන්වහන්සේ ජීවිතයෙන් තොරකරන්ට නො පිළිවන්වන්නේය.

ඒ ලොකපාල සර්වඥයන් වහන්සේ පූර්වජන්මයෙහි ප්‍රණීතාහාරයන් දන්දුන්සේක. එහෙයින් උන්වහන්සේට සත්තුස්සද නම් මහාපුරුෂලක්ෂණය ඇතිවන්නේය ප්‍රණීතාහාරයන් ලබන සුලුසේක.

ඒ ලොකෛක ශරණවූ සර්වඥයන් වහන්සේ පූර්වජන්මයෙහි දාන-ප්‍රියවචන-අර්ථචර්‍ය්‍යා-සමානාත්මතා යන සතර සංග්‍රහවස්තුවෙන ජනසංග්‍රහය කළසේක. එහෙයින් උන්වහන්සේට ජාල හස්ත පාද ඇති බවය, මුදුතළුන හස්තපාද ඇතිබවය, යන මේ මහාපුරුෂලක්ෂණ දෙක ඇතිවන්නේය. සුවිනීත පිරිවරජනයන් ද ඇතිවන සේක.

ඒ ලොකාලොකදිවාකර වූ සර්වඥයන් වහන්සේ පූර්වජන්මයෙහි බොහෝ ජනයාට අර්ථයෙන් ධර්මයෙන් යුක්තවූ බස් කීසේක. හිතසැප එළවූසේක. ධර්මයාගය කළසේක. එහෙයින් උන්වහන්සේට උස්සඞ්ඛපාද ඇති බවය උර්ධ්වාග්‍රලෝම ඇති බවය යන මේ මහාපුරුෂලක්ෂණ දෙක ඇතිවන්නේය.

ශ්‍රමණයන්ට සුදුසුවූ, ශ්‍රමණයන් විසින් ප්‍රයොජන වින්දනුවූ ශ්‍රමණපරිෂ්කාරයෙක් ඇත්නම් වහා ලබනසුලුසේක. සියලු සත්ත්වයන්ට අග්‍රවනසේක.

ඒ ලොකප්‍රදීපවූ සර්වඥයන් වහන්සේ පූර්වජන්මයෙහි සියලු සත්ත්වයෝ සිවුසැටසිල්පය හා අෂ්ටාදශවිද්‍යාස්ථාන කෙසේ නම් වහා දැනගණිද්දෝ හෝ කෙසේ නම් වහා ඉගෙණගණිද්දෝ හෝයි සිතා ශිල්පශාස්ත්‍රයසකස් කොට ප්‍රගුණ කැරවූසේක. එහෙයින් උන්වහන්සේට ඒණිජඞ්ඝ නම් ඉම් මහාපුරුෂලක්ෂණය ඇත් වන්නේය.

ඒ ලොකෙක නායකවූ සර්වඥයන් වහන්සේ අතීතභවයෙහි ශ්‍රමණබ්‍රාහ්මණයන් කරා එළඹ වහන්සේ? කුසල් කවරේද? අකුසල් කවරේද? සාවද්‍ය කවරේද? නිරවද්‍ය කවරේද? කුමක් සේවනය කටයුතුද? කුමක් සේවනය නොකටයුතුද? කුමක්කළ කල මට බොහෝ කලක් අවැඩ හා දුක්වේද? කුමක් කළ කල මට බොහෝ කලක් වැඩ හා සැප වේද යනාදීන් විචාරණ සුලු සේක. එහෙයින් ඒ සර්වඥයන්වහන්සේ සියුම්වූ ඡවි ඇති ව උපදනාසේක. මහත්වූ ප්‍රඥාවක් ඇතිසේක. සියලු සත්ත්වයන් අතුරෙන් කිසිවෙක් ඒ සර්වඥයන් වහන්සේට ප්‍රඥාවෙන් සදෘශ නො වන්නේය. ඒ ලොකෙකපුණ්‍ය වූ සර්වඥයන් වහන්සේ අතීත ජන්මයෙහි සත්ත්වයන් කෙරෙහි ක්‍රොධ නොකළසේක. උපායාස බහුල නුවූසේක. බොහෝ ආක්‍රොශ පරිභව බණමින් සිටියදීත් කොපයෙන් සිත් ගටා නො ගත්සේක. සිනි මොළොක් ආස්තරණ පාපුරණාදියත් දුන්සේක. එහෙයින් උන්වහන්සේ සුවර්ණවර්ණ වනසේක. සිනි මොළොක් ආස්තරණ පාපුරණාදීයත් ලබනසේක. ඒ ලොකෙකයික බන්ධුවූ සර්වඥයන් වහන්සේ පූර්වජන්මයෙහි බොහෝකලක් නොරට ගෙණ් වැදහුන් බොහෝ කලක් ගමින් බැහැර ගොස්වැදහුන් නෑයන් මිත්‍රයන් විශ්වාසීන් යහළුවන් උන් උන් ඒ ඒ තැනින ගෙණහැර තමන් තමන්ගේ නෑයන් හා සමග එක්කළසේක. ඔවුනොවුන් කෙරෙහි මෙත් සිත් උපදවා සමග සතුටුත්කැරවූසේක. එහෙයින් උන්වහන්සේ කොශයෙන්වාවකිනවූ වස්ත්‍රගුහ්‍ය ඇතිව උපදනාසේක. බොහෝ පුත්‍ර සම්පත් ඇතිවනසේක.

ඒ කාරුණිකමයවූ සර්වඥයන් වහන්සේ පූර්වජන්මයෙහි මහා ජනසංග්‍රහය පරීක්ෂාකරණසේක් මේ පුරුෂ මෙතම් සත්කාරයක් විඳගන්නට සුදුසුවන්නේයයි පුරුෂ විශෙෂානුරූප සත්කාර සම්මාන කළසේක. එහෙයින් උන්වහන්සේ න්‍යග්‍රොධපරිමණ්ඩලද

වනසේක. සිට නොනැමී ම දෙඅත්ලෙන් දෙදන අතගා පිරිමදිනාසේක. යන මේ මහාපුරුෂ ලක්ෂණ දෙකින් සමන්විත සේක. ආඪ්‍යව මහත්ධනීව මහත්වූ උපභෝග පරිභෝගත් ඇතිවන සේක.

ඒ ප්‍රඥාදීපවූ සර්වඥයන්වහන්සේ පූර්වජන්මයෙහි මේ සියලු සත්ත්වයෝ ශ්‍රද්ධායෙන් කෙසේනම් වැඩෙද් දෝහෝ' ශීලයෙන් ශ්‍රැතයෙන්, ත්‍යාගයෙන්, ප්‍රඥාවෙන්, ධනධාන්‍යයෙන්, ඥාතිමිත්‍ර ජනයන්ගෙන් කෙසේනම් වැඩෙද්දෝහෝයි බොහෝජනයාට වැඩකිරීමෙහි නිරතවූ සිත්ඇතිව උපකාර කළසේක. එහෙයින් උන්වහන්සේට සිංහයාගේ ඌර්ධවශරීරය බඳු ශරීර ඇති බවය, සම්පූර්ණ වූ අන්තරාංශ ඇති බවය, සමව වටවූ ග්‍රීවා ඇතිබවය, යන මේ මහා පුරුෂලක්ෂණ තුන ඇතිවන්නේය. සියලු සම්පත් තීන් නොපිරිහෙන්නාවූ ස්වභාවත් ඇතිසේක.

ඒ ගුණසාරවූ සර්වඥයන්වහන්සේ පෙර සියලු සත්ත්වයන්ට අතින් පයින් වත් කැටමුගුරු ආදියෙන් වත් ශස්ත්‍රයෙන් වත් මැරීම් තැලීම් කැපීම් ආදිවශයෙන් කිසි හිංසාපීඩාවක් නො කළ සේක. එහෙයින් උන්වහන්සේ එසමයෙහි රසග්ගසග්ගී වන සේක. නිරාබාධ වනසේක.

ඒ ජගදානන්දලෝචනවූ සර්වඥයන් වහන්සේ පූර්වජන්මයෙහි ප්‍රියචක්ෂුසින් බොහෝ ජනයා බැලූසේක. එහෙයින් උන්වහන්සේට අභිනීලනෙත්‍ර ඇතිබවය, ගොපක්ෂ්ම ඇතිබවය යන මේ මහාපුරුෂලක්ෂණ දෙක ඇතිවන්නේය, ප්‍රියදර්ශනීයත් වන සේක.

ඒ ධර්මප්‍රදීපවූ සර්වඥයන් වහන්සේ පූර්වජන්මයෙහි බොහෝ ජනයන් කුශලධර්මයෙහි පෙරදුරිකොට හැසිරවූසේක. එහෙයින් උන්වහන්සේට උෂ්ණීෂශීර්ෂ නම් මහාපුරුෂලක්ෂණය ඇති වන්නේය. මහාජනයෝත් උන්වහන්සේට අනුව පවත්නාහ.

ඒ පිරිසුදුවූ අදහස්ඇති සර්වඥයන් වහන්සේ පූර්වජන්මාන්තර වල මෘෂාවාදයෙන් වැළකී සත්‍යවාදීවූසේක. එහෙයින් උන්වහන්සේට එකෙකලොම බවය. දෙබැම අතුරෙහි ඌර්ණරෝමධාතුව අටගැන්මය යන මේ මහාපුරුෂලක්ෂණ දෙක ඇති වන්නේය. උන්වහන්සේට මහාජනයෝත් සම්පවර්ති වන්නාහ.

ඒ ත්‍රෛලොක්‍යතිලකවූ සර්වඥයන් වහන්සේ පූර්වභවයෙහි ප්‍රිය ශූන්‍ය වචනයෙන් වැළකිසේක. කේලාමින් බිඳුනවුන් හා

බිඳුනු සත්ත්වයන් සමඟ කළසේක. සමඟවූ සත්ත්වයන් සන්ධානය කරවූසේක. සමඟ බැව්හි ඇලුනුසේක. සමඟ කරවන්ට සුදුසු බස් කීසේක. එහෙයින් උන්වහන්සේට චත්තාළීස දන්ත බවය අවිවරදන්ත බවය යන මේ මහාපුරුෂලක්ෂණ දෙක ඇතිවන්නේය. භෙදයකට පමුණුවාලිය නොහැකි පර්ෂද්දු ඇතිවනසේක.

ඒ සර්වකාමදදවූ සර්වඥයන්වහන්සේ පූර්වභවයෙහි පරුෂවාක්‍යයෙන් වැළකීසේක. ප්‍රේමනීයවූ සිත්කලුවූ බොහෝජනයාට කන්කලුවූ බස් කියනසේක. එහෙයින් උන්වහන්සේට මොලොක් පලල් දිව ඇතිබවය, බ්‍රහ්මස්වර බවය, යන මේ මහාපුරුෂලක්ෂණදෙක ඇතිවන්නේය. දෙව්මිනිසුන් විසින් අදහාගතහැකි බස් ඇතිවනසේක.

ඒ ලොකස්වාමීවූ සර්වඥයන් වහන්සේ පූර්වජන්මයෙහි සම්ප්‍රලාපයෙන් වැළකී ස්වර්ග මොක්ෂයට බාධකවූ නිෂ්ප්‍රයොජනවූ බස් නොකියා විද්‍යමානවූ නිධානවත්වූ බස් කියන සුලුසේක. එහෙයින් උන්වහන්සේට සිංහහනු නම් පුරුෂලක්ෂණ වන්නේය. අභ්‍යන්තර බාහ්‍යවූ පසමිතුරන් විසින් නසාලිය නොහැකිසේක.

ඒ ලොකප්‍රද්‍යොතවූ සර්වඥයන්වහන්සේ පෙර සසර ඇවිදිනාසේක් අනන්තාපරියන්තවූ දහස්ගණන් ජාතිවල මිථ්‍යා ආජීවය දුරුකොට සම්‍යක්ආජීවයෙන් ජීවිකාව කළසේක. තුලාකූට කංසකූට මාර කූටාදියෙන් වැළකීසේක. එහෙයින් ස්වර්ග ලොකයෙහි ඉපද දිව්‍යවූ ආයුෂයෙන්, දිව්‍යවූ වර්ණයෙන්, දිව්‍යවූ සැපයෙන්, දිව්‍යවූ යසසින්, දිව්‍යවූ අධිපතිභාවයෙන්, දිව්‍යවූ රූපයෙන්, දිව්‍යවූ ශබ්දයෙන්, දිව්‍යවූ ගන්ධයෙන්, දිව්‍යවූ රසයෙන්, දිව්‍යවූ ප්‍රෂ්ටව්‍යයෙන්, සෙසුදෙවියන් මැඩපැවැත ප්‍රමාණාතික්‍රාන්තවූ කාලයක් මුළුල්ලෙහි දිව්‍යමනුෂ්‍යසම්පත් අනුභවකොට ගියාවූ සර්වඥයන්වහන්සේට සමදන්තබවය සුශුක්ලදංෂ්ට්‍රා ඇතිබවය යන මේ මහාපුරුෂලක්ෂණ දෙක ඇතිවන්නේය. පිරිසුදුවූ නිර්මලපර්ෂදුත් ඇතිවනසේක.

මෙපමණෙකින් මහාපුරුෂලක්ෂණයන්ගේ කර්මය, කර්මසාදෘශ්‍යය, ලක්ෂණය, ලක්ෂණානුශංසය යන චතුර්විධ කොට්ඨාසය විස්තර හෙයින් කියන ලද්දේය. මෙසේ මෙබඳුවූ දෙතිස්මහාපුරුෂලක්ෂණයෙන් හා චිතඹගුලිතාදි අසූඅනුව්‍යඤ්ජනයෙන් යුක්තවූ විපදෙනනම්වූ ගිහිකල "අජිතකුමාර" යන නම් ඇත බුදුවූ කල "මෛත්‍රෙය" යන නම ඇති ඒ භාග්‍යවත්වූ

බුදුරජාණන්වහන්සේ අනාගතයෙහි යථොක්තවූ ශ්‍රීසමෘද්ධියෙන් යුක්තව ඒ කේතුමතී නම් රාජධානියෙහි උපදනාසේක.

එසේහෙයින් වදාළහ බුදුහු:—

"අජිතොනාම නාමෙන මෙත්තෙය්‍යො දිපදුත්තමො,
අනුබ්‍යඤ්ජනසම්පන්නො ද්වත්තිංසවරලක්ඛණො"යි.

තවද ඒ සර්වඥයන්වහන්සේ කර්මාන්ත කොට නිමවා දිව්දළින් ඔප්නැගූ මටසිළුටු කරණලද ජාම්බෝනදසවර්ණයක්වැනිවූ රන්වන් ශරීර ඇතිවනසේක. සියුම් සිවි ඇතිබැවින් හා රජස්ධූලි කය නො ඇලෙන බැවින් පිරිසුදු නිර්මල ශරීර ඇතිවනසේක. රජස් ආදිය කය නො ඇලෙන බැවින්ම සොඳුරුවූ සියලු දස දිග පැතිරෙන්නාවූ ශරීරාලොක ඇතිවනසේක. සොඳුරුවූ ශරීරාලෝක ඇතිබැවින් තෙජස්වීවූ ශරීරශොභා දරණසේක. උතුම්වූ යසස් හා විශිෂ්ටවූ පිරිවර ඇතිබවට පැමිණෙනසේක. කුශලය, ප්‍රඥාය, ශරීරශොභාය යනාදිවූ ශ්‍රී සමෘද්ධිය ඇතිවන බැවින් ශ්‍රීමත් වනසේක. උක්තප්‍රකාර ශ්‍රී සමෘද්ධියෙහි පිහිටි බැවින් විශිෂ්ටවූ පූජ්‍යවූ අධික රූපශ්‍රී ඇතිවනසේක. ආයුෂ්කල්පස මුළුල්ලෙහිත් බලන්නාවූ සත්ත්වයන්ට අතෘප්තිකරවූ සොඳුරුවූ දසුම් ඇති වන බැවින් සුදර්ශනීය වනසේක. මහත්වූ සියලු ලොකානුභාවය මැඩපවත්වන්නාවූ සෘද්ධ්‍යානුභාවය හා ප්‍රතාපතෙජස් ඇතිවන බැවින් මහානුභාව වනසේක. තමන්වහන්සේ හා සමාන කෙනෙකුන් ලොකයෙහි නැතිවන බැවින් අසම සමසේක. උභය කුලපරිශුද්ධවූ සියලු ලෝවැස්සන් විසින් පිදියයුතුවූ මහානුභාව සම්පන්නවූ මහත්වූ භොගසම්පත් ආදියෙන් යුක්තවූ පුරොහිත බ්‍රාහ්මණවංශයෙහි උපදනාසේක.

තවද ඒ අජිත නම් මහබෝසතාණෝ නිධානගතවූ මහත්වූ ධනය අපර්යන්තවන බැවින් ධනෛශ්වර්‍යවන්නාහ. සත්ත්වයන් විසින් අනවරතයෙන් අනුභවකාටයුතුවූ උපභොග පරිභොග සඞ්ඛ්‍යාත මහත්වූ වස්තුරාශිය ඇතිවන බැවින් මහත්වූ භොග සම්පත් ඇතිවන්නාහ. වන්දනමානනාදි වශයෙන් රජදරුවන් ගෙන් සම්භාවනා ලබන්නට සුදුසු ප්‍රශස්තකුලයෙහි උපදනා හෙයින් උතුම්වූ කුල ඇතිවන්නාහ. තෙපි මෙබඳු ජාතියක් ඇතිවාදැයි කීකල්හි තොපිත් මෙබඳු ජාතියක් ඇත්තාවාදැයි නැවත පෙරළා කුලකියා ජාතිගටා බැණ පසු බාලිය නොහැක්වූ බොහෝ කාලක් උභයකුලපරිශුද්ධව ආවාවූ උතුම්වූ බ්‍රාහ්මණවංශයෙහි ඒ අජිත නම් මහබෝසතාණෝ යථොක්තවූ ශ්‍රීසමෘද්ධියෙන් යුක්තව උපදනාහ.

ඒ අජිත නම් මහබෝසතාණෝ බ්‍රාහ්මණවංශයෙහි කවරකලෙක උපදිද්ද? යත්:- ඉක්බිති ඒ මෛත්‍රෙය මහාබෝධි සත්ත්වයන් යට කියනලද ක්‍රමයෙන් තුෂිතපුරයෙහි වෙසෙමින් සිටියදීම මේ අන්තඃකල්පයට අනතුරු දෙවෙනි අන්තඃකල්පයෙහි අසූදහසක් අවුරුද්දට ආයුෂය ඇති මනුෂ්‍යයන් සමයෙහි "බුද්ධ කොලාහල" නම් කෝලාහලයෙක් උපදනේය.

ලෝකයෙහි කප්පකොලාහලය–බුද්ධකොලාහලය-චක්‍රවර්ති කොලාහලය යි කොලාහල තුනෙක් වන්නේය. ඒ ත්‍රිවිධ කොලාහලයන් අතුරෙන් අවුරුදුලක්‍ෂයක් ඉකුත්වූ කල කල්පවිනාශය වන්නේය යි "ලෝකව්‍යවහාර" නම් කාමාවචරදෙවතා කෙනෙක් අවමඟුල්වෙසක් ගෙණ හිසකෙස් මුදා විසුරුවා හඬන මුහුණ ඇතිව දෑතින් කඳුලු පිස පිස රත්පිළි හැඳ පෙරව ඉතා විරූපවූ වෙස් දරා මනුෂ්‍යපථයෙහි ඇවිදිනාහු නිදුකිනි! නිදුකිනි! මෙයින් අවුරුදුලක්‍ෂයක් ඇවෑමෙන් කල්පවිනාශය වන්නේය. මේ ලෝකය විශේෂයෙන් නස්නේය. එහෙයින් මහාසමුද්‍රයත් වියලෙන්නේය, මේ මහාපොළොව හා මහමෙරත් දන්නේය, බ්‍රහ්මලෝකය දක්වා නස්නේය, ලෝකයවිනාසව විශෙෂයෙන් නස්නේය. එහෙයින් නිදුක්වූ සත්ත්වයෙනි! මෛත්‍රී භාවනාකරව, කරුණා–මුදිතා–උපෙක්‍ෂාභාවනා කරව, මවුන්ට උපස්ථාන කරව, පියන්ට උපස්ථානකරව, කුලදෙටුවන්ට උපස්ථාන කරවයි මෙසේ කියා ඇවිදිනාහ. මේ කප්ප කොලාහල නම් වන්නේය.

අවුරුදුදහසක් ඉකුත්වූකල ත්‍රිලොගුරු සර්වඥකෙනෙකුන් වහන්සේ ලොකයෙහි උපදනාසේකැයි ලොකපාලදෙවතාවෝ නිදුකිනි මෙයින් අවුරුදු දහසක් ඇවෑමෙන් ලොව්තුරා සම්‍යක් සම්බුද්ධකෙනෙකුන්වහන්සේ ලොකයෙහි උපදනාසේකැයි හඬගා කියමින් ඇවිදිනාහ. මේ බුද්ධකොලාහල නම් වන්නේය. අවුරුදු සියයක් ඉකුත්වූකල චක්‍රවර්තිරජ්ජුරුකෙනෙක් උපදනාහුයයි දෙවතාවෝ නිදුකිනි! මෙයින් අවුරුදු සියයක් ඇවෑමෙන් චක්‍රරත්නය පවත්වන්නාවූ චක්‍රවර්තිරජ්ජුරුකෙනෙක් ලොකයෙහි උපදනාහුය යි හඬගා කියමින් ඇවිදිනාහුය. මේ චක්‍රවර්ති කොලාහල නම් වන්නේය. මේ ත්‍රිවිධ කොලාහලය ලොකයෙහි මහත්ව උපදනේය.

ඒතුතින් බුද්ධකොලාහලශබ්දයඅසා සියලු දසදහසක්සක්වළ දෙවියෝ එකතැනකට රැස්ව අසවල්නම් සත්ත්වයෙක්බුදුවන්නෙයයි දැන ඔහු කරා එළඹ යාච්ඤාකරන්නාහුය. එසේ ආරාධනා

කරන්නාහුත් පඤ්චපූර්වනිමිත්ත පහළවූකල්හි යාච්ඤාකරන්නාහුය. එසමයෙහි වූකලී සියලුම දෙවියෝ එකී එකී සක්වළෙක චාතුර්මහාරාජ, ශක්‍ර, සුයාම, සන්තුෂිත, සුනිර්මිත, වශවර්ති, මහා බ්‍රහ්මයන් හා සමග මේ එක සක්වලට රැස්ව තුෂිතභවනයෙහි වසන්නාවූ බොධිසත්ත්වයන් කරා එළඹ නිදුකානන් වහන්ස! දශපාරමී ධර්මයන් පුරන්නාවූ තුඹවහන්සේ විසින් ශක්‍රසම්පත් මාරසම්පත්, බ්‍රහ්මසම්පත්, චක්‍රවර්තිසම්පත්, ප්‍රාර්ථනා කෙරෙමින් පිරූයේ නැත. ලෝවැස්සන් සංසාරසාගරයෙන් එතරකරවන පිණිස සර්වඥතාඥානය ප්‍රාර්ථනා කෙරෙමින් දශපාරමිධර්මයන් පුරණලද්දේය. දුන්වූකලි තුඹවහන්සේව ඒ පාරමිධර්මයෝ සම්පූර්ණවූහ. එසේහෙයින් නිදුකානන්වහන්ස! බුදුවීමටකල් වන්නේය. නිදුකානන්වහන්ස! බුදුබවට සමය වන්නේය යි කියා යාච්ඤාකරන්නාහුය.

ඉක්බිත්තෙන් මහබෝසතානෝ දෙවියන්ට ප්‍රතිඥා නොදීම කාල, දෙශ, ද්වීප, කුල, ජනෙතනී ආයුපරිච්ඡෙද වශයෙන් පඤ්චමහාවිලොකන නම් වූ විලොකනයක් කරන්නාහ. ඒ පඤ්චමහාවිලොකනයන් අතුරෙන් මේ බුදුවන්නට කල්දෝහෝ නොවේද්හෝයි පළමුකොට කාලවිලොකනය කරන්නාහ. එහි අවුරුදු ලක්ෂයකින් මත්තෙහි වැඩිසිටි ආයුඇතිකල කල් නම් නොවන්නේය. කුමක්හෙයින්ද? යත්:—

එසමයෙහි සත්ත්වයන්ට ජරාමරණ නො පෙණෙන්නේය. සර්වඥවරයන්වහන්සේගේ ධර්මදෙශනාව නම් ත්‍රිලක්ෂණයෙන් විනිර්මුක්ත නො වන්නේය. ඒ සර්වඥවරයන් "අනිච්චං දුක්ඛං අනත්තා යි" ලක්ෂණත්‍රයාරොපණය කොට ධර්මදෙශනා කරණ කල්හි මූන්වහන්සේලා මේකියන්නේ කිමෙක්දැයි වදාරන්නාවූ ධර්මය අසන්ඩත් නොසිතති, අදහන්ටත් නො සිතති. එසේකල්හි මාර්ගඵලාධිගමය නො වන්නේය. ඒ මාර්ගඵලයට පැමිණීම නැතිකල්හි බුදුන්ගේ අවවාදනුශාසනය සත්ත්වයන් නිවණට නොපමුණුවන්නේය. එහෙයින් ලක්ෂයක් අවුරුද්දෙන් වැඩුනාවූ ආයුෂය ඇතිකාලයත් බුදුවන්නට කල්නම් නො වන්නේය.

අවුරුදුසියයකින් උනුවූ ආයුෂය ඇතිකලත් බුදුවන්ට කල් නම් නොවන්නේය. කුමක්හෙයින්ද? යත්:-එසමයෙහි සත්ත්වයෝ උත්සන්නවූ කෙලශයන් ඇතිවන්නාහ. අධිකකෙලශයන ඇති සත්ත්වයන්ට දුන්නාවූ අවවාදය අවවාදසථානයෙහි නො පිහිටන්නේය. දියෙහි ඇඳි ඉරක් මෙන් වහා නස්නේය.

එහෙයින් අ රුදුසියෙන් උනුවූ ආයුඇතිකලත් බුදුවන්වකල් නම් නොවන්නේය. අවුරුදුලක්ෂයක් පටන් යටිතුක් අවුරුදු සියයකින් මත්තෙහිත් ආයුෂය ඇතිකල බුදුවන්ව කල්නම් වන්නේය.

එසමයටත් අසුදහසක් අවුරුද්දට ආයුෂය ඇති කාලය වන්නේය. එහෙයින් මහබෝසතාණෝ මේ ඉපැද්දයුතු කාලයයි කාලවිලොකනය කරන්නාහ. ද්වීපවිලොකනය කරන්නාවූ මහබෝසතාණෝ පිරිවරසහිතවූ සතරමහා දිවයින බලා තුන්දිවයිනෙක සර්වඥවරයෝ නූපදනාහ. ජම්බූද්වීපයෙහි උපදනාහයි දීපය බලන්නාහ.

ඉක්බිත්තෙන් ජම්බූද්වීපය නම් ඉතා මහත දසදහසක් පමණ යොදුන් ඇත්තේය. කවර ප්‍රදෙශයක සර්වඥවරයෝ උපදනාසේක් දෝහෝයි අවකාශ බලන්නාහු මධ්‍යදෙශය බලන්නාහ

මධ්‍යදෙශය නම්:—දිගින් තුන්සියයක් යොදුන, පුළුලින් දෙසියපණස් යොදුන, වටින් නවසියයක් යොදුන, මේ ප්‍රදෙශයෙහි බුද්ධ, ප්‍රත්‍යෙක බුද්ධ, අග්‍රශ්‍රාවක, අශීතිමහාශ්‍රාවක, චක්‍රවර්තිරජදරුවන්, හා අනිකුත් මහානුභාවසම්පන්න ක්ෂත්‍රිය, බ්‍රාහමණ, ගෘහපති මහාසාරාදීහු උපදනාහ.

එබඳු මධ්‍යමණ්ඩලයෙහි කෙතුමතී නම් රාජධානිය වන්නීය. එහි මාවිසින් ඉපැද්දයුතුයයි නිෂ්ඨාවට පැමිණෙන්නාහ.

ඉක්බිත්තෙන් ඉපැද්දයුතු කුලය බලන්නාවූ මහබෝසතාණෝ සර්වඥවරයෝ නම්:–වෙළඳකුලෙහිත් ගොවිකුලෙහිත් නූපදනාහ. ලොකප්‍රසිද්ධවූ පූජ්‍යවූ ක්ෂත්‍රියකුලය, බ්‍රාහමණකුලය, යන මේ දෙකුලෙහිම උපදනාහ. මේ බ්‍රාහමණකුලය වූකලි ලොකපූජ්‍යවන්නේය. එසේහෙයින් බ්‍රාහමණවංශයෙහි උපදිමියි ශංඛ නම් චක්‍රවර්තිරජ්ජුරුවන්ගේ සුබ්‍රහමා නම් පුරොහිත බ්‍රාහමණයානකෙනෙක් මට පිය වන්නාහයි කුලය බලන්නාහුය. ඉක්බිත්තෙන් මාතෘවිලොකනය කරන්නාවූ මහබෝසතාණෝ බුද්ධමාතාවෝ නම් පුරුෂලොලත්වයක් නැත්තාහ, සුරාධූර්තී නොවන්නාහ, කප්ලක්ෂයක් මුළුල්ලෙහි පුරණලද පාරමිතාවන් ඇත්තාහ, උපන්තැන් පටන් අඛණ්ඩවූ පඤ්චශීලය රක්ෂාකරන්නාහ. මේ බ්‍රහමවතී නම් බැමිණීදේවීද වනාහි එබඳුගුණධර්මයන් ඇත්තෝය. එහෙයින් මේ බ්‍රහමවතී නම් බැමිණීදේවී මට

මවුවන්නාහ. උන්ට අයුෂය කොපමණෙක් දැයි පරීක්ෂා කොට බලා දසමසකින් මත්තෙහි සද්දවසක් ආයුෂය දුටුවාහුය.

මෙසේ ඒ මහබෝසතාණෝ මේ පස්බැලුම් බලා නිදුක්නි! බුදුවීමට කල්වන්නේයයි දෙවියන්ට සංග්‍රහකොරෙමින් ප්‍රතිඥාදී තෙපි හැමදෙනා යවයි ඒ දෙවියන් යවා තුෂිතදිව්‍යලොකයෙහි දෙවියන් විසින් පිරිවරණලදුව තුෂිතපුරයෙන් නන්දනවනයට වදනාහ. සියලු දිව්‍ය ලොකවලම නන්දනවනොද්‍යාන ඇත්තේය. එහෙයින් ඒ නන්දනවනොද්‍යානයට වන් දෙවතාවෝ මෙසින් චුතවූ නුඹවහන්සේ සුගතිසඞ්ඛ්‍යාත මනුෂ්‍යලොකයට ගියමැනව, මෙසින් චුතවූ නුඹවහන්සේ සුගතිසඞ්ඛ්‍යාත මනුෂ්‍යලොකයට වැඩියමැනැවැයි පූර්වජන්මාන්තරවල කරණලද කුශලකර්මවලට අවසර සිහිකරවමින් ඇවිදිනාහුය. මෙසේ කුශලකර්මය සිහිකරවන්නාවූ දෙවියන් විසින් පිරිවරණලද ඒ මහබෝසත්තෝ ඒ නන්දනවනොද්‍යානයෙහි ඇවිදිමින් සිට ම චුතව කෙතුමතී නම් රාජධානියෙහි ශඞ්ඛනම් චක්‍රවර්තිරජ්ජුරුවන්ට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන්නාවූ උභයකුලපරිශුද්ධව උපන්නාවූ අංස්‍යවූ ධනෛශ්වරවූ මහත්වූ උපභොග පරිභොග වස්තු ඇති අපමණවූ යසස්සමෘද්ධියෙන් යුක්තවූ සියලු ලොවට ප්‍රසිද්ධවූ සියලු සත්ත්වයන් විසින් පුදනලද රජදරුවන් විසින් කරණලද සත්කාර සම්මාන ඇති පූරණලද පාරමිතා ඇති අධිකවූ කුසල්මුල් ඇති පශ්චිමභවිකවූ සුබ්‍රහ්මා නම් පුරොහිතබ්‍රාහ්මණයන් නිසා එබඳුම සියලු ඓශ්වර්යයෙන් සමෘද්ධවූ බ්‍රහ්මවතී නම් බැමිණිදේවීන් කුස ඇසළමස පුණුපොහෝදවස් අලුයම් වේලෙහි ප්‍රතිසන්ධිග්‍රහණය කරන්නාහුය.

මෙසේ ඒ මහබෝසතාණන් මවුකුස පිළිසිඳගත් ඇසිල්ලෙහි එක පැහැරම දසදහසක් සක්වළ සැලෙන්නේය, වෙව්ලන්නේය, ෂට්ප්‍රකාරයකින් කම්පිතවන්නේය.

දසදහසක් සක්වළ අපමණවූ උදාරතරවූ මහත්වූ ආලොක පැතිරෙන්නේය. ඒ ශ්‍රී සමෘද්ධිය දක්නාකැමැත්තවුන් මෙන් අන්ධයෝ ඇස්ලබන්නාහ. බිහිරිසත්ත්වයෝ ගීතිකා ශබ්දාදි ශබ්ද අසන්නාහ. ජාතියෙන් කථාකරන්ට අසමර්ථ සත්ත්වයෝ කථාකරන්නාහ. කුදුවූ සත්ත්වයෝ සෘජුවූ ගාත්‍ර ඇතිවන්නාහ. පිළුවූ සත්ත්වයෝ පයින් ගමන් යන්නාහ. බන්ධනගත සියලු සත්ත්වයෝ අන්දුබන්ධන, සඞ්ඛලිකබන්ධන, රජ්ජුබන්ධනාදීන් මිදෙන්නාහ. සියලු එක්සියයක්පස්නරකයෙහි ගිනි නිවෙන්

නේය. ප්‍රෙතලොකයෙහි දුකින් පීඩනාලද සියලු සත්ත්වයන්ගේ ක්ෂුධාපිපාසා සන්සිඳෙනනේය. තිරිසනුන්ට භය නැතිවන්නේය. සියලු සත්ත්වයෝ ප්‍රියතෙපුල් කියන්නාහ. සියලු සත්ත්වයන්ගේ රොග සන්සිඳෙන්නේය. අශ්වයෝ මිහිරිවූ ආකාරයෙන් හේෂාරවධ්වනි පවත්වන්නාහ. හස්තිහු කුංචනාද කරන්නාහ. වීණාවෙණු ආදිවූ සියලු තූර්‍යභාණ්ඩයෝ ස්වකීයනාද පවත්වන්නාහ. කිසිකෙනකුන් විසින් නොසොල්වන ලද මනුෂ්‍යයන් අතපය ආදිය පැලඳි සියලු ආභරණ විශෙෂය තෙමේම නාද පවත්වන්නේය. සියලු දසදිග විශෙෂයෙන් ප්‍රසන්න වන්නේය. සත්ත්වයන්ට සැපළපදවමින් මොලොක් සිහිල් පවන් හමන්නේය. නොකල්වැසි වසින්නේය. පොළෝ පළාගෙණ දිය උඩනැගී වතුරු ගෙණ යන්නේය. සියලු පක්ෂීහු ආකාශයෙහි ගමන් අරනාහ. සියලු ගංගා හෝ ආදියෙහි ජලය යටිගංබල නොගොස් ඇතිලියක පුරාලූ පැන්පරිද්දෙන් නිශ්චලවසිටිනේය. මහාසමුද්‍රයෙහි ලවණජලය මිහිරිපැන් වන්නේය. සියලු ජලතලය පස්වණක් පියුමෙන් සැදෙන්නේය. දියෙහි ගොඩෙහි පිපෙන සියලු මල් එකපැහැර පිපෙන්නේය. සියලු වෘක්ෂයන්ගේ කඳෙහි කඳපියුම්ද, අත්තෙහි අතුපියුම්ද, ලියෙහි ලියපියුම්ද පිපෙන්නේය.

පොළොව පළාගෙණ අතළුගල් පළාගෙණ මතුමත්තෙහි සතක් සතක්ව දණ්ඩක පද්ම නම් සත්බුමු මහ පියුම් පිපෙන්නේය. ආකාශයෙහි ඔලම්බක පද්ම නම් පියුම් එලෙන්නේය. හාත්පසින් මල්වැසි වස්නේය. ආකාශයෙහි දිව්‍යවූ පඤ්චාඞ්ගිකතූර්‍යනාද පවත්නේය. සියලු දසදහසක් සක්වළ වට්කොටලා දමාලූ මල්වටක් මෙන්ද, තරකොට හසුරුවා බඳනාලද මල්මිටියක් මෙන්ද, සරහා පිළියෙලකරණලද මලස්නක් මෙන්ද එකමාලාවෙන් සැරැහී ගැවසීගන්නේය. වල්විදූනාවෙන් දසදිග බැබලී තබෙන්නේය. පුෂ්පධූපගන්ධයෙන් එක සුගන්ධවන්නේය. මෙසේ සියලු දසදහසක් සක්වළම උතුම්වූ ශ්‍රී සෞභාග්‍යයෙන් අග්‍රප්‍රාප්ත වන්නේය.

ඒ මහබොධිසත්ත්වයන්ගේ ප්‍රතිසන්ධිග්‍රහණයේ පටන් මෙසේ ගන්නාලද පිළිසඳඇති බොධිසත්ත්වයන්ට හා බොධිසත්ත්ව මාතාවන්ට උපද්‍රව වළකන පිණිස සතරවරම් මහරජ දරුවෝ සතරදිග ශ්‍රීයගත් ගබඩාවේ කඩුගත් අත්ඇතිව රකවල් ගන්නාහ.

හුදක් ඒ සතරදෙන මතුනොවෙති, වැළිකවුරු රකවල් ගණිද්දැයියත්:-

දසදහසක්සක්වළින් එකී එකී සක්වළෙක වරම්රජදරුවෝ සතර සතර දෙනෙකැයි,සතළිස්දහසක් වරම්රජදරුවෝ ගනීවා රජප්‍රාසාදද්වාර-පුරවාරයෙහි පටන් සක්වළගල දක්වා හාත්පසින් කඩුගත් අත්ඇතිව රකවල් ගන්නාහ. බොධිසත්ත්වමාතාවන්ට පුරුෂයන් කෙරෙහි රාගචිත්තයෙක් නූපදනේය. දෙළදුක්ආදිවූ කිසි කායචිත්තපීඩාවෙකින් නො මිරිකී සුඛිතමුදිතව සතුටුසිතින් බොධිසත්ත්වයන් ඇතුළුකුස උන්තැනැත්තන් විශෙෂයෙන් ප්‍රසන්නවූ ජාතිරත්නමාණික්‍යයෙක් අවුණතලද රන්පලස්හුයක් මෙන් බොධිසත්ත්වමාතාවෝ දක්නාහ.

යම්හෙයකින් බොධිසත්ත්වයන් විසූ මවුකුස නම්:- දෑතරඹු චක් හා සමාන වන බැවින් අන්කිසිසත්ත්වයක්හු විසින් වසන්ට වත් ප්‍රයෝජන විඳින්ටවත් නො පිළිවන්වේද, එහෙයින් බොධිසත්ත්වමාතාවෝ මහාබොධිසත්ත්වයන් උපන් සත්දවසින්ම කාලක්‍රියාකොට තුෂිතපුරයෙහි උපදනාහ.

යම්සේ අන්‍යස්ත්‍රීහු දසමසට නො පැමිණත් දසමස ඉක්මවාත් හිඳත් දරුවන් වදන්නාහු වෙද්ද, බොධිසත්ත්වමාතාවෝ වූකලී එසේ නො වදන්නාහ. ඒ බොධිසත්ත්වමාතාවෝ බොධිසත්ත්වයන් දසමසක් මුළුල්ලෙහි කුසින් පරිහරණයකොට සිටම වදන්නාහ. මේ බොධිසත්ත්වමාතාවන්ගේ ස්වභාවයෙක් වන්නේය.

බ්‍රහ්මවතීනම් බැමිණිදේවීන් පිරුණුතෙල්පාත්‍රයක් මෙන් දසමසක් මුළුල්ලෙහි කුසින් බොධිසත්ත්වයන් පරිහරණය කොට පිරිහුන් ගප්ඇතිව උයනට යනු කැමැති වන්නාහ. එසමයෙහි උද්‍යානයට යන්නාවූ මාර්ගය සමකරවා නොයෙක් මල් පුවඳදුම් සුවඳසුණු කෙහෙල්ගස් ධජපතාක පුන්කලස පුන්නාලි ආදියෙන් සරහා බොධිසත්ත්වමාතාවන් රන්සිවිගෙයක හිඳුවා මහත්වූ පෙරහරින් මහත්වූ ශ්‍රීසෞභාග්‍යයෙන් සපු-හෝපලු-නා-දොඹ-කිත-දඹ-මිදෙල්-තඳුන්-සඳුන් ආදී නොයෙක් වෘක්ෂසමූහයෙන් ගැවැසීගත්තාවූ මූලපටන් අගදක්වා ප්‍රභාසම්පන්නවූ සුවඳමලින් සුපුෂ්පිතවූ නීලාදි පඤ්චවර්ණ භෘඞ්ගයන් විසින් අතු පත් මල් අතුරු ආදියෙහි සඤ්චාරය කරන්නාවූ නොයෙක් මත්මොනර කොවුලුකෙවිල් ආදි සියගණන් පක්ෂි සමූහයා විසින් රැව් පිළිරැව් දෙනලද්දාවූ නන්දනවනයෙන් ගිලිහී බිමවැටී ගියාක් වැනි

වූද, මහානුභාවසම්පන්න රජ්ජුරුකෙනකුන්ට මහාකොට සරහා පිළියෙලකරණලද සුරාපාන මණ්ඩලයක් වැනිවූ ඉතා සශ්‍රීක ඉසිපතන නම් නාගවනෝද්‍යානයට ගෙණයන්නාහ. ඒ බෝධිසත්වමාතාවෝ රන්සිවිගෙන් බිමට බැස මහත්වූ පිරිවරින් උයනවට ඇවිදිනාහු සුපිපි මල්රුකක් මුලට පැමිණ සර්වාභරණයෙන් සැරහී දකුණතින් මල්අත්තක් අල්වාගෙණ නැගෙනහිර සක්වල දිශාව බලබලා සිටම මහාබෝධිසත්වයන් වදන්නාහ.

යම්සේ අන්‍යසත්වයෝ මවුකුසින් බිහිවන්නාහු පිළිකුල්වූ මලමූත්‍රාදීන් ගැවසුනු ශරීර ඇතිව බිහිවෙද්ද, බෝධිසත්වයෝ එසේ බිහි නොවන්නාහ.

මහබෝසතාණෝ වූකලී ධර්මාසනයකින් බස්නාවූ මහා ධර්මකථික කෙනකුන් මෙන් දික්කරණලද හස්තපාදයන් ඇතිව කසීවස්ත්‍රයෙක්හි තබනලද ජාතිරත්නමාණික්‍යයක් මෙන් බබලමින් මවුකුසින් බිහිවන්නාහ.

ඉක්බිත්තෙන් ඒ බෝධිසත්වයන් ප්‍රහීණකාමරාගයන් ඇති සුද්ධාවාසබ්‍රහ්මලෝකයෙහි වසන්නාවූ මහාබ්‍රහ්මයෝ සතරදෙනෙක් අවුත් රන්දැලින් පිළිගෙණ මෑණියන් අභිමුඛයෙහි තබා දේවීනි! සතුටුසිත්ඇතිවව. මහානුභාවසම්පන්න පුතකු කෙනෙක් තොපට උපන්නෝ වේදැයි කියන්නාහ.

ඒ මහාබ්‍රහ්මයන් අතින් සතරවරම්මහරජදරුවෝ ප්‍රශස්ත යයි දන්නාලද සුවපහස් ඇති අඳුන්දිවිසමකින් පිළිගන්නාහ. ඒ වරම්රජදරුවන් අතින් අමාත්‍යයෝ දුහුල් සුඹුලකින් පිළිගන්නාහ. ඔවුන් අතින් බැස සමපන්ලෙන් භූමියෙහි පිහිටා නැගෙණහිරදිග බලමින් සිටිනාහ. එකෙණෙහි පිරිසුදු නිර්මල ශරීර ඇත්තාවූ ඒ මහාබෝධිසත්වයන් හා බෝධිසත්වයන්ගේ මෑණියන්ට සත්කාර පිණිස ආකාශයෙන් ස්ඵටික මාණික්‍යමයවූ ජලධාරාවෝ දෙදෙනෙක් අවුත් දෙදෙනාගේම ශරීරයේ සෑහුගන්වන්නාහ. හුදුජලධාරාවෝ මතුපහළවන්නාහු නොවෙති, වැළි කුමක්වේද?යත්:-යටකියනලද්දවූ ප්‍රකාර ඇත් පෘථිවිකම්පාදිවූ දෙතිස්පූර්වනිමිත්ත පහළවන්නේය.

මෙසේ පහළවූ නොයෙක් ආශ්චර්යඇති මහබෝසතාණෝ නැගෙණහිරිදිග බලමින් මාහාසමාන කෙනෙක්වත් අධික කෙනෙක්වත් ලෝකයෙහි ඇද්දෝ නැද්දෝහෝයි පරීක්ෂාකරන්නාහ. එසඳ නොයෙක් කෙළලක්‍ෂගණන් සක්වළ එකාඞ්ගණ

වන්නේය. එහි දිව්‍යමනුෂ්‍යයෝ ගඳ-දුම්-මල්-පහන් ආදීන් පූජාකෙරෙමින් මහාපුරුෂයාණන්වහන්ස! මෙහි තුඹවහන්සේ හා සමාන කෙනෙකුත් නැත. එහෙයින් මෙහි තුඹවහන්සේට උත්තරිතරකෙනෙක් කොයින්දැයි අස්වසා කියන්නාහ. මෙසේ සතරදිගය, සතරඅනුදිගය, උඩය, යටය යි දසදික් බලා එයින් තමන් හා සමාන කෙනකුන් නො දැක මේ උත්තරදිශාභාගයයි නියම කොට සත්පියවරක් තබා යන්නාහ.

එසඳ මහාබ්‍රහ්මයා දෙවෙනි පුන්සඳක් බඳුවූ සේසත් මුදුනට ධරා අල්වන්නාහ. සුයාම නම් දිව්‍යපුත්‍රයා වල්විදුනාව අල්වා සලන්නේය. එක්දිව්‍යපුත්‍රයෙක් රත්රුවන් කම්මාන්තකරණලද මඟුල්කඩුව අල්වන්නේය. එක්දිව්‍යපුත්‍රයෙක් රත්මිරිවැඩි සඟල අල්වාගෙණ යන්නේය. එක් දිව්‍යපුත්‍රයෙක් දිව්‍යමයවූ තලල්පත අල්වාගෙණ යන්නේය. බෝධිසත්වයෝ වූකලි තුමූ බාලකුමාරව සිට සොළොස් හැවිරිදි වයස්ඇති කෙනකුන්මෙන්ද, තුමූ නග්නනැතැත්තෝ කසීසළුහන්කෙනකුන් මෙන්ද, තුමූ නො සැරහුනුනැතැත්තෝ චක්‍රවර්ති අලංකාරයෙන් සැරහුනු කෙනකුන් මෙන්ද, බිමින්යනතැනැත්තෝ ආකාශයෙන් යන කෙනකුන් මෙන්ද සියලු සත්වයන්ට පෙණෙන්නාහ.

ඒ උත්තරදිශාභාගයෙහිත් නොයෙක් කෙළලක්ෂගණන් සක්වළ එක් එළි වන්නේය. ඉක්බිත්තෙන් එදිග මහාබ්‍රහ්මයා බ්‍රහ්මාභරණයෙන් සැරසී බඹ දුහුල්සළුවක් ඒකාංශකොට බහා දකුණුදනමඬල බිම්හැන වම්දනමඬල ඔසවා සිටුවා එකඇඟිල්ලකින් දහසක්සක්වළ දසඇඟිල්ලෙන් දසදහසක් සක්වළ ආලෝකකරන්ට සමර්ථව මහානුභාවසම්පන්නවූයේ නොයෙක් දහස්ගණන් බ්‍රහ්මසමූහයා විසින් පිරිවරණලද්දුව දොහොත්මුදුනෙහි පිහිටුවා තිදුකාතන්වහන්ස; සියලු දසදිග බැලීමෙන් ප්‍රයෝජන කිම්ද? අවීචියෙහි පටන් භවාග්‍රය දක්වා භවාග්‍රයෙහි පටන් අවීචිය දක්වා සරසින් අනන්තාපරිමාන සක්වළ තුඹවහන්සේ හා සමවූත් අධිකවූත් කිසිසත්වයෙක් නම් නැත්තේය යි කියන්නේය. එසමයෙහි මහබෝසතාණෝ සියලු සර්වඥවරයන්ට චාරිත්‍රවූ උත්තමනාද සංඛ්‍යාතවූ සිංහනාද කෙරෙමින් සියලු ලොව එකතින්නාද කෙරෙමින් සියලු ලොවට අග්‍ර වෙමි, ජ්‍යෙෂ්ඨවෙමි, ශ්‍රෙෂ්ඨවෙමි. මේ මාගේ කෙළවර ජාතිය ය, නැවත මට පුනරුත්පත්තියෙක් නැත්තේය යි" මෙසේ අභීත නාද පවත්වන්නාහ.

එසඳ සියලු දිව්‍යමනුෂ්‍යයෝ මහබෝසතාණන් අපමණවූ පූජාසත්කාරයෙන් උදාරතරවූ ශ්‍රීසමෘද්ධියෙන් මහත්වූ උත්සව යෙන් කෙතුමතී නම් රාජධානියටම ගෙණයන්නාහ. ඒ මහබෝසතාණන්ට මවූ වූ බ්‍රහ්මවතී නම් බැමිණීදේවී සත්වැනිදවස් කාලක්‍රියා කොට තුෂිතදිව්‍යලෝකයෙහි මහෙශාක්‍යවූ දිව්‍යපුත්‍ර ව උපදනාහ. මෙසේ ඒ මෛත්‍රෙයබෝසතාණෝ බ්‍රාහ්මණ මහාසාරකුලයෙහි ඉපද අනන්තාපරිමාණවූ මහපිරිවරින් අනන්තවූ යසසින් මහත්වූ ශ්‍රීසෞභාග්‍යයෙන් දිව්‍යකුමාරයකුමෙන් වැඩී වියපැමිණෙන්නාහ.

මෙසේ ඒ මහාපුරුෂයාණන්ගේ උත්පත්තිය දක්වා දූන් උන්ගේ ප්‍රාසාදසම්පත්ති ආදිය දක්වන්නාවූ සර්වඥයන්වහන්සේ

"සිරිවඩ්ඪො වඩ්ඪමානො ච සිද්ධත්ථො චෙව චන්දකො
අජිතස්සත්ථාය උප්පන්නා පාසාදා රතනාමයා"

යනාදීන් මෙසේ වදාළසේක.

කෙසේද? යත්:-

එකල අජිත නම් මහාබොධිසත්ත්වයන්ගේ කුශලානුභාවයෙන් පොළොව පළාගෙණ නැංගාවූ ශොභාවෙන් බබලන්නාවූ වඩ්ඪමානය, සිද්ධාර්ථය, චන්ද්‍රකය යන ප්‍රාසාදයන් තුන්දෙනා අතුරෙන් එකී එකී ප්‍රාසාදයෙක් සත්සත් මහල් වන්නේය. එකී එකී මාලයෙක සුවර්ණමයවූ රජතමයවූ, ප්‍රවාලමයවූ ස්ඵටික මාණික්‍යමයවූ, ලොහිතඞ්කමාණික්‍යමයවූ, මසාරගල්ලමාණික්‍ය මයවූ, සර්වරත්නමයවූ කෙළලක්ෂයක් කූළුගෙවල් වන්නේය. එකී එකී ප්‍රාසාදයෙක් සත්රුවන් පවුරුවලළු සතකින් වටකරණ ලද්දේය. ඉන් එක් පවුරුවලල්ලෙක් රත්නමයය, එකෙක් රිදීමයය, එකෙක් ප්‍රවාලමයය, එකෙක් පිළිවහනමයය, එකෙක් ලොහිතඞ්කමයය, එකෙක් මැසිරිගල්මයය, එකෙක් සත්රුවන් මයය.

එහි සත් සත් තොරණ පෙළ වන්නේය. සුවර්ණමය ප්‍රාකාරචාරයෙහි රජතමය තොරණපඞ්ක්තිය වන්නීය. රජතමය ප්‍රාකාරචාරයෙහි සුවර්ණමය තොරණපඞ්ක්තිය වන්නීය. ප්‍රවාලමය ප්‍රාකාරචාරයෙහි ස්ඵටිකමාණික්‍යමය තොරණ පඞ්ක්තිය වන්නීය. ස්ඵටික මාණික්‍යමය ප්‍රාකාරචාරයෙහි ප්‍රවාල මය. තොරණපඞ්ක්තිය වන්නීය. ලොහිතඞ්කමාණික්‍යමය ප්‍රාකාරචාරයෙහි මසාරගල්ල මය තොරණපඞ්ක්තිය වන්නීය. මසාරගල්ලමාණික්‍යමය ප්‍රාකාරචාරයෙහි ලොහිතඞ්කමාණික්‍ය

මය තොරණ පඞ්ක්තිය වන්නීය. සර්වරත්නමය ප්‍රාකාරවාර යෙහි සර්වරත්නමය. තොරණපංක්තිය වන්නීය. හාත්පසින් සත්රුවන්මය යටග නොයෙක් පැහැඇති විසිතුරු ධවජපතා කා ලෙලෙමින් ප්‍රාසාදය සරහමින් බබලමින් සිටිනාහ. සර්වරත් නමයවූ කිඞ්කිණික ජාලාවෝ හාත්පසින් සත්රුවන්මය පල සෙවෙනිමුවවිට එලෙන්නාහු දිව්‍යවූ පඤ්චාඞ්ගිකතූර්‍යනාදයක් හා සමානවූ මධුරනාද පවත්වමින් සිටිනාහ. ඒ සත්රුවන්මය වූ රසුදුල්හඬින් හා ධජපතාකාවල බඳනාලද රත්රුවන් මිණි හඬින් සියලු නුවරවැසි සත්ත්වයෝ රැඳුවල් දිවපසහතුරුරැව් හඬින් කුල්මත්වෙමින් වෙසෙසින් සතුටුව සිත්අලවන්නාහ.

ඒ ප්‍රාසාදවලින් නික්මෙන්නාවූ ආලෝකය සූර්‍යරශ්මිජා ලාලෝකයක් මෙන් බබලන්නේය. ඒ ආලෝකයෙන් විශෙෂවත් ව බබලන්නාවූ ප්‍රාසාදයෝ දිලියෙන තල්වන, හුනවන, බටවන ආදිය මෙන් දිලියෙමින් සිටිනාහ. ප්‍රවාල, ඉන්ද්‍රනීල, ස්ඵටික ලෝහිතඞ්කාදිමයවූ දහස්ගණන් කුළුගෙවලින් සියදහස්ග ණන් දෙව්දුන්නෙන් වලඳනාලද රත්නකූටපර්වතශ්‍රීන් බබලන් නාක්මෙන් වන්නාහ.

ඒ ප්‍රාසාදයන්ගේ භිත්තිවල හාත්පසින් ඉන්ද්‍රනීලමාණික්‍ය යෙන් විචිත්‍රවූ තාලපංක්තිය, සර්වරත්නමය මකරපංක්තිය, සිංහ පංක්තිය, ව්‍යාඝ්‍රපංක්තිය, හස්තිපංක්තිය, අශ්වපංක්තිය, දිවිවලස් ආදි ව්‍යාලරූපපංක්තිය, රථපංක්තිය, මයූරපංක්තිය, හංසපංක්තිය, කොස්ලිහිණිපංක්තිය, බලාකාපංක්තිය, ගිජුලිහිණිපංක්තිය, ගරුඩපංක්තිය, නාගපංක්තිය, දෙවපංක්තිය, බ්‍රහ්මපංක්තිය, ලතාපංක්තිය, වෘක්ෂපංක්තිය, පර්වතකූටපංක්තිය, ගඞ්ගා යමුනාදි ගඞ්ගාපංක්තිය, අනවතප්තාදි විල්පංක්තිය, මරාවත්මුහුදු, පබළු වන්මුහුදු, ආදි සමුද්‍රපංක්තිය, රන්රිදීපබළුවන් වැව්පංක්තිය, කෙතුමතී ආදි නගරපංක්තිය, දෙව්දුනුබඳු රත්නිල් ආදි පස්ව ණක් පැහැයෙන් දිලියෙන පට්ටිකාපංක්තිය යනාදී විචිත්‍ර රූපපං ක්තීහු මනාව විභාගවත්ව පිහිටියාහු වන්නාහ. නිරන්තරයෙන් දිවමල් වැසි වස්නේය. ඒ ප්‍රාසාදවල එකී එකී මාලෙක සත් දහසක් සත්දහසක් ගබඩා වන්නේය. මනාකොට සරහා පිළි යෙලකරණලද වෛඩූර්‍යමාණික්‍යමයවූ සද්දහසක් සද්දහසක් සිංහාසන වන්නේය. රුවන්මය පුඩුඇති සත්රුවන්මයවූ සත්දහසක් සත්දහසක් ධවලාතපත්‍ර වන්නේය. සතරඟුලෙන් දික් ලොම් ඇති කොඳුපලස් අතුළ එළලොම්මය සුදුඇතිරි

අතුල එසේම එළලොම්මය රන්ඇතිරි අතුල සිංහාදි රූපයෙන් විසිතුරු ඇතිරි අතුල සතපුප් ඇතිරි අතුල එක්පිමෙක ලොම් ඇති ඇතිරි අතුල දෙපිට ලොම් ඇති ඇතිරි අතුල රන්කම්කළ මාහැයි ඇතිරි අතුළ නොයෙක් පැහැයෙන් බබළන්නාවූ සද් දහසක් සද්දහසක් ශ්‍රී යහන් වන්නේය.

සත්රුවන් කර්මාන්තයෙන් විසිතුරුවූ මිටිඇති කොන්ත සද්දහසක් සද්දහසක් වන්නේය.

එකි එකී ප්‍රාසාදයක් සමීපයෙහි මටසොම ඡද්දන්ත නම් හස්තිරාජයා ප්‍රධාන කොට ඇති සද්දහසක් සද්දහසක් හස්තීහු සියලු හස්ත්‍යලඞ්කාරයෙන් සරසණලදුව මුදුනෙහි බඳනාලද රන්ධජ, රිදීධජ, ආදිය ඇතිවූ රන්දැලින් පිට වසන ලදුව සත් රුවන්මය සන්නාහයෙන් සන්නාධව සැරහී සිටිනාහ.

එසේම වලාහක නම් අශ්වරාජයා ප්‍රධාන කොට ඇති සර්වාලඞ්කාරයෙන් සැරහුනාවූ සත්රුවන්මය සන්නාහයෙන් සන්නාධවූ ආජානීය සෙන්ධවවූ සත්දහසක් සද්දහසක් අශ්වයෝ සැරහී සිටිනාහ.

එසේම සත්රුවන්මයවූ නගනලද රන්ධජ, රිදීධජ, ඇති සියලු රථාලඞ්කාරයෙන් සැරහුනාවූ බාලාර්කමණ්ඩලයන් හා සමානවූ තමන් තමන්ගේ ආලෝකසමූහයෙන් සියලු ප්‍රාසාදය ගලා පියන්නාක් වැනිවූ සද්දහසක් සද්දහසක් රථයෝ සැරහී සිටිනාහ. එකිඑකී මාළෙක දිව්‍යප්සරාවන් හා සමානවූ සියලු ස්ත්‍රී ආභරණයෙන් සැරහුනාවූ නැටීම්–ගීකීම්–බෙරවැයීම් ආදියෙහි දක්‍ෂවූ භාවහාවලීලාකටාක්‍ෂමන්දස්මිතයෙන් යුක්තවූ ආතත විතතාදි පඤ්චාඞ්ගිකතූර්‍ය්‍යභාණ්ඩයන් ගන්නාලද අත් ඇති උභයකුලපරිශුද්ධ උත්තමවංශයෙහි උපන්නාවූ සද්දහසක් සද්දහසක් නාටකස්ත්‍රීහු සැරහී සිටිනාහ. ඔවුන් හැමදෙනාට ප්‍රධානවූ අග මෙහෙසුන් බිසවූ චන්දමුඛි නම් වන්නාහ.

ඒ චන්දමුඛී නම් බිසවූ විශිෂ්ටවූ රූපශ්‍රී ඇත්තාහ. දර්ශනීය වෙති, බැලුවන්ට ප්‍රසාද එළවති, උතුම්වූ වර්ණසෞන්දර්‍ය්‍යයෙන් සමන්විත වෙති, ඉතා උස් නො වෙති, ඉතා මිටි නො වෙති, ඉතා දුර්වල නොවෙති, ඉතා ස්ථූල නොවෙති. ඉතා කැළු නොවෙති. ඉතා එළෙලි නො වෙති, මනුෂ්‍යරූපය ඉක්ම සිටිනාහ, දිව්‍යරූපයට නො පැමිණෙන්නාහ. ඒ බිසවුන්ගේ ශරීරයෙන් සඳුන්සුවඳ වහනය වන්නේය, මුඛයෙන් මහ

තෙල්මල් පුවද හමන්නේය, ශරීරාලෝකය දෙළොස්රියනක් පැතිර සිටිනේය. කපුපුළුන් ඉඹුල්පුළුන් සේ මොළොක් සුවපහස් ඇති ශරීරස්පර්ශ වන්නේය. කෙසකල්‍යාණය-අසිකල්‍යාණය- මංසකල්‍යාණය- ඡවිකල්‍යාණය- වයකල්‍යාණය යන මේ පඤ්චකල්‍යාණයෙන් සමන්විත වන්නාහ. එම ජන්මයෙහි රහත්ව නිවන් දක්නට සුදුසු කුසල් ඇතිහෙයින් පශ්චිමාත්මභාව ඇතිවන්නාහ. ඒ මහබෝසතාණන්ගේ පුතනුවෝ බ්‍රහ්මවර්ධන කුමාර නම් වන්නාහ. ඒ කුමාරයෝත් අපගේ සර්වඥයන්වහන්සේට පුත්‍රවූ රාහුල කුමාරයන් මෙන් පිරූ පාරමිතා ඇතිව ඉහාත්මභාවයෙහි රහත්ව නිවන් දක්නට සුදුසු පින් ඇතිහෙයින් පශ්චිමභවික වන්නාහ. ඒ බ්‍රහ්මවර්ධනකුමාරයන් ප්‍රධාන කොට ඇති දහසක් පුත්‍රයෝ වන්නාහ.

එකී එකී ප්‍රාසාදයෙහි යොදනක් යොදනක් පමණ දිග පුළුල ගැඹුර ඇති නිධානසැළ සතරක් ඇර ගත්තැන් පිරෙණ බැවින් සැලකටින් සත්රුවන් වමාරන්නාක් මෙන් පිරී ඉතිර සිටින්නේය. ඒ ප්‍රාසාදවල සතර සතර කොණ කප්රුක් සතරෙක් පොළොව පලාගෙණ නැගී නොයෙක් වස්ත්‍ර නොයෙක් ආභරණ නොයෙක් උපකරණාදියෙන් බබලමින් සැරසී සිටිනේය.

එකී එකී ප්‍රාසාදයෙක මහබෝසතාණෝ තුමූ දිව්‍යකුමාරයක්හු මෙන් සර්වාභරණයෙන් සරසා පිළියෙල කරණලද ශරීර ඇත්තාහු එසේම සර්වාභරණයෙන් සැරහුනාවූ උපමාවිෂයාතික්‍රාන්තවූ රූපසෞන්දර්යශ්‍රීයෙන් යුක්තවූ ස්ත්‍රීසමූහයා විසින් පිරිවරණ ලදුව අවුරුදු දහසක් අවුරුදු දහසක් සම්පත් අනුභව කෙරෙමින් වාසය කරන්නාහ.

එසමයෙහි අජිත නම් මහබෝසතාණන්ගේ කුශලානුභාවයෙන් මෙහෙයන ලද්දාවූ සියලු ජම්බුද්වීපයෙහි කේතුමතී නම් රාජධානිය ප්‍රධාන කොට ඇති සුවාසූදහසක් රාජධානීවල රජ දරුවෝද, ශඞ්ඛ නම් චක්‍රවර්තීරජ්ජුරුවන් හා සමග අවශේෂ දිව්‍යමනුෂ්‍යයෝද, මහබෝසතාණන් කරා එළඹ නිදුකාණන් වහන්ස! අපි හැම තුඹවහන්සේට අත් පා මෙහෙවරකරණු කැමැත්තම්හ යි කියා මුහුණ බල බලා සිටිනාහ.

එසඳ මහබෝසතාණෝ අපට වෙයාවත් කරන්නෝ ඇත. තෙපි සැම තොප තොපගේ වාසස්ථානවලට ම යවයි ඒ රජ දරුවන් ආදිවූ දිව්‍යමනුෂ්‍යයන් තමන් තමන්ගේ වාසස්ථානවල

එම් යවන්නාහුය එසමයෙහි මහාබෝධිසත්ත්වයන් හා සමග දිව්‍යලෝකයෙන් චුතව අවුත් කෙතුමතී නම් රාජධානියෙහි ඒ ඒ උතුම්වූ කුලවල උපන්නාවූ අටළොස් කෙළක් පමණ දිව්‍ය පුත්‍රයෝ බෝධිසත්ත්වයන්ට අමාත්‍යමණ්ඩල වන්නාහ.

මෙසේ ඒප්‍රාසාද–නාටක–පරිවාර සමෘද්ධිය දක්වා දූන් ඒ මහ බෝසතානන්ගේ මහාභිනික්මන් දක්වන්නාවූ තිලෝගුරු බුදු රජානන් වහන්සේ:–

“රමිස්සති රති සමප්පන්නො මොදමානො මහාසුඛෙ,
අනුභවිත්වා යසං සබ්බං නන්දනෙ වාසවො යථා”

යනාදීන් මෙසේ වදාළසේක. කෙසේද?යත්.–

මෙසේ අතිශයින් සමෘද්ධවූ මහායුගයෙහි සම්පූර්ණවූ පාරමිතා ඇති අජිතකුමාරයෝ ගිහිගෙයි සිට දිව්‍යපඤ්චකාමරතිය ඉක්මවන්නාක් වැනිවූ මනුෂ්‍යකාමරතියෙහිමස්තකප්‍රාප්තවූ පඤ්චකාමකොට්ඨාසයෙහි ඇල්මෙන්යුක්තව එම කාමරතියෙන් සතුටුව සම්ඥතාඥනයෙන් පිරිසිඳ කියන්ට නො පිළිවන්වූසැපයට පිහිටවූබොහෝ සැපයට සුදුසුවූ උපකරණ අතුරුනැතිව උපදනාහෙයින් මහත්වූ කායික චෛතසික සැපයෙන් සිත් අලවා බොහෝ කාලක් වාසය කොට නන්දනොද්‍යානයෙහි දිව්‍යඓශ්වර්‍ය්‍ය අනුභව කරන්නාවූ වාසව සඞ්ඛ්‍යාත ශක්‍රදේවේන්ද්‍රයන් පරිද්දෙන් සියලු දිව්‍යලෝක මනුෂ්‍යලෝකයන් එකතැනට රැස්කොට ලූවාක් වැනිවූ මහත්වූ සම්පත්, මහත්වූ යසස්, අප්‍රමාණවූ ශ්‍රී සමෘද්ධිය අනුභව කෙරෙමින් අවදහසක් අවුරුදු මුළුල්ලෙහි ගිහිගෙයි වැස චන්ද්‍රමුඛී නම් අගමෙහෙසුන් බිසවුන් බ්‍රහ්මවර්ධන නම් පුත් රුවන වැදූද නුවණ මිහිකිරීමෙන් කල්පිරුණු කල්හි එක්දවසක් මහපෙරහරින් මහත්වූ ආනුභාවයෙන් දිව්‍යවිමානයක් සේ සශ්‍රීකවූ උතුම් රථයකට පැනනැගී උයන්කෙළියට යන්නාහු දෙවියන් විසින් මවා පානාලද ජරාජීර්ණ රූපයක් දැක යෞවනමදය හැර කලකිරුණාවූ සිත් ඇති බෝධිසත්ත්වයෝ උයන් කෙළියට නොගොස් එතන සිටම පෙරළා නුවරට අවුත් නැවතත් එක්දවසක් උයන් කෙළියට යන්නාහු පඤ්චකාමරතිය නැසීමට කාරණවූ ව්‍යාධිරූපයක් දැක ආරෝග්‍යමදය දුරුකොට උයනට නොගොස් පෙරළා නුවරට අවුත් නැවතත් එක්දවසක් උයන්කෙළියට යන්නාහු එසේම දෙවියන් විසින් මවා පානා ලද මෘතරූපයක් දැක ජීවිතමදය හැර වජුපජීනයෙහි

දක්නාලද රන්ධජයක් මෙන්ද, අලුතපිපි උතුම් රත් පියුමෙක දක්නාලද නිශ්‍රීකයක් මෙන්ද සූර්‍ය්‍යවිමානයෙහි දක්නාලද අන්ධකාරයක් මෙන්ද, ශරත්කාලයෙහි නිර්මලවූ සම්පූර්ණ චන්ද්‍රමණ්ඩලයෙහි දක්නාලද අසෞම්‍යබවක් මෙන්ද, දිව්‍යබ්‍රහ්මවිමානයෙහි දක්නාලද මලමූත්‍රයක් මෙන්ද තමන්ගේ ශ්‍රීසමෘද්ධියෙහි දක්නාලද විපිළිසර ඇත්තාහු නන්දනවනයෙහි උකටලීවූ දිව්‍යපුත්‍රයක්හු මෙන්ද, වස්තුකාමක්ලේශකාමයෙහි ආදීනව දක්මෙන් තමන්ගේ ශ්‍රී සමෘද්ධියෙහි කලකිරී නැවත එක්දවසක් උයන්කෙළියට යන්නාහු ආකාශයෙහි දෙවියන් විසින් දක්වනලද ප්‍රව්‍රජ්‍යාසැපයෙන් සුඛිතවූ ශ්‍රමණරූපයක් දැක ඊට අභිනන්දනය කොට මහණවීමෙහි අභිප්‍රාය උපදවා උයන්කෙළි නොළ දෙවියන් විසින් සරහා පිළියෙල කරණලදුව නුවරට වැද ප්‍රාසාදයට සැතතැගී සියලු සත්ත්වයන් විසින් අනුභවකරන්නාවූ සංසාර දුඃඛය දැක කරුණාවෙන් කම්පිතවූ සිත් ඇති හෙයින් මහාකාරුණිකවූ තෘෂ්ණාච්ඡන්දය දුරුකළාවූ සසර කළකිරුණාවූ ඒ මහබෝසතානෝ සියලු ධර්මයන් අතුරෙන් එක ධර්මයකුත් මේ නිර්වාණධර්මයට උත්තරිතර නොවන හෙයින් නිරුත්තරවූ නිර්වාණය නිසා සකලක්ලේශයන් සන්හිඳෙන හෙයින් ශාන්තිකරවූ සර්වඥවරයන් ප්‍රධාන කොට ඇති සියලු මහෝත්තමයන්ට පිහිටවූ නිර්වාණධර්මය සොයමින් සියලු බෝධිසත්ත්වවරයන්ට ධර්මතාවූ මහබිනික්මන් නික්මෙන්නාහ.

මෙසේ මෛත්‍රෙයසර්වඥයන් වහන්සේගේ මහනික්මන් දක්වා දැන් උන්වහන්සේගේ ප්‍රව්‍රජ්‍යාව දක්වන්නාවූ සර්වඥයන්වහන්සේ:—

“සත්තාහං පධානචාරං චරිත්වා පුරිසුත්තමො,
පාසාදෙනෙ’ව නෙක්ඛම්මං නික්ඛම්ස්සති සො ජිනො’

යනාදීන් මෙසේ වදාළ සේක.

ඒ අජිත නම් මහබෝසතාණෝ උයන්කෙළියට නික්මුනු සතරවාරයෙන් කෙළවරදවස් ප්‍රව්‍රජිතරූපය දැක හටගත්තාවූ මහණවීමෙහි බලවත් අභිලාෂ ඇතිව ප්‍රාසාදයේ මතුමාල්තලයෙහි ශ්‍රීයහන්ගබඩාවෙහි සද්දවසක් මුළුල්ලෙහි මහාවීර්‍ය්‍ය කොට මාගේ ශරීරය මහණවීමට සමර්ථයේහෝ අසමර්ථයේහෝයි පරීක්ෂාකරණ පිණිස කලට සුදුසුවූ ප්‍රව්‍රජ්‍යාවට යොග්‍යවූ කිසියම්දුකක් අනුභවකෙරෙමින් සතියක් මුළුල්ලෙහි ප්‍රධන්සැරි

සරා මැණික්ගුහාවෙක්හි පවා උකටලීවූ කෙසරසිංහරාජයකු මෙන් උකටලී ප්‍රකාර සකලෛශ්වර්‍ය්‍යයෙන් සමෘද්ධවූ රත්නප්‍රාසාදවල උකටලීවූ පුරුෂොත්තමවූ මහබෝසතාණෝ මහාභිනික්මන් නික්මෙනු කැමැති වන්නාහ.

ඉක්බිත්තෙන් ඒ මහබෝසතාණන්ගේ චිත්තොත්පාදානුභාවයෙන් සියලු දසදහසක් සක්වළ දේවතාවෝ එකෙණෙහි මේසක්වළට රැස්වන්නාහ. සියලු රාජධානි හා සියලු ජම්බුද්වීපය අජිතකුමාරයෝ අද මහාභිනික්මන් නික්මෙන්නාහුය යි එක කොලාහල වන්නේය.

එකෙණෙහි ශඛ නම් චක්‍රවර්තිරජ්ජුරුවෝ සුවාසූදහසක් නාටකස්ත්‍රීන් හා අවශෙෂ සිව්රඟසෙනගින් පිරිවරණ ලදුව අවුත් ප්‍රාසාදය පිරිවරා සිටිනාහුය.

අවශෙෂ ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, වෛශ්‍ය, ශූද්‍රඋපාසක උපාසිකාවරුන් හා යටකියනලද ක්‍රම ඇති නුවරවැසි, දනව්වැසි සත්ත්වයන් හා මෛත්‍රියෙන් ගැලපුනු දූරසම්බන්ධ මිත්‍රයන් සියලු කාරියෙහි නියුක්ත අමාත්‍යයන් ආසන්නසම්බන්ධය කළවුන් හා මල්බෑ මයිල් ආදි සාලොහිත බන්ධූන් දූරසම්බන්ධ අවශෙෂ නෑයන් ආදිවූ නොයෙක් ජනසමූහයා සුවඳමල් සුවඳසුණු සුවඳ දුම් ධජ-පතාක-කෙසෙල්ගස්-පුන්කළස්-පුන්පා මල් ඇඟෑ මල් මාලා-මල්කරඬු ආදිය ගත් අත් ඇතිව පිරිවරා ගන්නාහ.

ආකාශයෙහි දෙවතාවෝ සැණෙවස්ගෙණ දිව්මල් දිව්සුවඳ ආදිය ගත් අත් ඇතිව සාධුකාරනාදයෙන් හා දිව්‍යගන්ධර්ව නිර්ඝෝෂයෙන් අකනිට්ඨබ්‍රහ්මලොකය දක්වා එකනින් නාද කෙරෙමින් සිටිනාහ. චක්‍රවාටපර්‍ය්‍යන්ත අකනිෂ්ඨභවනාදියෙහි සිටියාවූ දෙවියන් විසින් රන්, රිදී, මැණික්, පබළු, පිළිවහන, ලොහිතඞ්ක, මසාරගල්ල, සප්රුවන්මය කරඬුවලින් දමනලද සුවඳ මල් සුවඳ සුණු ආදියෙන් මුළුලොව අතුරුනැතිව විස්තා ඝන වර්‍ෂාවෙන් මඩනාලද්දක් මෙන් වන්නේය. එකෙණෙහි සත්රුවන් ප්‍රාසාදය පොළොවින් අහසට නැඟෙන්නාවූ සුවර්ණහංසරාජයකු මෙන් බොධිසත්ත්වයන් හා අග්‍රමහිෂිකා, නාටකස්ත්‍රීන් ආදීන් විසින් සම්පූර්ණවම ආකාශයට පැනනැඟෙන්නේය.

එකෙණෙහි සියලු පක්ෂීන් මහබෝසතාණන්ගේ කුශලානුභාවයෙන් හා චක්‍රවර්තිරජ්ජුරුවන්ගේ රාජානුභාවයෙන් හා දෙවියන්ගේ දෙවතානුභාවයෙන් ආකාශයට පැනනැඟෙන්

නාහ. යම් යම් කෙනෙක් මහබෝසතාණන් හා සමඟ යනු කැමැති වේද්ද ඒ ඒ සත්ත්වයෝ ආකාශයෙහිදී තමන් තමන් දක්නාහ. මහාබ්‍රහ්මයා තුන්යොදනක් පමණ ධවලච්ඡත්‍රය මස්තකයට දරන්නේය. ශක්‍රදේවේන්ද්‍රයෝ එක්සිය විසිරියන් ජයතුරා සක තුඩතබා පිඹිනාහ. සුයාම නම් දිව්‍යපුත්‍ර වල්විදුනාව ගෙණ සලමින් සිටින්නේය. සන්තුෂිත නම් දිව්‍යපුත්‍ර මැණික්තල්වැටක් ගෙණ සලන්නේය. පඤ්චසිඛගන්ධර්ව නම් දිව්‍යපුත්‍ර බෙලුවපාණ්ඩු වීණාව ගෙණ ගායනා කෙරෙමින් සිටින්නේය. සතරදිග කඩුගත් අත් ඇතිව වරම්රජදරුවෝ රකවල් ගෙණ සිටිනාහ. දිවසුවඳ මල් පිරුණු රන් රිදී මැණික් කරඬු ආදිය ගත් අත් ඇතිව දෙතිස් දිව්‍යාඞ්ගනාවෝ පූජාකෙරෙමින් සිටිනාහ. නොයෙක් දිග කඩුගත් අත් ඇති යක්‍ෂසේනාධිපතීහු රකවල් ගෙණ සිටිනාහ. හාත්පසින් දිව්‍යවූ රන්ධජ රිදීධජ ආදිය අතින් අල්වා ගෙණ අසුරයෝ සිටිනාහ. මිණිදඬුවැටපතන් අතින් ගෙණ දිව්‍යනාගරාජයෝ සිටිනාහ. සතුතිගායනා කෙරෙමින් දිව්‍යගරුඬරාජයෝ සිටිනාහ. මධුරස්වරයෙන් ගායනා කෙරෙමින් කිම්පුරුෂ කින්නරාඞ්ගනාවෝ සිටිනාහ. දිවතැටුම් නටමින් ගන්ධර්වදිව්‍යපුත්‍රයන් හා දිව්‍යාඞ්ගනාසමූහයෝ දසදිග සිටිනාහ.

මෙසේ මෙබඳුවූ ශ්‍රීසෞභාග්‍යයෙන් සමෘද්ධවූ දිව්‍යමනුෂ්‍යාදි පර්ෂදින් පිරිවරණ ලදුව මහබෝසතාණෝ ආජානීයන්ගේ හැවීමෙන් හා ඇතුන්ගේ කුඤ්චනාදයෙන් හා අශ්වයන්ගේ හේෂාරවයෙන් හා සිංහයන්ගේ සිංහනාදයෙන් හා ව්‍යාඝ්‍රයන්ගේ නාදපවත්වා මැලිඇඹීමෙන් හා හංසයන්ගේ තුෂ්ටිරාවයෙන් හා දෙවියන්ගේ සාධුකාරනාදයෙන් හා අසුරයන්ගේ සතුති ඝෝෂයෙන් හා බ්‍රහ්මයන්ගේ අත්පොළසන්දීමෙන් හා එකනින්නාද එකනිඝෝෂවූ ආකාශය සරහමින් ප්‍රාසාදයෙන් ගොස් බෝමැඩ සමීපයට පැමිණෙන්නාහුය. ඒ ප්‍රාසාදය බොධිමණ්ඩල සමීපයෙහි ආකාශයෙන් බැස සිත්කලුවූ භූමිප්‍රදෙශයෙහි පිහිටන්නේය. එකෙණෙහි මහාබ්‍රහ්මයා දිව්‍යමය අටපිරිකර ගෙණ එතනට පැමිණෙන්නේය.

එසඳ මහබෝසතාණෝ ප්‍රාසාදයෙන් බැස රන්කඩුවෙන් මුහුළු සහිත කෙස්වැටිය කපා ආකාශයට දමා මහාබ්‍රහ්මයා අතින් අටපිරිකර පිළිගෙණ ප්‍රාසාදවාරයෙහිදී මහණවන්නාහ.

මෙසේ ඒ මහාපුරුෂයාණන්වහන්සේගේ ප්‍රව්‍රජ්‍යාව දක්වා දූන් උන්වහන්සේට අනුව මහණවන පර්ෂත් දක්වන්නාවූ සර්වඥයන්වහන්සේ:-

"චතුරාසීති සහස්සානි බ්‍රාහ්මණා වෙදපාරගා,
මෙත්තෙය්‍යස්මිං පබ්බජිතෙ පබ්බජිස්සන්ති තෙතදා"

යනාදීන් මෙසේ වදාළසේක.

එසමයෙහි ඒ මෛත්‍රෙය බොධිසත්ත්වයන් මහණවූදවස්ම ඍග්වෙදයජුර්වේදය-සාමවේදය-යන වෙදත්‍රයෙහි පරතෙරටපැමිණියාවූ සුවාසූදහසක් බ්‍රාහ්මණයෝ බොධිසත්ත්වයන්ට අනුව මහණවන්නාහ. ඉසිදත්තය-පූරාණය යන බ්‍රාහ්මණකුමාරවරු දෙබෑකෙණෙක් සුවාසූදහසක් සුවාසූදහසක් පිරිවර ගෙණ මහණවන්නාහ. ජිතමිත්‍රය-විජයය යන ප්‍රඥාවන්තයෝ දෙදෙනෙක් අග්‍රධර්මදෙශනාවෙහිදීම ආර්‍ය්‍යමාර්ගප්‍රඥාව ප්‍රතිවෙධකරන්ට සමර්ථවූසුවාසූදහසක් සුවාසූදහසක් පිරිවරගෙණ මහණවන්නාහ. සිද්ධාර්ථ නම් සිටාන කෙනෙක් සුවාසූදහසක් උපාසකපිරිස් හා සමග මහණවන්නාහ සුධනා නම් උපාසිකා කෙනෙක් සුවාසූදහසක් උපාසිකා පිරිස් හා සමග මහණවන්නාහ. ශසවතීය-විශාඛාය යන ප්‍රසිද්ධ යෙහෙළියෝ දෙදෙනෙක් සුවාසූදහසක් සුවාසූදහසක් ස්ත්‍රීපිරිස් පිරිවරා මහණ වන්නාහ. තවද අන්‍යවූ නුවරවාසී ජනපදවාසී සත්ත්වයෝද, රජ-බමුණු-වෙළඳ-ගොවි සතරපක්ෂයෙහි බොහෝ සත්ත්වයෝද, නොයෙක් ජාති ඇති අවශෙෂ මහජනයෝද නෛෂ්කර්ම්‍යයට නැමීනවූ සිත් ඇතිව එසමයෙහි ඒ මෛත්‍රෙය බොධිසත්ත්වයන්ගේ ශාසනයෙහි බොධිසත්ත්වයන්ට අනුව මහණ වන්නාහ.

මෙසේ මහාපුරුෂයානන් වහන්සේගේ මහණවීම හා උන්වහන්සේට අනුව මහණවන පිරිස් දක්වා දැන් උන්වහන්සේගේ බුදුවීම දක්වන්නාවූ තිලෝගුරු සම්‍යක්සම්බුදුරජානන් වහන්සේ:-

"යස්මිං ච දිවසෙ ධීරො නෙක්ඛම්මං අභිනික්ඛමි,
නික්ඛන්තදිවසෙ යෙව බොධිමණ්ඩං උපෙහි සීති"

යනාදීන් මෙසේ වදාළසේක.

ඒ මහාපුරුෂයානෝ මහණව ප්‍රාතිමොක්ෂසංවරශීලාදි සියලු සිල් ඉටාගැන්මෙන් සංවරසමාදානය කොට ගඞ්ගායෙහි ගැලී ජලස්නානය කිරීමෙන් ශරීරය සාතුගන්වා චඤ්ජුම්බි නම් අග මෙහෙසුන් බිසවුන් විසින් දෙනලද දිව්‍යොජස් බැහු ක්ෂීරපිඩු බත වළඳා නාගභවනයට යන පරිද්දෙන් රත්තලිය උඩුගංබලා හැර පුෂ්පඵලපල්ලවයෙන් සැරහුණාවූ වනලැහැබක දිවාවිහාර

කොට සවස්වේලෙහි රත්වන් සුවඳමල් තුවටුවෙන් ගිලිහී සිවීර මත්තේ වැටෙන්ට වන්කල්හි නාගසුපර්ණාදීන් විසින් මල්සුවඳ ආදියෙන් පූජාකරන්ට වන්කල්හි දසදහසක්සක්වළ සැලෙන්ට වෙව්ලන්ට පටන්ගත් කල්හි දෙවියන් විසින් සරහා පිළියෙළ කරණලද මාර්ගයෙන් දිව්‍යබ්‍රහ්මසමූහයා විසින් පිරිවරණ ලදුව ගොස් දක්ෂිණදිශාභාගයෙන් නාගශ්‍රීබොධි සමීපයට පැමිණ තුන්යලක් පැදකුණුකොට පරීක්ෂාකරණලද අවිජහිත අචල ස්ථානයෙහි එක්තරා පුරුෂයෙක්හු විසින් එලවතලද ශීතණ අට මිටක් පිළිගෙණ අගඅල්වා සලා එකෙණෙහි පොළොව පළා ගෙණ පැනනැංගාවූ ඒ අපරාජිතපර්‍ය්‍යඞ්කායට පැනනැගී මනාව පිහිටි නාග ශ්‍රී බෝකඳ පිටට කොට නැගෙනහිරට මුහුණ ලා මාගේ සම්, මස්, නහර, ඇට වියලී සුණුවිසුණුවගියේ නමුත් බුදුවම්ස මේ අස්නෙන් නොනැගෙමියි යන චතුරඞ්ගසමන්වාගත වීර්‍ය්‍යාධිෂ්ඨානය කොට විදුරස්න මුදුනේ හිඳිනාහ. එසමයෙහි වසවර්තිමාරයා තමාගේ දිව්‍යලොකයෙහි සිටීයේම මහාබෝධිසත්ත්වයන් උතුම් බොධිපර්‍ය්‍යඞ්කායට පැනනැගී සර්වඥතාඥානයට නො පැමිණ පර්‍ය්‍යඞ්කාය නොහරිමියි හුන්නවුන් දැක අජිත කුමාරයා මාගේ විෂය ඉක්මෙනු කැමැත්තේය. දැන් මම ඔහු මාගේ විෂය ඉක්මවිය නො දෙමියි මාරසේනාව ගෙණ සක්වළ මුවවිටට බැස බලන්නේ මහාපුරුෂයානන්ගේ ආනුභාවය හා මෛත්‍රීපිඩක් බඳුවූ ශ්‍රී මුඛය දැක භයින් වෙව්ලා පැරද තමාගේ දිව්‍යලොකයටම යන්නේය.

එකෙණෙහි පණස්යොදනක් පමණ ඇති සහස්‍රරශ්මීන් හෙබියාවූ සූර්‍ය්‍යමණ්ඩලය නිම්වලල්ලෙහි ගෙණ සමුද්‍රයෙහි ගලන්නාවූ සවර්ණචක්‍රයක් මෙන් අස්තපර්වතයට යමින් සිටිනේය. උනුපණස්යොදුන් පමණ ඇති ප්‍රභාසමූහයා විහිදුවන්නාවූ චන්ද්‍රමණ්ඩලය සියලූ චක්‍රවාටගර්භය ක්ෂීරසාගරයෙහි ගලන්නාක් මෙන්ද, නිම්වලල්ල අල්වා ගෙණ ආකාශපථයට නගන්නාවූ රථචක්‍රයක් මෙන්ද, නැගෙනහිරිසක්වළ මුවවිටින් නැගෙමින් සිටිනේය.

එසඳ මහාබොධිසත්ත්වයෝ චක්‍රවාටමධ්‍යයෙහි තමන්ගේ රන්වන්වූ ශරීරාලොකයෙන් ඒ ප්‍රදෙශය රන්රසයෙහි ගලන්නාක්මෙන් බබුළුවමින් ඉඳිනාහුය. බ්‍රහ්ම-ශක්‍ර-සුයාම-සන්තුෂිතාදි දෙවියෝ මහබිනික්මන් නික්මෙන වේලෙහි මෙන් ධවලඡත්‍රය- විජයොත්තර ශඞ්ඛ-දිව්‍ය චාමර-දිව්‍යතාලවෘන්ත ගෙණ සිටිනාහුය.

සමහර දෙවතා කෙනෙක් **රන්තොරණමාලාවන්** ගෙණ පිරිවරා සිටිනාහ. සමහර දෙවතා කෙනෙක් **සත්රුවන්ඇගෑ මාලාවන්** ගෙණ පිරිවරා සිටිනාහ. සමහර දෙවතා කෙනෙක් **ස්වර්ණකදලිමාලාවන්** ගෙණ පිරිවරා සිටිනාහ. සමහර දෙවතා කෙනෙක් සත්රුවන්මය **සිරිවසමාලාවන්** ගෙණ පිරිවරා සිටිනාහ. සමහර දෙවතා කෙනෙක් **චාමරමාලාවන්** ගෙණ පිරිවරා සිටිනාහ. සමහර දෙවතා කෙනෙක් **අඞ්කුශමාලාවන්** ගෙණ පිරිවරා සිටිනාහ. සමහර දෙවතා කෙනෙක් **මත්ස්‍යයුගල මාලාවන්** ගෙණ පිරිවරා සිටිනාහ. සමහර දෙවතා කෙනෙක් **නන්දාවර්තමාලාවන්** ගෙණ පිරිවරා සිටිනාහ. සමහර දෙවතා කෙනෙක් **භද්‍රපීඨමාලාවන්** ගෙණ පිරිවරා සිටිනාහ. සමහර දෙවතා කෙනෙක් **ශඞ්ඛමාලාවන්** ගෙණ පිරිවරා සිටිනාහ. සමහර දෙවතා කෙනෙක් **කලසමාලාවන්** ගෙණ පිරිවරා සිටිනාහ. සමහර දෙවතා කෙනෙක් **පුෂ්පපාතිමාලාවන්** ගෙණ පිරිවරා සිටිනාහ. සමහර දෙවතා කෙනෙක් **පුෂ්පසටමාලාවන්** ගෙණ පිරිවරා සිටිනාහ. සමහර දෙවතා කෙනෙක් **දුඹුල්සුණු සුමුගුමාලාවන්** ගෙණ පිරිවරා සිටිනාහ. සමහර දෙවතා කෙනෙක් **මිණිදඹුවැටප්‍රදීපමාලාවන්** ගෙණ පිරිවරා සිටිනාහ. සමහර දෙවතා කෙනෙක් **ස්වර්ණාදර්ශමාලාවන්** ගෙණ පිරිවරා සිටිනාහ. සමහර දෙවතා කෙනෙක් **රජතාදර්ශමාලාවන්** ගෙණ පිරිවරා සිටිනාහ. සමහර දෙවතා කෙනෙක් **මාණික්‍යාදර්ශමාලාවන්** ගෙණ පිරිවරා සිටිනාහ. සමහර දෙවතා කෙනෙක් **සර්වරත්නාදර්ශමාලාවන්** ගෙණ පිරිවරා සිටිනාහ. සමහර දෙවතා කෙනෙක් **මාණික්‍යප්‍රදීපමාලාවන්** ගෙණ පිරිවරා සිටිනාහ. සමහර දෙවතා කෙනෙක් **ධජපතාකමාලාවන්** ගෙණ පිරිවරා සිටිනාහ. සමහර දෙවතා කෙනෙක් **කල්පවෘක්ෂමාලාවන්** ගෙණ පිරිවරා සිටිනාහ. සියලු දසදහසක් සක්වළ දෙවතාවෝ මඟුල් වෙස් ගෙණ දිවනැටුම් දිවගී ආදිය පවත්වමින් සිටිනාහ. එසේම දිවසුවඳමල් සුවඳ සුණු සුවඳදුම් ආදියෙන් පුජාකරන්නාහ. සියලු ආකාශතලය මහත්වූ වැසිවර්ෂාවෙන් පිරිගියාක් මෙන් දිව සුවඳමල් වැස්සෙන් අතුරු නැතිවන්නේය.

එසඳ මහාපුරුෂයානන්වහන්සේ චක්‍රවාටපර්වත නැමැති තිරයෙන් වටකරණලද, තාරකා නැමැති මැණික්කර්ණානත කරණලද, ආකාශනැමැති වියන් ඇති, සකලරාත්‍රියෙහි දිලියෙන්නාවූ චන්ද්‍රමණ්ඩල නැමැති ප්‍රදීප ඇති, චක්‍රවාට ගර්භනැමැති රත්න මණ්ඩපමධ්‍යයෙහි බෝධිද්‍රැමනැමැති මරකතමාණික්‍යමය ඡත්‍රයෙ

කීන් යුක්තවූ වජ්‍රාසනමස්තකයෙහි නාටකස්ත්‍රීන් සහිත දිව්‍ය මනුෂ්‍යපර්ෂත් පිරිවරා වැඩහුන්සේක්ම ප්‍රථමයාමයෙහි පූර්වේනිවාසානුස්මෘතිඥානය, සමධිගම කොට මධ්‍යමයාමයෙහි දිව්‍යචක්ෂුරභිඥානය, ප්‍රතිවෙධ කොට පශ්චිමයාමයෙහි ද්වාදශාඞ්ගප්‍රතීත්‍යසමුත්පාදචක්‍රය, අනුලොම ප්‍රතිලොමාදිවශයෙන් සම්මර්ශනය කෙරෙමින් අරුණොද්ගමනවෙලායෙහි සියලු දසදහසක් සක්වළ එකනින්නාදකොට දශබලචතුවෛශාරද්‍යාදි සියලු ගුණසමූහයෙන් හෙබියාවූ සර්වඥතාඥානය ප්‍රතිවෙධකරණසේක.

එකෙණෙහි ප්‍රතිසන්ධිග්‍රහණයෙහි මෙන් දෙතිස් පූර්වනිමිත්ත පහළවන්නේය. සියලු දසදහසක් සක්වළ වට කොට අකුලා දම්මාලූ වල්වටක් මෙන්ද, ඝනකොට හසුරුවා බඳනාලද මල් කලඹක් මෙන්ද, මනාකොට සරහණ ලද මලස්නක් මෙන්ද, සරහා පිළියෙළ කරණලද්දේ වන්නේය.

මෙසේ සියලු ලොව එකනින්නාද, එකනිඝෝෂ කොට එක සාධුකාර, එකකොලාහල, එකමඞ්ගල, එකශ්‍රීශොභාභාදයකීයෙන් යුක්තකොට ප්‍රතිවෙධකරණ ලද සර්වඥතාඥාන ඇති ඒ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේ "අනෙකජාතිසංසාරං" යනාදීන් ප්‍රීතිවාක්‍ය පවත්වනසේක.

මෙසේ ඒ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේගේ සම්‍යක්සම්බොධිය දක්වා දූත් උන්වහන්සේගේ දම්සක්පැවතුන්සූත්‍රදෙශනාව දක්වන්නාවූ සර්වඥයන්වහන්සේ:-

"උපෙත්වා උය්‍යානවරං ඵුල්ලං නාගවනං ජිනො,
අනුත්තරං ධම්මචක්කං එවං සො වත්තයිස්සති"

යනාදීන් මෙසේ වදාළසේක.

ඒ මෛත්‍රෙය නම් සම්‍යක්සම්බුද්ධරජානන්වහන්සේ බොධිද්‍රුම සමීපයෙහිම නොයෙක් කෙළලක්ෂගණන් සමාපත්තියට සමවදිමින් සත්සතිය ඉකුත් කොට අටවැනි සත්තාහයෙහි ධර්මනමසීරන්ධය ප්‍රත්‍යවෙක්ෂා කරණසේක් බ්‍රාහ්මාරාධනාව නිසා මූල පටන් අගදක්වා සර්වප්‍රකාරයෙන් පැළී පිපීගියාවූ මල් ඇති, නාඥනොද්‍යානය හා සමානවූ "ඉසිපතන" නම් නාගවනොද්‍යානයට වැඩ ශ්‍රමණ-බ්‍රාහ්මණ-දිව්‍ය-මාර-බ්‍රහ්මාදීන් විසින් නොපැවැත්විය හැකි උතුම්වූ දෙශනාචක්‍රය පවත්වනසේක.

එසමයෙහි මනුෂ්‍යයෝද, සියලු දසදහසක් සක්වළ දෙවියෝද බණ අසනු පිණිස රැස්වන්නාහ. මනුෂ්‍යපර්ෂද වටින්

සියක් යොදනෙක පැතිර සිටිනාහ. දිව්‍යපර්ෂද සක්වළගබ පුරා සිටිනාහ. මෙබඳුවූ දිව්‍යමනුෂ්‍යපර්ෂත් මධ්‍යයෙහි වැඩහිඳ මෛත්‍රෙය සම්‍යක්සම්බුදුරජාණන්වහන්සේ:—

"දුක්ඛං දුක්ඛසමුප්පාදං දුක්ඛස්ස ච අතික්කමං,
අරියං චට්ඨඞ්ගිකං මග්ගං දුක්ඛූපසමගාමිනං"

යනාදීක්‍රමයෙන් දක්වනලද දම්සක්පවතුම් සූත්‍රදෙශනාව කරණසේක. මෙසේ ත්‍රිපරිවර්තයක් ඇති, ද්වාදශාකාරයක් ඇති, දුඃඛසත්‍යය, සමුදයසත්‍යය, නිරොධසත්‍යය, මාර්ගසත්‍යය යන චතුරාර්‍ය්‍යසත්‍යසඞ්ඛ්‍යාත නිරුත්තරවූ ධර්මචක්‍රය මෛත්‍රෙය සම්‍යක්සම්බුද්ධරජාණන්වහන්සේ යථොක්ත වූ දිව්‍යමනුෂ්‍යපර්ෂත් මධ්‍යයෙහි වැඩහිඳ පවත්වනසේක.

ඒ ධම්සක්පවතුන්සූත්‍රදෙශනාව කරණ සමයෙහි සත්ත්ව සන්තාන ගත කෙලෙස්නැමැති සතුරන් නසන හෙයින් ලොකනාථවූ බුදුරජාණන්වහන්සේ ඒ ධම්සක්පවතුන්සූත්‍රදෙශනාව කරන්නාවූ ස්ථානයට රැස්වූ හාත්පසින් සියක්යොදනෙක පැතිර සිටියාවූ මනුෂ්‍යයන් අතුරෙන් කෙළලක්ෂයක් මනුෂ්‍යයන් ක්ලෙශබන්ධනයෙන්, සංසාරබන්ධනයෙන්, භවබන්ධනයෙන් මුදා එකම දෙශනාවෙන් සතරමග සතරඵලයට පමුණුවා අමාමහ නිවන් දක්වනසේක.

සක්වළගබ පුරා සිටි දෙවියන්ගෙන් මාර්ගඵල ලැබ අමාමහ නිවන් දුටු දෙවියෝ මෙතෙකැයි ගණන් නැත්තාහ.

මෙසේ දම්සක්පවතුන්සූත්‍රදෙශනාව දක්වා දූන් ශඞ්ඛ නම් චක්‍රවර්තිරජ්ජුරුවන්ගේ ප්‍රව්‍රජ්‍යාව දක්වන්නාවූ සර්වඥයන් වහන්සේ:-

"තදා සො සඞ්ඛරාජාච පාසාදං රතනාමයං,
ජිත පාමොක්ඛසඞ්ඝස්ස නිය්‍යාදෙත්වා පුනාපරං"යි.

යනාදීන් මෙසේ වදාළසේක.

ඒ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේ දම්සක්පවතුන් සූත්‍රදෙශනාව කොට ලොකහිතයනය කරන්නාවූ කාලයෙහි ඒ ශඞ්ඛ නම් චක්‍රවර්තිරජ්ජුරුවෝ තමන් බොහෝදවසක් විසූ පස්විසියොදුන් පමණ රත්නප්‍රාසාදය බුදුන් ප්‍රධාන කොට ඇති භික්ෂුසඞ්ඝයාවහන්සේට පිළිගන්වන්නාහු සර්වඥයන්වහන්සේ ඒ ප්‍රාසාද

යෙහි භික්ෂුසඞ්ඝයා වහන්සේ හා සමග සැපසේ වසන පිණිස මෙතැන් පටන් බුදුන්ට සඞ්ඝාරාම වන්නේය යි පිළිගන්වා එයින් මත්තෙහි දුගී මගී වනී යාචකයන්ට මහදන්දී නාටක ස්ත්‍රීන් සහිත අග්‍රමහිෂිකාවන් හා සමග මහත්වූ රාජානුභාව යෙන් හා අපරියන්තවූ සේනාවාහනයෙන් යුක්තව අනූ කෙළ දහසක් මනුෂ්‍යයන් හා සමඟ වහ වහා සම්‍යක්සම්බුද්ධවූ සර්වඥ යන්වහන්සේ කරා එළඹෙන්නාහ.

එසමයෙහි මෛත්‍රෙය සම්‍යක්සම්බුදුරජානන් වහන්සේ උතුම්වූ විශිෂ්ටවූ චතුස්සත්‍යධර්ම නැමැති භේරිය දෙශනාකිරීම් වශයෙන් පහරණසේක. චතුස්සත්‍යය ප්‍රකාශකරන්නාවූ ඒ අමෘතභෙරීශබ්දය අසා එසමයෙහි සඞ්ඛ නම් චක්‍රවර්තිරජ්ජුරුවන්ට සම්පචාරී සෙවකවූ ක්ෂත්‍රිය, බ්‍රාහමණ, වෛශ්‍ය, ශුද්‍ර අමාත්‍යාදි ජනසමූහයා අතුරෙන් එකසත්ත්වයකුත් නොහැර ඒ සියලුම අනූකෙළදහසක් පමණ මනුෂ්‍යයන් හා එහි භික්ෂුභා වයෙන් පැවිදිවන්නාහ. එයින් වදාළහ බුදුහු:—

“අථ ඛො භික්ඛවෙ සංඛො රාජා යො සො යූපො රඤ්ඤා මහාපනාදෙන කාරාපිතො තං යූපං උස්සාපෙත්වා අජ්ඣාවසිත්වා දදිත්වා විස්සජ්ජෙත්වා සමණ බ්‍රාහමණ කපණද්ධික වනිබ්බක යාච කානං දත්වා මෙත්තෙය්‍යස්ස භගවතො සන්තිකෙ කෙස මස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිස්සති”

මෙසේ ශඞ්ඛ නම් චක්‍රවර්තිරජ්ජුරුවන්ගේ ප්‍රව්‍රජ්‍යාව දක්වා දූන් අවශෙෂ දිව්‍යමනුෂ්‍යයන්ගේ අභිසමය දක්වන්නාවූ සර්වඥ යන්වහන්සේ:—

“තතො දෙවා මනුස්සා ච උපෙත්වා ලොකනායකං,
අරහත්තවරමාරබ්භ පඤ්හං පුච්ඡිස්සරෙ ජිනං”

යනාදීන් මෙසේ වදාළ සේක.

ඉක්බිත්තෙන් සියලු දිව්‍යමනුෂ්‍යයෝ නිර්වාණයට අභිමුඛ කොට ලොකවාසී සත්ත්වයා පමුණුවන හෙයින් ලොකනායක වූ සර්වඥයන්වහන්සේ කරා එළඹ ස්වාමීනි බුදුරජානන්වහන්ස! අර්හත්වය නම් කවරේද? ඒ අර්හත්වයට පැමිණෙන්නෝ කව්රුද? ඒ අර්හත්වයට පැමිණෙන්නාවූ ප්‍රතිපත්තිය කවරීද? යනාදී ක්‍රම යෙන් උතුම්වූ අර්හත්ඵලය උදෙසා ප්‍රශ්න විචාරන්නාහ.

එසඳ සර්වඥයන්වහන්සේ ඒ දිව්‍යමනුෂ්‍යයන්ට උතුම්වූ අර්හත්ඵලයට පැමිණෙන පිණිස ඒ අර්හත්ඵලප්‍රතිපත්ති සඞ්ඛ්‍යාත උපාය ප්‍රකාශකරන්නාවූ ප්‍රශ්නව්‍යාකරණය කරණසේක. ඒ ප්‍රශ්න විසර්ජනය හේතුකොට ගෙණ අසූකෙළදහසක් දිව්‍යමනුෂ්‍යයන් ගෙන් තුන්වැනි අභිසමය වන්නේය.

මෙසේ අභිසමයතුන වෙනවෙන දක්වා දැන් ඒ ත්‍රිවිධවූ අභිසමය එක්කොට දක්වන්නාවූ සර්වඥයන්වහන්සේ:—

"ඛීණසවානං විමලානං සන්තචිත්තානතාදිනං,
කොටිසතසහස්සානං පඨමො හෙස්සති සමාගමො"යි.

යනාදීන් මෙසේ වදාළසේක.

එහි කාමාසවය, භවාසවය, දිට්ඨාසවය, අවිජ්ජාසවය, යන චතුරාශ්‍රවයන් ක්‍ෂය කළහෙයින් ක්ෂීණාශ්‍රව නම් වූ පහවූ රාගාදි කෙලෙසමල ඇතිහෙයින් නිර්මලවූ කෙලෙශසංක්ෂෝභයක් නැති හෙයින් සන්හුන්නාවූ සිත් ඇති ලාභාලාභ, අයශ යශ, නින්දාප්‍රශංසා සුඛදුඃඛයෙහි සමව පැවැත්තාවූ සිත් ඇති බැවින් තාදි ගුණයෙන් යුක්තවූ ධම්සක්පවතුන් සූත්‍රදෙශනාවෙහි අර්හත්ඵලයට පැමිණියාවූ කෙළලක්‍ෂයක් භික්ෂූන්වහන්සේගෙන් පළමුවන ශ්‍රාවකසමාගමය වන්නේය, මේ පළමුවන ශ්‍රාවකසන්නිපාතය වන්නේය.

තවද ඒ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේ පළමු වනවස වැස පවරන්ට සිටිපසු සියලු දිව්‍යමනුෂ්‍යයන් පවුරුණුඝෝෂය කළ කල්හි ශංඛ නම් චක්‍රවර්තිරජ්ජුරුවන් හා සමඟ එහිභික්ෂුප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව රහත්වූ අනූකෙළදහසක් රහතුන්වහන්සේ හා සමඟ විශුද්ධිප්‍රවාරණයෙන් පවරණසේක. මේ දෙවෙනි ශ්‍රාවකසන්නිපාතය වන්නේය.

තවද යම් සමයෙක්හි ඒ මෛත්‍රෙයසර්වඥයන්වහන්සේ හිම නම් පිනිබිඳු සමූහයට වාසස්ථානබැවින් "හිමාලය" නම් වූ වනයෙහි ඇතුළට වන් වන් සත්ත්වයන් කළුවැල් ආදි මූලගන්ධයෙන්ද, සඳුන් ආදි සාරගන්ධයෙන්ද, සරළාදි ඵෙග්ගු ගන්ධයෙන්ද, ලමහසුඹුළු ආදි තවගන්ධයෙන්ද, ගිවුළුආදි පපටිකාගන්ධයෙන්ද, සදෙළුමළ ආදි රසගන්ධයෙන්ද, තමාලපත්‍රාදි පත්‍රගන්ධයෙන්ද, නාගකුඩකුමාදි පුෂ්පගන්ධයෙන්ද, ජාතිඵල කකෙකාලාදි ඵලගන්ධයෙන්ද, සකලගන්ධයෙන්මිශ්‍රවූ ගන්ධයෙන්ද යන මේ දශවිධවූ සුගන්ධයෙන් සම්බන්ධව උන්මාදය

කරවන හෙයින් "ගන්ධමාදන" නම් වූ පර්වතයෙහි සුවර්ණපර්වතය ඇතුළෙහි පිහිටි රජතමය ප්‍රාග්භාරයෙහි ගණයා කෙරෙන් තමන්වහන්සේ වෙන්කොට ගැන්මයයි කියනලද කායවිවේකය, කාමච්ඡන්දනීවරණාදි ක්ලේශධර්මයන් කෙරෙන් දුරුව රූපාවචරාරූපාවචර සමාධි ඉපදවීමයයි කියන ලද චිත්තවිවේකය, සකන්ධොපධි ක්ලේශොපධි ආදියෙන් දුරුවූ බැවින් නිර්වාණ ධර්මසඞ්ඛ්‍යාත උපධිවිවේකය යන මේ ත්‍රිවිධවිවේකයෙන් යුක්තව වාසයකරණ සේක් සන්හුන්නාවූ සිත් ඇති ඉෂ්ටානිෂ්ටයෙහි නිර්විකාරීවූ රාගමලාදිය දුරුකළාවූ චතුරාශ්‍රවයන් ක්ෂය කළාවූ අර්හත්ඵලප්‍රශ්න ව්‍යාකරණයෙහිදී සංසාරබන්ධනයෙන් මිදුනාවූ අසූතෙලදහසක් ක්ෂීණාශ්‍රව භික්ෂූන් වහන්සේ හා සමග ආලම්බනාදීන් සමරණය කරන්නාවූ අර්ථයෙන් ධ්‍යානය යි ලබනලද නම් ඇති රූපාවචරධ්‍යානයන්ට අනුලෝමය, ප්‍රතිලෝමය, උභතොවර්ධනය, මධ්‍යසංක්ෂෙපය යන පඤ්චකනයින් සමවදනා සේක. විදර්ශනාවට පටන් ගෙණ ඵලසමාපත්තියට සමවැද ලක්ෂණොපනිධ්‍යානයෙන් ධ්‍යානක්‍රීඩාව කරණ සේක. මේ තුන්වැනි ශ්‍රාවකසන්නිපාතය වන්නේය

මෙසේ ත්‍රිප්‍රකාරවූ ශ්‍රාවකසන්නිපාතය දක්වා දූන් ඒ සර්වඥයන්වහන්සේගේ පිරිවර භික්ෂූන් හා චාරිකාදිය දක්වන්නාවූ සර්වඥයන්වහන්සේ:-

"කොටිසතසහස්සානි ඡළභිඤ්ඤා මහිද්ධිකා
මෙත්තෙය්‍යං ලොකනාථං පරිවාරෙස්සන්ති සබ්බදා
පටිසම්භිදාසු කුසලා නිරුත්තිපදකොවිදා,

බහුස්සුතා ධම්මධරා වියත්තා සංඝසොභනා
සුදන්තා සොරතා ධීරා පරිවාරෙස්සන්ති තං ජිනං,

පුරක්ඛතො තෙහි භික්ඛූහි නාගො නාගෙහි තාදිහි
තිණ්ණො තිණ්ණෙහි දන්තො දන්තෙහි සන්තමාගතො,

සද්ධිං සාවකසංඝෙහි පරිවාරෙත්වා මහාමුනි
අනුකම්පිකො කාරුණිකො මෙත්තෙය්‍යො දිපදුත්තමො,

උද්ධරන්තො බහූ සත්තෙ නිබ්බාපෙන්තො සදෙවකෙ
ගාමනිගමරාජධානීසු චරිස්සති චාරිකං ජිනො,

ආහනං ධම්මභෙරිං ධම්මසංඛඵලාසනං
ධම්මයාගං පකිත්තෙන්තො ධම්මධජසමුස්සයං,

නදන්තො සීහනාදං වත්තෙන්තො චක්කමුත්තමං
රසුත්තමං සච්චපානං පායෙන්තො නරනාරිනං,

හිතාය සබ්බසත්තානං නාථානාථං මහාජනං
බොධෙන්තො බොධනෙය්‍යානං චරිස්සති චාරිකං ජිනො,

කස්සචි සරණාගමනෙ නිවෙසෙස්සති චක්ඛුමා
කස්සචි පඤ්චසීලෙසු කස්සචි කුසලෙ දස,

කස්සචි දස්සති සාමඤ්ඤං චතුරො ඵලමුත්තමෙ
කස්සචි අසමෙ ධම්මෙ දස්සති පටිසම්භිදා,

කස්සචි වරසමාපත්තියො අට්ඨ දස්සති චක්ඛුමා
කස්සචි තිස්සො විජ්ජායො ඡළභිඤ්ඤායො පවෙච්ඡති,

තෙන යොගෙන ජනකායං ඕවදිස්සති සො ජිනො
තදා විත්ථාරිකං හෙස්සං මෙත්තෙය්‍යජිනසාසනං,

බොධනෙය්‍යං ජනං දිස්වා සතසහස්සෙපි යොජනෙ
ඛණෙන උපගන්ත්වාන බොධයිස්සති සො මුනි.

යනාදීන් මෙසේ විදළසේක.

එසමයෙහි පූර්වේනිවාසානුස්මෘතිඥනය, දිව්‍යචක්ෂුරභිඥනය, දිව්‍යශ්‍රොත්‍රඥනය, සියලුසත්ත්වයන්ගේ චෙතොපර්‍ය්‍යඥනය, ඍද්ධිවිධඥනය, ආශ්‍රවක්ෂයකරඥනය යන මේ ෂඩභිඥවන් ඇති අධිෂ්ඨානඍද්ධිය, විකුර්වණ ඍද්ධිය, මනොමය ඍද්ධිය ඥණවිප්ඵාරඍද්ධිය, ආර්‍ය්‍යඍද්ධිය, කම්මවිපාකජ ඍද්ධිය, පුණ්‍යවන්තොඍද්ධිය, විජ්ජාමයඍද්ධිය, ඒ ඒ භාවනාමනසිකාරාදීයෙහි සම්‍යක්ප්‍රයොගප්‍රත්‍යයෙන් සමෘද්ධවන්නාවූ ඍද්ධිය යන දශවිධ ඍද්ධීන් සමන්විත බැවින් මහත්වූ ඍද්ධි ඇති කෙළලක්ෂයක් පමණ ක්ෂීණාශ්‍රවයන් වහන්සේ හැමකල්හිම ලොකස්වාමිවූ මෛත්‍රෙයසර්වඥයන්වහන්සේ පිරිවරා ඇවිදිනාසේක.

තවද අවිපරීත ස්වභාවයෙන් අර්ථාදීන් වෙන්වෙන් කොට ඒ ඒ ධර්මයෙහි ප්‍රභෙදගතවන්නාවූ ඥනය ප්‍රතිසම්භිදා නම් වන බැවින් එබඳු අර්ථපටිසම්භිදාය, ධර්මපටිසම්භිදාය, නිරුක්ති පටිසම්භිදාය, පටිභානපටිසම්භිදාය යන චතුපටිසම්භිදායෙහි දක්ෂවූ නිරුක්තිපටිසම්භිදාවට පැමිණි හෙයින්ම ඒ ඒ ව්‍යවහාර කොට්ඨාසයෙහි සමර්ථවූ ප්‍රගුණව වාචොද්ගතවූ ත්‍රිපිටක බුද්ධවචනය ඇති බැවින් බහුශ්‍රැතවූ පර්‍ය්‍යාප්තිසහිත සතරමඟ, සතර ඵල, නිර්වාණ යන නවලොකොත්තර ධර්මය දරණ හෙයින් ධර්මධරවූ දෙව්මිනිසුන් සහිත ලොකයෙහි ප්‍රසිද්ධ බැවින් ව්‍යක්ත

තවූ උක්තප්‍රකාර ගුණයෙන් යුක්ත බැවින් හා සීලාදි ගුණයෙන් යුක්ත බැවින් සඞ්ඝශෝභනවූ ඒ ආයුෂ්මතුන්වහන්සේ හැමකල්හි මෛත්‍රෙය සර්වඥයන්වහන්සේ පිරිවරා ඇවිදිනාසේක.

තවද කිසිසේත් ආරෝහපරිණාහයෙන් හා විශෙෂ රූපයෙන් යුක්තවූ පටසිවුරු, දුහුල් සිවුරු ආදි මල්සිලුටු සිවුරු ධරන්නාවූ ගන්නාලද මැණික්වන් පාත්‍ර ඇති ශරීරයෙහි බහා තිබෙන්නාවූ අවශෙෂ පරිස්කාරයන් ඇති දුශ්ශීලභික්ෂූනු ශීලාදිය විරහිත බැවින් විචිත්‍ර චිත්‍රකර්මාන්තයෙන් අලඞ්කෘතව අමෙධ්‍යයෙන් සම්පූර්ණවූ ඝටයක් මෙන්ද, සිංහසම්පොරෝවූවතලද කොටලුවන් මෙන්ද, සුවඳ රන්හැල් බදුනෙහි බොල්මෙන්ද, අන්තඃසාරයක් නැත්තාහ. ඉඹුල්රුක් ආදිවූ බොරුහර ඇති රුක්ආදිය මෙන් අභ්‍යන්තර ශුද්ධියක් නැතිහෙයින් සාරයක් නැත්තාහ. දෞශ්ශීල්‍යගුණයෙන් සම්පූර්ණවූ ශ්‍රමණගද්‍රභයහ, අභ්‍යන්තරයෙහි ශීලාදි කිසි සාරවස්තුවක් නැතිහෙයින් ශ්‍රමණපලාපයහ, අභ්‍යන්තරශුද්ධියක් නැති හෙයින් අන්තඃපූතියහ, සතතයෙන් වැගෙන්නාවූ මේතෙල්බඳුනක් මෙන් නිරන්තරයෙන් වෑහෙන්නාවූ කෙලෙසාශුචි ඇත්තාහ, ගවර වළක් මෙන් ප්‍රතිකූලයහ, සියලු ලෝවැසියන්ගේ කුසල්නැමැති බඩු සොරාගන්නාවූ මහසොරුන් වැනියහ, දෙකෙළවර ගිනිගත් මැද අමෙධ්‍යයෙන් වැකුණු සොහොන්පෙනෙහෙල්ලකට බඳු උපමා ඇත්තාහ, සැඟවුනාවූ ස්වර්ගමොක්ෂමාර්ගයන් ඇත්තාහ, එළිකොට තබන ලද නරකාදි සතරඅපාය මාර්ගයන් ඇත්තාහ, නරකාග්නියට පෙනෙහෙලි වැනිවූහ, ප්‍රත්‍යවෙක්ෂාකිරීම් නැති බැවින් හා සැදැහැත්තන් දුන් චීවරාදි චතුර්විධප්‍රත්‍යය සීලවිපන්නව සිට අනුභවකරණ හෙයින් ඍණපරිභොග ඇත්තාහ. ශාසනයට නුසුදුසු ප්‍රතිපත්තියෙහි යෙදෙන හෙයින් බුදුන් විසින් නින්දාකොට ගරණාලදහ. නිරන්තරයෙන් උපවගයට පැමිණෙන ලද සිත් ඇත්තාහ. "අග්ගික්ඛන්ධොපමසූත්‍රයෙහි" වදාරණ ලද දුක් පිළිගන්ට යොග්‍යයහ. කාරුණාපර ජනයන්ගේ කාරුණාවට වස්තුවූහ. අශ්‍රමණව ශ්‍රමණප්‍රතිඥ ඇත්තාහ. සියලු සත්ත්වයන් විසින් කරණලද නින්දාවට භාජනයහ. මෙබඳුවූ දුශ්ශීල පුද්ගලයෝ සඞ්ඝයා හොබවන්නාහු නොවෙති. ඔහු ශාලික්ෂෙත්‍රය දූෂ්‍යකරන්නාවූ බඩඅමු ආදි තෘණධාන්‍යයක් මෙන් සඞ්ඝදූෂක වන්නාහ. එබඳු දුශ්ශීලභික්ෂූන් ඒ සඞ්ඝපඞ්ක්තිහි නැති බැවින් ඒ සියලු ක්ෂීණාශ්‍රවභික්ෂූන්වහන්සේ සඞ්ඝශොභන නම් වන

සේක. මෙබඳු සඞ්ඝශොභනවූ කෙලෙසක්ෂයක් රහතුන් වහන්සේ නිරන්තරයෙන් ඒ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේ පිරිවරා ඇවිදිනාසේක.

තවද රූපාදි ෂඩාලම්බනයෙහි පවත්නා චක්ෂුරින්ද්‍රියාදි ෂඩින්ද්‍රියයන් මනාකොට දමනයෙහි ලූ බැවින් සුදන්තවූ විශෙෂවත් ශීලාදි ගුණයෙහි ඇලුනු බැවින් හා ගම්භීරාරණ්‍යසේනාසනයෙහිත් උත්කෘෂ්ටකුශලධර්මයෙහිත් උකටලීබව කරන්නාවූ කෙලශයන් ප්‍රහීණකළ බැවින් සර්වඥශාසනයෙහි ඇලුනාවූ තම තමන්වහන්සේලාට සුදුසු ශ්‍රාවකපාරමිතාඥානයෙහි මස්තකප්‍රාප්තවූ බැවින් ප්‍රඥාවන්තවූ ක්ෂීණාශ්‍රවයන්වහන්සේ හැමදවස් ඒ මෛත්‍රෙයසර්වඥයන්වහන්සේ පිරිවරා ඇවිදිනාසේක.

තවද ඒ මෛත්‍රෙයසර්වඥයන්වහන්සේ ඡන්දාදිවශයෙන් අගතියට නොයනසේක් තමන්වහන්සේ බඳු ඡන්දාදියෙන් අගතියට නොයන්නාවූ භික්ෂූන්වහන්සේ විසින් පිරිවරණලදසේක. තමන්වහන්සේ ඉෂ්ටානිෂ්ටයෙහි අකම්ප්‍යස්වභාවයට පැමිණිසේක් තමන්වහන්සේ බඳු ඉෂ්ටානිෂ්ටයෙහි අකම්ප්‍යස්වභාවයට පැමිණියාවූ භික්ෂූන්වහන්සේ විසින් පිරිවරණලදසේක. තමන්වහන්සේ සංසාරසාගරයෙන් හා කෙලශසාගරයෙන් එතරවූසේක් තමන් වහන්සේ බඳු සංසාරසාගරයෙන් හා කෙලශසාගරයෙන් එතරවූ භික්ෂූන්වහන්සේ විසින් පිරිවරණලදසේක. තමන්වහන්සේ චක්ෂුරින්ද්‍රියාදි ෂඩින්ද්‍රියයන් දමනයෙහි ලූසේක් තමන්වහන්සේ බඳු චක්ෂුරින්ද්‍රියාදි ෂඩින්ද්‍රියයන් දමනයෙහි ලූ භික්ෂූන්වහන්සේ විසින් පිරිවරණලදසේක. තමන්වහන්සේ සකලකෙලශයන් සන්හිඳුවූ බැවින් ශාන්තවූසේක් තමන්වහන්සේ බඳු සකලකෙලශයන සන්හිඳුවූ ශාන්තවූ භික්ෂූන්වහන්සේ විසින් පිරිවරණලදසේක. තමන්වහන්සේ බඳු කෙලශාග්නි නිවියාවූ සිත්ඇති භික්ෂූන්වහන්සේ විසින් පිරිවරණලදසේක.

මෙසේ උක්තප්‍රකාර ගුණසමූහයන් ඇති සියලු සත්ත්වලොකයාට අනුකම්පා කරන්නාවූ සකල ලොකාර්ථසිද්ධියට කාරණව සිටි මහාදයාසඞ්ඛ්‍යාත කරුණා ඇති බැවින් මහාකාරුණිකවූ, දෙපා ඇති සියලු සතුන්ට උතුම්වූ බැවින් ද්විපදොත්තමවූ මෛත්‍රෙයසර්වඥයන්වහන්සේ තමන්වහන්සේ බඳු සියලු ගුණගණාගයෙන් සම්පූර්ණවූ ශ්‍රාවකසඞ්ඝයාවහන්සේ විසින් පිරිවරණ ලදුව සියලු සත්ත්වයන් සංසාරදුඃඛයෙන් උඩ

නගනසේක් රාගාග්නි ආදි එකාදශාග්නිය නිවා උතුම් මාර්ගඵල නැමැති ජලයෙන් දිව්‍යමනුෂ්‍යයන්ගේ ලය සිහිල්කරණසේක් ගම්, නියම් ගම්, රාජධානියෙහි සැරිසරා ඇවිදිනාසේක

තවද ඒ සර්වඥයන්වහන්සේ සතරසතිපට්ඨානය, සතරසම්‍යක් ප්‍රධානය, සතරඍද්ධිපාදය, පඤ්චන්ද්‍රියය, පඤ්චබලය. සප්ත බොධ්‍යඞ්ගය, ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය යන මේ සත්තිස් බොධිපාක්ෂිකධර්ම නැමැති භෙරිය පහරණා සේක් චතුසසත්‍යධර්ම නැමැති සඞ්ඛනාදය පවත්වනසේක් නවවිධ ලොකොත්තර ධර්මනැමැති ධ්වජය ප්‍රකාශ කොට චතුරණසේක් එක් පණස් කුශලධර්ම නැමැති ධජයන් නඟනසේක් ගම්, නියම්ගම්, රාජධානියෙහි සැරිසරා වඩනාසේක.

තවද ඒ සර්වඥයන්වහන්සේ යම්සේ සිංහයාගේ නාදය සමාන ජාති ඇති සත්ත්වයන්ට සොම්නස් උපදවාද, හීනජාති ඇති සත්ත්වයන්ට භය, සන්ත්‍රාස උපදවාද, එපරිද්දෙන්ම ඒ සර්වඥයන්වහන්සේගේ නාදය අවිපරීත දෘෂ්ටි ඇති කල්‍යාණාධ්‍යාශය ඇති උත්තම්පුද්ගලයන්ට සොම්නස් උපදවන්නේය. අනිත්‍යාදියෙහි නිත්‍යාදිපරිකල්පනා ඇති අනුත්තමාධ්‍යාශ ඇති ලාමකසත්ත්වයන්ට භය, සන්ත්‍රාශ උපදවන්නේය. එහෙයින් සිංහයාගේ නාද බඳු නාද ඇතිසේක.

තවද යම්සේ සිංහයා හස්ත්‍යශ්වාදි උත්කෘෂ්ටසත්ත්වයන් නසාද, කැනහිල් ආදි ලාමකසත්ත්වයන්ගේ අවශ්‍යද සඟනය කෙරේද, එපරිද්දෙන්ම සර්වඥයන්වහන්සේ වෛනෙයජන සන්තානගත කෙලශයන් නසන හෙයින් හා ලොකාවර්ත්තනය සඟනය කිරීම හෙතුකොට ගෙණ සිංහයා හා සමාන බැවින් සිංහනාද බඳු නාද පවත්වනසේක.

මෙසේ සිංහනාද පවත්වන්නාවූ උත්තම ධර්මචක්‍රය පවත්වන්නාවූ සියලු රසයන් අතුරෙන් උතුම් රසඇති චතුසසත්‍ය පානය සියලු සත්පුරුෂයන් පානය කරන්නාවූ උත්තමසත්ත්වයන්ටම අනුශාසනා කෙරෙමි, අනුත්තම සත්ත්වයන්ට අනුශාසනා නොකෙරෙමි, අනුත්තමසත්ත්වයන්ට අනුශාසනා කෙරෙමි, උත්තමසත්ත්වයන්ට අනුශාසනා නොකෙරෙමි, යන මෙසේවූ වෙනසක් නැතිහෙයින් සියලු සත්ත්වයන්ට වැඩපිණිස අවශ්‍ය අනවශ්‍ය උත්තම අධම සියලු මහජනයාට අනුශාසනා කෙරෙමින් චතුසසත්‍යාවබොධය කටයුතුවූ සත්ත්වයන් අවබොධය කරවමින් ඒ මෛත්‍රයසර්වඥයන්වහන්සේ සැරිසරා වඩනාසේක.

තවද ඒ චක්ෂුෂ්මත්වූ සර්වඥයන්වහන්සේ රත්නත්‍රය සරණයක් අන්‍යවූ සිහිකටයුතුවූ වස්තුවක් නැති බැවින් හැමකල්හි ලෞකිකලෝකෝත්තර සම්පත් කැමැත්තනු විසින් සිහිකටයුතු හෙයින්ද, සරණයෙන් මත්තෙහි අන්පිහිටක් නැති බැවින්ද, සරණය කරණකොට ගෙණ ස්වර්ගමෝක්ෂසැපයට පැමිණෙන හෙයින්ද, සරණ නම්වූ රත්නත්‍රය සරණය. මෙහි කිසි සත්ත්ව කෙනකුන් පිහිටුවන සේක. කිසි සත්ත්ව කෙනකුන් පඤ්චශීලයෙහි පිහිටුවන සේක. කිසි සත්ත්ව කෙනකුන් දශකුශලකර්මපථයෙහි පිහිටුවන සේක. කිසි සත්ත්ව කෙනකුන්ට ශීල-සමාධි-ප්‍රඥාසංඛ්‍යාත ශ්‍රමණභාවය කරන්නාවූ ප්‍රව්‍රජ්‍යා උපසම්පදා දෙන සේක. කිසි සත්ත්ව කෙනකුන්ට උත්තමවූ චතුර්විධ ආර්‍ය්‍යඵලයන් දෙන සේක. සමහර සත්ත්ව කෙනකුන්ට ලෞකික ධර්මයන් හා අසමාන බැවින් අසම වූ නවලෝකෝත්තරධර්මය දෙනසේක. සමහර සත්ත්ව කෙනකුන්ට අර්ථපටිසම්භිදාදි චතුපටිසම්භිදාවන් දෙනසේක. කිසි සත්ත්ව කෙනකුන්ට අපගේ සර්වඥයන්වහන්සේ විශාඛාමහාඋපාසිකාවන්ට හා අනඳමහතෙරුන්වහන්සේට දුන් වරඅට හා සමාන වූ අෂ්ටවරයන් දෙන සේක. සමහර සත්ත්ව කෙනකුන්ට ප්‍රථමධ්‍යානාදි අෂ්ටසමාපත්තීන් දෙනසේක. කිසි සත්ත්ව කෙනකුන්ට පූර්වේනිවාසානුස්මෘතිඥාන-දිව්‍යචක්ෂුරභිඥාන-ආශ්‍රවක්ෂයකරඥාන සංඛ්‍යාතත්‍රිවිද්‍යාවන් දෙනසේක. කිසි සත්ත්ව කෙනකුන්ට ඍද්ධිවිධඥානාදි ෂඩ්අභිඥාවන් දෙනසේක.

මෙසේ ඒ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේ සියලු ජනසමූහයාට යථොක්තක්‍රමයෙන් අවවාද අනුශාසනා කරණසේක. එසමයෙහි ඒ මෛත්‍රෙයසර්වඥයන්වහන්සේගේ පර්‍ය්‍යාප්ති-ප්‍රතිපත්ති-ප්‍රතිවේධ වශයෙන් ත්‍රිවිධ වූ යථාපරාධ-යථානුලෝම-යථාධර්ම වශයෙන් ත්‍රිවිධ වූ ශාසනය සියලු ලෝකයෙහි ව්‍යාප්ත වන්නේය. සියලු ජම්බුද්වීපය භික්ෂු-භික්ෂුණීන් වහන්සේ පෙරෙවි සිවුරෙහි ආලෝකයෙන් එකාලෝක වන්නේය. ගෙටවදනාවූත් නික්මෙන්නාවූත් භික්ෂු-භික්ෂුණීය යි කියන ලද සංඝීවරයන්ගේ චීවරමාරුතයෙන් හා අතපය දික්කිරීම් මක්කිරීම් ආදියෙන් උපන්නාවූ ශරීරමාරුතයෙන් සියලු රෝගදුක් දුරුවන්නේය.

තවද ඒ මෛත්‍රෙයසර්වඥයන්වහන්සේ ලක්ෂයක් යොදනෙහිද ඊටත් වඩා දුරුවූ දිව්‍යලෝක-බ්‍රහ්මලෝක-අන්‍යචක්‍රවාටාන්තරයෙහි උපන්නාවූ චතුස්සත්‍යාවබෝධය කටයුතුජනයා දූත

අනන්තාපරිමාණ සක්වළ සියලු සත්ත්වයන්ට වැඩහුන් තැනම වැඩහිඳ අහස්මුදුනෙහි පිහිටි පුන්සඳමඬලක් මෙන් පෙණෙන්ට සුදුසු බුද්ධානුභාවයෙන් හා එක්සිතක් ඉපද නිරුද්ධනොවනතෙක් සෘද්ධියෙන් අනන්තාපර්‍යන්ත සක්වළ කෙළවරට ගොස් පෙණෙන්ට සුදුසු සෘද්ධ්‍යනුභාවයෙන් යුක්ත බැවින් කායගති-චිත්තගතියෙන් එකචිත්තක්ෂණයෙහි ම එළඹ ඒ හේතුසම්පත් ඇති සියලු ජනයන් චතුස්සත්‍යාවබොධය කොට අමාමහනිවන් දක්වනසේක.

මෙසේ සියලු ගම්-නියම්ගම්-රාජධානියෙහි සැරිසරා වඩනාවූ සියලු දිව්‍යබ්‍රහ්මලෝකාදියට වඩනාවූ ගිය ගිය තැන සත්ත්වයන් නියතයෙන් මාර්ගඵලයට පමුණුවා හෙයින් නොහිස් ගමන් ඇති, ඒ මෛත්‍රෙයසර්වඥයන් වහන්සේ තමන් වහන්සේ සමීපයෙන් කමටහන් ගෙණ සැපතැනක වසන්නාවූ භික්ෂූන් අසවල් මහණ මා සමීපයෙන් කමටහන් ගෙණ ගියේ, මාර්ගඵල සඞ්ඛ්‍යාත විශෙෂයක් උපදවන්ට සමර්ථවී දෝහොයි පරීක්ෂාකරණසේක. ඉදින් ඒ භික්ෂූන් කමටහන් හැර අකුශලවිතර්කයක් විතර්කණය කරන්නාවුන් දුටුසේක් වී නම් එසඳ මාබඳු සර්වඥ කෙනකුන් සමීපයෙන් කමටහන් ගෙණ වසන්නාවූ මේ කුලපුත්‍රයා අකුශලවිතර්කයෙන් මැඩ අනවරාග්‍රවෘත්තදුඃඛයෙහි කෙසේ නම් ගලා හෙලද්දූයි, ඒ කුලපුත්‍රයාට අනුග්‍රහ පිණිස ඔහු උන් තැනට තමන්වහන්සේ දක්වා ඒ කුලපුත්‍රයාට අවවාද කරණසේක. කෙසේද? යත්:—

සත්පුරුෂය! තෝ මාවිසින් කාමවිතර්ක-ව්‍යාපාදවිතර්ක-විහිංසාවිතර්ක සඞ්ඛ්‍යාත ත්‍රිවිධවිතර්කයන් දුරුකරණ පිණිස ධර්මය දෙසමින් සිටියදී කෙසේ නම් විතර්කවශගවෙහිද, අනවරාග්‍රසංසාරයෙහි විතර්කවශගවූ තාවිසින් කායදුශ්චරිතාදිය කොට නොයෙක් දහස්ගණන් ජාතිවල ඉතා දරුණුවූ කර්කශවූ නරකදුක් අනුභව කරණලද. ඉදින් දැනුදු විතර්කවශග වන්නෙහි වී නම් බොහෝ දහස්ගණන් අවුරුදුමුළුල්ලෙහි ඉතා දරුණුවූ නරකදුක් අනුභවකෙරෙමින පඤ්චවිධජ්වාලාමාලාවෙන් ගැවසීගත් මහත්වූ වහ්නියෙන් අතුරුතැනි අවීචිමහානරකයෙහි ඉපැද නරකගින්නෙන් ඇවිලෙන්නාවූ ශරීර ඇතිව බැගෑහඬින් හඬමින් "අහොදුක්ඛං අහොදුක්ඛං" යිආර්තනාස්වර පතුරුවමින් මහත්වූ ව්‍යසන අනුභව කරන්නෙහිය.

තවද මේ සංසාරයෙහි කළුවරදෙපෝයේ මධ්‍යම රාත්‍රියය, ඝනවනලැහැබය, මේඝපටලය යන මේ චතුරඞ්ගයෙන් සමන්විත ඝනාන්ධකාරයක් වැනිවූ මොහාන්ධකාර ඇති, සද්ධර්ම නැමැති ප්‍රදීපවිරහිතවූ දෙසැටක් දෘෂ්ටියෙන් ගහණවූ බුද්ධශූන්‍යවූ නොයෙක් කෙලලක්ෂගණන් කල්පයන් ඉකුත්වූකල්හි ඉතා ලැබගත නොහැක්කාවූ එකම සම්බුද්ධ නැමැති සූර්යයෙක් පහළවන්නේය. මෙම ක්‍රමයෙන් උපන්නාවූ නොයෙක් කෙළලක්ෂගණන් සම්බුද්ධවරයන් සියලු ජනසමූහයා සංසාරසාගරයෙන් එතර කොට නිර්වාණස්ථලයෙහි පිහිටුවූකල්හි තොප අද දක්වාත් කුශලසම්පත්තීන් පහවූ පූර්වභාග ප්‍රතිපත්ති ඇති බැවින් සංසාරසාගරයෙහිම ගැලී සිටියෙහිය. ඉදින් දුනුදු අවුරුදු සියයක් ගියකල නගන්නාවූ හිස් ඇති පවන්වෙගයෙන් ඈළෙන්නාවූ රළපහරින් ලෙලවූ සමුද්‍රමස්තකයෙහි පෙරළෙන එකසිදුරක් ඇති වියසිදුරට වන්නාවූ හිස් ඇති කාණකැස්බෑ මෙන් අතිදුර්ලභවූ මනුෂ්‍යාත්මභාවය ලැබ කිසිව කුශලයකින් අෂ්ටදුෂ්ටක්ෂණයෙන් විනිර්මුක්තවූ තවවැනි බුද්ධොත්පාදක්ෂණසම්පත්තිය ලැබ සිටියෙහිය. ඒ අෂ්ටදුෂ්ටක්ෂණයෙන් වෙන්වූ බුද්ධොත්පාදක්ෂණය ලැබීමෙහි ඵල දූන් සිද්ධකොට ගන්ට අසමර්ථවූයෙහි වී නම් මෙබඳු ක්ෂණසම්පත්තියක් තට කවරකලෙක ලැබේද?

එහි අෂ්ටදුෂ්ටක්ෂණ නම්:-කෙසේද? යත්:—

1 අක්ඛණවිනිමුත්තං ඛණං පරමදුල්ලභං
උපලද්ධෙන කත්තබ්බං පුඤ්ඤං පඤ්ඤවතා සදා

2 තයො අපායා ආරුප්පාසඤ්ඤං පච්චන්තිමං පිච
පචින්ද්‍රියානං වෙකල්ලං මිච්ඡාදිට්ඨිච දාරුණා

3 අපාතු භාවො බුද්ධස්ස සද්ධම්මො මතදෙසිතො
අක්ඛණා අසමයා ඉතිඑතෙ පකාසිතා

4 කාරෙන්තො කම්මකරණං නිරයෙ අතිදාරුණං
භයානකං භුසංඝොරං කථං පුඤ්ඤං කරිස්සති

5 සද්ධම්මං සඤ්ඤජනිතෙ සදාඋබ්බිග්ග ජීවිතෙ
තිරච්ඡාන භවෙසන්තො කථං පුඤ්ඤං කරිස්සති

6 ගන්ධබ්බානපෙත්තිවිසයං සන්තාපපරිසොසිතො
ඛුප්පිපාසා පරිස්සන්තො කථං පුඤ්ඤං කරිස්සති

7 ආරුප්පා සඤ්ඤලොකෙ සවණොපාය වජ්ජිතො
සද්ධම්මසවණාහීණො කථං පුඤ්ඤං කරිස්සති

8 අච්චන්තකාමබහුලෙ මුනින්දසුතවජ්ජිතෙ
පච්චන්තවිසයෙ ජාතො කථංපුඤ්ඤං කරිස්සති

9 ජළාමූගාදිකො චාපි විපාකාවරණෙනිතො
ගහණොපාය රහිතො කථංපුඤ්ඤං කරිස්සති

10 උක්ඛෙත්තා පාපිකං දිට්ඨිං සබ්බථා අතිවත්තියං
සංසාරඛාණු භූතොව කථංපුඤ්ඤං කරිස්සති

11 බුද්ධාදිච්චෙ අනුදිතෙ සිද්ධිමග්ගාවභාසකෙ
මොහන්ධකාරෙ වත්තන්තො කථංපුඤ්ඤං කරිස්සති යි.

මෙසේ දක්වනලද නරකාදි අටතැන්හි උපන් සත්ත්වයන් කුසල් කරන්ට අයොග්‍යවනබැවින් මේ අෂ්ටදුෂ්ටක්ෂණයෙන් වෙන්වූ ඉතා ලැබගත නොහැකි නවවැනි බුද්ධොත්පාදකාලය ක්ෂණසම්පත්තිය නම් වේ. ක්ෂණසම්පත්තියක් සත්පුරුෂය තට කවරකලෙක ලැබෙදැයි අවවාදකරණසේක.

තවද සත්පුරුෂය ඉදින් තෝ නොයෙක් මාණික්‍ය සමූහා ලොකයෙන් බබලන්නාවූ රත්නාකරයකට වැද් කැට කැබිලිති අවුලාරැස්කරන්නාක්මෙන් ඉතා නොලැබිය හැකි ධම්මරත්නයෙන් බබලන්නාවූ මාගේ මේ උතුම් ශාසනයට වැද චිත්තවශග වන්නෙහි වී නම් එබඳුවූ තෝ මාගේ ශාසනයෙන් චුතව භව නැමැති වනයට වැද යම්සේ අවුල්වුන් ඇඹුරැලණුවෙක මේ මූලය මේ අගයයි අක්මුල් දැනගත නොහැකිවේද, එපරිද්දෙන්ම අපරිච්ඡින්න පූර්වාපර කොටි ඇති බැවින් අක්මුල් නැති සසරින් නැගීයා නොහී භව අවුලෙහිම ගෙතී ගුළුනම් ලිහිණියන්ගේ අවුල්කදල්ලක් තිව දීරාගිය අවුල් මුදුනණ බබුස්තණින් ඇඹෑරූ රැණක්වැනිව අනාගතයෙහි උපදනා සර්වඥවරයන්ගේ දර්ශනමාත්‍රයකුත් නොලැබ දෙසැට දෘෂ්ටියගෙණ අපායදුර්ගති විනිපාත සංඛ්‍යාත සංසාරසාගරය නොඉක්ම චුතියෙන් ප්‍රතිසන්ධිය ප්‍රතිසන්ධියෙන් චුතියයි මේසේ නැවත චුතිප්‍රතිසන්ධිග්‍රහණය කෙරෙමින් කාමභවාදි ත්‍රිවිධ භවයෙහිද, අණ්ඩජාදි චතුර්විධ යොනියෙහිද, නරකාදි පංචගතියෙහිද, එකත්තකායාදි සප්තවිඥානස්ථිතියෙහිද, එසේම නානත්තකායාදි නවසත්තාවාසයෙහිද, ගැඹුරු ගොරබිරම් මුහුදුපිට හරණලද කැවක් මෙන්ද, හොතලුවෙහි ලූ ගොනකු මෙන්ද ඔබිනොබ පෙරළි පෙරළී ඇවිදින්නෙහිය.

තවද දූත් තෝ ශම යම් දුශ්චරිතයක් කරන්නෙහි වී නම් මතු උපනුපන්නාවූ ස්ථානයෙහි වාසනාදෝෂයෙන් ඊට අනුව

දුශ්චරිත කෙරෙමින් බොහෝ කලක් ඉකුත්වූ කල්හි කිසිම දෛවබලයකින් අනාගතයෙහි උපදනා සර්වඥයකුන්ට සම්මුඛ වන්නෙහිය. එතැන්හිදී ඒ සර්වඥයෝ තට නිග්‍රහ කොට ලජ්ජාකරවා දිව්‍ය, මනුෂ්‍යපර්ෂද් මධ්‍යයෙහි තාගේ වාසනාදෝෂය ගෞතමසර්වඥයන්ගේ ශාසනයෙහි වෘඩභික්ෂුකෙනකුන් වහන්සේ හා ලදරුභික්ෂුන් දෙදෙනකුන්වහන්සේගේ වාසනාදෝෂය මෙන්ද, උපනන්ද- මක්ඛිකාවධක- වාරුණිදූසක-කුටිදූෂක-පූටදූෂක-ආරාමදූෂක-අම්බගොපක-දූර්ව කුනකාදීන්ගේ වාසනාදෝෂය මෙන්ද ප්‍රකාශ කොට කියන්නාහ. ඒ තාගේ වාසනාදෝෂ ප්‍රකාශ කොට කීමෙන් දිව්‍යමනුෂ්‍යපර්ෂද් මධ්‍යයෙහි තට මහත්වූ නින්දා වන්නේය යි, අවවාද කරණසේක.

එහි වෘඩභික්ෂුන් හා ලදරුභික්ෂුන් දෙදෙනාගේ වාසනාදෝෂය කවරේද? යත්:—

සැවැත්නුවරවැසි කුලපුත්‍රයෝ දෙදෙනෙක් අපගේ සර්වඥයන් වහන්සේගේ ශාසනයෙහි මහණව අශුභභාවනා නොකොට රූපමදයෙන් බැගෑවවන්නාහු මම්මයහපත්මි, මම්මයහපත්මියි ඔවුනොවුන් හා වාද කොට එක් වෘඩභික්ෂුකෙනකුන් වහන්සේ දැක උන්වහන්සේ කරා එළඹ ස්වාමීනි! අපදෙදෙනා අතුරෙන් යහපත්හු කවුරුදැයි විචාළහ. එසඳ ඒ වෘඩභික්ෂුන් වහන්සේ තෙපිත් යහපත්හුව, තෙපිත් යහපත්හුව, තොපදෙදෙනාටත් වඩා මම්ම යහපත්මි යි කීසේක.

සර්වඥයන්වහන්සේ එපවත් අසා මේ මහණ දැන් මතු නොවෙයි, පෙරත් මේ දෙදෙනාට එසේම කීයේවිදැයි ඉකුත්වත් දක්වා වදාළසේක.

අතීතයෙහි ගංගා-යමුනා දෙගඟ එක්වූ තැන මත්ස්‍යයෝ දෙදෙනෙක් මම්ම යහපත්මි, මම්ම යහපත්මි යි රූනිසා වාද කොට අන්‍යවූ සමීපගංගාවෙහා වැල්ලේ වැදහොත් ඉබ්බකු දැක ඔහුකරා ගොස් සබඳ! අපදෙදෙනා අතුරෙන් යහපත්හු කවුරුදැයි විචාළහ. ඒ ඉබ්බා කියන්නේ තෙපිත් යහපත්හුය, තෙපිත් යහපත්හුය, තොපදෙදෙනාට වඩා මම්ම යහපත්මි යි කීය. එකල්හි ඒ ඉබ්බා නම්: දැන් මේ වෘඩභික්ෂුහුය. ඒ මත්ස්‍යයෝ දෙදෙනා නම්: දැන් මේ ලදරුභික්ෂු දෙදෙනාය යි වදාළසේක.

මෙහි විස්තර දුකනිපාතයේ ගංගෙය්‍යජාතකයෙන් දතයුත්තේය. මේ ඔවුන් තුන්දෙනාගේ වාසනාදෝෂ වන්නේය.

උපනන්දස්ථවිරයන් වහන්සේගේ වාසනාදෙෂ කවරේද? යත්:–

උපනන්ද නම් ශාක්‍යපුත්‍රයාන කෙනෙක් බුදුසස්නෙහි මහණව අපිස් සතොස් බව් හැර ලොභවශගව වස්වසන දවස් දෙතුන් විහාරයක් අත්ගෙණ එක් විහාරයෙක කුඩයක් තබා එක් විහාරයෙක වහන්සගලක් තබා එක් විහාරයෙක සැරයටියක් තබා එක්විහාරයෙක ඩබරාවක් තබා එක්විහාරයෙක තමන් වහන්සේ වස් විසූසේක. වස්අන්තයෙහි පවරා හැමතැනින් ලද මහා සිවුරුපිරිකර එකසමයටම ලැබ ගැල්වල පුරාලා ගෙණ ජෙතවනමහාවිහාරයට යනසේක් අතරමග එක් වනවාසවිහාරයෙක පිටිපස්සේ වැලක පැකිල මේ විහාරයෙන් කිසි ඵදයක් ලද් මැනවැයි ඒ වනවාසවිහාරයට වන්සේක. එහි වස්විසූ භික්ෂුහු දෙදෙනෙක් සේලපටදෙකක් හා එක් සිහින් පලසක් ලැබ බෙදාගත නොහී ඒ උපනන්දස්ථවිරයන් වහන්සේ දැක සතුටුව මේ අපට බෙදා දුන මැනැවැයි කීහ. එසඳ උන්වහන්සේ යහපතැයි ගෙන්වා ගෙණ පිළිදෙක දෙදෙනාවහන්සේට දී මේ මා විනයධරයකුට තිසියයි පලස තමන් වහන්සේ ඇරගෙණ ගියසේක.

බුදුහු එපවත් අසා දුන් මතු නොවෙයි, පෙරත් ඒ දෙන්දනාට මේ මහණ එසේම කෙළේ වේදැයි වදාරා ඉකුත්වත් ගෙණ හැර දක්වා වදාළසේක.

අතීතයෙහි එක් කැනහිලෙක් ගංගාතීරයෙහි මත්ස්‍යයන් සොයමින් ඇවිදිනේය. එසඳ ගංනාවේ මස්සාවෝ දෙදෙනෙක් තමන් අල්වා ගත් රෝමසකු බෙදාගත නොහී කැනහිලා දැක සබඳ! මේ අපට බෙදා දී ලවයි කීහ. කැනහිලා යහපතැයි ගිවිස තමා සමීපයට ගෙන්වා ගෙණ ඉසයටිය වල්පත කඩා තබා තා අනුතීරචාරිකට වල්පත තිසිය, තා ගම්භීරචාරිකට ඉසටිය තිසිය, මා රජකුලෙහි මැදහත්ව විනිශ්චය කරණ ධර්මිෂ්ට මහාමාත්‍යහට මැදකඩ තිසියයි මැදකඩ ඇරගෙණ ගියේය. ඒ කැනහිල් නම් දූන් මේ උපනන්දස්ථවිරය. මස්සාවෝ දෙදෙන නම් භික්ෂුහු දෙදෙනායයි වදාළසේක. මෙහි විස්තර ජාතකනිපාතයෙහි ධම්මඨජාතකයෙන් දතයුත්තේයි. මේ උපනන්දස්ථවිරයන්ගේ වාසනාදෘෂය වන්නේය.

මක්ඛිකාවඩකාවගේ වාසනාදෙෂ කවරේද? යත්:–

අනේපිඩුමහසිටාණන්ගේ බඩහල රොහිණී නම් දැසියක් තමාගේ මව ඇඟ මැස්සන් ගසමියි මෝලක් හැරගෙණ ගසා

මව මරාපූව. බුදුහු එපවත් අසා මෑ දූන් මතු නොවෙයි, පෙර මා බරණැස්සිටුව උපන් කල්හි මාගේ බඹහලදී එසේම මැස්සන් ගසමිසි, මොහොලක් ගෙණ ගසා මව මැරූ එකක් වේදැයි, වදාළ සේක. මෙහි විස්තර එකකනිපාතයෙහි රොහිණී ජාතකයෙන් දතයුත්තේය.

මේ මක්ඛිකාවධකාවගේ වාසනාදෙෂය වන්නේය.

**වාරුණීදූෂකයාගේ** වාසනාදෙෂ කවරේද? යත්:-

**සැවැත්නුවර** රාවෙළඳකුගේ අතවැස්සෙක් රාවෙළඳ ජලස්ථානයට යාදී එතනට පැමිණි සත්ත්වයන්ට රා විකුණන්නේ ඔවුන්ගෙන් එකකු ලුණුකැටියක් බැඳගෙණ රා බොන්නා දූක රාකිච්ල තවතැයි රාසැළක ලුණුනැළියක් බැගින් ලා ඒ රා කැකීශ කොට නොබිය හැකි කෙළේය. බුදුහු එපවත් අසා මොහු දූන් මතු නොවෙයි, මා බරණැස්නුවර සිටුව උපන් කල්හි මාගේ යහලු වෙළඳකුගේ අතවැස්සෙක්ව මෙසේම රායේ ලුණු ලා රා නැසූයේ වේදැයි, වදාළසේක. මෙහි විස්තර **එකකනිපාතයෙහි වාරුණීජාතකයෙන්** දතයුත්තේය. මේ වාරුණීදූෂකයාගේ වාසනාදෙෂ වන්නේය.

**කුටිදූෂකයාගේ** වාසනාදෙෂ කවරේද? යත්:-

**මහාසුප්මහතෙරුන්** වහන්සේට අත්පා මෙහෙවර කරණ ලදරුභික්ෂු දෙදෙනකුගෙන් වත්සම්පන්න නොවන එක් භික්ෂු කෙනෙක් මහතෙරුන් වහන්සේ තමන්ට අවවාද කළහෙයින් උන්වහන්සේ සිගා ගමට වැඩිකල්හි පැන්වළන් සපා බිඳ පැන් හල ගිනිලා දවා එයින් චූතව ගොස් අවීචිමහනරකයෙහි උපන්හ. බුදුහු එපවත් අසා මේ මහණ දූන් මතු නොවෙයි, පෙරත් කුටිදූෂණය කෙළේවේදැයි, වඳුරා ඉකුත්වත් දක්වා වදාළසේක.

**එක්කලෙක** අප මහබෝසත්තානෝ **සිලිබිලි** නම් ලිහිණි යෝනියෙක ඉපද වැඩිවිය පැමිණි කල්හි තමන්ට යහපත් තො තස්තා කදූල්ලක් ඉදිකොට හිමාලයවනප්‍රදෙශයෙහි වාසය කරන්නාහ. එකල්හි එක් වඳුරෙක් වර්ෂාකාලයෙහි අතුරුනැතිව වස්නා වැස්සේ සීතයෙන් වෙවුල වෙවුලා දත් කනා හුන්නේය. එසඳ මහබෝසත්තානෝ ඒ වානරයා බලා ඔහු කැකීෂ නියාව දූන තාගේහිස මිනිසුන්ගේ හිසක් වැන්නේය. අත්පා මිනිසුන් අත් පා වැන්නේය. කවර කාරණයකින් තෝ වසන ගෙයක් කොට ගත නො හෙන්නෙහිදැයි කීහ. එකල්හි වඳුරු සිලිබිලිය! අත පය බල ඇතත් කාරිය කොට ගනට තිසි තුවණෙක මට නැතැයි

කීය. එබස් අසා බොධිසත්ත්වයෝ සබඳ! එක්තැනෙක්හි නොපිහිටි සැහැල්ලු සිත් ඇති සත්ත්වයන්ට සුවයෙක් ඇත්තේ නම් නොවෙයි නුවණ උපදින්ට නිසි ප්‍රයොග කරවයි අවවාද කළහ. එසඳ වඳුරු තමා නොතෙමෙනතැන හුන්නෙන් පරිභව කෙරෙතියි කීපී බොධිසත්ත්වයන් අල්වනු කැමැතිව සමීපයට දිවගෙණ ගියේය. බොධිසත්ත්වයෝ එතැනින් නික්ම අනික් තැනකට ගියහ. එසඳ වඳුරු කදල්ල විදු සුණුවිසුණු කොට ගියේයයි වදාළසේක. මෙහි විස්තර චතුක්කනිපාතයෙහි කුටිදූසකජාතකයෙන් දතයුත්තේය. මේ කුටිදූසකයාගේ වාසනාදෙෂය වන්නේය.

පුටදූසකයාගේ වාසනාදෙෂ කවරේද? යත්:-

සැවැත්නුවර වැසි එක් අමාත්‍යයෙක් බුදුපාමොක් මහසඟ පිරිසට මහදන් දෙනු කැමැතිව ආරාධනා කොට කැඳවා ගෙණ ගොස් තමාගේ උයනෙහි හිඳුවා දන් දෙන්නේ කැඳ වළඳා අන් තැනෙහි උයන ඇවිදිනා කැමති භික්ෂූන්කෙනකුන් වහන්සේද උයන ඇවිදිනේ යහපතැයි සම්මත කෙළේය. භික්ෂූන්වහන්සේත් අමාත්‍යයා කීපරිද්දෙන්ම උයන සැරි සරා ඇවිදිනාසේක. එසඳ අමාත්‍යයා උයන්වැල්ලේ පත්මහත්රුකකට නැගී මහත් මහත් පත් කඩා ගෙණ මේ මල්පුරාලාලා තබන්ටය, මේ ඵල පුරාලාලා තබන්ටයයි පලාවිද රුක්මුල එලන්නේය, ඔහුගේ පුතෙක් එලඑලාලූ පත්ගොටු විද විදා දමන්නේය, බුදුහු එපවත්අසා මේ දූන් මතු පලා විදා දැමූයේ නොවෙයි, පෙරත් පලා විදූයේම වේදැයි වඳුරා ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස එක් වඳුරෙක් උයන්ගොව්වකු රුකෙක හිඳ විද එලාලූ පත්ගොටු විදා දමන්නේය. එකල මහබෝසතාණෝ එනුවර එක්තරා කුලයෙක ඉපැද වැඩිවිය පැමිණ කිසිකාරියක් සඳහා උයනට ගියාහු වඳුරා පත්ගොටු විදා දමන්නා දැක පලා විදි නියා නපුරුහෙයින් යහපත් කොට විදිනා කැමැතිව පලා විද සි කීහ. වඳුරු එබස් අසා කළ කළ දූ නසනු අපගේ ධර්මයෙකැයි කීහ. එබස් අසා බොධිසත්ත්වයෝ තොපගේ ධර්මය මෙසේ කල අධර්මය කෙසේවේදැයි වඳුරාට නින්දාකොට ගියාහ. එකල ඒ වඳුරා තම දූත් මේ පලා විදා දැමූ අමාත්‍යපුත්‍රයයි වදාළසේක. මෙහි විස්තර තිකනිපාතයේ පුටදූසක ජාතකයෙන් දතයුත්තේය. මේ පුටදූසකයාගේ වාසනාදෙෂ වන්නේය.

කොසොල්රට එක් උයනෙක ගස් හිඳුවූ කල්හි එක් කුමාරයෙක් මූල්පමණින් දියබටතියාව බැලුව මැනවැයි ගස් උදුරා මරා එක් උද්‍යානප්‍රදෙශයක් සිස්කෙළේය. බුදුහු එපවත් අසා දැන් මතු නොවෙයි, පෙරත් මේ බාලකුමාරයා බොහෝ වඳුරන් ගෙණ බරණැස්රජ්ජුරුවන්ගේ උයන්හි වසන්නේ උයන්ගොව්වා වඳුරන් ගස්වලට පැන්වත්කරන්ට සලසා සැණකෙළි කෙළින්ට තමංනුවරට ගිය කල්හි වඳුරන් ලවා ගස් උදුරවා බලා ගැඹුරට බට බටගස බොහෝ කොට පැන්වත්කරවා නොබට ගසමුල මඳකොට පැන් වත්කරවා ගස් මරා ඒ උයන්පියෙස සිස්කෙළේයයි වදාළසේක.

මෙහි විස්තර එකකනිපාතයෙහි ආරාමදූෂකජාතකයෙන් දතයුත්තේය. මේ ආරාමදූෂකයාගේ වාසනාදෙෂ වන්නේය.

අඹගොපකයාගේ වාසනාදෙෂ කවරේද? යත්.-

මහලු කල සසුන්වන් එක් වහන්දෑනමෙක් දෙව්රම්වෙහෙර පිටිපස අඹවනයෙක පන්සලක් කරවා අඹගසින් වගුළු අඹ අනුභව කෙරෙමින් වාසය කරණසේක. තමන්වහන්සේට ආවෙනික කුලුපග මිනිසුන්ටත් දෙනසේක. එකල එක්දවසක් උන්වහන්සේ සිඟන්ට ගිය කල්හි සොරු අවුත් ගසතුබූ අඹ කඩා ගෙණ ගියහ. එකෙණෙහි සිටුදූසතරදෙනෙක් අචිරවතී නම් ගංගාවෙහි ජලස්නානය කොට යන්නාහු ඒ අඹවනයට ගොස් වන්හ. එසඳ වෘද්ධභික්ෂූන් වහන්සේ සිඟාගිය තැනින් අවුත් තොපියැ මාගේ අඹකෑවොයයි කීසේක. ස්වාමීනි! අපි දැන් ආම්හ. අඹ නොකැම්හයි කීහ. එසේ තොපකීයතුදු මා අදහන්නේ නැතැයි දිවිරන්ට වුවමැනවැයි කියා ඔවුන් දිවුරුවා ලජ්ජා උපදවා අවසරදී යවූසේක. බුදුහු එපවත් අසා මෙසේ මොවුන් මේ මහණ දූන් මතු දිවුරුවූයේ නොවෙයි පෙරත් දිවුරුවූයේම වේදැයි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

අතීතයෙහි එක් කූටජටිලයෙක් බරණැස නිසා වසනුයේ අඹවනයෙක පන්සලක් කොට ගෙණ අඹරුකින් වගුළු අඹ අනුභවකෙරෙමින් තමා සමීපයට පැමිණි කුලුපග මිනිසුන්ටත් දිදී නොයෙක් මිථ්‍යාජීවයෙන් ජීවත්වන්නේය. එකල්හි අප මහබෝසතානෝ සක්දෙව්රජව ඉපද ලොකයෙහි මව්පියන්ට උපස්ථාන කරන්නාහු කවුරුඇද්දෝ, කුලදෙටුවන් පුදන්නාහු කවුරුඇද්දෝ, පන්සිල්, අටසිල්, රක්ෂාකරන්නාහු කවුරුඇද්

හෝ, පැවිදිව මහණදම් පුරන්නාහු කවුරුදෝහෝ, දුරාචාරයේ හැසිර අකුසල් පුරන්නාහු කවුරුදෝහෝයි නුවණැසින් බලන්නාහු අඹරක්නා කුටජටිලයා දැක මේ ජටිලයා නියුණුභාවනා ආදිවූ මහණදම් හැර අඹ රකා ඇවිදින්නේය. ඔහට සංවේග උපදවුව මැනවැයි ඔහු සිතා ගිය කල්හි තමන්ගේ ආනුභාවයෙන් සොරුන් අවුත් අඹ කඩා ගෙණ ගියා දක්වූහ.

එකල බරණැස්නුවර වැසි සිටුදූසතරදෙනෙක් ඒ අඹවනයට ගොස් වන්හ. ඒ කුටජටිලයා සිඟන්ට ගිය තැනින් අවුත් ඔවුන් සතරදෙනා දැක තෙපියැ මාගේ අඹ කෑවෝයයි කීය. එසඳ ඔහු වහන්ස! අපි දූන් ආම්හ. තුඹගේ අඹ නොකෑම්හයි කීහ. එසේ වීනම් දිවුරවයි කීය. දිවුළහොත් අප යාදෙන්නේ ඇද්දැයි කීහ. යාදෙමියි කීකල්හි යහපත වහන්සැයි කියා සතරදෙන දිවුරන්නාහු මින් එකක් තුඹගේ අඹකෑවු නම් වෘද්ධස්වාමියකු ලැබෙම්වයි කිවුය. එකක් සොළොස්ඇවිරිදි වයස නවයෞවනයෙහි සවාමියකු නොලදින් විසි පස් විසිහැවිරිදි කල මුහුකළ වයස සවාමියකු ලැබෙම්වයි. කීව. එකක් සවාමියකු කොරේ බලවත් ඇදිහිලි ඇතිව දෙහුදකලාව ගව් දෙගව් පමණ සලකුණු සිතැනට ගොස් ඔහු නො දක්ම්වයි කීව. එකක් හැඳ පැලඳ සුවඳමල් ආදියෙන් සැරහී යහන්හි උදකලාව හොවිම්වායි කීව. එබස් අසා කුටජටිලයා කියන්නේ තොප සතරදෙනා දිවුළ දිවිරීම ඉතා බැරැරුම්වූ දිවිරීමෙක් වන්නේය. අඹ කෑවෝ අනික් කෙනෙක්මය. තොපි හැම යවයි ඔවුන් සතරදෙනා යවූසේක. එසඳ සක්දෙව්රජ භයානක රූපයක් දක්වා ඒ කුටජටිලයා අඹවනයෙන් නෙරපීය. බුදුහු මේ ධම්මදෙශනාව ගෙණහැර දක්වා වදාරා එකල්හි කුටජටිලයා නම් දූන් මේ වෘද්ධමහණය. එකල සිටුදූසතරදෙන නම් දූන් මේ සිටුදූසතරදෙනාය. එකල ශක්‍රදෙවේන්ද්‍රයෝ නම් දූන් බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක. මෙහි විස්තර චතුක්කනිපාතයෙහි අම්බජාතකයෙන් දතයුත්තේ. මේ අම්බගොපකයාගේ වාසනාදෙෂ වන්නේ.

දුර්වචයාගේ වාසනාදෙෂ කාරේද? යත්:—

සැවැත්නුවර වැසි කුලපුත්‍රයෙක් මේ සර්වඥශාසනයෙහි මහණව ආචාර්ය්‍යඋපාධ්‍යායයන් වහන්සේත් ඉෂ්ටකාමී භික්ෂූන් වහන්සේත් කීවා නොකොට නො කී කරුව වාසයකරන්නේය. බුදුහු එපවත් අසා මේ මහණ දූන් මතු නොවෙයි, පෙරත් නො කීකරුම වේදැයි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

අතීතයෙහි එක්කලෙක අප මහබෝසතාණෝ ගිජුලිහිණි යෝනියෙහි ඉපද ගිජුලිහිණිසමූහයා පිරිවරා ගිජුකුළුපව්වෙහි වාසයකරන්නාහ. ඒ බොධිසත්ත්වයන්ගේ පුත්‍රයෙක් ඉතා බල වත්වූ ශක්ති ඇත්තේය. සෙසු ගිජුලිහිණියන්ගේ විෂය ඉක්ම ඉතා දුරුඅහසට නැඟෙන්නේය. ගිජුරජ එපවත් අසා ඔහු තමා සමීපයට කැඳවා ගෙන්වාගෙණ පුත! තෙපි ඉතා උස් අහසට නැඟෙව්ල, එසේ කරව් නම් තෙපි නොබෝ දවසකින් නැසෙව තොපි ගම්පමණ තැනකට නැගිකල මේ පෘථිවීතලය සතරැස් ලියද්දක්සේ පෙණෙන්නේ වී නම් එයින් මත්තට නො නැඟෙව, අවුරුදුදහසකට ආයුෂය ඇති ගිජුලිහිණියෝ තමතමන්ගේ විෂය ඉක්ම නැගිවහාම නටහයි කීහ. ඒ තමා නො කීකරුවන බැවින් උස්අහසට නැඟෙන්නේ පියා කැඩෙන්නාක් වැනිවූ කාලු වාතයට පැමිණ එයිනුදු උඩනැගී වෙරම්බවාතයට නොස් වන වේරම්බවාතවේගයෙන් කැඩී කැඩී අහසම මිය, සුණුවිසුණුවැ අතුරුධන්විය. බුදුහු මෙම ධර්මදෙශනාව ගෙණ හැර දක්වා වදාරා එකල්හි පියා කීවා නො කළ ගිජ්ඣපුත්‍ර නම් දූන් මේ නො කී කරු මහණ වන්නේය. එසමයෙහි ගිජුරජ්ජුරුවෝ නම් දූන් බුදුවූ මම්ම වේදූයි තමන්වහන්සේ දක්වා වදාළසේක. මෙහි විස්තර නවකනිපාතයෙහි ගිජ්ඣජාතකයෙන් දතයුත්තේය. මේ දුර්වචයාගේ වාසනාදෙෂ වන්නේය.

කුහකයාගේ වාසනාදෙෂ කවරේද? යත්:—

සැවැත්නුවර වැසි එක් කුලපුත්‍රයෙක් බුදුසස්නෙහි මහණව සතරපසය සඳහා තුන්වැදෑරුම් කොට කුහකවත් පුරන්නේය. බුදුහු ඔහු කුහක කමින් ජීවිකාව කරණබව අසා මේ දූන් මතු නොවෙයි; පූර්වහවයෙහිදු කොහොන්කම් කොට ජීවත්වූයේ ම වේදූයි වදාරා ඉකුත්වත් දක්වා වදාළසේක.

අතීතයෙහි බරණැස් රජ්ජුරුවන්ගේ පුරොහිත බ්‍රාහමණයාට දුව අවශ්‍යව බඩහොත් උද්දාලක නම් කුමාරයෙක් තක් සලානුවරට ගොස් ශාසත්‍ර ඉගෙණ පසල්දනව් මෙහි තපස්වීවරයන් සමීපයෙහි පැවිදිව උන්ට ආචාරිව එක්දවසක් ඒ තපස් වීවරයන්ට කියන්නේ වනමූල් වනඵලාඵල අනුභව කොට අරණ්‍යයෙහි වාසය කරන්ට සැප නො වෙයි, මිනිසුන් වසන තැන වසම්හයි කීය, තපස්විවරයෝ කියන්නාහු මනුෂ්‍යයෝ දන්දී බණඅස්නු කැමැත්තෝය, ප්‍රශ්නවිචාරණු කැමැත්තෝය, එසේ හෙයින් අපි ඒ ප්‍රශ්න විසර්ජනාදිය කිරීමෙහි භයින් ඔබ නොයම්හයි කීහ.

එබස් අසා තාපසයා කියන්නේ තෙපි හැම බණකීම් ආදියට බිය නො කරව, සක්විතිරජෙක්වී නමුත් ඔහු සිත්ගෙණ බණ කියන්ට මට බාරවන්නේයයි කියා, ඒ සියලු තපස්වීවරයන් කැඳවාගෙණ සැරිසරා ඇවිදිමින් බරණැස් නුවර උයනට ගොස් එහි ලැග පලමුවන දවස් නුවර වාසල්දොර ගමකට වැද ලැග දෙවෙනිදවස් අවුත් නුවරට වන්නේය. මනුෂ්‍යයෝ තපස්වීවරයන් දැක දන්දී ධර්මිෂ්ඨතපස්වීවරයෝ අපගේ නුවරට වැඩියහ. ඔහු බණ කියති, පැන විසඳතියි ගොස් රජ්ජුරුවන්ට දැන්වූහ. රජ්ජුරුවෝ ඔවුන් බස් අසා තපස්වීවරයන් දක්නටයෙමියි, කිවූය. එපවත් උද්දල තාපසයා අසා අවශෙෂ තපස්වීවරයන් කැඳවා කියන්නේ රජ්ජුරුවෝ අපහැම දකින්ට එත්ල, ඉසුරන් එක්දවසක් සිත්ගත්කල දිවිපමණින් ජීවත්විය හැක්ක, එසේ හෙයින් සමහරුන් වවුල්තපස් කල මැනව, සමහරුන් කටුමැස්සේ වැදහොත මැනව, සමහරුන් හිරමුදුනේ සිටිවේලෙහි සතර දිග ගිනිමැල සතරක් බැද ගිනිමැල සතර මැද්දේ වැදහෙව මුදුනේ හිරුරැසින් හා සතරදිග ගිනිරැසින් තැවී පඤ්චතාපතපප නය කලමැනව, සමහරුන් උදුසනම කරවටක් දියට බැස සිටිය මැනව. සමහරුන් ඒ ඒ තැන හිඳ මන්ත්‍රජල්පනය කල මැනවැයි, යොදු තෙමේ නුවණැති ප්‍රගුණ කරණලද වාසස්ථාන ඇති තපස්වීවරයන් සත්අටදෙනකු හැරගෙණ යහපත් දණ්ඩාසනයක විසිතුරු බණවස්නක් අතුට විසිතුරු පොත් තබාගෙණ අතැවැස්සන් පිරිවරාගෙණ යහපත් හස්නෙක හුන්නේය. එකෙණෙහි රජ්ජුරුවෝ පුරොහිතබ්‍රාහමණයා හා සමඟ මහ පිරිවරින් උයනට ගොස් මිථ්‍යාතපස්කරන්නවුන් දැක පැහැද උද්දලකයා කරා ගොස් සුවදුක් කථාකොට එකත්පස්ව හිඳ සතුටු සිතින් ඔවුන්ට ප්‍රශංසාකොට ගුණකිවූය. එසඳ පුරෝහිතබ්‍රාහමණයා රජ්ජුරුවන්ට කියන්නේ, මහරජ්ජුරුවන්වහන්ස! මූහැමදෙන සිල්වත් තපස්වීවරකෙණෙක් නොවෙති, ඇති කුගුණ සඟවා නැතිගුණ අඟවා දඹදිව්වැසි සත්ත්වයන් තමන්ගේ කුහක ප්‍රතිපත්තියෙන් නසති, එසේ හෙයින් මොවුන් හැමගේ අවුල්හැර පවුල් උදුරා ගෙණ ගිහි කැරැවුව මැනැවැයි කීය. රජ්ජුරුවෝ යහපතැයි කිවිස ඔවුන් හැමදෙන ගිහිකරවා උද්දලකයාට අනුපුරෝහිත තනතුරුදී, අවශෙෂයන්ට කඩුපළගදී, සෙවකකොට හැරගෙණ නුවරට වන්න.

මෙහි විස්තර පකිණ්ණකනිපාතයෙහි උද්දාලජාතකයෙන් දතයුත්තේය. සර්වඥයන්වහන්සේ මේ ධර්මදෙශනාව නෙණහැර

දක්වා වදුරා එසමයෙහි උද්දාලකයා නම් දූත් මේ කුහක මහණය, රජ්පුරුවෝනම් ආනන්දසථවිරයෝය, පුරෝහිතබ්‍රාහ්මණයා නම් තිලෝගුරු බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

මේ කුහකයාගේ වාසනාදෙෂය වන්නේය. මෙසේ මෙබඳු සත්ත්වයන්ගේ වාසනාදෙෂ හා අන්‍යවූත් සියදහස්ගණන් සත්ත්වයන්ගේ වාසනාදෙෂ මෙන් සත්පුරුෂය! තාගේ වාසනාදෙෂය දිව්‍යමනුෂ්‍යපර්ෂද් මධ්‍යයෙහි අනාගතයෙහි උපදනා සර්වඥවරයෝ ප්‍රකාශකොට කියන්නාහ. ඒ තාගේ වාසනාදෙෂය දෙව්මිනිස් පිරිස්මැද පහළ කොට කීමෙන් තට මහත්වූ නින්දාවන් නීයයි, අවවාද කරණසේක.

තවද සොඳුරුවූ සත්පුරුෂය! ශොක, පරිදෙව, දුක්ඛ, දෙමනස්සුපායාස නැමැති ජලයෙන් සම්පූර්ණවූ ජාති-ජරා-ව්‍යාධි-මරණ නැමැති මහත්වූ රළපහර බිඳුනාවූ ලොභ-ද්වෙෂ-මොහ-මද-මාන-මාත්සර්‍යාදි චණ්ඩමත්ස්‍යසමූහයාගෙන් ගැවසීගත්තාවූ ගෘහරාක්ෂසීයයි කියන ලද සත්‍රීන්ට වාසස්ථානවූ නොහොත් මාතුගාම නැමැති උදකරාක්ෂසයන් ගෙන් ගැවසී ගත්තාවූ තෘෂ්ණා නැමැති ගංගාජලය වැදීමට පිහිටවූ රූප ශබ්දාදි පඤ්චකාම කොඨාස නැමැති සළාවැට්ටුම් ඇති ඉතා ගැඹුරුවූ පරතෙර දක්ක නොහැකි සංසාරසාගරයෙහි ගැලෙමින් කාමවිතර්කාදි නැමැති තරඞ්ගවෙගයෙන් පහරණ ලදුව, ඇවිදිනාවූ තෝ දූත් ශීල-සමාධි-ප්‍රඥා-විමුක්ති-විමුක්තිඥාන දර්ශනාදි කෙහෙල් සුවඳ හැල්වී-මීඅඹ-තල්-පොල් ආදිවූ ඵලවෘක්ෂයෙන් සමෘද්ධවූ සත්තිස් බොධිපාක්ෂික ධර්ම නැමැති රත්නාකරයට වැද දිව්‍යසැපත් නිවන් සැපත් දෙන්නාවූ සිත්කලුවූ මාගේ ශාසන නැමැති දිවයිනට පැමිණ උතුම් බලවත් පිහිට ලැබගෙණ සංසාර නැමැති මුහුදින් නැගී කෙලෙස් නැමැති සැඩදියවතුරෙන් ගොස් අපාය නැමැති වඩබාමුඛයෙහි නොවැටෙන පිණිස බඹසරවස් රක්ෂාකරව.

තවද සත්පුරුෂය! තෝ සංසාර නැමැති රසාතලයට බට අවිද්‍යා නැමැති මහමුල් ඇති, මහත් ඝන සාරවූ සංස්කාර නැමැති කඳ ඇති, භවාග්‍රය දක්වා නැගී ජරා මරණ නැමැති අත් ඇති, සියලු ලොකයෙහි විසිර සිටි තෘෂ්ණා නැමැති අතුපතර ඇති, රූපාදි පඤ්චකාම විෂය නැමැති වනමල් පිපෙන්නාවූ දුක්නැමැති විෂඵලයෙන් භරිතවූ කර්මවර්තක්ලෙශවර්ත-විපාකවර්ත

සංඛ්‍යාත චෛත්‍රභූමිකවතී නැමැති විෂම්භක්ෂය කර්මස්ථාන මනස්කාර නැමැති පොරොවින් සංක්ෂෙපයෙන් සතරමහාභූතයන්ගේ මනස්කාරයෙන් කඩ කඩ කොට දෙසැත්‍රිස් කොට්ඨාසයෙහි විස්තරමනස්කාරයෙන් පළා නාම රූපපරිග්‍රහයෙන් කැබලි කැබැලි කොට ලෑහැලි වපුරා එම නාමරූපධර්මයන්ට ප්‍රත්‍යය පරියෙෂණය කිරීමෙන් මුල් උදුරා අනුපූර්විදර්ශනා නැමැති අව්සුළඟින් වියළා අභීත්ඵලප්‍රාප්ති නැමැති ගින්නෙන් දවා පිය.

එහෙයින් දුන්ම තෝ මදජලයෙන් යුක්තවූ කපොලස්ථල ඇති, ඒ කාරණයෙන්ම වැහෙන්නාවූ මදජල ඇති, භාඬගතාදයෙන් දෙඬමලුවූ මුහුණු ඇති, හස්තියක්හු වජ්‍රාංකුශයෙන් කොටා මදවා හික්මවන්නාක් මෙන් පඤ්චකාමවිෂයෙහි ලොල්වූ සිතට නුවණ නැමැති විදුරුඑබු අකුස්සෙන් පැහැර නිග්‍රහකර. එපරිද්දෙන් චිත්තනිග්‍රහකරන්ට තට ඉතා පිළිවන්ම වන්නේය. හේ කෙසේද? යත්:—

අතීතචිත්තය අතික්‍රාන්තම විය, අනාගතචිත්තය අසම්ප්‍රාප්තවිය, වර්තමාන චිත්තක්ෂණයම රක්ෂාකර. එසේ එපරිද්දෙන් චිත්තසංරක්ෂණය කිරීම තට බොහෝ කලක් හිත සැප පිණිස වන්නේය, යන මේ ආදි ක්‍රමයෙන් අනෙකප්‍රකාරයෙන් අවවාද කොට හිරුරැසින් පුබුදුවන මහපියුමක් මෙන් ඒ සත්ත්වයන්ගේ චිත්ත නැමැති පද්මය තමන්වහන්සේගේ අවවාදධර්මදෙශනා නැමැති සූර්යරශ්මීන් ප්‍රබොධ කොට ආකාශයට පැනනැගී ඇසිල්ලකින් මැත තමන් වහන්සේ වසන්නාවූ ගඳකිළියට වඩිනාසේක. එසේ හෙයින් කියනලදී.

"බොධෙනෙය්‍යං ජනං දිස්වා සතසහස්සෙපි යොජනෙ,
ඛණෙන උපගන්ත්වාන බොධයිස්සති සො ජිනො"යි.

තවද එසමයෙහි සියලු සතුන් කෙරෙහි කරණ ලද අනුකම්පා ඇති මහාකාරුණිකවූ දිපදෙත්තමවූ මහාමුනිවූ ඒ මෛත්‍රෙයසම්‍යක්සම්බුද්ධරජාණන් වහන්සේ තමන් වහන්සේ ෂට් අභිඥා ඇතිසේක්, තමන්වහන්සේ බඳු ෂට්අභිඥා ඇති භික්ෂූන් වහන්සේ විසින් පිරිවරණලද සේක. තමන්වහන්සේ මහත්වූ සෘද්ධි ඇතිසේක්, තමන්වහන්සේ බඳු මහත්සෘද්ධි ඇති භික්ෂූන් වහන්සේ විසින් පිරිවරණ ලදසේක. තමන් වහන්සේ චතුපටිසම්භිදාවට පැමිණි සේක් තමන්වහන්සේ බඳු චතුපටිසම්භිදාවට පැමිණි භික්ෂූන් විසින් පිරිවරණ ලද සේක. තමන්

වහන්සේ නිරුත්තිපදයෙහි දක්ෂවූසේක්, තමන්වහන්සේ බඳු නිරුත්තිපදයෙහි දක්ෂවූ භික්ෂූන්වහන්සේ විසින් පිරිවරණලද සේක. තමන්වහන්සේ බහු ශ්‍රැතවූසේක්, තමන්වහන්සේ බඳු බහුශ්‍රැතභික්ෂූන්වහන්සේ විසින් පිරිවරණදල සේක. තමන් වහන්සේ ධම්මධරවූසේක්, තමන්වහන්සේ බඳු ධම්මධරභික්ෂූන් වහන්සේ විසින් පිරිවරණලද සේක තමන්වහන්සේ ව්‍යක්තවූ සේක්, තමන්වහන්සේ බඳු ව්‍යක්තවූ භික්ෂූන්වහන්සේ විසින් පිරිවරණ ලද සේක. තමන්වහන්සේ සංඝශෝභනවූසේක්, තමන්වහන්සේ බඳු සංඝශොභනවූ භික්ෂූන්වහන්සේ විසින් පිරිවරණ ලද සේක. තමන්වහන්සේ සුදන්තවූසේක්, තමවහන් සේ බඳු සුදන්ත භික්ෂූන්වහන්සේ විසින් පිරිවරණ ලද සේක. තමන්වහන්සේ සොරතවූසේක්, තමන්වහන්සේ බඳු සොරත භික්ෂූන් වහන්සේ විසින් පිරිවරණ ලද සේක. තමන්වහන්සේ ධීරවූසේක්, තමන්වහන්සේ බඳු ධීරභික්ෂූන්වහන්සේ විසින් පිරිවරණ ලද සේක. තමන්වහන්සේ නාගවූසේක්, තමන්වහන්සේ බඳු නාගභික්ෂූන්වහන්සේ විසින් පිරිවරණ ලද සේක. තමන් වහන්සේ තාදිගුණයෙන් යුක්තවූසේක්, තමන්වහන්සේ බඳු තාදිගුණයෙන් යුක්ත භික්ෂූන්වහන්සේ විසින් පිරිවරණ ලද සේක. තමන්වහන්සේ නිසතිණ්ණසේක්, තමන්වහන්සේ බඳු නිසතිණ්ණ භික්ෂූන්වහන්සේ විසින් පිරිවරණ ලද සේක. තමන් වහන්සේ ශාන්තවූසේක්; තමන්වහන්සේ බඳු ශාන්ත භික්ෂූන් වහන්සේ විසින් පිරිවරණ ලද සේක. තමන්වහන්සේ අල්පෙච්ඡවූ සේක්, තමන්වහන්සේ බඳු අල්පෙච්ඡ භික්ෂූන්වහන්සේ විසින් පිරිවරණ ලද සේක. තමන්වහන්සේ සන්තුෂ්ටවූසේක්, තමන් වහන්සේ බඳු සන්තුෂ්ට භික්ෂූන්වහන්සේ විසින් පිරිවරණ. ලද සේක. තමන්වහන්සේ ප්‍රවිවික්තවූසේක්, තමන්වහන්සේ බඳු ප්‍රවිවික්තභික්ෂූන්වහන්සේ එසින් පිරිවරණලද සේක,තමන්වහන් සේ කුලෙහි ගණෙහි නො ඇලෙනසේක්, තමන්වහන්සේ බඳු කුලෙහි ගෙණෙහි නො ඇලෙන භික්ෂූන්වහන්සේ විසින් පිරිවරණලද සේක. තමන් වහන්සේ කෙලශසංලිඛතය කරණසේක්, තමන්වහන්සේ බඳු කෙලශසංලිඛතය කරණ භික්ෂූන්වහන්සේ විසින් පිරිවරණ ලදසේක. තමන්වහන්සේ වඩන ලද වීර්‍ය්‍ය ඇති සේක්, තමන්වහන්සේ බඳු වඩන ලද වීර්‍ය්‍ය ඇති භික්ෂූන්වහන් සේ විසින් පිරිවරණ ලද සේක. තමන්වහන්සේ ශීලසම්පන්න සේක්, තමන්වහන්සේ බඳු ශීලසම්පන්න භික්ෂූන්වහන්සේ විසින් පිරිවරණ ලද සේක. තමන්වහන්සේ සමාධිසම්පන්නසේක්,

තමන්වහන්සේ බඳු සමාධිසම්පන්න භික්ෂූන්වහන්සේ විසින් පිරිවරණ ලද සේක. තමන්වහන්සේ ප්‍රඥාසම්පන්නවූසේක්, තමන්වහන්සේ බඳු ප්‍රඥාසම්පන්න භික්ෂූන්වහන්සේ විසින් පිරිවරණලද සේක. තමන්වහන්සේ විමුක්තිසම්පන්නවූසේක්, තමන්වහන්සේ බඳු විමුක්තිසම්පන්න භික්ෂූන්වහන්සේ විසින් පිරිවරණ ලද සේක. තමන්වහන්සේ විමුක්තිඥානදර්ශන සම්පන්නවූසේක්, තමන්වහන්සේ බඳු විමුක්තිඥානදර්ශන සම්පන්න භික්ෂූන්වහන්සේ විසින් පිරිවරණ ලද සේක. තමන්වහන්සේ චෝදකවූසේක්, තමන්වහන්සේ බඳු චෝදක භික්ෂූන්වහන්සේ විසින් පිරිවරණ ලද සේක. තමන්වහන්සේ පාපගරහීවූසේක්, තමන්වහන්සේ බඳු පාපගරහී භික්ෂූන්වහන්සේ විසින් පිරිවරණ ලද සේක. තමන්වහන්සේ වක්තෘවූසේක්, තමන්වහන්සේ බඳු වක්තෘ භික්ෂූන්වහන්සේ විසින් පිරිවරණ ලද සේක. තමන්වහන්සේ භග්නකරණ ලද කෙලශයන් ඇතිසේක්, තමන්වහන්සේ බඳු භග්නකරණ ලද කෙලශයන් ඇති භික්ෂූන්වහන්සේ විසින් පිරිවරණ ලද සේක. තමන්වහන්සේ කෙලෙස්අවුල් හළසේක්. තමන්වහන්සේ බඳු කෙලෙස්අවුල් හළ භික්ෂූන්වහන්සේ විසින් පිරිවරණ ලද සේක. තමන්වහන්සේ පතිතමානධ්වජ ඇතිසේක්, තමන්වහන්සේ බඳු පතිත මානධ්වජ ඇති භික්ෂූන්වහන්සේ විසින් පිරිවරණ ලද සේක. තමන්වහන්සේ නසනලද සසර සිරගෙවල් ඇතිසේක්, තමන්වහන්සේ බඳු නසන ලද සසර සිර ගෙවල් ඇති භික්ෂූන්වහන්සේ විසින් පිරිවරණ ලද සේක. තමන්වහන්සේ සන්තානයෙන් උදුරණ ලද ශොක පරිදෙවාදී ඉන්ද්‍රඛීල ඇතිසේක්, තමන්වහන්සේ බඳු සන්තානයෙන් උදුරණ ලද ශොක පරිදෙවාදි ඉන්ද්‍රඛීල ඇති භික්ෂූන්වහන්සේ විසින් පිරිවරණලදසේක.

මෙසේ මෙබඳුවූ උතුම්වූ ගුණසමූහයෙන් යුක්ත කෙළලක්ෂයක් පමණ ක්ෂීණාශ්‍රව භික්ෂූන්වහන්සේ පිරිවරණලද ඒ මෛත්‍රෙය සම්‍යක්සම්බුදුරජානන් වහන්සේ පෙත්තෙන් පිරිවරණ ලද කෙසුරු මෙන්ද, කෙසුරෙන් පිරිවරණ ලද පියුම් කෙමියක් මෙන්ද, සප්තකූලපර්වතයෙන් පිරිවරණ ලද මහාමේරුපර්වතය මෙන්ද, පබළුවන් පිළිකඩින් වටකරණ ලද සවර්ණප්‍රාසාදයක් මෙන්ද, නොයෙක් සියදහස් ගණන් මිණිදඹුවැටපතන් මධ්‍යයෙහි පිහිටි දිලියෙන මහ පතන්රුකක් මෙන්ද, සුපිපි රත් පියුම්වන මධ්‍යයකට පැමිණි සවර්ණ නෞකාවක් මෙන්ද, අනූ දහසක් හංසයන් විසින් පිරිවරණ ලද සවර්ණහංසරාජයකු

මෙන්ද, වෘෂභසමූහයා විසින් පිරවරණ ලද වෘෂභරාජයක්හු මෙන්ද, ව්‍යාඝ්‍රසමූහයා විසින් පිරිවරණ ලද ව්‍යාඝ්‍රරාජයක්හු මෙන්ද, සිංහසමූහයා විසින් පිරිවරණ ලද කේශරසිංහරාජයක්හු මෙන්ද, හස්තිසමූහයා විසින් පිරිවරණ ලද ඡද්දන්ත නම් හස්තිරාජයක්හු මෙන්ද, අශ්වසමූහයා විසින් පිරිවරණ ලද වලාහක නම් අශ්වරාජයා මෙන්ද, තාරකාසමූහයා විසින් පිරිවරණ ලද පූර්ණ චන්ද්‍රමණ්ඩලය මෙන්ද, සහස්‍රරශ්මීන් පිරිවරණ ලද ශරත් සූර්ය්‍යමණ්ඩලය මෙන්ද, සතිස් යොදුනෙක පැතිර සිටි පක්ෂීන් පිරිවරණ ලද සක්විතිමහරජක්හු මෙන්ද, දිව්‍යසමූහයා විසින් පිරිවරණ ලද ශක්‍රදෙවේන්ද්‍රයා මෙන්ද, බ්‍රහ්මසමූහයා විසින් පිරිවරණලද සහම්පතී මහාබ්‍රහ්මයා මෙන්ද, තුන්සියයක් යොදුන් පමණඇති අන්තොමණ්ඩලයෙහිද, සසියයක් යොදුන් පමණ ඇති මධ්‍යමණ්ඩලයෙහිද, නවසියයක් යොදුන් පමණ ඇති මහාමණ්ඩලයෙහිද, සැරිසරා එඩනා සේක් ධර්මභේරිය පහරණසේක්, ධර්මශංඛය පිඹිනාසේක්, ධර්මධ්වජය නඟනසේක්, ධර්මකොන්තය ඔසවනසේක්, සිංහනාද කරණසේක්, ධර්මචක්‍රය පවත්වන සේක්, උතුම් චතුස්සත්‍යරස පානය කරවනසේක්, වෛනෙය ජන නැමැති මහාගංගාව ධර්මනැමැති වර්ෂාවෙන් පුරවනසේක්, ධර්මනැමැති හිණ බඳනාසේක්, ධර්ම නැමැති මහදොර සිටුවන සේක්, ධර්ම නැමැති මහනැව මෙහෙවර කරණසේක්, වෛනෙය ජන නැමැති පද්මාකරය ප්‍රබොධ කරණසේක්, කිසිකෙනකුන් ශරණශීලයෙහිද, කිසි කෙනකුන් පඤ්චශීලයෙහිද, කිසිකෙනකුන් ප්‍රව්‍රජ්‍යාවෙහිද, කිසි කෙනකුන් උපසම්පදාවෙහිද, පිහිටුවන සේක්, කිසි කෙනකුන්ට රූපාවචරධ්‍යානයද, කිසි කෙනකුන්ට අරූපාවචරධ්‍යානයද, කිසි කෙනකුන්ට විදර්ශනාද, කිසි කෙනකුන්ට මාර්ගඵලද, කිසි කෙනකුන්ට චතුපටිසම්භිදාවන්ද, කිසි කෙනකුන්ට අෂ්ටවරයද, කිසි කෙනකුන්ට අෂ්ටසමාපත්තීන්ද, කිසි කෙනකුන්ට ත්‍රිවිද්‍යාවන්ද, කිසි කෙනකුන්ට ෂඩ්අභිඥාවන්ද, දෙනසේක්, සියලු පෘථිවිමණ්ඩලයෙහි ශාසනය පතුරුවනසේක්, සංසාරදුඃඛයෙන් සියලු සත්ත්වයන් ගොඩනඟන සේක්, සියලු සත්ත්වයන්ට මාර්ගඵලාවබොධය කොට සත්ත්වයා විනයනය කෙරෙමින් වාසය කරණ සේක.

මෙසේ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේගේ පරිවාරසමෘද්ධිය හා චාරිකාගමන්ද දක්වා දැන් උන්වහන්සේගේ මාතෘ පිතෘ අග්‍රශ්‍රාවක- අග්‍රශ්‍රාවිකා- උපස්ථායක- උපස්ථායිකා-බොධිවෘක්ෂ සමෘද්ධිය දක්වන්නාවූ සර්වඥයන්වහන්සේ මෙසේවදාළසේක.

"මාතා බ්‍රහ්මවතී නාම සුබ්‍රහ්මා නාම සො පිතා,
පුරොහිතො සංඛරඤ්ඤො මෙත්තෙය්‍යස්ස තදා භවෙ.

අසොකො බ්‍රහ්මදෙවො ච අග්ගා හෙස්සන්ති සාවකා,
සීහො නාම උපට්ඨාකො උපසිස්සති තං ජිනං.

පදුමා චෙව සුමනා ච අග්ගා හෙස්සන්ති සාවිකා,
සුධනො චෙව සංඝො ච භවිස්සන්තග්ගුපට්ඨකා.

යසවතී ච සංඝා ච භවිස්සන්තග්ගුපට්ඨිකා,
බොධි තස්ස භගවතො නාගරුක්ඛො භවිස්සති.

වීසංහත්ථසතක්ඛන්ධො සාඛා වීසං සතානි ච,
පවෙල්ලිතග්ගා ලලිතා මොරහත්ථොව සොභති.

සුපුල්ලිතග්ගා සතතං සුරභී දෙවගන්ධිකා,
නාළිපූරං භවෙ රෙණු සුපුල්ලාවක්කමත්තකා.

අනුවාතපටිවාතම්හි වායති දසයොජනෙ,
අජ්ඣොත්ථරිස්සන්ති පුප්ඵානි බොධිමණ්ඩ සමන්තතො.

සමාගතා ජානපදා ඝායිත්වා ගන්ධමුත්තමං,
වාක්‍යංනිච්ඡාරයිස්සන්ති තෙන ගන්ධෙන මොදිතා.

සුභො විපාකො පුඤ්ඤානං බුද්ධසෙට්ඨස්ස තාදිනො,
යස්ස තෙජෙන පුප්ඵානං අචින්තෙය්‍යො පවායති"යි.

එසමයෙහි ශංඛ නම් චක්‍රවර්ති රජ්ජුරුවන්ගේ පුරොහිත වූ සුබ්‍රහ්මා නම් බ්‍රාහ්මණමහාසාරයාන කෙනෙක් මෛත්‍රෙය සර්වඥයන්වහන්සේට පියවන්නාහ. බ්‍රහ්මවතී නම් බැමිණි දේවී කෙනෙක් මවුවන්නාහ. එකාසංඛ්‍යකප්ලක්‍ෂයක් මුළුල්ලෙහි පිරූ පාරමිතා ඇති නුවණැත්තන් කෙරෙහි අගතැන්පත් වූ ප්‍රථම මහාශ්‍රාවකවූ අශොක නම් මහතෙර කෙනකුන්වහන්සේ දක්‍ෂිණශ්‍රාවක වනසේක. එසේම එකාසංඛ්‍යකප්ලක්‍ෂයක් මුළුල්ලෙහි පිරූ පාරමිතා ඇති සෘද්ධිමතුන් කෙරෙහි අගතැන්පත් වූ ද්විතීය මහාශ්‍රාවකවූ බ්‍රහ්මදෙව නම් මහතෙර කෙනකුන් වහන්සේ වාමශ්‍රාවක වනසේක. සංප්ලක්‍ෂයක් මුළුල්ලෙහි පිරූ පාරමිතා ඇති බහුශ්‍රැතාදීන් අතුරෙන් අගතැන්පත් වූ ධම්මභාණ්ඩාගාරිකවූ සීහ නම් මහතෙරකෙනකුන් වහන්සේ අපගේ සර්වඥයන්වහන්සේට ආනන්ද මහතෙරුන්වහන්සේ මෙන් මෛත්‍රෙයසර්වඥයන්වහන්සේට නිරන්තරයෙන් උපස්ථානකරණ සේක.

තවද එසමයෙහි පදුමා නම් සථවිරීය, සුමනා නම් සථවිරීය යන දෙදෙනෙක් අග්‍රශ්‍රාවිකා වන්නාහ. සුධනය, සංඛය යන සිටුවරු දෙදෙනෙක් අග්‍රඋපසථායක වන්නාහ. යසවතීය, සංඝාය යන උපාසිකාවරු දෙදෙනෙක් අග්‍රඋපසථායිකා වන්නාහ. ඒ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේට නාගවෘක්ෂයෙක් ශ්‍රී මහාබෝධිය වන්නේය. ඒ බෝධිවෘක්ෂයෙහි මඳ මඳ පවනට සැලෙන රන්වූ ලපලු අක් ලීලොපෙතව සැලෙමින් සිටිනේය. මරකත මාණික්‍යමයවූ පත් ඇති බැවින් ඉතා නිල්වූ ඒ බෝධිවෘක්ෂය ඝනකොට හසුරුවා බඳනාලද මොනරපිල්කලඹක් මෙන් ඉතා හොබනේය. හැමකලම උතුම් මනොඥවූ දිව්‍යසුවඳින් යුක්තවූ සුපිපි මල් ඇතිවන්නේය. එකි එකි මලෙහි නැළියක් පමණ රෙණු වන්නේය. පිපිමල් රථසකක් පමණ වන්නේය. ඒ පුෂ්පයන්ගේ දිව්‍යසුගන්ධය යටිසුලඟින් උඩුසුලඟින් හාත්පසින් දසයොදනෙක හමනේය. ඒ බෝධිමණ්ඩලය හාත්පසින් තුන්යොදනෙක නා, සපු, සිනිද්ද, බෝලිද්ද ද ඈ සමන් ආදිහු නොයෙක් සුවඳ මල් සලා රැස්කොට පුදන්නාහ. එතනට රැස්වූ දනව්වැසි, නියම්ගම්වැසි, සත්ත්වයෝ උතුම් පුෂ්පගන්ධය ආඝ්‍රාණය කොට ඒ සුගන්ධයෙන් සනතුෂ්ටවූවාහු සුගන්ධයක් ඉතා යහපත්තියාය සුගන්ධයක් ඉතායහපත්තියායැයි කියා සොම්නසින් යුක්තවූ ප්‍රීතිවාක්‍යය පවත්වන්නාහ යනාදි ගුණයෙන් යුක්තවූ ඒ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේගේ යම් බඳු සැපවිශෙෂයක් උපදවන්නාවූ කුශලානුභාවයෙන් මහාබෝධිවෘක්ෂයෙහි පුෂ්පයන්ගේ නොසිතිය හැකි මනොඥවූ දිව්‍යසුගන්ධය වටින් දසයොදනක් මාතයෙහි හමාද එහෙයින් උන්වහන්සේගේ කුශලවිපාකය නොයෙක් සැපයට ආසන්න කාරණ වන බැවින් ඉතා සැපවන්නේය.

එහෙයින් නුවණැත්තාවූ සත්පුරුෂයන් විසින් විශෙෂයෙන් කුශල් කටයුත්තේය.

තවද ඒ නාගශ්‍රීබෝධිය වූ කලි සුදු සිනිඳු රිදීකඳක් හා සමානව හවගත් වට මට කෙලින් නැගී ගැට නැති එක්සිය විසිරියනක් පමණ උස නැගි කඳ ඇත්තේය. එපමණ වූම පඤ්චමහාශාඛා ඇත්තේය. මූලපටන් අතුඅග දක්වා අතුර දෙසිය සතළිස් රියන් පමණ වන්නේය. එසේම පශ්චිමශාඛාග්‍රයෙහි පටන් පූර්වශාඛාග්‍රයට දෙසියසතළිස් රියනක් පමණ වන්නේය. දක්ෂිණශාඛාග්‍රයෙහි පටන් උත්තර ශාඛාග්‍රයට දෙසියසතළිස්

රියන් පමණ වන්නේය. හාත්පසින් සත්සියවිසි රියනක් පමණ වන්නේය. සතකොට හසුරුවා බඳනා ලද මොනරපිල් කලඹක් මෙන්ද, රිදීකඳක් මත්තෙහි තබන ලද කුළු නැති ඉන්ද්‍රනීල මාණික්‍යමය පර්වතයක් මෙන්ද, ශොභමානව සියලු පෘථිවි මණ්ඩලය සරහමින් සිටිනේය. ඒ බොධිවෘක්ෂයෙහි ලාටු හා පඬෙරපින් පත්ද තුවට්ටුවෙන් ගිලිහෙන්නාවූ පත්ද, නැතිවන්නේය. හැමසලම ඉන්ද්‍රනීලමාණික්‍යමය වූ පත් ඇතිව අතුරෙහි පබළ දළුහා සමාන මඳ මඳ පවනින් සැලෙන ලපලු පතින් සැරහී සිටිනේය. ඉඳුනිල්මිණිවන් අතුඅතරෙහි හටගත් එකී එකී නා කැකුළෙක් දෙළොස් නැළියක් පමණ පැන් ගන්නේය. පිපිමල් ශිහාරථඍකක් පමණ වන්නේය. එකී එකී මලෙක නැළියක් නැළියක් පමණ රේණු වන්නේය. ඒ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේ බුදුවන දවස් පිපිමල් අසූදහසක් අවුරුදු මුළුල්ලෙහි පරනොවී තිබී සර්වඥයන්වහන්සේ පිරිනිවන් පානා දවස් තුවට්ටුවෙන ගිලිහී රොන් සළා විසුරුවමින් සියලු සුවඳ දරින් මිශ්‍රවූ සඳුන් දරසැය මත්තෙහි වැගිරෙන්නේය. ඒ ශ්‍රී මහා නාගබෝධීන්වහන්සේට හාත්පසින් තුන්යොදනක් පමණ තැන නොයෙක් පැහැ ඇති මල්රුක් ඒ බොධීන්වහන්සේ පිරිවරා උන්වහන්සේට අභිමුඛව සිටිනේය. නොයෙක් පැහැ ඇති මල්පල ගන්නා ලතාජාතිය මනා සුවඳ ඇති නොයෙක් පැහැයෙන් බබළන්නාවූ මලින් සැදී දක්ෂිණාවෘතතව මුක්තාමාණික්‍යයෙන් කරණ ලද පවුරක් මෙන් වට සැරහී සිටිනේය. බොධීන්වහන්සේට වටින් අටයොදනක් පමණ ඇති භූමිය සත්රුවන් වැල්ලෙන් ගැවසී ගෙණ තිබෙන්නේය. ඒ සත්රුවන් වැලි පිට අනෙකප්‍රකාර වර්ණගන්ධයෙන් යුක්තවූ දියෙහි හොඬෙහි. පිපෙන්නාවූ සියලු සුවඳමල් අතුට තිබෙන්නේය. තවද එහි අතුරු නැතිවැ අනොජාමල්, එලතික, රත්තික, සීනිද්ද, බෝලිද්ද, දූසමන්, පලොල්, සපු, බක්මී, සලල, දෙඹ, කීත, දඹ, මූහුලුමල් ආදි මල්වැසි වස්නේය. හාත්පසින් රතුපුල්, නිලුපුල්, හෙලපුල්, රතැඹුල, හෙළඇඹුල, රත්පියුම්, හෙළපියුම් මිටියෙන් පුරණ ලද සවර්ණඝටපංකති සැරහී තිබෙන්නේය. සතරවාසල්දෙර සැඞියෙහි යුක්ත රත්නප්‍රදීපමාලාවෝ වන්නාහ. බොධිවෘක්ෂස්කන්ධයෙහි ඔලම්බකපද්මයන් ඇති මල්වියන් ආකාශයෙහි බැඳ තිබෙන්නේය. ආකාශයෙන් යන්නාවූ නොයෙක් පැහැ ඇති පක්ෂිසමූහයෝ මධුරනාදයෙන් පූජා කොට පැදකුණු කොට යන්නාහ. අතුපත් වෙළෙප් අතුරෙහි සැඟවී හිඳිනා පක්ෂිකෙනෙක්

නම් නැත්තාහ. මහාබ්‍රහ්මයාගේ කුශලානුභාවයෙන් උපන්නාවූ මරකත මාණික්‍යමයවූ ඡත්‍රයෙක්හි ශ්‍රී සමෘද්ධිය මඬනාක් වැනිවූ සකල ශ්‍රී සෞන්දර්‍ය්‍යයෙන් අග්‍රප්‍රාප්තවූ ඒ ශ්‍රී මහා බෝධිය බබලන්නේය. නිරන්තරයෙන් දිව්‍යමනුෂ්‍යයන් සහිත ලෝකවාසීන් විසින් සත්කාර ගරුකාර කරණ ලද්දේ වන්නේය. නාග-සුපර්ණ අසුර-ගන්ධර්ව-දිව්‍ය-බ්‍රහ්මයෝ නිරන්තරයෙන් බල බලා සිටිනාහුත් තෘප්තියකට නො පැමිණෙන්නාහ. මෙබඳු ආශ්චර්‍ය්‍ය ශ්‍රී සෞන්දර්‍ය්‍යයෙන් අග්‍රප්‍රාප්තවූ ශ්‍රී මහා බෝධියෙක් ඒ මෛත්‍රේය සර්වඥයන්වහන්සේට එසමයෙහි පහළ වන්නේය.

මෙසේ මාතෘ, පිතෘ, අග්‍රශ්‍රාවක, අග්‍රශ්‍රාවිකා, උපස්ථායක, උපස්ථායිකා, බෝධිවෘක්ෂ සමෘද්ධිය දක්වා දූන් ඒ මෛත්‍රේය සර්වඥන්වහන්සේගේ රූපකාය ප්‍රමාණාදි සමෘද්ධිය දක්වන්නාවූ සර්වඥයන් වහන්සේ මෙසේ වදාළසේක.

"අට්ඨාසීති හවෙ හත්ථා ආයාමෙනෙව සො ජිනො,
උරමහවෙපණ්ණුවීසං විකඛමෙහ තසස සත්ථුතො"යි.

ඒ මහාභාග්‍යවත්වූ මෛත්‍රේය සම්‍යක්සම්බුද්ධරජාතන්වහන්සේගේ බුද්ධකාය අටඅසූරියන් පමණ වන්නේය. සුප්‍රතිෂ්ඨිත පාදතලයෙහි පටන් දෙදනමඬලට දෙවිසිරියන් පමණ වන්නේය. දනමඬලයෙහි පටන් නාභිමඬලට දෙවිසිරියන් පමණ වන්නේය. නාභිමඬලයෙහි පටන් අකුධාතුවට දෙවිසිරියන් පමණ වන්නේය. අකුධාතුවෙහි පටන් ශිරොධාතුවට දෙවිසිරියන් පම වන්නේය. දකුණුඋර මඬලෙහි පටන් වම්උරමඬලට පස්විසිරියන් පළල වන්නේය. එකී එකී කණ සත් සත් රියන් පමණ වන්නේය. කන්වැල් සැලෙන්නාවූ ආකාරය විදුලිය සැලෙන්නාවූ ආකාරයක් මෙන් ශොභමාන වන්නේය. එකී එකී ඇස පස් පස් රියන් පමණ වන්නේය. සවර්ණච්ඡත්‍රයක් මස්තකයෙක හුනු ඉතානිල්වූ දෙව්දුනුසඟළක් වැනි සශ්‍රීකවූ බැමසඟළ පස් පස් රියන් පමණ වන්නේය. දෙබැම අතුර පස් රියන් පමණ වන්නේය. රත්අකුස්සක් හා සමාන උස්වූ නාසිකාව සත්රියන් පමණ වන්නේය. අතිරක්තවූ බිම්බඵලයක් හා සමාන අධරමාංසය පස්රියනක් පමණ වන්නේය. සිනිඳු මොළොක් තුනී ඉතාරත් දිගු පුළුල් දිව දසරියන් පමණ වන්නේය. ශිරොධාතුව වටින් පස්විසිරියන් පමණ වන්නේය. එසේම රන් කැටපතක් හා සමානවූ මුඛමඬලය වටින් පස්විසිරියන් පමණ වන්නේය. රන්මිහිගුඹරයක් මෙන් සමව වටවූ ග්‍රීවාධාතුව

වටින් පස්විසිරියන් පමණ වන්නේය. අනනන්ත නම් නාගරාජ ගාගේ දරණවැලයක් බඳුවූ සිත්කලු පිරිපුන් වටමටවූ අත්සගළ සතළිස් සතළිස් රියන් පමණ දිග ඇත්තේය. ජාලාවෙන් වල දනා ලද එකි එකී අතුල්තල පස් පස් රියන් පමණ වන්නේය. මෙසේ ශරීරප්‍රමාණය දක්වා දූන් ඒ මෛත්‍රෙය සර්වඥයන්වහන් සේගේ නෙත්‍රප්‍රමාණය දක්වන්නාවූ බුදුරජානන්වහන්සේ මෙසේ වදාළසේක.

"විසාලනෙත්තො උළාරක්ඛි විසුද්ධනයනො ඉසි,
අනිමිසං දිවාරත්තිං අඤ්ඤංවූලං මංසචක්ඛුනා
අනාවරණං පස්සෙය්‍ය සමන්තා ද්වාදසයොජනං"යි.

දිඹුළුලුල් පිරිසුදු නිම්මල පස්පැදිස්නා විසිතුරු මසැස් ඇති ඒ සර්වඥයන්වහන්සේ අනිමිසලොචනයෙන් රාත්‍රින්දිනයෙහි චතුරඞ්ගසමන්නාගත ඝනාන්ධකාරයෙහිත් අවටින් එකි එකී දිගින් දෙළොස් දෙළොස් යොදුන් ඇතුළත තුබූ හබඇට ආදි සියලු රූපද සාවරණවුත් මාංසචක්ෂුසෙහි ආනුභාවයෙන් ආව රණ රහිතව පෙණෙන්නා දක්නාසේක. මෙසේ නෙත්‍රසම්බන්ධය දක්වා දූන් ඒ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේගේ රශ්මිසම්බන්ධය දක්වන්නාවූ බුදුරජානන්වහන්සේ මෙසේ වදාළසේක.

"පභා නිද්ධාවති තස්ස යාවතා පණ්ණ වීසති,
සොභති විජ්ජුලට්ඨී ච දීපරුක්ඛො ච සො ජිනො
රතනගඝිකසංකාසො භානුමා විය භාසති.
ලක්ඛණාබ්‍යජනා රංසා දිස්සන්ති සබ්බකාලිකා
පතන්ති විවිධා රංසා නෙකසතසහස්සියො"යි.

ඒ භාග්‍යවත්වූ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේගේ ව්‍යාමප්‍ර භාසංඛ්‍යාත ඝනවූ රශ්මිමණ්ඩලය ආයුපමණින් පස්විසි යොදුනක් මාතයේ පැතිර සිටින්නේය. ඒ සර්වඥයන්වහන්සේ ඝනාහිනිල්වූ ආකාශයෙහි සැලෙන්නාවූ විද්‍යුලියකලඹක් මෙන්ද, ගිලිහෙන්නාවූ ලක්ෂගණන් ජ්වාලාවෙන් ගැවසීගත්තාවූ ප්‍රජ්වලිත මහාප්‍රදීපවෘක්ෂයක් මෙන්ද, අවාසූරියන් උස ඇති ප්‍රභාසමූහයෙන් බබලන්නාවූ සත්රුවන් ඇගෑයක් මෙන්ද, සහස්‍ර රශ්මින් දිලියෙන්නාවූ සූය්‍ර්‍යයා මෙන්ද, විශෙෂයෙන් බබලනසේක. එකල ඒ සර්වඥයන්වහන්සේගේ ශරීරයෙහි පිහිටියාවූ ද්වාත්‍රිංශත්වර මහාපුරුෂලක්ෂණයෝ පිළිවෙළින් සිටුවන ලද චන්ද්‍රදිව්‍යපුත්‍රයන් දෙතිස්දෙනකුගේද, සූය්‍ර්‍යදිව්‍යපුත්‍රයන් දෙතිස්දෙනකුගේද

චක්‍රවර්තිරජ්ජුරුවන් දෙතිස්දෙනකුගේද, චරම්රජදරුවන් දෙතිස්දෙනකුගේද, ශක්‍රදෙවේන්ද්‍රයන් දෙතිස්දෙනකුගේද, සුයාම දිව්‍යපුත්‍රයන් දෙතිස්දෙනකුගේද, සන්තුෂිතදිව්‍යපුත්‍රයන් දෙතිස්දෙනකුගේද, සුනිර්මිතදිව්‍යපුත්‍රයන් දෙතිස්දෙනකුගේද, මහාබ්‍රහ්මයන් දෙතිස්දෙනකුගේද, ශ්‍රී සමෘද්ධිය මැඩපවත්වන්නාවූ ශ්‍රී සමෘද්ධියෙන් යුක්තවන්නාහ. ඒ දෙතිස්මහාපුරුෂලක්ෂණයෙන් බබලන්නාවූ සර්වඥයන්වහන්සේගේ ශ්‍රී ශරීරය නැංගාවූ තාරකාසමූහයෙන් දිලියෙන ආකාශතලයක් මෙන්ද, විකසිත පද්මෝත්පලපුණ්ඩරීකයෙන් දිලියෙන්නාවූ මහාවිලක් මෙන්ද, නොයෙක් මාණික්‍යාලෝකසමූහයෙන් බබලන්නාවූ භූමිතල ඇති රත්නාකරයක් මෙන්ද් විශේෂයෙන් බබලන්නේය.

තවද ඒ සර්වඥයන් වහන්සේගේ අසූඅනුව්‍යඤ්ජනයෙන් දිලියෙන්නාවූ ශරීරය සන්ධ්‍යාවලාපටලයකින් හා සියරැලිවිදුලිය දෙව්දුනු ආදියෙන් රැඳීගිය රන්සිරිකුළක් හා සමාන වන්නේය. ඒ සර්වඥයන්වහන්සේගේ ශරීරයෙන් නික්ම හැසිරෙන්නාවූ ෂට්වර්ණඝනබුද්ධරශ්මීහු ඉන්ද්‍රනීලමාණික්‍යමය ඝටයෙකින් නික්මුනාවූ නිල්මිණිරසධාරාවෙන්ද, ස්වර්ණඝටයෙකින් නික්මුනු කුංකුමරසධාරාවන් මෙන්ද, ප්‍රවාලඝටයෙකින් නික්මුනු සුපක්වලාක්ෂාරසධාරාවන් මෙන්ද, රජතඝටයකින් නික්මුනාවූ ක්ෂීරරසධාරාවන් මෙන්ද, නික්ම කරකැවි කරකැවී යුවල යුවලව නාඹතල්කඳ රළුසක්සේ සත්කුළුගෙවල් ආදි ප්‍රමාණව දසදහස් සක්වළ එකාවතීව යටින් වාපොළොව ඉක්ම මත්තෙන් භවාග්‍රය ඉක්ම ශාසතානන්තධාතය දක්වා අතුරුනැතිව ප්‍රමාණාතික්‍රාන්ත සක්වළ පැතිර පවත්නාහ. මෙසේ රශ්මිසමෘද්ධිය දක්වා දූන් ඒ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේගේ පද්මසමෘද්ධිය දක්වන්නාවූ බුදුරජාණන්වහන්සේ මෙසේ වදාළසේක.

"පදුඩාරෙ පදුඩාරෙ සුපුල්ල පදුමා රුහා,
තිංසහත්ථා මහාපත්තා අනුපත්තා පණ්ණුවීසති.

කෙසරා වීසති හත්ථා කණ්ණිකා සොළසමහවෙ,
සුරත්තරේණු හරිතා පදුම කොසමත්තරෙ"ති.

ඒ භාග්‍යවත්වූ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේ එබූ එබූ පියවරක් පියවරක් පාසා චක්‍රලක්ෂණයෙන් ජනිතවූ පාදතලයන් පිළිගණිමින් සුපිපි මහපියුම් පොළොව පලාගෙණ නැගෙන්

නේය. ඉන් එකි එකී පියුමෙක තිස්රියන් පමණ මහපෙති වන්නේය. පස්විසිරියන් පමණ අනුපෙති වන්නේය. විසිරියන් පමණ මල්කෙසුරු වන්නේය. සොළොස්රියන් පමණ කෙමි වන්නේය. එකි එකී මලෙක අමුණක් අමුණක් පමණ රේණු වන්නේය. ඒ සර්වඥයන් වහන්සේ ශ්‍රීපාද එබූ එබූ වේලෙහි දූහිගුල්සුණු හා සමාන වූ ඉතා රත් රොන්සළා කේතුමාලාවෙන් සමලඞ්කෘතවූ නිල් වූ ශිරොධාතුව දක්වා නැඟි සවර්ණප්‍රතිමාවක ලාක්ෂාරසධාරාවන් තවරන්නාක් මෙන් උන්වහන්සේගේ සකල ශරීරය හාත්පසින් තවරා සරහමින් ශ්‍රීපාදමූලයෙහි වැගිරෙන්නේය. අතුර තුරෙහි බලාකාවර්ණ සෙවතපද්මයෝද පොළොව පළාගෙණ නැඟී ඒ සර්වඥයන්වහන්සේගේ ශ්‍රීපාදය ගොබවන්නේය.

මෙසේ උපමාවිෂයාතික්‍රාන්තවූබුද්ධශ්‍රීන් හා අනන්තාපරිමාණ බුද්ධවිලාශයෙන් යුක්තව දෙව්මිනිසුන් සහිතවූ සියලු ලොකයෙහි බුද්ධරාජ්‍යය කරණසේක. මෙසේ රූපකාය ප්‍රමාණ සම්පත්-නෙත්‍ර සම්පත්-රස්මිසම්පත් දක්වා දූන් ඒ මෛත්‍රෙය සර්වඥයන් වහන්සේට කාමාවචර දෙවතාදීන් විසින් කරන්නාවූ රත් රුවන් ඇගෑ ආදිවූ පූජාවිශෙෂය දක්වන්නාවූ සර්වඥයන්වහන්සේ මෙසේ වදාළසේක.

"කාමාවචරිකා දෙවා නිම්මිනිස්සන්ති අඞ්ගණෙ,
නාගරාජා සුපණ්ණා ච තදා තෙලං කරිස්සරෙ.

අට්ඨ සොණ්ණමයා අඞ්ගී අට්ඨ රූපිමයා පි ච,
අට්ඨ මණිමයා අඞ්ගී අට්ඨ පවාළමයා පි ච.

අනෙක රතනවිචිත්තා ධජමාලා විභූසිතා,
ඔලම්බමානා කීළන්ති ධජානෙකසතා බහු.

මණිමුත්තදාමභූසිතා විතානා හෙමසණ්ඨිතා,
පරික්ඛිත්තා කිඞ්කිණිකජාලා වට්ටංස කළිතා යුතා.

නානාපුප්ඵා විකිරිස්සන්ති සුරභිගන්ධ ගන්ධිතා,
විවිධා නානාචුණ්ණානි දිබ්බමානුසකානි ච.

විචිත්ත නානා දුස්සානි පඤ්චවණ්ණක සොභනා,
අභිප්පසන්නා බුද්ධස්මිං කීළිස්සන්ති සමන්තතො.

හත්ථසහස්සමුබ්බිද්ධා දස්සනෙය්‍යා මනොරමා,
රතනඝටිතතොරණා තස්ස අසම්බාධා සුසණ්ඨිතා.

ඔභාසමානා පදිස්සන්ති විසාලා සබ්බතො පභා,
තෙසං මජ්ඣගතො බුද්ධො භික්ඛුසඞ්ඝපුරක්ඛතො.

බ්‍රහ්මාව පාරිසජ්ජානං ඉන්දූව විමානන්තරෙ,
ගච්ඡන්ති බුද්ධෙ ගච්ඡන්තෙ තිට්ඨමානම්හි ඨස්සරෙ.

නිසින්නෙ සයිතෙ චාපි සත්ථරි සඞ්ඝපාරිසෙ,
චතු ඉරියාපථෙ නිච්චං ධාරයිස්සන්ති සබ්බසො.

එතෙචඤ්ඤෙ ච පූජායො දිබ්බමානුසකානි ච,
විවිධානි පාටිහීරානි හෙස්සන්ති සබ්බකාලිකා.

ආගතා පුඤ්ඤතෙජෙන මෙත්තෙය්‍යමභිපූජිතුං,
දිස්වාන තං පාටිහීරං නානාජච්චා මහාජනා
සපුත්තදාරා පාණෙහි සරණං ගෙස්සන්ති සත්ථුනො.

යෙ බ්‍රහ්මචරියං චරිස්සන්ති සුත්වාන මුනිනො වචං,
තෙ තරිස්සන්ති සංසාරං මච්චුධෙය්‍යං සුදුත්තරං
බහුවිධම්මචක්කං විසොධෙස්සන්ති තෙ සදා.

දසහි පුඤ්ඤකිරියාහි තීහි සුචරිතෙහි ච,
ආගමාධිගමෙහෙව සොභයිත්වාන සාසනං.

අනුධම්මචාරිනො හුත්වා බහුසඞ්ගුපගා භවෙ,
නසක්කා සබ්බසො වත්තුං එත්තකාං ඉති වා සයං
අච්චන්තං සුඛිතා නිච්චං තස්මිං තො කාලසම්පදෙ"ති.

එසමයෙහි ඒ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේගේ ගඳකිළිය පිරිවරා හාත්පසින් කාමාවචර දිව්‍යලොකවාසීවූ දෙවතාවෝ නොයෙක් රන් රුවන් ඇඟෑමවන්නාහ. ඉන් ඇඟෑඅටෙක් සවර්ණමය වන්නේය. අටෙක් රජතමය වන්නේය. අටෙක් මැණික්මය වන්නේය. අටෙක් පබළුමය වන්නේය. නොයෙක් සිය දහස් ගණන් මල්ඇඟෑගඳකිළිය සතරදිග සැරහී සිටින්නේය. ඒ සියලුම ඇඟෑඋසින් අටඅසූරියන් පමණ වන්නේය. මහානුභාව සම්පන්න නාග-සුපර්ණ- ගන්ධර්වාදීහු නොයෙක් සැරහීමෙන් හා අනෙකරත්නයෙන් විචිත්‍රවූ ධවජමාලාවෙන්ද, මුතුදම්, මැණික්දම්, රන්රිදීදම්, සුවඳදම්, මල්දම්, රන්රසුදූල්, මල්කලස මල්කැන් ආදියෙන්ද, හාත්පසින් එල්වන ලද රන්තරු-රිදී තරු-මැණික්තරු ආදියෙන් විසිතුරුවූ සත්රුවන්මය වීය තින්ද, ඒ සියලු රන්රුවන් ඇඟෑ සරහන්නාහ. හැමකල්ව නො

යෙක් දිව්‍යසුවඳමල් වැසි වස්නාහ. දිව්‍යසුගන්ධයෙන් එකසුගන්ධවූ
අනෙකප්‍රකාර දිව්‍යමානුෂිකවූ සඳුන් සුණු ආදි දිව්‍යසුවඳසුණු විසු
රුවන්නාහ. ඒ ඇගෑමධ්‍යයෙහිත් එසේම විසිතුරුවූ පස්වණක්
පැහැඇති නොයෙක් ප්‍රභාසමූහයෙන් බබලන්නාවූ දිව්‍යවස්ත්‍රා
යෝ සියලු දිගත් ලෙළි ලෙළී සිටිනාහුය.

ඒ මෛත්‍රෙය සර්‍වඥයන්වහන්සේ කෙරෙහි ප්‍රසන්නවූ සියලු
දිව්‍යමනුෂ්‍යයෝ සතුටින් කුල්මත්ව නොයෙක් කෙළි කෙළනා
හ. ගී කියන්නාහ. ඔල්වරහඬ ගසන්නාහ. පොළොසන් දෙන්නා
හ. පිළිහිස සිසාරන්නාහ. අසුරුසන් දෙන්නාහ. සාධුකාර දෙන්
නාහ. හාත්පසින් ඒකනිඝෝෂ එකනින්නාද කරන්නාහ. ගඳ
කිළිදෙරකඩ පිහිටියාවූ සෙසුඇගෑයට වඩා විශිෂ්ටවූ දහසක්
රියන් උස ඇති, මනාව පිහිටි විශෙෂවත්සටහන් ඇති, දර්ශනීය
සිත්කළුවූ රුවන්ඇගෑ හා රුවන් තොරණ සමූහයක් ඉන් ඒව
අසම්බාධව පිහිටි විශාලවත් විචිත්‍රවත් රන්ධජ රිදීධජ මැණික්
ධජ ආදි නොයෙක් සියදහස් ගණන් ධජමාලාවෙන් ගැවසී
ගෙණ සර්‍වශොභාගයෙන් අලඞ්කෘතව බැබලි බැබලී සිටිනේය.
ඒ ඇගෑ තොරණ දෙකට අතුරෙහි පොළොව පළාගෙණ නැගි
රත්නමණ්ඩපමධ්‍යයෙහි පිහිටි රත්නපර්‍යඞ්කමස්තකයෙහි භික්ෂු
සංඝයාවහන්සේ පිරිවරා වැඩහුන්නාවූ මෛත්‍රෙය සම්‍යක්සම්බු
දුරජානන්වහන්සේ බ්‍රහ්මපාරිෂද්‍ය බ්‍රහ්මලොකයෙහි බ්‍රහ්මසමූහයා
පිරිවරා හුන්නාවූ සහම්පති මහාබ්‍රහ්මයා මෙන්ද, දිව්‍යසමූහයා
විසින් පිරිවරණ ලදුව පාණ්ඩුකම්බල ශෛලාසනමස්තකයෙහි
හුන්නාවූ ශක්‍රදෙවෙන්ද්‍රයන් මෙන්ද, විශෙෂයෙන් බබලනසේක.
ඒ භාග්‍යවත්වූ සර්‍වඥයන්වහන්සේට වැඩහිඳිනා පිණිස පො
ළොව පළාගෙණ සත්රුවන්මය මණ්ඩපයක් නැගෙන්නේය.
ඒ මණ්ඩපය තෙමේ වටින් දොළොස්යොදනක් පමණ වන්නේය.
ඒ මණ්ඩපය සතරකොණ තිස්රියන් පමණ දිග ඇති ඝණ්ඨා
සතරෙක් එල්ලෙන්නේය. ඒ ඝණ්ඨාසතර පවනින් සැලෙන්ට
පටන්ගත් කල්හි එහි නාදය සක්වළගබ පැතිර එකනින්නාද
කරන්නේය. මණ්ඩපමධ්‍යයෙහි සර්‍වරත්නයෙන් සමලඞ්කෘතවූ
මාණික්‍යපර්‍යඞ්කයක් වන්නේය. ඒ පර්‍යඞ්කමස්තකයෙහි සර්‍ව
රත්නමයවූ ධවලච්ඡත්‍රයෙක් වන්නේය. ඒ පර්‍යඞ්කමධ්‍යයෙහි
වැඩහිඳ මෛත්‍රෙය සම්‍යක්සම්බුදුරජානන්වහන්සේ දෙව්මිනිසුන්
සහිත ලොකවාසීන්ට ධර්‍මදෙශනා කොට අග්‍රධර්‍මවූ අභීත්ඵලය
දෙවා වදාරණසේක. ඒ භාග්‍යවත්වූ සර්‍වඥයන්වහන්සේගේ
කුශලානුභාවයෙන් උපන්නාවූ රන්ඇගෑ, රිදීඇගෑ, මැණික්

ඇඟෑ, පබළුඇඟෑ, රන්තොරණ, රිදීතොරණ, මැණික්තොරණ පබළුතොරණ, රන්ධජ, රිදීධජ, මැණික්ධජ, පබළුධජ, රන්දම් රිදීදම්, මැණික්දම්, පබළුදම්, සත්රුවන්දම්, රන්කලශ, රිදීකලශ, සත්රුවන්කලශ, රන්මල්, රිදීමල්, නන්විසිතුරු දිවදුහුල්, පස්වණක් පැහැ ඇති දිවපිළී, මලලොඹු, සර්වරත්නයෙන් විචිත්‍ර වූ පටකඩවියන්, සුවඳමල්පිරූ රන්මාලා, රිදීමාලා, සත්රුවන් මාලා, සුවඳසුණුපිරූ රන්කරඬු, රිදීකරඬු, සත්රුවන්කරඬු, නන්විසිතුරු රුවන්කර්මාන්ත කරණ ලද මිටි ඇති රන්චාමර රිදීචාමර, රන්තල්වැට, රිදීතල්වැට, රන්කැටපත්, රිදීකැටපත්, ආදිවූ නොයෙක් පූජාභාණ්ඩවිශේෂය ඒ භාග්‍යවත්වූ සර්වඥයන් වහන්සේ වඩනාකල්හි කැටුවම යන්නේය.

පිරිවරසහිත සර්වඥයන්වහන්සේ වැඩසිටිතෙක වැඩහුන් තෙක ඒ පූජාවිශේෂයන් හැමකලම දෙවියන් අල්වාගෙණ සිටිනා පූජාභාණ්ඩයක් මෙන් හැමවේලෙහිම සර්වඥයන්වහන්සේ පිරිවරාගෙණ සිටිනේය. ඒ මෛත්‍රය සම්‍යක්සම්බුද්ධරජානන්වහන්සේට පූජාකරණු සඳහා ආවාවූ නොයෙක් දෙවියන් හා ක්ෂත්‍රිය බ්‍රාහමණ වෛශ්‍ය ශුද්‍ර සංඛ්‍යාත චතුර්වර්ණමහාජනයෝ ඒ ප්‍රාතිහාර්‍ය්‍යය දැක ප්‍රසන්නවූ සිත්ඇත්තාහු තමතමන්ගේ පුත්‍රදාරයන් හා සමඟ සර්වඥයන්වහන්සේගේ සරණ යන්නාහ. ඒ භාග්‍යවත්වූ බුදුරජානන්වහන්සේ මාණික්‍යපර්‍ය්‍යඞ්කමස්තකයෙහි වැඩහිඳ මේ ත්‍රිසහස්‍රී මහාසහස්‍රී ලොකධාතුවත් තමන්වහන්සේගේ ධර්මදෙශනාශබ්දයෙන්ම අස්වා බණ වදාරණසේක.

රත්නමය මණ්ඩපයෙහි රත්නාලොකයෙන් හා මැණික් ඇඟෑයෙහි මැණික්ආලොකයෙන් හා වියන් තොරණ පිළී රන් රිදී කරඬු කැටපත් ආදියෙහි ආලොකයෙන් හා දශබලධාරීවූ බුදුරජානන්වහන්සේගේ ශ්‍රී ශරීරාලොකයෙන් නිෂ්ප්‍රභවූ සූර්‍ය්‍යයා රාත්‍රින්දිනයෙහි විභාන දක්වන්ට අසමර්ථ වන්නේය. බුදුන්ගේ ශරීරාලොකයම. අතුරු නැතිව ලොකයෙහි පැතිර සිටිනේය. එසමයෙහි සවස උදෑසන අඬනගන්නාවූ කුකුළුආදී පක්ෂීන්ගේ ශබ්දයෙන් හා සවස පිපෙන දෑසමන් සීනිද්ද බෝලිද්ද සෙපාලිකා ආදි මලින් හා උදෑසන පිපෙන නාමල් සපුමල් රත්නෙළුම් නෙලනෙළුම් ඇඹුල උපුල ආදි නොයෙක් මල්පිපෙන සලකුණෙන්ම ලොකවාසී සත්ත්වයෝ රෑය, දවලය, යන වෙනස දැනගන්නාහ. ඒ දශබලධාරීවූ සර්වඥයන්වහන්සේ අතීත

හවයෙහි නොයෙක් සර්වඥවරයන්වහන්සේට කරවා පිළිගන්වනලද සත්රුවන්මණ්ඩපවල විපාකයෙන් හා පූජාපිණ්ඩ කරවනලද රත්රුවන් ඇඟෑ ආදියෙහි විපාකයෙන් උපන්නාවූ සත්රුවන්මණ්ඩපය සකලලෝකශ්‍රිය එකතැනට රැස්කොට ලූවාක් මෙන් සශ්‍රීක වන්නේය. මණ්ඩපය ඒ ඒ කොණ සුවඳමල් සුවඳදුමින් සුවඳකවන ලද මිහිරි සිහිල් පැන් පිරුණු රන් රිදී රුවන් කළස හා සිව්දූගඳ පිරුණු රුවන්කරඬු අතුරු නැතිව පිළිවෙළින් සිටිනේය.

තවද දිවසුවඳ දුමින් පිරුණු රන් රිදී මැණික් සත්රුවන්මය දුම්බුළුසුණු හා සුවඳසුණු පිරුණු රන් රිදී රුවන් කරඬු හා සුවඳතෙල් පිරුණු සකලරාත්‍රියෙහි ඇවිලෙන සත්රුවන්මය පහන්රුක් සතරදිග අතුරු නැතිව පිළිවෙළින් සිටිනේය.

තවද රන්පියුම් හෙලපියුම් රතැඹුල හෙලඇඹුල රතුපුල් නිලුපුල් එළඋපුල් මිටියෙන් ගැවසීගත් රන් රිදී මැණික් පබළු ලොහිතඞ්ක ශංඛ ශිලා ප්‍රවාල මැසිරිගල් පිළිවහණ සත්රුවන් ආදියෙන් කරණ ලද සම්පූර්ණ සව්මාලාවෝ අතුරු නැතිව පිළිවෙළින් සිටිනාහ. මත්තෙහි සර්වරත්නයෙන් විචිත්‍ර ) බබලන්නාවූ ධජමාලාවෝ ලෙලි ලෙලී සිටිනාහ. එසේම විචිත්‍ර රත්නමාලාවෙන් අලංකෘතවූ ධවලාතපත්‍රපංක්තිය හාත්පසින් පිළිවෙළින් අතුරු නැතිව මස්තකය හොබවා සැරහී සිටිනේය. ඒ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේට උපාසකවරුන් ආරාධනා කොට තමන් තමන්ගේ ගෙවලට වඩානකල්හි සත්රුවන් මණ්ඩපය ආකාශයෙන් ගොස් ගෙදොරවල පිහිටන්නේය. ඒ මණ්ඩපයෙහි එලෙන්නාවූ ඝණ්ඨානාදයෙන් දශබලධාරීවූ බුදුරජාතන්වහන්සේ දූන් දූන්ම වඩනාසේකැයි දූන මනුෂ්‍යයෝ පෙරගමන් කරන්නාහ.

ඒ මනුෂ්‍යයන් අතුරෙහි දෙවියන් හා නාගමානවකාදීහු භොජනශාලාමෙහි වලඳවන්නාහ. එසමයෙහි සර්වඥයන්වහන්සේ හා භික්ෂූන්වහන්සේට අටලොස්වගීයේ පූපාපූප හා නොයෙක් රසමසවුලෙන් යුක්තවූ සුවඳ ඇල්හාල් බත් දෙන්ට අසමර්ථ කෙනෙක් නම් නැත්තාහ. අනුමෙවෙති ධර්මදෙශනා කරන්නාවූ ඒ සර්වඥයන්වහන්සේගේ ශබ්දය සියලු සක්වළ එකාපැහැර පැතිර සිටින්නේය. සියලුමනුෂ්‍යයෝ තමන් තමන්ගේ ගෙවලම සිටියාහු බුද්ධාලම්බන ප්‍රීති උපදවා රත්නමණ්ඩපයෙහි ඒ ආශ්චර්ය්‍යවත් ප්‍රාතිහාර්ය්‍ය හා ඇඟෑ පියුම් ආදිය හා සර්වඥවිලාසය

දැක තමන් තමන්ගේ ලබ්ධි හැර සර්වඥයන්වහන්සේගේ ශරණ ගොස් පඤ්චශීලාදී ශීලයෙහි පිහිටා උතුම් බඹසරවස් රක්‍ෂා කොට මාර්ගඵල උපදවා සකලක්ලේශයන් නසා අග්‍රධර්මවූ අර්හත් ඵලයට පැමිණෙන්නාහ. සියලු ලෝකයෙහි අන් පාෂණ්ඩක කෙනෙක් වත් අන් ප්‍රව්‍රජිත කෙනෙක් වත් නො වන්නාහ. බොහෝ ජනසමූහයෝ දන ශීලාදි දශපුණ්‍යක්‍රියා වස්තූන් හා කාය සුචරිතාදි ත්‍රිවිධ සුචරිතයෙන් හා ත්‍රිපිටකධාරී වීමෙන් හා මාර්ග ඵල ඉපදවීමෙන් සර්වඥශාසනය බබුලුවා විදර්ශනා වඩා සමහර සත්ත්ව කෙනෙක් රහත්ව ඉහාත්මභාවයෙහි අමාමහ නිවන් දක්නාහ. සමහර සත්ත්වකෙනෙක් එම මාර්ගඵලානුරූපවූ පරිද්දෙන් දිව්‍යලෝක බ්‍රහ්මලෝකයෙහි උපදනාහ.

එසමයෙහි මෛත්‍රෙය සර්වඥයන්වහන්සේ ද්වාත්‍රිංශත් මහා පුරුෂලක්‍ෂණ අසූඅනුව්‍යඤ්ජන ව්‍යාමප්‍රභා කේතුමාලාලඞ්කාරයෙන් විරාජමානවූ රූපවිලාශය හා දිව්‍ය-බ්‍රහ්ම-මනුෂ්‍ය-ගන්ධර්වාදි සියලු සත්ත්වයන් විසින් අතුරු නැතිව කරන්නාවූ නොයෙක් පූජාසත්කාර හා උන්වහන්සේගේ කුශලානුභාවයෙන් නිර්මිතවූ රත්නමණ්ඩප, රුවන් ඇඟෑ රන්රුවන් තොරණ, රන් රිදීධජපතාකා ආදිවූ පූජාභාණ්ඩවිශෙෂය හා නිත්‍ය පරිවාර කෙළලක්‍ෂයක් භික්‍ෂූන්වහන්සේ නැමවේලෙහිම පිරිවරා ඇවිදීම් ආදිවූ නොයෙක් යශශ්ශ්‍රීසමෘද්ධිය මෙපමණෙක් ඇත්තේයයි සර්වප්‍රකාරයෙන් සංඛ්‍යා කොට කියන්ට එබඳුමසර්වඥකෙනකුන්වහන්සේට මුත් පෘථග්ජනව සිටි අන්‍යසත්ත්වයෙකුන්ට නො පිළිවන් වන්නේය. එසේහෙයින් නුවණැති සියලු සත්ත්වයන් විසින් මෙබඳු සියලු ඓශ්වර්‍ය්‍ය දැක ඒ මෛත්‍රෙයසර්වඥයන්වහන්සේගෙන් ධර්මදෙශනාවන් අසා අමාමහ නිවන් දක්නට උත්සාහ කටයුත්තේය.

මෙසේ ඒ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේට කාමාවචරදෙවතාදීන් විසින් කරන්නාවූ රන් රිදී ඇඟෑ ආදිවූ පූජාවිශෙෂය දක්වා දූන් එසමයෙහි උපන් සත්ත්වයන්ගේ යශස් සැප ආයු-වර්ණ-බල සමෘද්ධි ආදිය දක්වන්නාවූ සර්වඥයන් වහන්සේ මෙසේ වදාළසේක.

“මහායසස්සුඛෙනාපි ආයුවණ්ණබලෙන ච,
දිබ්බසම්පත්තිවාතෙසං මනුස්සානං භවිස්සති.

අනුභොත්වාකාමසුඛං අඩ්ඪානං යාව තිවජ්ජනං,
තෙපච්ඡාසුඛිනා යෙව නිබ්බායන්තායුසංඛයා.

අසීතිවස්සසහස්සානි තදා ආයු භවිස්සරෙ,
තාවතා තිට්ඨමානො සො තාරෙස්සති බහුං ජනං.

පරිපක්කමානසෙ සත්තෙ බොධයිත්වාන සබ්බසො,
අවසෙසතිට්ඨමානං මග්ගාමග්ගානුසාසිය.

ධම්මුක්කං ධම්මනාවංච ධම්මාදාසඤ්ච ඔසධං,
සක්කච්චෙවනහි සො සත්ථා ඨපෙත්වා ආගතිං ජනෙ.

සඞ්ඝං සාවකසඞ්ඝෙන කතකිච්චෙන තාදිනා,
ජලිත්වා අග්ගික්ඛන්ධොවනිබ්බායිස්සති සො ජිනො.

පරිනිබ්බුතම්හි සම්බුද්ධෙ සාසනං තස්ස ඨාහති,
විස්සවස්සසහස්සානි ආසීතිඤ්ච සහස්සතො,.
තතො පරං අන්තරධානං ලොකෙ හෙස්සති දාරුණං"යි.

එසමයෙහි උපන්නාවූ සියලු මනුෂ්‍යයන්ට යසපිරිවර සැපයෙන්ද, ආයු වර්‍ණ බලසමෘද්ධියෙන්ද, දිව්‍යසම්පත්තියක් මෙන් අඩුවෙක් නොවන්නේය. මෙබඳුවූ සියලු පඤ්චකාම සැපය කැමැති පරිද්දෙන් අනුභව කොට බොහෝ කලක් ඉක්මවා සුඛිත මුදිතවූ සියලු සත්ත්වයෝ එම සැපයෙන් නො පිරිහී පසුව ආයුකෙළවර මරණමඤ්චකයෙහි වැදහොන්නාහු සම්පත්තියෙහි උකටලී වන්නාහ. එසමයෙහි උපන් සත්ත්වයන්ට අසූදහසක් අවුරුද්දට ආයුෂය වන්නේය. ඒතාක්කල් මුළුල්ලෙහි ජීවත්ව වැඩහිඳිනාවූ ඒ මෛත්‍රෙය සම්‍යක්සම්බුද්ධරජාතන් වහන්සේ බොහෝ ජනසමූහයා සංසාරසාගරයෙන් එතර කොට නිර්‍වාණ ක්ෂෙමභූමියට පමුණුවනසේක.

තවද ඥානපරිපාකගතවූ සියුම් නුවණැති සත්ත්වයන්ට සර්‍ව ප්‍රාකාරයෙන් චතුස්සත්‍යාවබොධය කරවා ඥානපරිපාකයට නො පැමිණි නුවණ මද චතුස්සත්‍යාවබොධය නොකළ අවශෙෂ සත්ත්වයන්ට මේ නිර්‍වාණගාමී මාර්‍ගය මේ අමාර්‍ගයයි මාර්‍ගොද්දෙශක වදුරා අවිද්‍යා නැමැති අඳුරු දුරුකරන්නාවූ ප්‍රඥා නැමැති ආලොකය ප්‍රකාශ කරන්නාවූ ධර්‍ම නැමැති ප්‍රදීපය ද සංසාර නැමැති සාගරයෙන් එතරවන පිණිස ධර්‍ම නැමැති මහනැවද, කුශල ධර්‍ම නැමැති මහමුහුන නැගී අකුශලධර්‍ම නැමැති කුරුළු ආදිය හරණ පිණිස ඒ මුඛපිළිකාදිය ප්‍රකාශකරන්නාවූ අතීත් ඵලය කෙළවරකොට ඇති විදර්‍ශනා සහිතවූ ධර්‍ම නැමැති කැට පතද, කෙලශව්‍යාධිය සන්හිඳුවන පිණිස ඒ කෙලශරොගය නසන්නාවූ ධර්‍ම නැමැති ඖෂධයද, දෙශනාවශයෙන් සකස්

ෂ්කාවී ආදරයෙන් අනාගතයෙහි උපදනා භික්ෂූන්වහන්සේට වැඩ පිණිස තබා චතුරාර්‍යසත්‍යයෙහි සොළොස් ආකාරයකින් සළමනා කෘත්‍යය කොට නිමවූ හෙයින් කෘතකෘත්‍යවූ ඉෂ්ටානිෂ්ටයෙහි නිර්විකාරිවූ ශ්‍රාවකසඞ්ඝයා වහන්සේ හා සමඟ හාත්පසින් අන්ධකාර දුරුකොට ආලෝක දක්වා පශ්චිමස්තකයෙක්හි ඇවිල නිවීගිය මහත්වූ වහ්නිස්කන්ධයක් මෙන් සියලු ලෝකවාසී සත්ත්වයන්ගේ සන්තානගතවූ කෙලශ නැමැති අන්ධකාරය දුරුකොට සර්වඥතාඥාන නැමැති ආලෝකය දක්වා ශාසන නැමැති පශ්චිමස්තකයෙහි අනන්තාපරිමාණවූ බුඩශ්‍රීන් දිලිහී ඒ මෛත්‍රෙයසම්‍යක්සම්බුඩ නැමැති වහ්නිස්කන්ධයානන්වහන්සේ නිරුපධිශෙෂ නිර්වාණධාතුවෙන් පිරිනිවන් පෑ වදාරණසේක.

ඒ සර්වඥයන්වහන්සේ පිරිනිවී කල්හි උන්වහන්සේගේ ශාසනය එක්ලක්ෂ අසූදහසක් අවුරුදු මුළුල්ලෙහි පැවැත අන්තර්ධානවන්නේය. සියලු දසදහසක්සක්වළ එකාන්ධකාර කොට ශාසනාන්තර්ධානය වූකල්හි එයින් මත්තේ ලෝකයේ දශකුශල කර්මපථය පිරිහෙන්ට වන් කල්හි දරුණුවූ කර්කශවූ දුඃඛවිශෙෂය උපදවන්නාවූ අකුශලධර්මය පහළවන්නේය.

මෙසේ ඒ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේගේ පරිනිර්වාණය දක්වා දූන් ජීර්ණපත්‍රපුටයෙක්හි නිස්සඞ්ගව පවත්නා දිවසසංසපත අංගුලයක් මෙන් සියලු ධර්මයෙහි අස්ඛලිතව පවත්නාවූ ඥානගති ඇති අපගේ සර්වඥයන්වහන්සේ සර්වාඞ්ගයෙන් ධවලවූ උතුම්වූ හස්තිරාජයක්හු සර්වාලඞ්කාරයෙන් සරහා ඔහුගේ ශොඩ පොළගසන්නාක්හු මෙන්ද, සර්වරත්නමයවූ උතුම් ප්‍රාසාදමස්තකයෙහි අසනිපාතයක් එළන්නාක්හු මෙන්ද, නොයෙක් කර්මාන්තයෙන් විසිතුරු කොට කරණලද රාජභවනයක් වහ්නියෙන් දහනය කරන්නාක්හු මෙන්ද, මෙබඳුවූ බුඩශ්‍රී සමෘද්ධිය ද, නිත්‍යසංස්කාරයක් නැති බැවින් අනන්තර්ධාන වන්නේය. එහෙයින් ශාරිපුත්‍රස්ථවිරයෙනි! සියලුම සංස්කාරධර්මයෝ චිරස්ථායිව බොහෝ කලක් නො පවත්නාහුයයි දක්වන්නාවූ සර්වඥයන්වහන්සේ මෙසේ වදාළසේක.

"එවං අනිච්චා සංඛාරා අඬුවා තාවකාලිකා,
ඉත්තරා භෙදනා චෙව ජජ්ජරා රිත්තකා භවෙ.

තුච්ඡමුට්ඨිසමාපුණ්ණා සංඛාරා බාලලාපනා,
න කස්සචි වසො තත්‍ථ වත්තති ඉද්ධිමස්ස පි
එතං ඤත්වා යථාභූතං නිබ්බින්දෙ සබ්බසංඛතෙ"යි.

මෙසේ ප්‍රදීපශිඛාවක් මෙන් කර්මාදි හේතුප්‍රත්‍යයන් හා සමඟ උපදනා වූ සංස්කාරධර්මයෝ ඇතිව නැතිවන්නාවූ අර්ථයෙන් අනිත්‍යය කෙළවර කොට ඇති බැවින් හා ආදි අන්ත දෙක ඇති බැවින් අනිත්‍යයහ. සියලුම සංස්කාරධර්මයෝ දියබුබුලු හා පෙණපිඩුමෙන් අස්ථිර බැවින් අධ්‍රැවවන්නාහ. පරායත්ත බැවින් පිරුලෙන්ලත් වස්තුවක් මෙන් තාවකාලික වන්නාහ. ස්වල්පවූ ආස්වාද ඇති බැවින් ස්වප්නයක් මෙන් මන්දාස්වාදව ලාමක වන්නාහ. උපන්නාවූ සංස්කාරධර්මයන් ඒකාන්තයෙන් නස්නා හෙයින් විදුලියක් මෙන් බිඳෙන්නාවූ ස්වභාව ඇත්තාහ.

තවද සියලු සංස්කාරධර්මයෝ කුඹලුන්කළාවූ වලන්පලහන වළඳහසුලය මුදුනට පලගත් රුකින් නැමුනු අතුඅග තුඹු පිතිවන් දූවක් මෙන්ද, ඉදිකටු අග තුඹු සබඇටක් මෙන්ද, ඒකාන්තයෙන් කලක් නො පිහිටන්නාහු උපන්නාවූ ස්වභාවයෙන් නොසිටීම ධර්මතා බැවින් බිඳෙන්නාවූ ස්වභාව ඇත්තාහ. ස්ථිරත්වයක් නැති බැවින් නොපැළහු මැටිවළඳක් මෙන්ද, දුදුරුව බිඳෙන්නාහ. නිත්‍යාදි සාර විරහිත බැවින් ආත්ම ආත්මීය භාවයෙන් සිස්වූ මිටක් මෙන් තුච්ඡවන්නාහ. ක්ෂණිකනිරෝධයෙන් නස්නා බැවින් නිරුද්ධවන්නාවූ ස්වභාව ඇත්තාහ. මිටමොලවා විදහා පෑ සිස්අතක් මෙන් ගතයුතු ආස්වාදයක් නැත්තාහ. නිත්‍ය සුඛ ශුභත්වයක් නැති හෙයින් ශූන්‍යයහ. අප්‍රාඥසත්වයන් විසින් මමය, මාගේයයි ගන්නා හෙයින් මාගේ පුතණුවෝය. මාගේ දියණියෝය, මාගේ නෑයෝය, මාගේ ධනධාන්‍යය යන මේ ආදීන් මමත්වය උපදවා කියන හෙයින් බාල ලාපනයහ. ඒ සියලු සංස්කාරධර්මයන් කෙරෙහි යශස්මහත්වය-පුණ්‍යමහත්වය-ප්‍රඥාමහත්වය යන මේ ආදිය ඇත්තවුන් අතුරෙන් යම් කිසි පුද්ගලයක්හුගේ වසයෙහි ඓශ්වර්‍ය්‍යී නො පවත්නේය. කුමක් හෙයින්ද? යත්:-සෘද්ධිමතුන් කෙරෙන් අග්‍රතැන්පත්වූ මහාමෞද්ගල්‍යායනස්ථවිරාදීන්ගේ වශයෙහි නො පවත්නා හෙයින් සෘද්ධිමතුන්ගේත් ඓශ්වර්‍ය්‍යවශගය ඒ සංස්කාරයන් කෙරෙහි නොපවත්නේය. මෙසේ සියලු සංස්කාරධර්මයන්ගේ අනිත්‍යාදි ස්වභාවය තත්වූපරිද්දෙන් දැන සියලු ප්‍රත්‍යයසමුත්පන්න ධර්මයෙහි කලකිරී භවවිරාගය කටයුත්තේය. මෙසේ සියලු සංස්කාරධර්මයන්ගේ අනිත්‍යතාව දක්වා දැන් ලෝකයෙහි අමෘත මහානිර්වාණයට පමුණුවන්නාවූ උත්තමපුරුෂයන්ගේ දුර්ලභ බවද දක්වන්නාවූ සර්වඥයන්වහන්සේ මෙසේ වදාළසේක.

දුල්ලභො පුරිසාජඤ්ඤො න සො සබ්බත්ථ ජායති,
යත්ථ සො ජායතී ධීරො තං කුලං සුඛමෙධති"ති.

මහණෙනි! ලොකයෙහි ස්ථිර සඳෙනකුගේ පහළවීම දුර්ලභ වන්නේය. කවර සඳෙනකුගේද? තිකෙලසිවූ තථාගතවූ සම්‍යක් සම්බුද්ධයන්ගේ පහළවීම ලොකයෙහි දුර්ලභ වන්නේය යනාදි ක්‍රමයෙන් වදාළ බැවින් කප්අසංඛ්‍යයක් මුළුල්ලෙහින් සර්වඥකෙනකුන්ගේ උත්පත්තිය දුර්ලභ බැවින් පුරුෂාජානීයවූ පුරුෂශ්‍රෙෂ්ඨවූ පුරුෂොත්තමයෙක් නො ලැබිබහැකි වන්නේය. ඒ එබඳුවූ පුරුෂොත්තම පුද්ගලයෙක් සියලු දසදහසක් සක්වළ කෙල්ලක්ෂයක් සක්වළ අනන්තාපරිමාණ සක්වළ වේවයි අන්‍ය දීපාන්තරයෙහි වේවයි ප්‍රත්‍යන්තජනපදයෙහි වේවයි රජ බමුණු දෙකුලය හැර සෙසු කුලයක වේවයි නූපදනේය. ඒ උතුම්ඥන ගති ඇති පුරුෂාජානීය තෙපුයම් කුලයක උපදනේ වී නම් ඒ කුලය සියලු සැපයෙන් මතුමත්තෙහි අභිවෘද්ධියට පැමිණෙන්නේය. වදාළේ මැනෝ:-

"ඒකපුග්ගලස්ස භික්ඛවෙ පාතුභාවො දුල්ලභො ලොකස්මිං, කතමෙ සං ඒකපුග්ගලං? තථාගතස්ස අරහතො සම්මා සම්බුද්ධස්ස පාතුභාවො දුල්ලභො ලොකස්මිං; ආදි. මෙසේ උත්තම පුරුෂයන් ලොකයෙහි නොලැබිබ හැකි නියාව දක්වා දූන් මෛත්‍රෙය සර්වඥයන් වහන්සේ දක්නට හේතුවූ කුශල සමෘද්ධිය කිරීමෙහි යොදන්නාවූ සර්වඥයන්වහන්සේ මෙසේ වදාළසේක.

"තස්මා මෙත්තෙය්‍යස්ස බුද්ධස්ස දස්සනත්ථාය වො ඉධ
උබ්බිග්ගමානසා සුබ්බු කරොථ විරියං දළ්හං.

යෙචිධකතකල්‍යාණා අප්පමාද විහාරිනො,
භික්ඛු භික්ඛුණියොචෙව උපාසක උපාසිකා.

මහාමහං බුද්ධසක්කාරං උළාරමභිපූජයං,
දක්ඛිනති භද්‍රසමිතිං තස්මිං කාලෙ සදෙවකා.

වරථ බ්‍රහමචරියං දෙථ දානං මනාරහං,
උපොසථඤ්චුපවසථ මෙත්තං භාවෙථ සාධුකං.

අප්පමාදරතා හොථ පුඤ්ඤකිරියාසු සබ්බදා,
ඉධෙව කත්වා කුසලං දුක්ඛස්සන්තං කරිස්සථ"ති.

තවද යම්හෙයකින් අමෘතමහානිර්වාණයට පමුණුවන්නාවූ පුරුෂාජානීයයන්ගේ උත්පත්තිය ලොකයෙහි දුර්ලභවේද එහෙයින් දුර්ලභොත්පත්ති ඇත් මෛත්‍රෙය සර්වඥයන් දක්නා පිණිස

තෙපි හැම මාගේ ශාසනයෙහි සිට උමෙගයට පැමිණි සිත් ඇති ව මනාකොට දැස්වියඃකරන්ට උත්සාහකරව. ලොකායෙහි කාරණ ලද කුසල් ඇති අප්‍රමාද විහාරිවූ යම් භික්‍ෂු භික්‍ෂුණී උපාසක උපාසිකා කෙනෙක් ඇත්නම් ඔහු භාග්‍යවත්වූ සර්වඥයන්වහන්සේට උදාරතරවූ විශෙෂවත්වූ මහත්වූ පූජාසත්කාර කරන්නාහු සොඳුරුගුණයෙන් යුක්තවූ ඒ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේ එසමයෙහි දිව්‍යමනුෂ්‍යයන් හා සමග දක්නාහුය ඒ භාග්‍යවත්වූ මෛත්‍රෙයසර්වඥයන්වහන්සේ දක්නෝ කවුරුද නොදක්නෝ කවුරුද යත හොත් මාතෘඝාතක පිතෘඝාතක අරහන්තඝාතක ලොහිතුප්පාදක සංඝභෙදකායයි කියනලද පඤ්චානන්තර්‍යයීකර්මය කොට අවීචිමහානරකයෙහි උපන්නාවූ සත්ත්වයෝ ඒ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේ දක්නනොහෙත්මය. මෙලොව නැත පර ලොවනැත කර්මනැත කර්මඵලනැත මවුනැත පියෝනැත කළාවූ කුශලාකුශලයෙහි විපාකනැත කියා මෙසේ මිථ්‍යාදෘෂ්ටිගෙණ අළගාඇව්දිනාවූ සත්ත්වයෝත් ඒමෛත්‍රෙය සර්වඥයනවහන්සේ දක්ක නොහෙතමය. ආර්‍යොපවාදකළාවූ සත්ත්වයෝත් ඒ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේ දක්ක නොහෙතමය. නරකතිර්‍යක්ප්‍රෙත අසුරනිකායෙහි උපන්සත්ත්වයෝත් අරූතල අසංඥතලයෙහි උපන්සත්ත්වයෝත් ඒ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේ දක්කනොහෙත්මය. ඉන්ද්‍රිය වෛකල්‍යයට පැමිණි සත්ත්වයෝත් ඒ මෛත්‍රෙය සර්වඥයනවහන්සේ දක්ක නො හෙත්මය. ප්‍රත්‍යන්තජනපදයෙහි උපන් සත්ත්වයෝත් ඒ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේ දක්ක නොහෙත්මය. නිගණ්ඨාදී පාෂාණ්ඩයෝත් ඒ මෛත්‍රෙය සර්වඥයන් වහන්සේ දක්ක නො හෙත්මය. බුදුන් සතුදෙය, ධර්මය සතුදෙය, සංඝයා සතුදෙය නොසැසින් ගෙණ කෑවෝත් ඒ මෛත්‍රෙය සර්වඥයන් වහන්සේ දක්ක නො හෙත්මය. මෙසින් පිටත් අවශෙෂ සත්ත්වයන්ගෙන් දුගී-මැගී සත්ත්වයන හා මහණ බමුණන්ට දන්දුන්නෝ ඒ මෛත්‍රෙය සර්වඥයන් වහන්සේ දක්නමය. පන්සිල් රක්‍ෂාකළෝ දකිත්මය. පෙහෙවස් රක්‍ෂාකළෝ දකිත්මය. බඹසර රක්‍ෂාකළෝත් දකිත්මය. දාගැප් කරවූවෝ දකිත්මය. බොධිපිහිටුවූවෝ දකිත්මය. පුෂ්පාරාම, ඵලාරාම කැරවූවෝ දක්නමය. උයන්-පොකුණු කැරවූවෝ දකිතමය. ඒදඬු ලැව්වෝ දකිති. ගොඩටු කැරවූවෝ දකිති. අම්බලම් කැරවූවෝ දකිති. මං මැලිකැරවූවෝ දකිති. ධර්මශාලා-භොජනශාලා කැරවූවෝ දකිති. ළිං කැණවූවෝ දකිති. දියපැන තුබුවෝ දකිති. බුදුනසැසුන ඇත්කරනට වහලවූවෝ

දකිති. ධර්මකථිකයන්ට මණ්ඩප කරවා පිළිගැන්වූවෝ දකිති. ධර්මාසන සැරහූවෝ දකිති. දණ්ඩාසන-කබලි-බණවසුත් දුන්නෝ දකිති. විජිනිපත්‍ර අතට ඔසවා දුන්නෝ දකිති. බණකියනා හෙයි වියන් බැන්දෝ දකිති. වියනේ මලලොඹු දුන්නෝ දකිති. රත්මල්-රිදීමල් ආදිය පිදුවෝ දකිති. සුවඳමල්-සුවඳසුණු පිදූවෝ දකිති. සුවඳදුම්ලූවෝ දකිති. බණකියන හෙයි පහන්දැල්වූවෝ දකිති. බණට අඩගෑවෝ දකිති. බණකියන කල සාධුකාර දුන්නෝ දකිති. බණකියන්නන් පයසේදූවෝ දකිති. මේ සියලු එතාවත් කොට නිමවා බණ කියන්නන් ආචාර උපචාරයෙන් වඩාගෙණවුත් ධර්මාසනයේ හිඳුවා සකස්කොට බණ පැවැත්වූවෝ ඒ මෛත්‍රෙය සර්වඥයන් වහන්සේ දකින්මය.

තවද ආමිසදාන, ධර්මදානාදීන් සඞ්ඝයා වහන්සේට පූජාසත්කාරකළෝ ඒමෛත්‍රෙය සර්වඥයන් දකින්මය. මවුන්ට උපස්ථාන කළෝ දකිති. පියන්ට උපස්ථාන කළෝ දකිති. කුලදෙටුවන්ට උපස්ථාන කළෝ දකිති. ලාබත්-පොහෝබත්-අවදිබත් දුන්නෝ දකිති. දසපින් කිරියවත් පිරූවෝ දකිති. සඞ්ඝාරාම කැරූවූවෝ දකිති. පිළිමගෙවල් කැරූවූවෝ දකිති. පිළිම කරවා ඇස්තැබ්බවූවෝ දකිති. බණපොත් ලියවා දුන්නෝ දකිති.

තවද ඒ මෛත්‍රෙය සර්වඥයන් දකුම්හයි පතා යටත්පිරිසෙයින් එකමල්මිටක්, එකපහනක්, එකබත්ආලෝපයක් පමණ දන් දුන්නෝද ඒ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේ දකින්මය අනුන්කළ පින් සමසිතින් සතුටුව අනුමෝදන්වූවෝත් ඒ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේ දකින්මය. තවද ඒ බුද්ධෝත්පාදයෙහි උපදමෝවයි පතා කුසල්කළ දිව්‍යමනුෂ්‍යයෝ ඒ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේ දකින්මය. ඒ දිව්‍යමනුෂ්‍යයෝද, මෛත්‍රෙය සර්වඥයන්ගෙන් ධර්මය අසා මාර්ගඵලයට පැමිණෙන්නාහුය. මාර්ගඵලයට පැමිණෙන්ට අසමර්ථ කෙනෙක් ස්වර්ගයෙහි උපදනාහ එසේ හෙයින් නුවණැත්තාවූ සියලු සත්ත්වයෙනි! පඤ්චශීල-දශශීල-කොටියක් සංවරශීලාදි වශයෙන් ශීලසංරක්ෂණය කෙරෙමින් උතුම්වූ බඹසරවස් රක්ෂාකරව.

දන්දෙන්නාවූ සත්ත්වයෝ බොහෝ ජනයාට ප්‍රියවන්නෝය. ඔවුන්බොහෝ ජනයෝ භජනය කෙරෙති. කීර්තියටත් පැමිණෙන්නෝය. ඔහුගේ යසස් වැඩෙන්නේය. මකුත් නොවී කරත් තොබා සිව්වණක් පර්ෂද් මධ්‍යයට වදනාහ. විශාරදවත්නාහ. මසුරු නොවන්නාහ. බුහුටි වන්නෝය යන මෙතෙක්

ගුණ ඇති ඓහලෞකික-පාරලෞකික සැපත් එළවන්නාවූ කෙලවර අමෘතමහානිර්වාණය සාදා දෙන්නාවූ මහාසීවූ අන්න-පාන වස්ත්‍ර-යාන-මාලා-ගන්ධ-විලේපන-ශය්‍යාවසථ-ප්‍රදීපෙයසඞ්ඛ්‍යාත දශවිධ දානවස්තූන් ශ්‍රමණබ්‍රාහමණාදීන් විෂයෙහි පිහිටි වී මෙන් මහදන් පවත්වව. අටවක-තුදුස්වක-පසළොස්වක සමාදන්ව රැක්කයුතු උපොෂිතසීලය සමාදන්ව පෙහෙවස් රක්‍ෂාකරව. තමාය-තමාට හිතයෝය-මධ්‍යස්තයෝය-වෛරීය යන චතුර්විධ සත්ත්වයන් කෙරෙහි සියලු සත්හු සුවපත් වෙත්වයි, නිදුක් වෙත්වයි නිරොගී වෙත්වයි, තමන් තමන්ගේ ධනධාන්‍ය සම්පත්තියෙන් නො පිරිහී සැපසේ ආත්මපොෂ්‍යය කෙරෙත්වයි යන මේ ආදික්‍රමයෙන් මෛත්‍රීභාවනා කරව. අප්‍රමාදව ප්‍රතිපත්තියෙහි ඇලී වාසය කරව. හැමකලම කුසල්කිරීමෙහි පසු නො බැස බලවත් ඇලුම් ඇතිව කුසල් කරව.

තවද කුශලක්‍රියාවට ආකරවූ බුද්ධොත්පාදකාලයෙහි දාන-ශීල-භාවනාදී අනෙකප්‍රකාර කුසල් රැස්කරව. ඒ කළාවූ කුසලයෙන් අනෙකප්‍රකාරවූ දුක්කෙළවර කොට අමෘතමහා නිර්වාණයට පැමිණෙවයි, අවවාද අනුශාසනා කොට දෙශනාව නිමවා වදාළසේක. ඒ ධර්මදෙශනාවසානයෙහි කෙළලක්‍ෂයක් දිව්‍යමනුෂ්‍යයෝ දීපඞ්කරසර්වඥයන්වහන්සේ ආදිකොට ඇති මෛත්‍රෙය සර්වඥයන්වහන්සේ කෙළවරකොට ඇති සවිස්සක් පමණ සර්වඥවරයන් වහන්සේගේ බුද්ධවංශය අසා අභීත්එලයෙහි පිහිටියාහ. අසඞ්ඛ්‍යයක් දිව්‍යමනුෂ්‍යයෝ සොවාන් සෙදගැමි අනාගැමි යන තුන්මඟ තුන්ඵලයට පැමිණියාහුය. ඒ දෙශනාවට මෑත භාගයෙහි චක්‍රවර්තිසූත්‍රදෙශනාව කරන්නාවූ සර්වඥයන් වහන්සේ අනාගතවංශදෙශනාව කොට වදාළසේක.. ඒ කෙසේද? යත්:—

එක්සමයෙක්හි භාග්‍යවත් බුදුරජානන්වහන්සේ මගධරට සැරිසරා වඩනාසේක් මාතුලා නම් නුවරට පැමිණ ඊට නුදුරු වනලැහැබෙක වාසයකරණසේක් අලුයම්වෙලෙහි මහාකරුණා සමාපත්තීන් නැගී ලොවබලා වදාරණසේක් මේ අනාගතවංශය ප්‍රකාශකරන්නාවූ සූත්‍රාන්තදෙශනාවෙන් මාතුලානුවර වාසීවූ සුවාසූදහසක් ප්‍රාණීන්ට වන්නාවූ ධර්මාභිසමය දැක උදෑසනම විසිදහසක් භික්‍ෂූන්වහන්සේ පිරිවරා මාතුලා නම් නුවරට පැමිණිසේක.

එකල මාතුලානුවර වාසී රජදරුවෝ සර්වඥයන්වහන්සේ වැඩිසේක යනු අසා පෙරගමන් කොට දශබලධාරීවූ බුදුරජානන්වහන්සේට ආරාධනා කොට මහත්වූ සත්කාර සම්මානයෙන් නුවරට වඩාගෙණ ගොස් වැඩඉන්ට සුදුසු ස්ථානයක් විශෙෂකොට සරහා මහාර්ඝවූ පර්‍යඞ්කයෙක වඩාහිඳුවා බුදුපාමොක් මහසඟපිරිසට මහදන් දුන්හ. භාග්‍යවත්වූ සර්වඥයන්වහන්සේ ආහාරකෘත්‍යය කොට තිමවා සිතනසේක්, ඉදින් මම මේ ස්ථානයෙහිදී මේ මනුෂ්‍යයන්ට ධර්ම්මදෙශනා කරන්නෙම් වී නම්, මේ ප්‍රදෙශය ඉතා හකපටු වන්නේය. මනුෂ්‍යයන් හිඳින්ටවත් සිටින්ටවත් අවසර මදවන්නේය මහත්වූ සමාගමයක් මෙතන්හි විය යුතුය යි සිතූසේක. ඉක්බිත්තෙන් රජදරුවන්ට අනුමෙවෙනි ධර්මයදෙශනා නොකොටම පාත්‍රය ගෙණ නුවරින් නික්මුණුසේක. මනුෂ්‍යයෝ සිතන්නාහු බුදුරජානන්වහන්සේ අපට භුක්තානුමෝදනා විවරකූත් නො කොට වඩනාසේක. ඒ කාන්තයෙන් බුදුනට පිළිගැන්වූ ආහාරපානවර්ගය නපුරුව ගියේ වන. බුදුනු නම් සිත් ගතහැකි කෙනෙක් නොවනසේක. බුදුන් හා සමඟ කරන්නාවූ විශ්වාසය නම් පණගප් විදහාගත් නාගරාජයක්හුගේ කරටියඅල්වා කෙළීමක් හා සමාන වන්නේය. එසේහොසින් පින්වත්නි! වරෝ යම්හ. බුදුරජානන්වහන්සේ ක්‍ෂමාකරවම්හ යි කියා සියලු නුවරවාසී සත්ත්වයෝ සර්වඥයන්වහන්සේ හා කැටිවම නික්මුණාහ. බුදුරජානන්වහන්සේ වඩිමින් සිටම මගධක්‍ෂෙත්‍රයෙහි පිහිටි ශාඛාවිටපසම්පන්නවූ ඝනච්ඡායා ඇති, කිරියක්මානයේ පැතිර සිටියාවූ එක් මයිලගසක් දැක, මේ වෘක්‍ෂමූලයේ හිඳ ධර්මදෙශනාකරන්ට වන් කල්හි මහජනයා ඉන්ට සිටින්ට අවසර පෙණෙන්නේය යි දැන වැළක මයිලරුක සමීපයට වැඩ ධර්මභාණ්ඩාගාරිකවූ ආනන්දස්ථවිරයන්වහන්සේගේ මුහුණ බලා වදාළසේක. එසඳ අනඳමහතෙරුන්වහන්සේ මුහුණ බැලූ ආකාරය දැනලාම බුදුරජානන්වහන්සේ වැඩහිඳිනා කැමතිසේක්වනැයි දැන සුගත්මහාචීවරය සතරපට කොට මයිලරුකමුල වැඩහිඳිනා පරිද්දෙන් ආසනය පැණවූසේක. බුදුරජානන්වහන්සේ පණවනලද ආසනමස්තකයෙහි බාලාර්කබිම්බයක් මෙන් දිළිහි දිලිහීවැඩහුන්සේක. ඉක්බිත්තෙන් උන්වහන්සේ අභිමුඛයෙහි මනුෂ්‍යයෝ උන්හ. දූලයෙහිත් පිටිපසත් භික්‍ෂුසඞ්ඝයා වහන්සේ වැඩහුන්සේක. ආකාශයෙහි දෙවතාවෝ සිටියාහ. මෙසේ මහත්වූ දිව්‍ය මනුෂ්‍ය භික්‍ෂුපර්ෂද් මධ්‍යයේ වැඩහුන්නාවූ තිලොගුරු සම්‍යක්සම්බුදුරජානන්වහන්සේ ධර්මය පිළිගන්ට සුදුසු භික්‍ෂූන්වහන්සේට ආමන්ත්‍රණය කොට

මහණෙනි! ආත්මප්‍රතිෂ්ඨා ඇතිව වසව. ආත්මශරණ ඇතිව වසව. අන්‍යසරණයක් ගෙණ නො වසව. මහණෙනි! ධර්මය පිහිට කොට වසව. ධර්මය ශරණ කොට වසව. අන්‍යසරණයක් ගෙණ නො වසව, යන මේ ආදික්‍රමයෙන් චක්‍රවර්ති සූත්‍රාන්තදේශනාව කොට වදාරා අනාගතවංශයක් දේශනාකොට වදාළසේක. එසේහෙයින් වදාරණලදී.

"අසීතිවස්සසහස්සායුකෙසු භික්ඛවෙ! මනුස්සෙසු මෙත්තෙය්‍යො නාම භගවා ලොකෙ උප්පජ්ජිස්සති අරහං සම්මා සම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිස දම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා ති" ආදි සූත්‍ර දේශනාවගේ කෙළවර විසිදහසක් භික්ෂූන්වහන්සේ අර්හත්ඵල යට පැමිණි සේක. සුවාසූදහසක් ප්‍රාණීහු අර්හත්ඵලයට පැමිණ අමාමහනිවන් දුටහ.

මෙසේ "අනාගතවංශය" සියලු ධර්මයෙහි අස්ඛලිතව පවත් නාවූ ඥානගති ඇති දශබලධාරී වූ චතුවෛශාරද්‍යවිශාරද වූ ධර්මරාජන්වූ ධර්මස්වාමී වූ තථාගත වූ අසමසම වූ අප්‍රතිපුද්ගල වූ ද්වයවාදී වූ සර්වඥ වූ තිලොගුරු සම්‍යක්සම්බුද්ධරජානන්වහන්සේ විසින් කිඹුල්වත්නුවර පරමරමණීය වූ න්‍යග්‍රෝධාරාමයෙහි වෙසෙමින් යමකප්‍රාතිහාර්‍ය්‍ය දක්වන්නාවූ කාලයෙහි තමන්වහන්සේ විසින් විශෙෂ කොට නිර්මාණය කරණ ලද ඉතා සිත්කලු වූ දකුම් ඇති රුවන්සක්මණෙහි සක්මන් කෙරෙමින් සිට 'බුද්ධවංශදෙශනාවසානයෙහි" නාමොසාදි චතුරොඝයෙන් නිස්තරණය පිණිස ද්‍රම්සෙනෙවි සැරියුත් මහතෙරුන්වහන්සේගේ ආරාධනාවෙන් දෙශනා කරණ ලද්දේය.

මෙපමණකින් කවරකෙනකුන් විසින් දෙශන ලද්දේද? කොතැන්හිදී දෙසනලද්දේද? කවරකාලෙක දෙසනලද්දේද? කුමක් පිණිස දෙසන ලද්දේද? කවුරුන්ගේ ආරාධනාවෙන් දෙසන ලද්දේද? යන මේ මහාප්‍රශ්නයෝ පස්දෙනා විශෙෂයෙන් විසර්ජනය කරණ ලද්දාහුය.

ධම්මරාජෙ පසාදෙන මෙත්තෙය්‍ය ගුණ සාගරෙ,
ලොකුත්තමස්ස නෙසෙව වංසං වණ්ණයතා මයා.
අපුබ්බ්‍යඤ්ජන සම්පන්නං කත්වාසොතරසායනං,
යං යං පුඤ්ඤං චිතංතෙන අනන්තං ගගනොපමං.
අනාගතෙ කෙතුමතී නගරෙ චක්කවත්තිනො,
උප්පජ්ජිත්වා කුලෙ දිස්වා මෙත්තෙය්‍යං ලොකනායකං,

අගාරෙ සම්පන්නානං කත්වා තස්ස යසස්සිනො,
බොධිමණ්ඩ නිසින්නස්ස පූජං කත්වා අනෙකධා,

එවං සත්ත සු ඨානෙසු ධම්මචක්කප්පවත්තනෙ,
මහන්තං මංගලං කත්වා නරාමරමනොරමං.

ධම්මං සුත්වා සීඝතා තත්ථ විචිත්තනෙතා අනෙකධා,
ගාථාසතසහස්සෙන ථූතිං කත්වා මහෙසිනො.

ද්වාදසයොජනඨානෙ නානාරතනභාසුරං,
පාසාදවාරපාකාරතොරණගසිකභූසිතං.

ජලාසය සහසෙහි සුඵුල්ලකමලෙහිච
මධුරොදක පුණ්ණෙහි සුපතිත්ථෙහි සොභිතං.

මාලචංකම පන්තීහි ලතානං මණ්ඩපෙහිච,
සබ්බදා පුප්ඵසඤ්ඡන්නං පාදපෙහි අලංකතං.

පාසාදෙනාභිරම්මෙන සිඛාපපත්තං මහෙසිනො,
පජ්ජලන්තං අංභාරතනං නානාරතනරංසිනා.

විහාරං සාධු කාරෙත්වා අනග්ඝං සයනාසනං,
පඤ්ඤපෙත්වා ජම්බුදීපං එකසංගීතිමණ්ඩලං.

කත්වා බුද්ධප්පධානස්ස දත්වා සංඝස්ස තං තදා,
පවත්තෙත්වා මහොසංච පණීතං චතුපච්චයං.

එවං දානං දදන්තොව අනන්තා දීඝස්ස අද්ධුනො,
පරිනිබ්බාණතො පුබ්බෙ පබ්බජිත්වා මහෙසිනො.

සීලාදිගුණ සම්පන්නො අට්ඨධම්මසමාහිතො,
ව්‍යාකතො ධම්මරාජෙන අයං බුද්ධො භවිස්සති.

ඉච්චෙවං සබ්බබුද්ධානං උප්පන්නානං තතොපරං,
වුත්තප්පකාරං සක්කාරං කත්වා නිච්චං මනොරමං.

කප්පරුක්ඛොව සත්තානං පූරෙත්වා සබ්බපාරමී,
බොධිපල්ලඞ්කමාරුය්හ බුද්ධො හුත්වා අනුත්තරො.

ධම්මචක්කං පවත්තෙත්වා සුවිසුද්ධං තමොනුදං,
තාරෙය්‍යං පාණිනො සබ්බෙ සොහං සංසාරසාගරා.

කුසලෙන අනෙනෙව අබ්‍යාපජ්ජා අවෙරිනො,
සත්තා අසෙසා සුඛිනො ඛෙමිනො හොන්තු සබ්බදා.

ගුණසාගරවූ ධර්මරාජන්වූ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේ කෙරෙහි ප්‍රසාදයෙන් ලොකොත්තම වූ උන්වහන්සේගේ වංශය අවිච්ඡින්නයෙන් සම්පූර්ණ කොට කර්ණරසායන කොට වර්ණනා කරන්නාවූ මා විසින් අනන්තාකාශයට බඳුවූ උපමා ඇති යම් යම් කුසලයෙක් රැස්කරණලද්දේ වේද,ඒ කුශලකර්මය හේතුකොට ගෙණ අනාගතයේ කෙතුමතී නම් රාජධානියෙහි ශංඛ නම් චක්‍රවර්ති රජ්ජුරුවන්ගේ වංශයෙහි ඉපැද ලොකනායක වූ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේ දූක යසපිරිවර ඇත්තාවූ ඒ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේට ගිහිගෙයි දී උපස්ථාන කොට බෝමඩ වජ්‍රාසනාරූඪව වැඩහිඳ සර්වඥතාඥානය සමධිගමය කළාවූ උන්වහන්සේට අනෙකප්‍රකාරයෙන් පූජා සත්කාර කොට එපරිද්දෙන්ම සත්සතියෙහිත්, දම්සක්පවතුන් සූත්‍රදෙශනාවෙහිත්, දිව්‍යමනුෂ්‍යයන්ට සිත්කළුවූ මහත්වූ උතුම් මඟුල් කොට බණ අසා සිටියාවූ මම එතැන්හිදී ඒ මහර්ෂිවූ සර්වඥයන්වහන්සේට විසිතුරුවූ ගාථාලක්ෂයක් බැඳ අනෙකප්‍රකාරයෙන් ස්තුති කොට දෙලොස්යොදනක් පමණ තැන් පැතිර සිටිනාවූ නොයෙක් රත්නයෙන් බබලනනාවූ ප්‍රාසාද දොරටු පවුරු තොරණ ඇගෑ ආදියෙන් හෙබියාවූ මළුසක්මන් පංක්තියෙන් හා ලියමඬුවෙන් හා මලින් ගැවසී ගත් වෘක්ෂයෙන් හැම කල්හිම අලංකෘතවූ සුපිපි රත්පියුම්-රත්නෙළුම්-එළනෙළුම්-ඇඹුල-උපුල ආදිය ඇති මිහිරි සිහිල්පැන් පිරුණාවූ සැපසේ බැස නහා පැන්බී ගොඩනැංගහැකි මනා තොට පතර ඇති දහස්ගණන් පොකුණුවලින් සැරහුනාවූ සිත්කලූ ප්‍රාසාදයෙන් මස්තකප්‍රාප්තවූ රුදුවල් නොයෙක් සත්රුවන් රැසින් බබලන්නාවූ විහාරයක් මහර්ෂිවූ ඒ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේට මනාකොට කරවා මාහැඟි කොඩුපලස් ආදි ආස්තරණ හා දළ ඇඳ, දළ පුටු, ආදි නොයෙක් සෙනසුන් පිරිකර එහි පණවා, සියලු ජම්බුද්වීපය එකරඟමඩලක් මෙන් කෙරෙමින් නොයෙක් පූජාසත්කාර කොට බුදුන් ප්‍රධානකොට ඇති භික්ෂුසඞ්ඝයාවහන්සේට ඒ විහාරය පිළිගන්වා උතුම්වූ ප්‍රණීතවූ චතුර්විධප්‍රත්‍යය මහවතුරක් මඩනාකාලක් මෙන් පවත්වා, මෙසේ එසමයෙහි බොහෝ කලක් මුළුල්ලෙහි දන් දෙන්නාවූත් මම මෛත්‍රෙය සර්වඥයන්වහන්සේට පිරිනිවන්පාන්ට පළමු කොට මහණව ශීලසමාධ්‍යාදි ගුණයෙන් යුක්තව මනුෂ්‍යාත්මභාවාදි අෂ්ටාඞ්ගයෙන් සමුපෙතව ධර්මරාජන් වූ ඒ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේ විසින් මේ මහණ අනාගතයෙහි බුදුවන්නේය යි විව

රණ දෙන ලද්දෙමි, ඒ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේ වැනිවූම එසින් මත්තෙහි උපදනා සියලු සර්වඥවරයන්වහන්සේට උක්ත ප්‍රකාර වූ සිත්කලුවූ මහත්වූ පූජාසත්කාර නිරන්තරයෙන කොට ඒ සියලු සර්වඥවරයන් වහන්සේගෙනුත් විවරණ ලැබ සියලු සත්ත්වයන්ට කල්පවෘක්ෂයක් මෙන් පැවැත, සියලු දශපාරමිධර්මයන් පුරා බොධිපර්‍ය්‍යෙෂ්ඨිකාරෑඪව නිරුත්තරවූ සම්‍යක්සම්බොධිඥානය සමධිගමය කොට මොහාන්ධකාර දුරුකරන්නාවූ අති පරිශුද්ධ වූ ධර්මදෙශනා කොට සියලු සත්ත්වයන් සංසාර නැමැති සාගරයෙන් එතරකොට නිර්වාණක්ෂෙම භූමියට පමුණුවම්වා.

මේ අනාගතවංශය විශෙෂ කොට කලාවූ මේ කුශලකර්මයෙන් ම සියලු සත්ත්වයෝ හැමකල්හි නිදුක් වෙත්වයි, නිරොගී වෙත්වයි,නිරුපද්‍රැතවෙත්වයි,අවෛරීවෙත්වයි,සුවපත්වෙත්වා.

මහාසම්මතපරම්පරාභිජාත විජයරාජොත්තම ප්‍රමුඛ අනෙක නරප්‍රතිශත නැමැති සාරහාරලතායෙහි විරාජමාන මධ්‍යමාණික්‍යයක් බඳු චක්‍රවාටපර්‍ය්‍යන්තානන්තදිගන්තව්‍යාප්ත කීර්ති ප්‍රබන්ධ ඇති සද්ධර්මරාජශාසනස්ථාපනාචාර්‍ය්‍යවූ පරමබොධිසත්ත්වාවතාර වූ සාමන්තභූපාලමකුටමණිකිරණ නැමැති සලිලධාරාවෙන් ප්‍රක්ෂාලිත පාදපද්ම ඇති කලියුගසන්තාපප්‍රශමනයට අභිනව මෙඝපටලයක් බඳුවූ වෛරීරාජප්‍රතාපභුජගසමූහයාට ගරුඩරාජයක්හු වැනිවූ සුරතරු සුරභි ධෙනුශචරාදීන්ගේ දර්පභඞ්ගය කරන්නාවූ අනවරතත්‍යාගෞදාර්‍ය්‍ය ඇති, නවයුවතිජන මනොමොහනයට සිද්ධෞෂධයක් වැනිවූ අපරිමිතශ්‍රමණගණප්‍රීණනය කරණ චතුර්විධප්‍රත්‍යයප්‍රදාන ඇති, දිගන්තයෂ්ටිකොටියෙහි බඳනාලද විශුද්ධ කීර්තිධ්වජ ඇති, සරස්වතීකාන්තාවට නිරන්තරවාසවූ මුඛපද්මයක් ඇති, ශත්‍රුරාජ නැමැති හංසයන්ගේ දර්පමර්දනයට වර්ෂාකාලයක් වැනිවූ, සද්ධර්ම නැමැති රත්නාවලියෙන් සරසනලද වක්ෂස්ථල ඇති, අනවරත ප්‍රවෘත්ත දශකුශලධර්මය ම බහුලකොට ඇති, තීක්ෂණප්‍රඥාවෙන් ප්‍රත්‍යක්ෂකරණ ලද සමස්තශාස්ත්‍ර ඇති, රත්නත්‍රය පරමප්‍රතිෂ්ඨා කොට ඇති, අකාරණපරමවත්සල ස්වභාවවූ අනන්තභොගීන්ද්‍රභොගාවලී සමාන දීර්ඝබාහු ඇති, දෙවැනි පණ්ඩිත පරාක්‍රමබාහු මහාරාජොත්තමයානන්වහන්සේ තමන් වහන්සේ කාරුණ්‍යසම්පන්න හෙයින් හා සම්පූර්ණ, ශ්‍රද්ධාබුද්ධි ඇතිහෙයින් හා අනන්තසත්ත්වයන් කෙරෙහි පතල කාරුණ්‍ය ඇති බැවින් අනාගතයෙහි ධර්මදෙශකයන්ගේ නොලැබීමෙන් මෛත්‍රෙයසර්වඥයන්වහන්සේ දුක ලොකික ලොකොත්

තරසම්පත් සිද්ධකරණු කැමැති සත්ත්වයන්ට හසරෙක් නො පෙණෙන්නේයයි සිතා කලියුගයෙහි නුවණමඳ සත්ත්වයන්ගේ සුඛාවබෝධය පිණිස මේ අනාගතවංශනම්වූ මහාප්‍රබන්ධය ස්වකීය භාෂාවෙන් ලියවනුකැමැතිසේක් මෛත්‍රීක්ෂමෝපශමාදි ගුණ ගණාඪ්‍යයෙන් සමන්විතවූ සර්වඥශාසන නැමැති පූර්වපර්වතශිඛර යෙහි විරාජමාන පූර්ණචන්ද්‍රමණ්ඩලයක් බඳුවූ ත්‍රිපිටක පර්‍ය්‍යාප්ති නැමැති ජලනිධිය ප්‍රඥානැමැති මන්දරාචලයෙන් අළලා එහි සාරා ර්ථනැමැත් අමෘතය ගෙණ විබුධප්‍රබන්ධයන් ප්‍රීණනයකළාවූ ශිෂ්‍යවර්ග නැමැති රාජහංසයන්ගේ සන්තෝෂයට ශරත්කාලයක් වැනිවූ විල්ගම්මූල මහාස්ථවිර නැමැති කනකගිරිශිඛරයෙහි විජෘම්භමාණ සිංහරාජයක්හු වැනිවූ මහාස්ථවිරපාදයන්වහන් සේට ආරාධනාකළසේක. උන්වහන්සේ ඒ ආරාධනා පිළිගෙණ ශ්‍රද්ධාබුද්ධිපූර්වඞ්ගම අදහසින් පාලිපාඨයෙන් කිසිවකුත් නොපිරි හෙළා හසක් එබූ කලක්මෙන් පාලියෙන් තිබුඑවාගෙණ මේ අනාගතවංශ නම්වූ ප්‍රබන්ධය ස්වභාෂාවෙන්කොට මස්තකප්‍රාප්ත කළසේක. තමහට හිතකැමැති සියලු සත්ත්වයන් විසින් සාවධා නව අසා ලෞකිකලෝකෝත්තර සම්පත් සිද්ධකටයුතු.

ලඞ්කාමෝද කරෝ පරක්කම භුජෝ රාජා ජනානං බහුං
කත්වා සංගහ මුත්තමං ච විපුලං සාධෙතු කාමොහිතං,
භාසායෙත්ථ ජනස්ස සන්තිසුඛදං සබ්බඤ්ඤුනා දෙසිතං
කත්වා වංස මනාගතං පන රිපුං විනෙත්ව සද්ධාධනො.

සම්මා සරොග්ගාම විහාරමූල මහාදිථෙරස්ස ගුණාකරස්ස'
ආරාධිතිත්වා මහතාදරෙන ජිනඤ්ඤං තිජං දීපයි සො තරිඤ්ඤො.

පාලික්කමං සොපචරො යතීනං නාතික්කමිත්වාන යථෙව මුද්ධං
.සකාය භාසාය අකාසි වංසං අනාගතං සාධුජනොදයාය.

සිද්ධිරස්තු.